197 වන කාණ්ඩය - 6 වන කලාපය
தொகுதி 197 - இல. 6
**Volume 197 - No. 6**

2011 ජනවාරි 21 වන සිකුරාදා
2011 சனவரி 21, வெள்ளிக்கிழமை
**Friday, 21st January, 2011**

# පාර්ලිමේන්තු විවාද
(හැන්සාඩ්)

# பாராளுமன்ற விவாதங்கள்
(ஹன்சாட்)

# PARLIAMENTARY DEBATES
(HANSARD)

## නිල වාර්තාව
அதிகார அறிக்கை
OFFICIAL REPORT

(අශෝධිත පිටපත /பிழை திருத்தப்படாதது /Uncorrected)

# අන්තර්ගත ප්‍රධාන කරුණු

**ජනාධිපතිතුමාගෙන් ලත් සන්දේශය:**
මහජන ආරක්ෂක ප්‍රකාශනය

**ප්‍රශ්නවලට වාචික පිළිතුරු**

**පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය:**
ස්වාභාවික ආපදා හේතුවෙන් ජනතාව මුහුණ දෙන දුෂ්කරතා

**නොපැමිණීමේ අවසරය:**
ගරු රාජවරෝදියම් සම්පන්දන් මහතා

**වැඩිහිටි තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ (සංශෝධන) පනත් කෙටුම්පත:**
දෙවන වර සහ තුන්වන වර කියවා සංශෝධිතාකාරයෙන් සම්මත කරන ලදී

**සමථ මණ්ඩල (සංශෝධන) පනත් කෙටුම්පත:**
දෙවන වර සහ තුන්වන වර කියවා සංශෝධිතාකාරයෙන් සම්මත කරන ලදී

**මහජන ආරක්ෂක ප්‍රකාශනය**

**කල් තැබීමේ යෝජනාව:**
ප්‍රාසාංගික කලාවන් සඳහා ජාතික රංග ශාලාවක් ස්ථාපනය කිරීම

---

# பிரதான உள்ளடக்கம்

**சனாதிபதியிடமிருந்து வந்த செய்தி:**
பொதுசனப் பாதுகாப்புப் பிரகடனம்

**வினாக்களுக்கு வாய்மூல விடைகள்**

**தனி அறிவித்தல் மூல வினா:**
இயற்கை அனர்த்தங்களினால் மக்கள் எதிர்நோக்கும் கஷ்டங்கள்

**வராதிருக்க அனுமதி:**
மாண்புமிகு இராஜவரோதயம் சம்பந்தன்

**முதியோரின் உரிமைகளைப் பாதுகாத்தல் (திருத்தச்) சட்டமூலம்:**
இரண்டாம், மூன்றாம் முறைகள் மதிப்பிடப்பட்டு, திருத்தப்பட்டவாறு நிறைவேற்றப்பட்டது

**மத்தியஸ்த சபைகள் (திருத்தம்) சட்டமூலம்:**
இரண்டாம், மூன்றாம் முறைகள் மதிப்பிடப்பட்டு, திருத்தப்பட்டவாறு நிறைவேற்றப்பட்டது

**பொதுசனப் பாதுகாப்புப் பிரகடனம்**

**ஒத்திவைப்புப் பிரேரணை:**
அரங்கியற் கலைகளுக்கெனத் தேசிய அரங்கம் ஒன்றினைத் தாபித்தல்

---

# PRINCIPAL CONTENTS

MESSAGE FROM THE PRESIDENT:
Public Security Proclamation

ORAL ANSWERS TO QUESTIONS

QUESTION BY PRIVATE NOTICE:
Difficulties Faced by People due to Natural Disasters

LEAVE OF ABSENCE:
Hon. Rajavarothiam Sampanthan

PROTECTION OF THE RIGHTS OF ELDERS (AMENDMENT) BILL:
Read a Second and the Third time, and passed as amended

MEDIATION BOARDS (AMENDMENT) BILL:
Read a Second and the Third time, and passed as amended

PUBLIC SECURITY PROCLAMATION

ADJOURNMENT MOTION:
Establishment of a National Theatre for Performing Arts

# පාර්ලිමේන්තුව
# பாராளுமன்றம்
# PARLIAMENT

***2011 ජනවාරි 21 වන සිකුරාදා***
*2011 சனவரி 21, வெள்ளிக்கிழமை*
*Friday, 21st January, 2011*

***අ. භා. 1.00ට පාර්ලිමේන්තුව රැස් විය. නියෝජ්‍ය කථානායකතුමා [ගරු චන්දිම වීරක්කොඩි මහතා] මූලාසනාරූඪ විය.***
*பாராளுமன்றம் பி.ப. 1.00 மணிக்குக் கூடியது. பிரதிச் சபாநாயகர் அவர்கள் [மாண்புமிகு சந்திம வீரக்கொடி] தலைமை வகித்தார்கள்.*
*The Parliament met at 1.00 p.m., MR. DEPUTY SPEAKER* [THE HON. CHANDIMA WEERAKKODY*] in the Chair.*

## ජනාධිපතිතුමාගෙන් ලත් සන්දේශය
## சனாதிபதியிடமிருந்து வந்த செய்தி
## MESSAGE FROM THE PRESIDENT

### මහජන ආරක්ෂක ප්‍රකාශනය
### பொதுசனப் பாதுகாப்புப் பிரகடனம்
### PUBLIC SECURITY PROCLAMATION

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

පහත සඳහන් සන්දේශය අතිගරු ජනාධිපතිතුමාගෙන් ගරු කථානායකතුමා වෙත ලැබී ඇති බව දන්වනු කැමැත්තෙමි.

**"ශ්‍රී ලංකා ජනාධිපති**
இலங்கை சனாதிபதி
President of Sri Lanka

ජීජේඑල්/ඊආර්/146-7
2011 ජනවාරි මස 18 වන දින.
කොළඹ දී ය.

ගරු කථානායකතුමනි,

(40 වන අධිකාරය වූ) මහජන ආරක්ෂක ආඥාපනතේ 2 වන වගන්තිය යටතේ 2011 ජනවාරි මස 18 දාතමින් කරනු ලබන ප්‍රකාශනය මගින් ඉහත කී ආඥාපනතේ II වන කොටසේ විධිවිධාන, ශ්‍රී ලංකාව මුළුල්ලේ ම වර්ෂ 2011 ජනවාරි මස 18 වන දින සිට ක්‍රියාත්මක විය යුතු බව මවිසින් ප්‍රකාශ කරන ලදී.

ඉහත කී ප්‍රකාශනය කිරීමට හේතුව මහජන සාමය ආරක්ෂා කිරීම හා මහජනතාවගේ ජීවිතයට අත්‍යවශ්‍ය සැපයීම් හා සේවා පවත්වා ගෙන යාම සඳහා බව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 155 වන ව්‍යවස්ථාවේ (4) වන අනු ව්‍යවස්ථාව අනුව ක්‍රියා කරමින් පාර්ලිමේන්තුව වෙත දැනුම් දෙනු ලැබේ.

මහින්ද රාජපක්ෂ

පාර්ලිමේන්තුවේ ගරු කථානායකතුමා."

## පිළිගන්වන ලද වාර්තා
## சமர்ப்பிக்கப்பட்ட அறிக்கைகள்
## REPORTS PRESENTED

### I

### බස්නාහිර පළාත් කෘෂි සේවා අධිකාරිය කෙටුම්පත් ප්‍රඥප්තිය
### மேல்மாகாண கமநல சேவைகள் அதிகாரசபை வரைபு நியதிச் சட்டம்
### WESTERN PROVINCE AGRARIAN SERVICES AUTHORITY DRAFT STATUTE

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)

Hon. Deputy Speaker, on behalf of the Chairman of Standing Committee "B", I present the Report of Standing Committee "B" on the Western Province Agrarian Services Authority Draft Statute.

"REPORT

Your Committee having considered the 'Western Province Agrarian Services Authority draft Statute' of the Western Province Provincial Council referred to the Committee under Standing Order 46 A (3) (a) and the observations submitted by the Attorney-General's Department, the Legal Draftsman's Department, and the relevant Ministries thereon wishes to report that your Committee resolved to inform the Western Province Provincial Council to re-draft the Statute in consultation with the Attorney-General's Department, the Legal Draftsman's Department and the relevant line Ministries and re-submit to the Parliament incorporating the suggestions made by the relevant line Ministries."

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා (වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යතුමා සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா - நீர்ப்பாசன, நீர்வள முகாமைத்துவ அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Nimal Siripala de Silva - Minister of Irrigation and Water Resources Management and Leader of the House of Parliament)

I move,

"That the report of the Standing Committee "B" on the Western Province Agraraian Services Authority Draft Statute be accepted."

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

I shall direct the Secretary-General of Parliament to forward the views of Parliament on the Draft Statute to the Western Province Provincial Council under Standing Order No. 46(3)(b).

## II

## නැගෙනහිර සංචාරක කාර්යාංශය කෙටුම්පත් ප්‍රඥප්තිය

கிழக்கின் சுற்றுலாத்துறைப் பணியக வரைவு நியதிச் சட்டம்

EASTERN TOURISM BUREAU DRAFT STATUTE

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)

Mr. Deputy Speaker, on behalf of the Chairman of Standing Committee "B", I present the Report of Standing Committee "B" on the Eastern Tourism Bureau Draft Statute.

"REPORT

Your Committee having considered the "Eastern Tourism Bureau" draft Statute of the Eastern Provincial Council, referred to the Standing Committee "B" by the Parliament under Standing Order 46A (3) (a) and the proposals submitted by the relevant officials of the Attorney General's Department, Legal Draftsman's Department and the Sri Lanka Tourism Development Authority thereon wishes to report to Parliament that your Committee resolved to inform the Eastern Provincial Council to redraft the Statute with the consultation of the Department of Legal Draftsman, as the draft Statute has not been prepared as per the required procedure."

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)

I move,

"That the report of the Standing Committee "B" on the Eastern Tourism Bureau Draft Statute be accepted".

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

I shall direct the Secretary-General of Parliament to forward the views of Parliament on the Draft Statute to the Eastern Province Provincial Council under Standing Order No. 46(3)(b).

## පෙත්සම්

## மனுக்கள்

## PETITIONS

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

| | |
|---|---|
| ගරු ඒ.එච්.එම් ෆවුසි මහතා | - පැමිණ නැත |
| ගරු රෙජිනෝල්ඩ් කුරේ මහතා | - පැමිණ නැත |
| ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා | - පැමිණ නැත |
| ගරු දුමින්ද දිසානායක මහතා | - පැමිණ නැත |
| ගරු ලසන්ත අලගියවන්න මහතා | - පැමිණ නැත |
| ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා | - පැමිණ නැත |
| ගරු (වෛද්‍ය) ජයලත් ජයවර්ධන මහතා | - පැමිණ නැත |
| ගරු හරින් ප්‍රනාන්දු මහතා | - පැමිණ නැත |

## ප්‍රශ්නවලට වාචික පිළිතුරු

## வினாக்களுக்கு வாய்மூல விடைகள்

## ORAL ANSWERS TO QUESTIONS

### නැගෙනහිර පළාතේ බිත්තර සහ කුකුළු මස් නිෂ්පාදනය: විස්තර

கிழக்கு மாகாணத்தில் முட்டை மற்றும் கோழி இறைச்சி உற்பத்தி : விபரம்

CHICKEN AND EGG PRODUCTION IN EASTERN PROVINCE: DETAILS

0785/'10

**5. ගරු අනෝමා ගමගේ මහත්මිය**
(மாண்புமிகு (திருமதி) அனோமா கமகே)
(The Hon. (Mrs.) Anoma Gamage)

පශු සම්පත් හා ග්‍රාමීය ප්‍රජා සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) නැගෙනහිර පළාතේ, එක් එක් දිස්ත්‍රික්කයේ,

(i) මස් නිෂ්පාදනය සහ බිත්තර නිෂ්පාදනය සඳහා කුකුළු පාලනයේ යෙදෙන ගොවීන් සංඛ්‍යාව;

(ii) මාසිකව නිෂ්පාදනය කරනු ලබන බිත්තර සහ කුකුළු මස් ප්‍රමාණය;

(iii) කුකුළු පාලනය සඳහා රජය මඟින් ලබා දෙන සහනාධාර සහ ඒ සඳහා වාර්ෂිකව වැය කරනු ලබන මුදල;

කොපමණද යන්න වෙන් වෙන් වශයෙන් එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) නැගෙනහිර පළාතේ, එක් එක් දිස්ත්‍රික්කයේ බිත්තර නිෂ්පාදනය හා කුකුළු මස් නිෂ්පාදනය නංවාලීම සඳහා ඉදිරියේදී රජය මඟින් ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත වැඩසටහන් කවරේද;

(ii) ඒ සඳහා එක් එක් දිස්ත්‍රික්කය වෙනුවෙන් රජය වැය කිරීමට බලාපොරොත්තු වන මුදල් ප්‍රමාණ කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නො එසේ නම්, ඒ මන්ද?

கால்நடை வளர்ப்பு, கிராமிய சனசமூக அபிவிருத்தி அமைச்சரைக் கேட்ட வினா:

(அ) கிழக்கு மாகாணத்தின் ஒவ்வொரு மாவட்டத்திலும் ,

(i) இறைச்சி உற்பத்தி மற்றும் முட்டை உற்பத்தியின் பொருட்டு கோழி வளர்ப்பில் ஈடுபடுகின்ற விவசாயிகளின் எண்ணிக்கை,

(ii) மாதாந்தம் உற்பத்தி செய்யப்படுகின்ற முட்டைகள் மற்றும் கோழி இறைச்சியின் அளவு,

(iii) கோழி வளர்ப்புக்காக அரசாங்கத்தினால் வழங்கப் படுகின்ற மானியங்களும் அதற்காக வருடாந்தம் செலவிடப்படுகின்ற தொகையும்

வெவ்வேறாக எவ்வளவென்பதை அவர் குறிப்பிடுவாரா?

(ஆ) (i) கிழக்கு மாகாணத்தின் ஒவ்வொரு மாவட்டத்திலும் முட்டை உற்பத்தி மற்றும் கோழி இறைச்சி உற்பத்தியை அதிகரிப்பதற்காக எதிர்காலத்தில் அரசாங்கத்தினால் நடைமுறைப்படுத்த எதிர்பார்க் கப்பட்டுள்ள நிகழ்ச்சித் திட்டங்கள் யாவையென் பதையும்,

(ii) இதற்காக ஒவ்வொரு மாவட்டத்தின் பொருட்டும் அரசாங்கம் செலவிடுவதற்கு எதிர்பார்க்கின்ற தொகை எவ்வளவென்பதையும்

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Livestock and Rural Community Development:

(a) Will he state separately-

(i) the number of farmers engaged in poultry farming for the production of chicken and the production of eggs ;

(ii) the amount of chicken and eggs produced monthly ; and

(iii) the subsidies granted by the government for poultry farming and the amount of money spent for it annually ;

(iv) with respect to each district in the Eastern Province?

(b) Will he inform this House -

(i) the programmes that are expected to be implemented by the Government in time to come in order to enhance the production of eggs and the production of chicken in each district of the Eastern Province ; and

(ii) the amounts of money that are expected to be spent by the Government for each district in order to implement the aforesaid programmes?

(c) If not, why?

**ගරු ආරුමුගන් තොණ්ඩමන් මහතා (පශු සම්පත් හා ග්‍රාමීය ප්‍රජා සංවර්ධන අමාත්‍යතුමා)**
(மாண்புமிகு ஆறுமுகன் தொண்டமான் - கால்நடை வளர்ப்பு, கிராமிய சனசமூக அபிவிருத்தி அமைச்சர்)
(The Hon. Arumugan Thondaman - Minister of Livestock and Rural Community Development)

(a) (i) 1. Trincomalee District - 7416

2. Batticaloa District - 12867

3. Ampara District - 15213

(ii)

| District | No. of poultry farm families | Monthly production of chicken | Monthly production of eggs |
|---|---|---|---|
| Trincomalee | 7,416 | 167,100 | 2,449,020 |
| Batticaloa | 12,867 | 338,760 | 1,327,740 |
| Ampara | 15,213 | 1,336,950 | 2,882,010 |
| Total | 35,496 | 1,842,810 | 6,658,770 |

(iii) In the year 2010, Rs. 1 million has been allocated for operating 777 domestic poultry units and 410 units have been already established.

(b) (i) For the year 2011, it is proposed to establish 444 new small-scale commercial poultry farms in 3 districts and Rs. 1 million has been allocated.

For the year 2011, it is proposed to establish 1777 new domestic poultry units in 3 districts and Rs. 2 million has been allocated.

Rs. 2 million has been allocated to improve the Trincomalee poultry breeder farm to increase the day-old chick production.

(b) (ii) Government expenditure on increasing Production of eggs and chicken - 2011

| Programme | Trincomalee District amount allocated (million Rs.) | Batticaloa District Amount allocated (million Rs.) | Ampara District Amount allocated (million Rs.) |
|---|---|---|---|
| Establishment of new poultry farms | 0.2475 | 0.315 | 0.4375 |
| Establishment of commercial poultry units | 0.495 | 0.63 | 0.875 |
| Establishment of domestic puoltry management units | 2 | | |
| Establishment of domestic poultry breeder units | 0.1 | | |

(c) Not relevant.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
අතුරු ප්‍රශ්න තිබෙනවා ද?

**ගරු අනෝමා ගමගේ මහත්මිය**
(மாண்புமிகு (திருமதி) அனோமா கமகே)
(The Hon. (Mrs.) Anoma Gamage)
තිබෙනවා.

Hon. Minister, my first Supplementary Question is - the Hon. Minister of Finance stated that he will be implementing a loan scheme with an 8 per cent interest for the livestock sector - whether it is applicable to the poultry sector also because it was stated that it is applicable only for the livestock sector, mainly for the dairy farmers?

**ගරු ආරුමුගන් තොණ්ඩමන් මහතා**
(மாண்புமிகு ஆறுமுகன் தொண்டமான்)
(The Hon. Arumugan Thondaman)
Yes, it is applicable.

**ගරු අනෝමා ගමගේ මහත්මිය**
(மாண்புமிகு (திருமதி) அனோமா கமகே)
(The Hon. (Mrs.) Anoma Gamage)
Then, I want to know whether the Government is planning to import eggs and chicken continuously.

**ගරු ආරුමුගන් තොණ්ඩමන් මහතා**
(மாண்புமிகு ஆறுமுகன் தொண்டமான்)
(The Hon. Arumugan Thondaman)
Import of eggs and chicken does not come under me. You will have to ask that from the Minister of Co-operatives and Internal Trade.

**ගරු අනෝමා ගමගේ මහත්මිය**
(மாண்புமிகு (திருமதி) அனோமா கமகே)
(The Hon. (Mrs.) Anoma Gamage)
But, you have to see that it is not done.

**ගරු ආරුමුගන් තොණ්ඩමන් මහතා**
(மாண்புமிகு ஆறுமுகன் தொண்டமான்)
(The Hon. Arumugan Thondaman)

If there is a shortage, we have to accommodate people's needs.

**ගරු අනෝමා ගමගේ මහත්මිය**
(மாண்புமிகு (திருமதி) அனோமா கமகே)
(The Hon. (Mrs.) Anoma Gamage)

But, you have to -

**ගරු ආරුමුගන් තොණ්ඩමන් මහතා**
(மாண்புமிகு ஆறுமுகன் தொண்டமான்)
(The Hon. Arumugan Thondaman)

On my part, I have to see that the chicken production is increased locally.

**ගරු අනෝමා ගමගේ මහත්මිය**
(மாண்புமிகு (திருமதி) அனோமா கமகே)
(The Hon. (Mrs.) Anoma Gamage)

The poultry farmers are utterly depressed over the importation of chicks and eggs.

**ගරු ආරුමුගන් තොණ්ඩමන් මහතා**
(மாண்புமிகு ஆறுமுகன் தொண்டமான்)
(The Hon. Arumugan Thondaman)

No, no. There is a group of -

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

Hon. Member, the Hon. Minister has given the answer.

**ගරු ආරුමුගන් තොණ්ඩමන් මහතා**
(மாண்புமிகு ஆறுமுகன் தொண்டமான்)
(The Hon. Arumugan Thondaman)

There is a group trying to carry out a mafia with the poultry industry. But, as of now -we had a shortage - it is coming under control.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, තුන්වන අතුරු ප්‍රශ්නය.

දැන් ආනයනය කර තිබෙන කුකුළු මස් ඇත්ත වශයෙන්ම මාස හයක් ශීතකරණවල තියා ගන්න හදනවා. ලංකාවේ කුකුළා ජීවත් වන්නෙත් දින 45යි. හැබැයි මාස හයක් freezer එකේ තියන්න හදනවා. ඒ වාගේමයි බිත්තරත්. ඔබතුමා දන්නවා, මේ ආනයනය කරන බිත්තරවල රසායනික ද්‍රව්‍යයක් තවරනවායි කියලා. පශු සම්පත් හා ග්‍රාමීය ප්‍රජා සංවර්ධන ඇමතිතුමා විධියට ඔබතුමාට ලැබිලා තිබෙන තොරතුරු අනුව ඔබතුමා කියන්නේ මාෆියාවක් තිබෙනවා කියලා. මාෆියාව නැති කරන්න තමයි ආණ්ඩුවක් හදලා තිබෙන්නේ. ඒ නිසා මම ඔබතුමාගෙන් ගෞරවයෙන් අහන්න කැමැතියි, කුකුළු මස් මේ විධියට ආනයනය කරලා මේ රටේ පාරිභෝගිකයන්ට කන්න දෙන කොට මේ කුකුළු මස් හොඳ තත්ත්වයෙන් තිබෙනවාද, නැද්ද කියන කාරණය සම්බන්ධව පශු සම්පත් අමාත්‍යාංශය විධියට අනුගමනය කරන්න හදන වැඩ පිළිවෙළ මොකක්ද කියලා.

**ගරු ආරුමුගන් තොණ්ඩමන් මහතා**
(மாண்புமிகு ஆறுமுகன் தொண்டமான்)
(The Hon. Arumugan Thondaman)

My part is only to see how we can increase the production locally. We are taking action on that. With regard to the importing of chicken, eggs and all that, you ask from the Minister of Co-operatives and Internal Trade. On our part, we import day-old chicks and we are trying to increase the number of day-old chicks produced in this country, by which we will get over the present problem.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

එතුමාට අදාළව කුකුළන් ගැන උත්තර දුන්නා.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

ප්‍රශ්නය තිබෙන්නේ ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ කුකුළන් -

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

ගරු මන්ත්‍රීතුමා දැන් ප්‍රශ්නයක් ඇහුවා. ගරු ඇමතිතුමා එයට අදාළව කුකුළන් සම්බන්ධයෙන් උත්තරයක් දුන්නා.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

තව එක විනාඩියක් දෙන්න ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ඇමතිතුමා, මේ ප්‍රශ්නය ඇති වුණේ ඔබතුමන්ලා ලංකාවේ hatcheries හැදුවේ නැති නිසායි. රුපියල් හතළිහට කුකුළු පැටවෙක් ගන්න තිබුණා. දැන් කුකුළු මස් කිලෝව රුපියල් දෙසිය හතළිස්පහයි.

**ගරු ආරුමුගන් තොණ්ඩමන් මහතා**
(மாண்புமிகு ஆறுமுகன் தொண்டமான்)
(The Hon. Arumugan Thondaman)

This is not an issue which has cropped up yesterday or the day before yesterday. It has been coming down for some time. So, what we are trying to do is to rectify it. Now, we are getting back the hatcheries into operation. We are going to open up a new hatchery in Batticaloa also.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

The problem is, now a kilo of chicken is Rs. 295 and a small chick should be sold at Rs. 40.

**ගරු ආරුමුගන් තොණ්ඩමන් මහතා**
(மாண்புமிகு ஆறுமுகன் தொண்டமான்)
(The Hon. Arumugan Thondaman)

You can get a day-old chick at Rs. 60.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

ගරු මන්ත්‍රීතුමනි, දැන් අතුරු ප්‍රශ්න තුනම අහලා ඉවරයි. We are now moving on to the next Question - ප්‍රශ්න අංක 6, ගරු බුද්ධික පතිරණ මන්ත්‍රීතුමා.

## අකුරැස්ස නගරය හා ඒ අවට ගම්මාන: පානීය ජල සම්පාදන ව්‍යාපෘතිය

අக்குரஸ்ஸ நகரம் மற்றும் சுற்றயல் கிராமங்கள்: குடிநீர் வழங்கல் கருத்திட்டம்

AKURESSA TOWN AND NEIGHBOURING VILLAGES: DRINKING WATER PROJECT

0798/'10

**6. ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)

ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය- (1) :

(අ) මාතර දිස්ත්‍රික්කයේ, අකුරැස්ස ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ අකුරැස්ස නගරය හා ඒ අවට ගම්මාන කිහිපයකට ජල අවශ්‍යතා ඉටු කිරීම සඳහා මීට වර්ෂ පහකට පමණ පෙර විදේශ ආධාර යටතේ පානීය ජල සම්පාදන ව්‍යාපෘතියක් ආරම්භ කළ බව එතුමා දන්නෙහිද?

(ආ) (i) එම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා ආධාර මුදල් ලබා දුන් රට හා මූල්‍ය ආයතනය කවරේද;

(ii) ඒ සඳහා ලැබුණු ආධාර මුදල කොපමණද;

(iii) එම ජල යෝජනා ක්‍රමය අවසන් කළ යුතු දිනය කවදාද;

(iv) එහි වර්තමාන තත්ත්වය කුමක්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) ඉහත ජල යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීම මඟින් ප්‍රතිලාභ සැලසීමට අරමුණු කර ගත් පවුල් සංඛ්‍යාව කොපමණද;

(ii) එමඟින් ජනතාවට පානීය ජලය සැපයීමට බලාපොරොත්තු වන කාල වකවානුව කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නො එසේ නම්, ඒ මන්ද?

நீர் வழங்கல், வடிகாலமைப்பு அமைச்சரைக் கேட்ட வினா:

(அ) மாத்தறை மாவட்டத்தின் அக்குரஸ்ஸ பிரதேச சபை அதிகாரப் பிரதேசத்தில் அக்குரஸ்ஸ நகரத்தினதும் அதை அண்மித்துள்ள சில கிராமங்களினதும் நீர்த் தேவைகளைப் பூர்த்தி செய்வதற்காக இற்றைக்கு சுமார் 5 ஆண்டுகளுக்கு முன்னர் வெளிநாட்டு உதவிகளின் கீழ் குடிநீர் வழங்கல் கருத்திட்டமொன்று ஆரம்பிக்கப்பட்டதென்பதை அவர் அறிவாரா?,

(ஆ) (i) மேற்படி கருத்திட்டத்தை செயற்படுத்துவதற்காக நிதி உதவிகள் வழங்கிய நாடு மற்றும் நிதி நிறுவனங்கள் யாவையென்பதையும்,

(ii) இதற்குக் கிடைக்கப்பெற்ற உதவித் தொகை எவ்வளவென்பதையும்,

(iii) மேற்படி நீர் வழங்கல் திட்டத்தை நிறைவு செய்ய வேண்டிய திகதி யாதென்பதையும்,

(iv) அதன் தற்போதைய நிலைமை யாதென்பதையும்

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) (i) மேற்படி நீர்வழங்கல் திட்டத்தை செயற்படுத்துவதன் மூலமாக பயன்பெறும் நோக்கத்தைக் கொண்டுள்ள குடும்பங்களின் எண்ணிக்கை எத்தனை என்பதையும்;

(ii) இதன் மூலம் மக்களுக்கு குடிநீர் வழங்குவதற்கு எதிர்பார்க்கப்படுகின்ற காலவரையறை யாதென்பதையும்

அவர் குறிப்பிடுவாரா?

(ஈ) இன்றேல், ஏன்?

asked the Minister of Water Supply and Drainage :

(a) Is he aware that a project for providing drinking water was started with foreign aid nearly five years ago to meet the water requirements of the Akuressa Town and a few villages in its neighbourhood within the Akuressa Divisional Secretariat Division in Matara District?

(b) Will he inform this House -

(i) the country and the financial institution which provided aid for the implementation of that project;

(ii) the amount of aid received in that respect;

(iii) the date by which that water project has to be completed;

(iv) the current condition of that project?

(c) Will he state -

(i) the number of families targeted to benefit from the implementation of that water project;

(ii) the timeframe within which the said people are expected to be provided with drinking water?

(d) If not, why?

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා (ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍යතුමා සහ ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා)**
(மாண்புமிகு தினேஷ் குணவர்தன - நீர்வழங்கல், வடிகாலமைப்பு அமைச்சரும் அரசாங்கத் தரப்பின் முதற்கோலாசானும்)
(The Hon. Dinesh Gunawardena - Minister of Water Supply and Drainage and Chief Government Whip)

(අ) ඔව්.

(ආ) (i)

| ආධාර ලබා දුන් රට | මූල්‍ය ආයතනය |
|---|---|
| ජපන් රජය (රුපියල් මිලියන 40) | කුඩා පරිමාණ යටිතල පහසුකම් පුනරුත්ථාපනය කිරීමේ සහ වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය |
| ශ්‍රී ලංකා රජය (රුපියල් මිලියන 298) | රජයේ ප්‍රාග්ධන අරමුදල |

(ii) රුපියල් මිලියන 338යි.

(iii) මේ වන විට අවසන් කර ඇත. ගරු මන්ත්‍රීතුමනි, දැනට මාස එකහමාරකට ඉස්සෙල්ලා ජනතා අයිතියට පවරා තිබෙනවා.

(iv) ඉදි කිරීම් කටයුතු අවසන් කර ඇත.

(ඇ) (i) පවුල් 3000ක් පමණ.

(ii) නව ජල සම්පාදන ක්‍රමයෙන් ජලය ලබා දීම සඳහා දැනට පවත්වාගෙන යන ප්‍රාදේශීය සභා ජල සම්පාදන ක්‍රමය ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයට පැවරිය යුතුය. මෙම පවරා ගැනීම 2011.01.31 වන දිනට -මේ මාසයේ 31 වන දිනට- ප්‍රථම සිදු කිරීමට අපේක්ෂිත අතර, පවරා ගැනීමෙන් අනතුරුව සෑම දෙනාටම ජලය සැපයීමේ මාර්ග සම්බන්ධ කරනු ඇත.

(ඈ) අදාළ නොවේ.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ පළමුවන අතුරු ප්‍රශ්නය මෙයයි. දැනට ක්‍රියාත්මක වන පැරණි ජල සම්පාදන යෝජනා ක්‍රමයක් පවරා ගැනීම පිළිබඳව ඔබතුමා සඳහන් කළා. දැන් ප්‍රශ්නය තියෙන්නේ මේකයි. අකුරැස්ස මැතිවරණ කොට්ඨාසයේ ජනතාවට ලැබෙන පානීය ජලයේ පවිත්‍රතාව පිළිබඳව නැත්නම් ගුණාත්මකභාවය පිළිබඳව බරපතළ ප්‍රශ්න තිබෙනවා. මොකද, වරක් මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයාත් සඳහන් කළා, මේ ජලයට අසූචි මිශ්‍ර වෙලා තිබෙනවාය කියලා. ඒ නිසා දැන් මේ පවරා ගත්තාය කියලා මේ පානීය ජලයේ පවිත්‍රතාව නැත්නම් ගුණාත්මකභාවය වෙනුවෙන් ඔබතුමාගේ ආයතනයේ මැදිහත් වීමක් කෙරෙනවාද?

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ඔව්. අපි පවරා ගැනීමෙන් අදහස් කරන්නේ ඒ පැරණි ප්‍රාදේශීය සභා ජල යෝජනා ක්‍රමයට ආවරණය වන කොටසටත්, ඊට අතිරේකව තව ගම්මාන කිහිපයකට ලබා දෙන කොටසටත් ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ පවිත්‍ර කරන ලද පානීය ජලය සැපයීම සඳහා කටයුතු කිරීමයි. ඒ නිසා ඔබතුමා අහන ප්‍රශ්නය ඇත්තයි. ප්‍රාදේශීය සභාවෙන් සපයන ජලය ගැන පරණ ප්‍රවෘත්තියක් ඔබතුමා අහන්නේ. දැන් ඒ කටයුත්ත නිමා කරන්න හා පිරිසිදු පානීය ජලය ලබා දෙන්න අපට පුළුවන්කම ලැබෙනවා.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ දෙවන අතුරු ප්‍රශ්නය මෙයයි. දැන් ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයෙන් ලබා දෙන ජලයේ මිල ගණන් සහ සමහර වෙලාවට පළාත් පාලන ආයතනවලින් ලබා දෙන ජලයේ මිල ගණන් අතර බරපතළ පරස්පරයන් තිබෙනවා. සමහර අවස්ථාවලදී පළාත් පාලන ආයතනයේ මිල ගණන් ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ මිල ගණන්වලට වඩා බොහෝ සෙයින් ඉහළ ගිහිල්ලා තිබෙනවා. සමස්ත රට පිළිබඳව කල්පනා කර පළාත් පාලන ආයතනත් එක්ක සාකච්ඡා කරලා මේ මිල ගණන් ඒකමතිකත්වයකට ගෙන එන්න ඔබතුමන්ලාගේ බලාපොරොත්තුවක් තිබෙනවාද?

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

පළාත් සභාවලින් කරන ව්‍යාපෘති තිබෙනවා; සමහර විට ඒවාට අය කිරීම් වැඩියි, සමහර ඒවා අඩුයි. ප්‍රාදේශීය සභා මඟින් සපයන ඒවා තිබෙනවා; සමහර විට සමහර මිල ගණන් වැඩියි, සමහර ඒවා අඩුයි. නමුත් ඔබතුමා පිළිගන්නවා පානීය ජලය, පවිත්‍ර පානීය ජලය පිළිගන්නා තත්ත්වයට යටත්ව සැපයීමට යම් කිසි වියදමක් ආයෝජනය කරන්නට ඕනෑය කියලා. ඒ වියදම අපි පියවා ගන්නටත් ඕනෑ. අපි සම්පූර්ණයෙන් ඒක පියවා ගන්නේ නැහැ. ජලය ලබා දීම පිළිබඳව රජය සහනාධාරයක් දෙනවා. නමුත් අපි යම් කිසි ප්‍රමාණයක් පියවා ගන්න ඕනෑ. ඒ නිසායි මේ සුළු ප්‍රභේදය පවතින්නේ.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මාගේ තුන්වන අතුරු ප්‍රශ්නය, ඔබතුමා සඳහන් කළා මේ ජල යෝජනා ක්‍රමය මාසයකට කලින් තමයි විවෘත කරන්න යෙදුණේ කියලා. නමුත් මෙහි වැඩ අවසන් කළ යුතු දිනය ලෙස තිබුණේ 2007 අවුරුද්දේ 06 වෙනි මාසයේ 30. වැඩ අවසන් කිරීම සහ ජනතා අයිතියට පැවරීම අතර බරපතළ කාල වකවානු වෙනස් වෙනවා. මේකට අදාළව පමණක් නොවෙයි, බොහෝ තැන්වල එහෙමයි. ඒ අනුව ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයට මේ යෝජනා අනුමත කරද්දී වැඩ අවසන් කළ යුතු දිනය, විවෘත කිරීම් ඇතුළු මේ සියල්ල බොහොම කෙටි කාලීනව සිදු කරලා ජනතාවට අවශ්‍ය ප්‍රතිලාභය ලබා දෙන්න කටයුතු කරන්න බැරි ඇයි?

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ජාතික ජල සම්පාදන සහ ජලාපවහන මණ්ඩලය චේතනාවකින් යුතුව ප්‍රමාද කිරීමක් කරලා නැහැ. අනුගමනය කරන්න තිබෙන රජයේ නීතිරීති මාලාවන් අනුවයි මේවා ඉදි කරන සමාගම්වලට ටෙන්ඩර් කැඳවීමක් දෙන්නේ. ඔය මතු වුණු ප්‍රශ්නයත්, අතර මඟදී එක ටෙන්ඩර්කරුවෙක් තම කටයුතු හරියාකාරව ඉෂ්ට නොකිරීම නිසා අපට ටෙන්ඩරය අවලංගු කිරීමට සිදු වූ බවත් ඔබතුමා දන්නවා ඇති. එමෙන්ම ඒ ප්‍රදේශය නිතර ජල ගැලීම්වලට යට වෙනවා. අපි ජනතා අයිතියට පවරන්නට යන කොටත් පාර ජල ගැල්මකට යට වෙලා තිබුණා. ඉතින් ප්‍රමාදයන් සිදු වනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමාත් දන්නවා ඇති, එතුමාගේ හබරාදුව ප්‍රදේශයේත් මෙවැනි ප්‍රමාදයක් සිදු වෙලා, අපි ඒවා විසඳලා දීලා තිබෙනවා. [බාධා කිරීමක්] කොම්පියුටරයක් නොවෙයි, ජලය සැපයීම.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)

බොහොම ස්තුතියි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

## වයඹ පළාත තුළ ක්‍රියාත්මක කිරීමට යෝජිත විදුලි ව්‍යාපෘති: මූල්‍ය ප්‍රභවයන්

வடமேல் மாகாண உத்தேச மின்சாரக் கருத்திட்டங்கள்: நிதி மூலங்கள்

PROPOSED ELECTRIFICATION PROJECTS IN NORTH-WESTERN PROVINCE: FINANCIAL SOURCES

0855/'10

**8. ගරු අජිත් කුමාර මහතා**
(மாண்புமிகு அஜித் குமார)
(The Hon. Ajith Kumara)

විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1) :

(අ) (i) වයඹ පළාත තුළ ක්‍රියාත්මක කිරීමට යෝජිත විදුලි ව්‍යාපෘති කවරේද;

(ii) එම එක් එක් ව්‍යාපෘතිය සඳහා වෙන් කර ඇති ප්‍රතිපාදන වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) ඉහත සඳහන් ප්‍රතිපාදන වෙන් කරන ලද මූල්‍ය ප්‍රභවයන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නො එසේ නම්, ඒ මන්ද?

மின்வலு, எரிசக்தி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) வடமேல் மாகாணத்தில் நடைமுறைப்படுத்தப் படுத்துவதற்கு உத்தேசிக்கப் பட்டுள்ள மின்சாரக் கருத்திட்டங்கள் யாவையென்பதையும்,

(ii) மேற்படி ஒவ்வொரு கருத்திட்டத்துக்கும் ஒதுக்கப் பட்டுள்ள நிதித்தொகை வெவ்வேறாக யாதென்ப தையும்,

(iii) மேற்குறிப்பிட்ட நிதி ஒதுக்கப்பட்ட நிதி மூலங்கள் யாவையென்பதையும்

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Power and Energy:

(a) Will he inform this House-

(i) the electrification projects which have been proposed to be implemented in the North-Western Province;

(ii) separately, of the financial provisions allocated for each of the aforesaid projects ; and

(iii) the financial sources from which the aforesaid provisions have been allocated?

(b) If not, why?

**ගරු ප්‍රේමලාල් ජයසේකර මහතා (විදුලිබල හා බලශක්ති නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு பிரேமலால் ஜயசேகர - மின்வலு, எரிசக்தி பிரதி அமைச்சர்)
(The Hon. Premalal Jayasekara - Deputy Minister of Power and Energy)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමා වෙනුවෙන් මා මෙම ප්‍රශ්නයට පිළිතුර දෙනවා.

(අ) (i) කඩිනම් ග්‍රාමීය විදුලි ව්‍යාපෘතිය (2010 - 2011)

ඉරාන ආධාර ව්‍යාපෘතිය (2011 - 2015)

සීඩා ව්‍යාපෘතිය (2009 - 2010)

විදලමු ශ්‍රී ලංකා වයඹ පළාත් ව්‍යාපෘතිය (2011)

(ii) සමස්ත ව්‍යාපෘතිය සඳහා වෙන් කර ඇති මුදලින් වයඹ පළාතට වෙන් කර ඇති ව්‍යාපෘති සංඛ්‍යාව මෙසේය:

| විදුලි ව්‍යාපෘතියේ නම | මුදල (රු.මිලියන) |
|---|---|
| කඩිනම් ග්‍රාමීය විදුලි ව්‍යාපෘතිය (2010 - 2011) | 1,300.00 |
| ඉරාන ආධාර ව්‍යාපෘතිය (2011- 2015) | 4,100.00 |
| සීඩා ආධාර විදුලි ව්‍යාපෘතිය (2009 - 2010) | 540.00 |
| විදලමු ශ්‍රී ලංකා වයඹ පළාත් ව්‍යාපෘතිය (2011 වර්ෂය සඳහා වෙන් කර ඇත.) | 200.00 |

(iii)

| විදුලි ව්‍යාපෘතියේ නම | මූල්‍ය ප්‍රභවය |
|---|---|
| කඩිනම් ග්‍රාමීය විදුලි ව්‍යාපෘතිය (2010 - 2011) | රජයේ මුදල් |
| ඉරාන ආධාර ව්‍යාපෘතිය (2011 - 2015) | රජයේ මුදල් සහ ඉරාන ආධාර |
| සීඩා ආධාර විදුලි ව්‍යාපෘතිය (2009 - 2010) | රජයේ මුදල් සහ සීඩා ආයතනයේ අරමුදල් |

(ආ) පැන නොනඟී.

## නැඟෙනහිර පළාතේ කර දිය හා මිරි දිය ධීවර කර්මාන්තය: විස්තර
## கிழக்கு மாகாணத்தில் உவர் நீர் மற்றும் நன்னீர் மீன்பிடித் தொழில்: விபரம்
## MARINE AND INLAND FISHING INDUSTRY IN EASTERN PROVINCE: DETAILS

0786/'10

**11. ගරු අනෝමා ගමගේ මහත්මිය**
(மாண்புமிகு (திருமதி) அனோமா கமகே)
(The Hon. (Mrs.) Anoma Gamage)

ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1) :

(අ) නැඟෙනහිර පළාතේ, එක් එක් දිස්ත්‍රික්කයේ,

(i) කර දිය හා මිරි දිය ධීවර කර්මාන්තයේ යෙදෙන ශ්‍රමිකයින් සංඛ්‍යාව;

(ii) මාසිකව නිෂ්පාදනය කරනු ලබන කර දිය හා මිරි දිය මත්ස්‍ය ප්‍රමාණය;

(iii) කර දිය හා මිරි දිය මත්ස්‍ය කර්මාන්තය සඳහා රජය මඟින් ලබා දෙන සහනාධාරයන් සහ ඒ සඳහා වාර්ෂිකව වැය කරනු ලබන මුදල;

වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) නැඟෙනහිර පළාතේ එක් එක් දිස්ත්‍රික්කයේ කර දිය හා මිරි දිය මත්ස්‍ය කර්මාන්තය නංවාලීම උදෙසා ඉදිරියේදී රජය මඟින් ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත වැඩසටහන් කවරේද;

(ii) ඒ සඳහා එක් එක් දිස්ත්‍රික්කය වෙනුවෙන් රජය වැය කිරීමට බලාපොරොත්තු වන මුදල් ප්‍රමාණයන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නො එසේ නම්, ඒ මන්ද?

கடற்றொழில், நீரகவளமூலங்கள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) கிழக்கு மாகாணத்தின் ஒவ்வொரு மாவட்டத்திலும்,

(i) உவர் நீர் மற்றும் நன்னீர் மீன்பிடித் தொழிலில் ஈடுபடுகின்ற விவசாயிகளின் எண்ணிக்கை யாதென்பதையும்,

(ii) மாதாந்தம் உற்பத்தி செய்யப்படுகின்ற உவர் நீர் மற்றும் நன்னீர் மீன்களின் அளவு யாதென்ப தையும்,

(iii) உவர் நீர் மற்றும் நன்னீர் மீன்பிடித் தொழிலுக்கு அரசாங்கத்தினால் வழங்கப்படுகின்ற மானியங்

களும் அதற்காக வருடாந்தம் செலவிடப்படுகின்ற தொகை யாதென்பதையும்

வெவ்வேறாக எவ்வளவென்பதை அவர் குறிப்பிடுவாரா?

(ஆ) (i) கிழக்கு மாகாணத்தின் ஒவ்வொரு மாவட்டத்திலும் உவர் நீர் மற்றும் நன்னீர் மீன்பிடித் தொழிலின் மேம்பாட்டுக்காக எதிர்காலத்தில் அரசாங்கத்தினால் நடைமுறைப்படுத்த எதிர்பார்க்கப்பட்டுள்ள நிகழ்ச் சித்திட்டங்கள் யாவையென்பதையும்,

(ii) இதற்காக ஒவ்வொரு மாவட்டத்தின் பொருட்டும் அரசாங்கம் செலவிடுவதற்கு எதிர்பார்க்கின்ற தொகை எவ்வளவென்பதையும்,

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Fisheries and Aquatic Resources Development:

(a) Will he state separately-

(i) the number of workers engaged in marine and inland fishing industry;

(ii) the marine and inland fish production per month; and

(iii) the subsidies granted by the Government for marine and inland fishing industry and the amount of money spent for it annually;

(iv) with respect to each district in the Eastern Province?

(b) Will he inform this House of-

(i) the programmes that are expected to be implemented by the Government in time to come in order to enhance marine and inland fishing industry ; and

(ii) the amounts of money that are expected to be spent by the Government for each district in order to implement the aforesaid programmes?

(c) If not, why?

**ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා (ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමා)**
(மாண்புமிகு வைத்திய கலாநிதி ராஜித சேனாரத்ன - கடற்றொழில், நீரக வளமூலங்கள் அபிவிருத்தி அமைச்சர்)
(The Hon. (Dr.) Rajitha Senaratne - Minister of Fisheries and Aquatic Resources Development)

(අ) (i)

| දිස්ත්‍රික්කය | කර දිය ශ්‍රමිකයින් | මිරි දිය ශ්‍රමිකයින් | එකතුව |
|---|---|---|---|
| මඩකලපුව | 29,670 | 2,460 | 32,130 |
| ත්‍රිකුණාමලය | 38,730 | 650 | 39,380 |
| අම්පාර | 24,440 | 2,680 | 27,120 |

(ii) එක් එක් දිස්ත්‍රික්කයේ වාර්ෂික කර දිය හා මිරි දිය ධීවර නිෂ්පාදන - 2010

| දිස්ත්‍රික්කය | කර දිය නිෂ්පාදන (මෙ.ටො) | මාසික සාමාන්‍යය (මෙ.ටො) | මිරි දිය නිෂ්පාදන (මෙ.ටො) | මාසික සාමාන්‍යය (මෙ.ටො) |
|---|---|---|---|---|
| මඩකලපුව | 39,610 | 3,300 | 1,820 | 152 |
| ත්‍රිකුණාමලය | 36,260 | 3,021 | 1,790 | 149 |
| අම්පාර | 16,380 | 1,365 | 5,730 | 477 |

(iii) ඇමුණුම් අංක - 01හි දැක්වේ.

(ආ) (i), (ii) ඇමුණුම් අංක 02 හි දැක්වේ. ඇමුණුම් **සභාගත*** කරමි.

(ඇ) අදාළ නොවේ.

***සභාමේසය මත තබන ලද ඇමුණුම්:**
*சபாபீடத்தில் வைக்கப்பட்ட இணைப்பு :*
*Annexes tabled:*

ඇමුණුම - 01

කර දිය ධීවර ක්ෂේත්‍රය - 2010

| දිස්ත්‍රික්කය | | ක්‍රියාත්මක කළ වැඩසටහන | මුදල (රු. මිලියන) | එකතුව (රු. මිලියන) |
|---|---|---|---|---|
| මඩකලපුව | I. | සහකාර අධ්‍යක්ෂ කාර්යාලය හා ධීවර පරීක්ෂක කාර්යාලය ඉදි කිරීම | 1.505 | |
| | II. | ඉදිවර බැංකු කාර්යාලය | 0.602 | |
| | III. | පානීය ජල ළිං 25 | 1.000 | |
| | IV. | විදුලිය ලබා දීම | 6.170 | |
| | V. | නිවාස | 5.000 | |
| | VI. | සනීපාරක්ෂක වැසිකිළි | 1.750 | |
| | VII. | වාලච්චේන ධීවර වරාය ඉදි කිරීම (2010 නිම විය) | 347.500 | |
| | VIII. | තොටුපළ 05ක් ඉදි කිරීම | 82.040 | |
| | IX. | නැංගුරම් පොළ 02ක් ඉදි කිරීම | 317.580 | |
| | X. | සේවා මධ්‍යස්ථානයේ අඩු පාඩු සැකසීම | 6.970 | |
| | XI. | අපද්‍රව්‍ය බැහැර කිරීමේ භාජන ලබා දීම | 4.220 | |
| | XII. | එන්ජින් කාමරයේ අඩු පාඩු සැකසීම | 3.920 | 778.257 |
| ත්‍රිකුණාමලය | I. | පෙර පාසල් 10 සඳහා උපකරණ ලබා දීම | 0.925 | |
| | II. | ආදායම් උත්පාදන වැඩසටහන් සඳහා චක්‍රීය අරමුදල් ලබා දීම | 0.300 | |

| | | | | |
|---|---|---|---|---|
| | III. | ප්‍රජාශාලාව ඉදි කිරීම | 1.380 | |
| | IV. | බෙල්ලන් වගාව | 15.000 | |
| | V. | පුහුණු වැඩසටහන් | 0.772 | |
| | VI. | පෙර පාසල් උපකරණ කට්ටල | 1.028 | |
| | VII. | පා පැදි ලබා දීම | 0.177 | |
| | VIII. | ධීවර පිවිසුම් මාර්ග අලුත්වැඩියාව | 8.400 | |
| | IX. | විදුලිය ලබා දීම | 0.603 | |
| | X. | පානීය ජල පහසුකම් ලබා දීම | 0.781 | |
| | XI. | පානීය ළිං | 1.080 | |
| | XII. | තොටු පළ 03ක් ඉදි කිරීම | 63.220 | |
| | XIII. | අයිස් ගබඩාවේ පහසුකම් වැඩි කිරීම | 1.850 | |
| | XIV. | අළෙවි මධ්‍යස්ථානය ඉදි කිරීම | 6.970 | 102.486 |
| අම්පාර | I. | එන්ජින් ලබා දීම | 4.220 | |
| | II. | යාත්‍රා සඳහා ඉන්ධන | 2.960 | |
| | III. | දිස්ත්‍රික් ධීවර සංවිධානයේ කාර්යාලය ඉදි කිරීම | 0.120 | |
| | IV. | ප්‍රජා ශාලා 02 | 1.430 | |
| | V. | සනීපාරක්ෂක පහසුකම් සැපයීම | 1.250 | |
| | VI. | ධීවර පිවිසුම් මාර්ග | 8.600 | |
| | VII. | බහුකාර්ය ගොඩනැගිලි 02 ඉදි කිරීම | 1.200 | |
| | VIII. | විදුලිය ලබා දීම | 0.850 | |
| | IX. | පිවිසුම් මාර්ග අලුත්වැඩියාව | 8.600 | |
| | X. | මසුන් ගබඩාව | 0.800 | |
| | XI. | තොටු පළ 02ක් ඉදි කිරීම (2010-2011) | 22.906 | |
| | XII. | නැංගුරම් පොළ ඉදි කිරීම (2010-2011) | 31.900 | |
| | XIII. | සේවා ගොඩනැගිල්ලේ අඩු පාඩු සැකසීම | 5.500 | |
| | XIV. | ධීවර සේවා මධ්‍යස්ථානයේ අඩු පාඩු සැකසීම | 6.260 | 96.596 |
| | | **එකතුව** | | **977.339** |

**මිරි දිය ධීවර ක්ෂේත්‍රය - 2010**

| දිස්ත්‍රික්කය | | ක්‍රියාත්මක කළ වැඩසටහන | මුදල (රු. මිලියන) | එකතුව (රු. මිලියන) |
|---|---|---|---|---|
| මඩකලපුව | I. | මත්ස්‍ය පැටවුන් හා ඉස්සන් පැටවුන් තැන්පත් කිරීම | 4.500 | |
| | II. | කිවුල්දිය ඉස්සන් අභිජනනාගාරය ඉදි කිරීම | 64.000 | |
| | III. | ආදර්ශ ඉස්සන් ගොවි පළ | 11.500 | |
| | IV. | ඉස්සන් වගාව සඳහා යටිතල පහසුකම් වැඩි කිරීම | 109.000 | 189.000 |
| ත්‍රිකුණාමලය | I. | මත්ස්‍ය පැටවුන් හා ඉස්සන් පැටවුන් තැන්පත් කිරීම | 1.600 | |
| | II. | යාත්‍රා ලබා දීම | 1.600 | 3.200 |
| අම්පාර | I. | මත්ස්‍ය පැටවුන් හා ඉස්සන් පැටවුන් තැන්පත් කිරීම | 10.000 | |
| | II. | යාත්‍රා හා දැල් ආම්පන්න ලබා දීම | 2.250 | |
| | III. | ප්‍රජාශාලා ඉදි කිරීම | 2.450 | |
| | IV. | පරිගණක ලබා දීම | 0.700 | 15.400 |
| | | **එකතුව** | | **207.600** |

**ඇමුණුම - 02**

**කර දිය ධීවර ක්ෂේත්‍රය**

| **දිස්ත්‍රික්කය** | | **ක්‍රියාත්මක කිරීමට නියමිත වැඩසටහන** | **මුදල (රු. මිලියන)** | **එකතුව (රු. මිලියන)** |
|---|---|---|---|---|
| මඩකලපුව | I. | මසුන් වෙළෙඳ සැලක් ඉදි කිරීම | 0.500 | |
| | II. | ටොන් 05 ධාරිතාවක් ඇති අක්‍රිය අයිස් යන්ත්‍රාගාරය හා ටොන් 10 ධාරිතාවෙන් යුතු බහාලුම් අයිස් යන්ත්‍රාගාරය අලුත්වැඩියා කිරීම. | | |
| | III. | ප්‍රජාව සවිබල ගැන්වීම හා යටිතල පහසුකම් සැපයීම | 2.500 | |
| | IV. | මාර්ග ඉදි කිරීම | 10.450 | |
| | V. | පානීය ජලය සැපයීම | 3.250 | |
| | VI. | සනීපාරක්ෂක පහසුකම් සැපයීම | 3.500 | 20.200 |
| ත්‍රිකුණාමලය | I. | නව මසුන් අළෙවි සැල් ආරම්භ කිරීම | | |
| | II. | බහාලුම් අයිස් යන්ත්‍රාගාරයක් ඇරඹීම | | |
| | III. | ටොන් 05 නව ශීතාගාර දෙකක් ඇරඹීම | | |
| | IV. | ටොන් 05ක අයිස් ගබඩා කරන ශීතාගාරයක් ඇති කිරීම | | |
| | V. | ප්‍රජාව සවිබල ගැන්වීම හා යටිතල පහසුකම් සැපයීම | 5.500 | |
| | VI. | මාර්ග අලුත්වැඩියාව | 5.000 | |
| | VII. | නව නිවාස ඉදි කිරීම | 6.670 | |
| | VIII. | විදුලිය සැපයීම | 1.200 | |
| | IX. | සනීපාරක්ෂක පහසුකම් | 1.880 | 20.250 |
| අම්පාර | I. | නව මිලදී ගැනීමේ මධ්‍යස්ථාන 02ක් ඇරඹීම | 2.000 | |
| | II. | නව සිල්ලර මසුන් වෙළෙඳ සැලක් ඇරඹීම | 1.000 | |
| | III. | ප්‍රජාව සවිබල ගැන්වීම හා යටිතල පහසුකම් සැපයීම | 4.000 | |
| | IV. | ධීවර තොටු පළ 02ක් සංවර්ධනය කිරීම | 10.000 | 17.000 |
| | | **එකතුව** | | **57.450** |

**මිරි දිය ධීවර ක්ෂේත්‍රය**

| **දිස්ත්‍රික්කය** | | **ක්‍රියාත්මක කිරීමට නියමිත වැඩසටහන** | **මුදල (රු. මිලියන)** |
|---|---|---|---|
| මඩකලපුව | I. | මත්ස්‍ය පැටවුන් තැන්පත් කිරීම | |
| | II. | ඉස්සන් පැටවුන් තැන්පත් කිරීම | 12.400 |

| | | | |
|---|---|---|---|
| ත්‍රිකුණාමලය | I. | මත්ස්‍ය පැටවුන් තැන්පත් කිරීම | |
| | II. | ඉස්සන් පැටවුන් තැන්පත් කිරීම | 18.000 |
| අම්පාර | I. | මත්ස්‍ය පැටවුන් තැන්පත් කිරීම | |
| | II. | ඉස්සන් පැටවුන් තැන්පත් කිරීම | 12.000 |
| | | **එකතුව** | **42.400** |

- මීට අමතරව 8% පොලී සහනාධාරය යටතේ බැංකු ණය පහසුකම් මඟින් ධීවර යාත්‍රා සහ ආම්පන්න ලබා දීමට යෝජිතය.
- දිවයින පුරා මිරි දිය මසුන් හා සංචාරක කර්මාන්තය සම්බන්ධ වැඩසටහන් ප්‍රචලිත කිරීම සඳහා රු. මිලියන 300ක් අය වැයෙන් ලබා දී ඇත. එයට අවශ්‍ය වැඩ පිළිවෙළ සකස් කෙරෙමින් පවතී.

මෙවර අය වැය ලේඛනයෙන් ඒ තිබෙන ණයවලින් සියයට 4ක් ආණ්ඩුව භාර අරගෙන සියයට 8ක සහන පොලියකට ණය දෙන්න අපි ලංකා බැංකුවෙන් රුපියල් බිලියනයක් -මිලියන දාහක් - වෙන් කර ගෙන තිබෙනවා.

**ගරු අනෝමා ගමගේ මහත්මිය**
(மாண்புமிகு (திருமதி) அனோமா கமகே)
(The Hon. (Mrs.) Anoma Gamage)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. අපේ ගරු ඇමතිතුමා කිව්වා අය වැය යෝජනාවේ ඇති සහනවලට දැන් මුදල් වෙන් කර තිබෙනවාය කියලා. මොකද, අය වැය යෝජනාවේ තිබෙනවා, මත්ස්‍ය නිෂ්පාදනය උතුරු නැඟෙනහිරින් විතරක් රටේ සමස්ත නිෂ්පාදනයෙන් සියයට 50 දක්වා වැඩි කරන්න ඕනෑය කියලා. මුදල් වෙන් කිරීම ඇරෙන්න දැනට මේ දක්වා මොනවා හරි ව්‍යාපෘති ආරම්භ කර තිබෙනවාද කියලා දැන ගන්න කැමැතියි.

**ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා**
(மாண்புமிகு வைத்திய கலாநிதி ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)

අපි 1982 අවසාන සංගණනය බැලුවොත් මේ රටේ මත්ස්‍ය නිෂ්පාදනයෙන් සියයට 43ක් උතුර සහ නැඟෙනහිරින් දුන්නා. අපි 2009 මැයි 19 වැනි දා උතුර හා නැඟෙනහිර නිදහස් කර ගන්න කොට ඒක සියයට 7කට වැටිලා තිබුණා. 2010 තුන්වැනි කාර්තුව වන කොට -මට අවසාන කාර්තුවේ වාර්තාව තවම ලැබිලා නැහැ- අපි ඒක සියයට 134කින් වැඩි කරලා තිබුණා. ඒ කියන්නේ සියයට 17කට පමණ. දැන් ඊටත් වඩා වැඩියි. මොකද අපි විශාල ව්‍යාපෘති කර තිබෙනවා. අපි රුපියල් බිලියන ගණනාවක් උතුරටත්, නැඟෙනහිරටත් වියදම් කර තිබෙනවා. විශේෂයෙන්ම උතුර නිදහස් කර ගත්තාට පසු ඒවා විශාල ව්‍යාපාර බවට පත් වුණා. ඒ ගොල්ලෝ බෝට්ටු 600ක් ඉල්ලා තිබුණා. ඒ 600ම බෙදා හැරීමේ වැඩ පිළිවෙළ අපි ආරම්භ කළා. ඒවායෙන් දැනට 300කට වැඩිය බෙදලා තිබෙනවා. දැල් ආම්පන්න, මිරි දිය මසුන්, ආධාර, ණය සියල්ලම ලබා දීලා දැනට ධීවර සංවිධානත් අපි හදලා තිබෙනවා.

**ගරු අනෝමා ගමගේ මහත්මිය**
(மாண்புமிகு (திருமதி) அனோமா கமகே)
(The Hon. (Mrs.) Anoma Gamage)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා දෙවන අතුරු ප්‍රශ්නය අහනවා. මත්ස්‍යයින් ආශ්‍රිත නිෂ්පාදන ආනයනය කරන්න රජය අවුරුද්දකට රුපියල් බිලියන 15ක් විතර වියදම් කරනවා. ඔබතුමාගේ ව්‍යාපෘති අනුව කොයි කාලය වන විට ආනයනය කිරීම අඩු කරන්න පුළුවන් වෙයි කියා විශ්වාස කරනවාද?

**ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා**
(மாண்புமிகு வைத்திய கலாநிதி ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)

අපි රුපියල් බිලියන 14ක් වැය කරනවා. අපි රුපියල් බිලියන 21ක් හම්බ කරනවා. එහෙමයි තියෙන්නේ. තායිලන්තය රුපියල් බිලියන 685ක් ආදායම් ලබන කොට ඒ ගොල්ලෝ බිලියන 490ක් ආනයනය සඳහා වියදම් කරනවා. ඒක value add කර ඒ ගොල්ලෝ ආපහු යවනවා. දැනට අපි සැමන් කර්මාන්තශාලාවක් ආරම්භ කර තිබෙනවා. තවත් දැවැන්ත කර්මාන්තශාලා තුනක් ලංකාවේ ආරම්භ කිරීමට ගිවිසුම් අත්සන් කරමින් පවතිනවා. ඒ අනුව අපි බලාපොරොත්තු වනවා, ආනයනය ඉතාමත්ම අඩු තත්ත්වයට ගෙනෙන්න. උම්බලකඩ සහ කරවල නිෂ්පාදනය පිළිබඳව NARA එකෙන් පර්යේෂණ කරලා ලංකාවේ කොහොමද ඒක ආරම්භ කරන්නේ කියා ව්‍යාපාරික ප්‍රජාවත් සමඟ කථා කර ගෙන යනවා. එතකොට ආනයන වියදම අඩු වනවා. කොහොම වුණත් අපේ මත්ස්‍ය නිෂ්පාදනය 2009 දෙසැම්බර් වන විට මෙට්‍රික් ටොන් 339,000ක් තිබුණා. ඒක 2013 දෙසැම්බර් වන විට මෙට්‍රික් ටොන් 686,000කට වැඩි කරනවා. 2010 දී මගේ ඉලක්කය වුණේ මෙට්‍රික් ටොන් 404,000යි. ඒ වන විට යුද්ධය ඉවර කරලා මාස ගණනාවයි ගත වී තිබුණේ. ඒ ඔක්කොම තිබිලාත් කොහොම හරි සියයට 94ක් වන මෙට්‍රික් ටොන් 381,000කට වැඩි ප්‍රමාණයක් නිෂ්පාදනය කරන්න අපට පුළුවන් වුණා. ඒ කියන්නේ පසු ගිය වසරට වඩා මෙට්‍රික් ටොන් මිලියන 42ක් විතර අපි නිෂ්පාදනය කළා.

**ගරු අනෝමා ගමගේ මහත්මිය**
(மாண்புமிகு (திருமதி) அனோமா கமகே)
(The Hon. (Mrs.) Anoma Gamage)

මගේ තුන්වැනි අතුරු ප්‍රශ්නය මෙකයි. ගරු ඇමතිතුමනි, නැඟෙනහිර පළාතේ ඇති වුණු ගංවතුර නිසා හුඟක් ධීවරයන්ට අලාභ හානි වුණා. මේ සඳහා ඔබතුමාගේ අමාත්‍යාංශය යම් කිසි පියවරක් අරගෙන තිබෙනවාද?

**ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා**
(மாண்புமிகு வைத்திய கலாநிதி ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)

අපි මුලින්ම පොළොන්නරුවට අශ්වබල 25 එන්ජින් අටක් ඇරියා. ඒකෙන් තමයි සම්පූර්ණයෙන්ම හැම පළාතකටම භාණ්ඩ බෙදා හැරියේ. එදා රෑ දෙක වන කොට මම ඒ ටික යැව්වා. ඒවා භාර අරගෙන පොළොන්නරුව දිසාපතිතුමා මට කථා කළා. ඊට පස්සේ මඩකලපුවේ දිසාපතිතුමා උදේ මට කථා කළා. එතුමාටත් මම අශ්වබල 25 එන්ජින් පහක් ඒ වෙලාවේම අරගෙන යැව්වා. ඒකට අපි මිලියන පහකට වැඩි ප්‍රමාණයක් වියදම් කළා. ඒ ධීවරයන්ට අවශ්‍ය සහන දෙන්න අමාත්‍යාංශයෙන් අපි මිලියන එකහමාරක් වෙන් කළා. අනික් කාරණය මෙකයි. මෙහිදී ධීවර යාත්‍රා හතරක් අතුරුදහන් වුණා. අපි නාවික හමුදාවත් එක්ක එකතු වෙලා එයින් තුනක් ඊට පසු දා සොයා ගත්තා. පසුව ඉතිරි එකත් හොයා ගෙන ඔක්කොම ආරක්ෂා කර ගත්තා. ඒ වාගේම සහනාධාර සඳහා මිලියන එකහමාරක් අපි අමාත්‍යාංශයෙන් වෙන් කළා. ඊට අමතරව අපේ සියලුම ආයතනවල ඉන්න 3,000ක් විතර සේවකයෝ-මගේත් ඇතුළුව- දවසක වැටුප අපි පරිත්‍යාග කරලා ඒ මුදලත් නැඟෙනහිර පළාතට අපි ලබා දෙනවා, වියදම් කරන්න.

**ගරු අනෝමා ගමගේ මහත්මිය**
(மாண்புமிகு (திருமதி) அனோமா கமகே)
(The Hon. (Mrs.) Anoma Gamage)

බෝට්ටු අරවා මේවා කැඩිච්ච ඒවාට?

**ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා**
(மாண்புமிகு வைத்திய கலாநிதி ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)

ඒ ඔක්කෝටම අපි උදවු කරනවා.

**ගරු අනෝමා ගමගේ මහත්මිය**
(மாண்புமிகு (திருமதி) அனோமா கமகே)
(The Hon. (Mrs.) Anoma Gamage)
බොහොම ස්තුතියි.

## ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය: විස්තර
## இலங்கை திறந்த பல்கலைக்கழகம்: விபரம்
## OPEN UNIVERSITY OF SRI LANKA: DETAILS

0799/'10

**12. ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
උසස් අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) 1994 සිට මේ දක්වා ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයට වාර්ෂිකව බඳවා ගනු ලැබූ සිසුන්ගේ සංඛ්‍යාව එක් එක් වර්ෂය සඳහා වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) රජය විසින් විවෘත විශ්වවිද්‍යාලය සඳහා වාර්ෂිකව වෙන් කරනු ලබන මුදල කොපමණද;

(iii) එක් සිසුවෙකුගෙන් එක් වර්ෂයක් සඳහා අය කරනු ලබන මුදල කොපමණද;

(iv) 1994 සිට මේ දක්වා විදේශ ණය හෝ ආධාර යටතේ එම විශ්වවිද්‍යාලයට ලැබුණු මුදල් ප්‍රමාණයන් වාර්ෂිකව, වෙන් වෙන් වශයෙන් කොපමණද;

(v) ඉහත කාල සීමාව තුළදී විදේශ ණය, ආධාර හා රජයේ ප්‍රතිපාදන යන ක්ෂේත්‍ර තුනෙන්ම එක් එක් වර්ෂයේදී එම විශ්වවිද්‍යාලයට ලැබුණු මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) 1994 සිට 2009 දක්වා විවිධ පාඨමාලා යටතේ උපාධි ලබාගෙන ඇති මුළු සංඛ්‍යාව කොපමණද;

(ii) එම උපාධිධාරීන්ගේ සංඛ්‍යාව වාර්ෂිකව, වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එක් එක් පාඨමාලා අනුව උපාධිධාරියකු බිහි කිරීම සඳහා වැය වන මුදල කොපමණද;

(iv) පළාත් මට්ටමින් බිහි වූ උපාධිධාරීන් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නො එසේ නම්, ඒ මන්ද?

உயர் கல்வி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) 1994 தொடக்கம் இதுவரை இலங்கை திறந்த பல்கலைக்கழகத்துக்கு வருடாந்தம் சேர்த்துக் கொள்ளப்பட்ட மாணவர்களின் எண்ணிக்கை ஒவ்வொரு வருடத்துக்கும் வெவ்வேறாக எவ்வளவு என்பதையும்,

(ii) அரசாங்கத்தினால் திறந்த பல்கலைக்கழகத்துக்கு வருடாந்தம் ஒதுக்கப்படும் பணம் எவ்வளவு என்பதையும்,

(iii) ஒரு மாணவரிடமிருந்து ஒரு வருடத்துக்காக அறவிடப்படும் பணம் எவ்வளவு என்பதையும்,

(iv) 1994 தொடக்கம் இதுவரை வெளிநாட்டுக்கடன்கள் அல்லது உதவிகளின் கீழ் மேற்படி பல்கலைக் கழகத்துக்கு கிடைத்த நிதியின் அளவு வருடாந்தம் வெவ்வேறாக எவ்வளவு என்பதையும்,

(v) மேற்கூறிய கால எல்லைக்குள் வெளிநாட்டுக் கடன்கள் உதவிகள் மற்றும் அரச நிதி ஒதுக்கீடுகள் ஆகிய மூன்று துறைகள் ஊடாக ஒவ்வொரு வருடத்திலும் மேற்படி பல்கலைக்கழகத்துக்கு கிடைத்த பணம் எவ்வளவு என்பதையும்

என்பதை அவர் இச்சபையில் அறிவிப்பாரா?

(ஆ) (i) 1994 தொடக்கம் 2009 வரை பல தரப்பட்ட பாடநெறிகளின் கீழ் பட்டம் பெற்றுள்ளவர்களின் மொத்த எண்ணிக்கை எவ்வளவு,

(ii) மேற்படி பட்டதாரிகளின் எண்ணிக்கை வருடாந்தம் வெவ்வேறாக எவ்வளவு,

(iii) ஒவ்வொரு பாடநெறிக்கமைய பட்டதாரி ஒருவரை உருவாக்குவதற்கு ஏற்படும் செலவு எவ்வளவு,

(iv) மாகாண அடிப்படையில் உருவாக்கப்பட்ட பட்டதாரிகளின் எண்ணிக்கை எவ்வளவு

என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Higher Education :

(a) Will he inform this House-

(i) of the number of students enrolled to the Open University of Sri Lanka annually, from 1994 up to now ;

(ii) of the amount of money allocated to the Open University by the government annually ;

(iii) of the amount of money charged from a student per year ;

(iv) separately, of the amounts received annually by that University under foreign loans or aid from 1994 up to now ;and

(v) of the amount received by that University in each year within that period from all three sources of foreign loans, aid and government provisions ?

(b) Will he inform this House of-

(i) the total number of persons who graduated in different courses from 1994 to 2009;

(ii) the number of those graduates with respect to each year separately ;

(iii) the cost of creating a graduate with respect to each course ; and

(iv) the number of graduates created as per each province?

(c) If not, why?

**ගරු නන්දිමිත්‍ර ඒකනායක මහතා (උසස් අධ්‍යාපන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு நந்திமித்ர ஏக்கநாயக்க - உயர் கல்வி பிரதி அமைச்சர்)
(The Hon. Nandimithra Ekanayake - Deputy Minister of Higher Education)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, උසස් අධ්‍යාපන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දෙනවා. ගරු මන්ත්‍රීතුමනි, දීර්ඝ පිළිතුරක් තිබෙන්නේ. ඉලක්කම් සේරම කියන්න ගියොත් හුඟක් වෙලාව යයි. මම එකක් දෙකක් කියවන්නද?

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
අවශ්‍ය නැහැ. ඔබතුමා පිළිතුර සභාගත කරන්න.

**ගරු නන්දිමිත්‍ර ඒකනායක මහතා**
(மாண்புமிகு நந்திமித்ர ஏக்கநாயக்க)
(The Hon. Nandimithra Ekanayake)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, උසස් අධ්‍යාපන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

***සභාමේසය මත තබන ලද පිළිතුර:***
**சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :**
**Answer tabled:*

**(ඇ)**

(i)

| වසර | සිසුන් සංඛ්‍යාව |
|---|---|
| 1994 | - |
| 1995 | - |
| 1996 | 4226 |
| 1997 | 7067 |
| 1998 | 8449 |
| 1999 | 8335 |
| 2000 | 9077 |
| 2001 | 8898 |
| 2002 | 9448 |
| 2003 | 11164 |
| 2004 | 9777 |
| 2005 | 7138 |
| 2006 | 11574 |
| 2007 | 10834 |
| 2008 | 9464 |
| 2009 | 9357 |
| 2010 | 11262 |

(ii)

| වසර | පුනරාවර්තන | මූලධන | එකතුව |
|---|---|---|---|
| 1994 | 104,000,000 | 14,000,000 | 118,000,000 |
| 1995 | 110,000,000 | 18,750,000 | 128,750,000 |
| 1996 | 108,600,000 | 48,450,000 | 157,050,000 |
| 1997 | 150,200,000 | 45,500,000 | 195,700,000 |
| 1998 | 160,700,000 | 35,725,000 | 196,425,000 |
| 1999 | 172,217,000 | 55,500,000 | 227,717,000 |
| 2000 | 165,000,000 | 49,000,000 | 214,000,000 |
| 2001 | 197,390,000 | 48,100,000 | 245,490,000 |
| 2002 | 206,500,000 | 13,500,000 | 220,000,000 |
| 2003 | 190,980,000 | 24,220,000 | 215,200,000 |
| 2004 | 202,500,000 | 58,500,000 | 261,000,000 |
| 2005 | 308,000,000 | 45,600,000 | 353,600,000 |
| 2006 | 394,200,000 | 47,000,000 | 441,200,000 |
| 2007 | 444,000,000 | 100,800,000 | 544,800,000 |
| 2008 | 503,500,000 | 97,650,000 | 601,150,000 |
| 2009 | 511,000,000 | 51,000,000 | 562,000,000 |

(iii) **පවත්වාගෙන යනු ලබන සහතික පත්‍ර, ඩිප්ලෝමා, උපාධි සහ පශ්චාත් උපාධිවලට අදාළ පාඨමාලා 72 සඳහා අයකරනු ලබන මුදල්.**

| | පාඨමාලාව | පාඨමාලා ගාස්තු |
|---|---|---|
| 1 | මූලික පාඨමාලාව - දෙමළ | 3,190.00 |
| 2 | පරිගණක දැනුවත් කිරීමේ පාඨමාලාව | 3,500.00 |
| 3 | නීති අධ්‍යාපනය සඳහා ඉංග්‍රීසි | 4,294.00 |
| 4 | ව්‍යාපාර සංනිවේදනය/ ලිවීමේ හැකියාව සඳහා ඉංග්‍රීසි | 4,750.00 |
| 5 | මූලික සිංහල පාඨමාලාව | 5,666.00 |
| 6 | මූලික ඉංග්‍රීසි | 6,166.00 |
| 7 | සමාජ විද්‍යා සහතික පත්‍ර පාඨමාලාව | 6,910.00 |
| 8 | සමාජ විද්‍යා පදනම් පාඨමාලාව | 6,910.00 |
| 9 | කෘෂි ඉංජිනේරු අඛණ්ඩ අධ්‍යාපනය | 7,274.00 |
| 10 | ඉංජිනේරු අඛණ්ඩ අධ්‍යාපනය | 7,274.00 |
| 11 | ව්‍යවසායකත්ව සහ කුඩා ව්‍යාපාර පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව | 7,702.00 |
| 12 | වෘත්තිය ඉංග්‍රීසි පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව | 8,674.00 |
| 13 | ඉංග්‍රීසි පිළිබඳ උසස් සහතික පත්‍ර පාඨමාලාව | 9,934.00 |
| 14 | කාර්මික හා පාරිසරික උවදුර පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව | 11,714.00 |
| 15 | කාර්මික අධ්‍යාපන පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව | 11,714.00 |
| 16 | මූලික ඇඟලුම් තාක්ෂණය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව | 11,734.00 |
| 17 | ඇඟලුම් තාක්ෂණය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව | 11,734.00 |
| 18 | තාක්ෂණය පිළිබඳ පදනම් පාඨමාලාව | 11,734.00 |
| 19 | පත්‍ර කලාවේදී සහතික පත්‍ර පාඨමාලාව | 11,760.00 |
| 20 | පෙරපාසැල් අධ්‍යාපන පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව | 12,166.00 |
| 21 | කළමනාකරණ ඩිප්ලෝමා පාඨමාලාව | 12,910.00 |
| 22 | තරුණ සංවර්ධන කටයුතු පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව | 14,350.00 |
| 23 | කාර්මික අධ්‍යාපන පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව | 14,398.00 |
| 24 | තාක්ෂණික ඩිප්ලෝමා පාඨමාලාව | 14,398.00 |
| 25 | ඇඟලුම් නිෂ්පාදන සහ කළමනාකරණය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව | 14,490.00 |
| 26 | කාර්මික කළමනාකරණ උසස් ඩිප්ලෝමා පාඨමාලාව | 14,498.00 |
| 27 | සමාජ විද්‍යාවේදී | 15,550.00 |
| 28 | පෙර පාසල් අධ්‍යාපනය පිළිබඳ උසස් සහතික පත්‍ර පාඨමාලාව | 16,558.00 |
| 29 | කළමනාකරණවේදී | 16,899.00 |
| 30 | මුල් ළමාවිය සහ ප්‍රාථමික අධ්‍යාපනය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව | 17,662.00 |
| 31 | ඉංග්‍රීසි ඩිප්ලෝමා පාඨමාලාව | 18,718.00 |
| 32 | පාරිසරික විද්‍යාව පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව | 19,210.00 |
| 33 | වනජීවී සංරක්ෂණය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව | 19,210.00 |
| 34 | විද්‍යාව පිළිබඳ අඛණ්ඩ අධ්‍යාපනය | 19,592.00 |
| 35 | ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීම සහ ඉංග්‍රීසි පිළිබඳ කලා උපාධිය | 21,310.00 |
| 36 | නීතිවේදී (පැරණි නිර්දේශය) | 21,478.00 |
| 37 | නීතිවේදී (නව නිර්දේශය) | 21,478.00 |
| 38 | දෙවන භාෂාවක් වශයෙන් ඉංග්‍රීසි ඉගැන්වීම පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය | 21,620.00 |
| 39 | විද්‍යාගාර තාක්ෂණය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව | 22,126.00 |
| 40 | අධ්‍යාපනපති | 23,766.00 |
| 41 | තාක්ෂණවේදී | 25,054.00 |
| 42 | කාර්මික අධ්‍යපනවේදී | 25,054.00 |
| 43 | අධ්‍යාපනවේදී | 28,030.00 |
| 44 | අධ්‍යාපන විද්‍යාවේදී | 28,078.00 |
| 45 | විද්‍යාවේදී (නව නිර්දේශය) | 28,078.00 |
| 46 | විශේෂ අවශ්‍යතා අධ්‍යාපනය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව | 28,295.00 |
| 47 | ගුරු අධ්‍යාපනය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය - (පැරණි නිර්දේශය) | 29,038.00 |
| 48 | ගුරු අධ්‍යාපනය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය - (නව නිර්දේශය) | 29,038.00 |
| 49 | වෛද්‍ය නිලධාරීන් සඳහා අඛණ්ඩ අධ්‍යාපනය | 29,460.00 |
| 50 | ගුරු අධ්‍යාපනය පිළිබඳ මාර්ගගත තනිපාඨමාලා | 31,774.00 |
| 51 | පශ්චාත් උපාධි අධ්‍යාපන - (පැරණි නිර්දේශය) | 32,510.00 |
| 52 | පශ්චාත් උපාධි අධ්‍යාපන | 32,510.00 |
| 53 | විද්‍යාගාර තාක්ෂණය පිළිබඳ උසස් සහතික පත්‍ර පාඨමාලාව | 32,662.00 |
| 54 | සංචාරක ව්‍යාපරය පිළිබඳ උසස් සහතික පත්‍ර පාඨමාලාව | 33,670.00 |
| 55 | සංචාරක ව්‍යාපාරය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව | 33,690.00 |
| 56 | පාරසරික විද්‍යාව පිළිබඳ පශ්චාත් උපාධිය | 34,388.00 |
| 57 | දුරස්ථ අධ්‍යාපනය පිළිබඳ පශ්චාත් උපාධිය | 35,912.00 |
| 58 | සෞඛ්‍ය විද්‍යාවේදී | 39,694.00 |
| 59 | කාර්මික ඉංජිනේරු තාක්ෂණපති | 41,434.00 |
| 60 | කෘෂි කාර්මික ඉංජිනේරු පශ්චාත් උපාධිය | 41,744.00 |
| 61 | ඉදිකිරීම් කළමනාකරණ තාක්ෂණපති | 41,744.00 |
| 62 | ඉංජිනේරු පශ්චාත් උපාධිය | 41,852.00 |
| 63 | කාර්මික ඉංජිනේරු තාක්ෂණපති | 41,852.00 |

| | | |
|---|---|---|
| 64 | කළමනාකරණ පශ්චාත් උපාධිය | 41,852.00 |
| 65 | ගුරු අධ්‍යාපනය පිළිබඳ ශාස්ත්‍රපති (ජාත්‍යන්තර) | 45,646.00 |
| 66 | පාරසරික විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය | 49,868.00 |
| 67 | සංවර්ධන අධ්‍යාපන සහ මහජන ප්‍රතිපත්ති පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය | 81,530.00 |
| 68 | ඉදිකිරීම් කළමනාකරණ පශ්චාත් උපාධිය | 41,852.00 |
| 69 | කාර්මික ඉංජිනේරු පශ්චාත් උපාධිය | 41,852.00 |
| 70 | ඉදිකිරීම් කළමනාකරණ පශ්චාත් උපාධිය | 41,852.00 |
| 71 | පොදු රාජ්‍ය මණ්ඩල විධායක ව්‍යාපාර පරිපාලනපති / රාජ්‍ය පරිපාලනපති උපාධිය | 101,516.00 |
| 72 | මානව සම්පත් කළමනාකරණ සහ ව්‍යාපාර පරිපාලන ශාස්ත්‍රපති උපාධිය | 181,460.00 |

(iv) 1994 සිට මේ දක්වා විදේශ ණය හෝ ආධාර ලැබී නැත.

(v)

| වසර | පුනරාවර්තන | ප්‍රාග්ධන | එකතුව |
|---|---|---|---|
| 1994 | 101,500,000 | 14,000,000 | 115,500,000 |
| 1995 | 110,000,000 | 18,750,000 | 128,750,000 |
| 1996 | 112,000,000 | 48,450,000 | 157,050,000 |
| 1997 | 150,200,000 | 35,500,000 | 185,700,000 |
| 1998 | 160,000,000 | 35,725,000 | 195,725,000 |
| 1999 | 172,217,000 | 55,500,000 | 227,717,000 |
| 2000 | 165,000,000 | 49,000,000 | 214,000,000 |
| 2001 | 207,700,000 | 30,994,000 | 238,694,000 |
| 2002 | 224,851,000 | 11,481,800 | 220,000,000 |
| 2003 | 211,561,800 | 23,169,427 | 215,200,000 |
| 2004 | 225,440,000 | 44,000,000 | 261,000,000 |
| 2005 | 286,000,000 | 42,300,000 | 328,300,000 |
| 2006 | 394,200,000 | 35,000,000 | 429,200,000 |
| 2007 | 449,321,000 | 48,775,000 | 498,096,000 |
| 2008 | 479,800,000 | 62,500,000 | 542,300,000 |
| 2009 | 505,000,000 | 41,000,000 | 546,000,000 |

**(ආ)** (i) මුළු සංඛ්‍යාව **18367** කි. ඒ පිළිබඳ විස්තර පහත පරිදි වේ.

| | පාඨමාලාව | මුළු උපාධිධාරීන් ගණන |
|---|---|---|
| උපාධි | කාර්මික අධ්‍යයනවේදී | 63 |
| | තාක්ෂණිකවේදී | 326 |
| | විද්‍යාවේදී | 2377 |
| | හෙද විද්‍යාවේදී | 321 |
| | අධ්‍යාපනවේදී | 119 |
| | නීතිවේදී | 1737 |
| | සමාජ විද්‍යාවේදී | 481 |
| | කළමනාකරණවේදී | 214 |
| | ශාස්ත්‍රවේදී (ඉංග්‍රීසි) | 44 |
| ශාස්ත්‍රපති උපාධි | දර්ශනශූරි | 6 |
| | දර්ශනපති | 37 |
| | ඉදිකිරීම් කළමනාකරණ තාක්ෂණපති | 13 |
| | කාර්මික ඉංජිනේරු තාක්ෂණපති | 26 |
| | අධ්‍යාපනපති | 86 |
| | ගුරු අධ්‍යාපනපති | 205 |
| | ගුරු අධ්‍යාපනය පිළිබඳ ශාස්ත්‍රපති (ජාත්‍යන්තර) | 10 |
| | සංවර්ධන අධ්‍යාපන සහ මහජන ප්‍රතිපත්ති පිළිබඳ | 1 |
| | | 52 |
| පශ්චාත් උපාධි ඩිප්ලෝමා | පශ්චාත් උපාධි අධ්‍යාපන | 11779 |
| | කළමනාකරණ පශ්චාත් උපාධිය | 108 |
| | සංවර්ධන අධ්‍යාපන සහ ප්‍රතිපත්ති පිළිබඳ පශ්චාත් උපාධිය | 80 |
| | කෘෂි කාර්මික ඉංජිනේරු පශ්චාත් උපාධිය | 10 |
| | කාර්මික ඉංජිනේරු පශ්චාත් උපාධිය | 117 |
| | ඉදිකිරීම් කළමනාකරණ පශ්චාත් උපාධිය | 70 |
| | පාරිසරික විද්‍යාව පිළිබඳ පශ්චාත් උපාධිය | 78 |
| | දුරස්ථ අධ්‍යාපනය පිළිබඳ පශ්චාත් උපාධිය | 7 |
| | මුළු එකතුව | 18367 |

(ii)

| වසර | උපාධිධාරීන් සංඛ්‍යාව |
|---|---|
| 1994 | 1088 |
| 1995 | 832 |
| 1996 | 1093 |
| 1997 | 1084 |
| 1998 | 895 |
| 1999 | 984 |
| 2000 | 870 |
| 2001 | 973 |
| 2002 | 1159 |
| 2003 | 1022 |
| 2004 | 1405 |
| 2005 | 303 |
| 2006 | 1962 |
| 2007 | 1321 |
| 2008 | 725 |
| 2009 | 2661 |
| ***එකතුව*** | ***18367*** |

(iii)

| උපාධිය | වැයවන මුදල (රු.) |
|---|---|
| අධ්‍යාපනවේදී | 19,657.00 |
| තාක්ෂණවේදී<br>කාර්මිකවේදී | 40,330.00 |
| ශාස්ත්‍රවේදී<br>කළමනාකරණ<br>නීතිවේදී<br>ඉංග්‍රීසිවේදී | 21,143.00 |
| විද්‍යාවේදී<br>හෙද | 42,288.00 |

(iv) විවෘත විශ්වවිද්‍යාලය විසින් 2008 වර්ෂය දක්වා පළාත් මට්ටමින් අදාළ තොරතුරු පවත්වාගෙන ගොස් නැත. 2008 හා 2009 වර්ෂයන්හි තොරතුරු පහත පරිදි වේ.

| පළාත | 2008 | 2009 |
|---|---|---|
| බස්නාහිර පළාත | 533 | 1022 |
| වයඹ පළාත | 9 | 262 |
| සබරගමු පළාත | 21 | 137 |
| උතුරු පළාත | 3 | 134 |
| නැගෙනහිර පළාත | 11 | 369 |
| මධ්‍යම පළාත | 79 | 421 |
| උතුරු මැද පළාත | 3 | 39 |
| ඌව පළාත | 5 | 56 |
| දකුණු පළාත | 61 | 221 |
| *මුළු එකතුව* | ***725*** | ***2661*** |

**(ඇ)** පැන නොනඟී

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)

ප්‍රශ්නයේ (ආ) (iii) කොටසටත් දීර්ඝ උත්තරයක්ද තිබෙන්නේ?

**ගරු නන්දිමිත්‍ර ඒකනායක මහතා**
(மாண்புமிகு நந்திமித்ர ஏக்கநாயக்க)
(The Hon. Nandimithra Ekanayake)

ඒ ප්‍රශ්නයට උත්තරය පිළිතුරේ මුල් කොටසේ තිබෙනවා. එක් එක් පළාත් අනුව තිබෙනවා. තමුන්නාන්සේට ඒ පිළිබඳව දැන ගන්න පුළුවන් අපි දීලා තිබෙන පිළිතුර අනුව. ගරු මන්ත්‍රීතුමනි, දැන් ඔබතුමාට පෙනෙනවා ඇති විවෘත විශ්වවිද්‍යාලය තුළින් මොන තරම් පාඨමාලා, පශ්චාත් උපාධි පාඨමාලා පවත්වනවාද කියන එක.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මේකයි. ගරු නියෝජ්‍ය අමාත්‍යතුමා සඳහන් කළා පාඨමාලා රාශියක් ගැන.

**ගරු නන්දිමිත්‍ර ඒකනායක මහතා**
(மாண்புமிகு நந்திமித்ர ஏக்கநாயக்க)
(The Hon. Nandimithra Ekanayake)

ඔව්.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)

හැබැයි ප්‍රශ්නය වෙලා තිබෙන්නේ, පාසල් දක්වා මේ පාඨමාලා පිළිබඳව සන්නිවේදනය වීමේ ගැටලුවක් තිබීමයි. ඒ නිසා පාසලෙන් සමු ගන්නා දරුවන්ගෙන් බොහොම අල්ප දෙනකුයි මේ පාඨමාලාවලට ඇතුළු වීම පිළිබඳව දන්නේ. ඒ නිසා

[ගරු බුද්ධික පතිරණ මහතා]

ළමුන් පාසල්වලින් සමු ගන්නා අවස්ථාවේදී පාසල්වල තිබෙන උපදේශන ඒකක හරහා, උපදේශන ඒකකවලටත් වඩා මාර්ගෝපදේශන ඒකක හරහා මේ පාඨමාලා පිළිබඳව දැනුවත් කිරීමට විවෘත විශ්වවිද්‍යාලය හෝ උසස් අධ්‍යාපන අමාත්‍යාංශය හෝ අධ්‍යාපන අමාත්‍යාංශයත් එක්ක ඒකාබද්ධ වෙලා වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරන්න බලාපොරොත්තු වනවාද?

**ගරු නන්දිමිත්‍ර ඒකනායක මහතා**
(மாண்புமிகு நந்திமித்ர ஏக்கநாயக்க)
(The Hon. Nandimithra Ekanayake)
ඇත්ත වශයෙන්ම ඔබතුමාගේ අදහස ඉතාම වැදගත්. ඒක කාලීන වැදගත්කමක් ඇති ප්‍රශ්නයක්. ඔබතුමා වාගේ බුද්ධිමත් මන්ත්‍රීවරයෙක් අපේ උපදේශක කාරක සභාවලට ඇවිල්ලා මේ යෝජනා සහ අදහස් ඉදිරිපත් කරන්න. අපි ඒකාබද්ධ වෙලා රටේ යහපත වෙනුවෙන් මේ ප්‍රතිපත්ති ක්‍රියාවට නංවමු.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මේකයි.

විවෘත විශ්වවිද්‍යාලයේ අධ්‍යාපනය ලබන උපාධි අපේක්ෂකයන්ගේ බරපතළ මැසිවිල්ලක් තිබෙනවා. සාමාන්‍ය විශ්වවිද්‍යාලයක නම් විභාග පැවැත්වීම පිළිබඳව නිශ්චිත කාල රාමු තිබෙනවා. විවෘත විශ්වවිද්‍යාලය මේ පාඨමාලාවල කාල රාමු වෙනස් කරනවා. විභාග කල් තැබීම් සිද්ධ කරනවා. ඒ නිසා මේ ශිෂ්‍යයෝ නැත්නම් උපාධි අපේක්ෂකයෝ යම් යම් අපහසුතාවන්ට පත් වනවා. දැන් විද්‍යාවේදී උපාධිය ලැබුවාට පස්සේ අභ්‍යන්තර ශිෂ්‍යයකුටත්, විවෘත විශ්වවිද්‍යාලයෙන් එන ශිෂ්‍යයකුටත් සම තත්ත්වයක් තමයි තිබෙන්නේ. නමුත් විවෘත විශ්වවිද්‍යාලයේ උපාධිය ලබා ගන්න ගත වන කාලයේ බරපතළ වැඩි වීමක් තිබෙනවා. ඒ නිසා මෙන්න මේ තත්ත්වය සමනය කරලා විවෘත විශ්වවිද්‍යාලයට ඇතුළත් වන ශිෂ්‍යයන්ටත් තමන්ගේ අභිප්‍රාය වූ උපාධිය ලබා ගන්න නියමිත කාල රාමුව විධිමත් කරන්න අමාත්‍යාංශය අවධානය යොමු කරනවාද?

**ගරු නන්දිමිත්‍ර ඒකනායක මහතා**
(மாண்புமிகு நந்திமித்ர ஏக்கநாயக்க)
(The Hon. Nandimithra Ekanayake)
ඔව්. ඔබතුමා ප්‍රශ්නයකට වඩා අදහස් ඉදිරිපත් කිරීමක් තමයි කරන්නේ. ඒක බොහොම වැදගත්. එවැනි අපහසුතාවක්, දුර්වලතාවක් තිබෙනවා නම් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිසමත් සමඟ ඒ ගැන සාකච්ඡා කරලා ඒවා මඟ හැරවීමට අපට කටයුතු කරන්න පුළුවන්.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ තුන්වැනි අතුරු ප්‍රශ්නය මේකයි. රාජ්‍ය නොවන නමින් හෝ වේවා, පෞද්ගලික නමින් හෝ වේවා විවෘත විශ්වවිද්‍යාලයට අනුබද්ධව වෛද්‍ය විද්‍යාලයක් ඇති කිරීම කෙරෙහි අවධානය යොමු වනවාද? නොවනවා නම් ඒ මන්ද?

**ගරු නන්දිමිත්‍ර ඒකනායක මහතා**
(மாண்புமிகு நந்திமித்ர ஏக்கநாயக்க)
(The Hon. Nandimithra Ekanayake)
ඒක මේ ප්‍රශ්නයට නම් අදාළ නැහැ. ඒ නැති වුණත් එවැනි ඉල්ලීමක් තිබෙනවා නම් ඒ ගැන සලකා බලන්න පුළුවන්.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
බොහොම ස්තුතියි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

## සිංහරාජ වනාන්තරය පුළුල් කිරීම: ඉඩම්
சிங்கராஜ வனத்தின் விஸ்தரிப்பு: காணிகள்
EXPANSION OF SINHARAJA FOREST: LANDS

0832/'10

**13. ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
පරිසර අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) ලෝක උරුමයක් වන සිංහරාජ වනාන්තරයට අයත් ඉඩම් ප්‍රමාණය කොපමණද;

(ii) 2004 වර්ෂයේ ජුලි මස 22 වැනි දින අමාත්‍ය මණ්ඩල සංදේශයට අනුව සිංහරාජය පුළුල් කිරීම සඳහා වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව වෙත පවරා ගැනීමට තීරණය කළ වනාන්තර කවරේද;

(iii) එම වනාන්තර මේ වන විට අදාළ ආයතනය වෙත පවරා දී තිබේද;

(iv) නො එසේ නම්, ඊට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) සිංහරාජ වනාන්තරය වෙත ලබා දීමට තීරණය කළ, ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිසන් සභාවට අයත් ඉඩම් මේ වන විට බදු දී තිබේද;

(ii) එසේ නම්, එම ඉඩම් බදු දුන් ආයතනය, බදු කාල සීමාව සහ බදු ගිවිසුම් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) ඉහත සඳහන් අමාත්‍ය මණ්ඩල සංදේශය අනුව කටයුතු කරමින් අදාළ වනාන්තර වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව වෙත ලබා දීමට කටයුතු කරන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නො එසේ නම්, ඒ මන්ද?

சுற்றாடல் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) உலக மரபுரிமையொன்றாகிய சிங்கராஜ வனத்திற்குச் சொந்தமான காணியின் அளவு யாதென்பதையும்,

(ii) 2004 யூலை 22ஆம் திகதிய அமைச்சரவை நிருபத்தின்படி சிங்கராஜ வனத்தை விஸ்தரிப்பதற்காக வனப்பாதுகாப்புத் திணைக்களத்திற்கு சுவீகரிப்பதற்கு தீர்மானிக்கப்பட்டுள்ள காடுகள் யாவையென்பதையும்,

(iii) மேற்படி காடுகள் தற்போது சம்பந்தப்பட்ட நிறுவனத்திடம் ஒப்படைக்கப்பட்டுள்ளதா என்பதையும்,

(iv) இன்றேல், அதற்கான காரணங்கள் யாவையென்பதையும்

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i) சிங்கராஜவனத்திற்காக வழங்குவதற்குத் தீர்மானிக்கப்பட்ட காணி சீர்திருத்த ஆணைக்குழுவுக்குச் சொந்தமான காணிகள் தற்போது குத்தகைக்கு விடப்பட்டுள்ளனவா என்பதையும்,

(ii) ஆமெனில், மேற்படி காணிகள் குத்தகைக்கு விடப்பட்டுள்ள நிறுவனம், குத்தகை கால எல்லை, மற்றும் குத்தகை உடன்படிக்கைகள் யாவை யென்பதையும்

அவர் குறிப்பிடுவாரா?

(இ) மேற்படி அமைச்சரவை நிருபத்தின் படி செயலாற்றி சம்பந்தப்பட்ட காடுகளை வனப் பாதுகாப்புத் திணைக் களத்திற்கு வழங்குவதற்கு நடவடிக்கை எடுப்பாரா என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஈ) இன்றேல், ஏன்?

asked the Minister of Environment:

(a) Will he inform this House-

(i) the extent of the land belonging to the Sinharaja Forest which is a World Heritage site ;

(ii) the names of the forests that were decided to be taken over by the Department of Forest Conservation for the expansion of the Sinharaja Forest, according to the Cabinet Memorandum dated 22nd July 2004 ;

(iii) whether those forests have been transferred to the relevant institution by now ; and

(iv) if not, the reasons for that?

(b) Will he state-

(i) whether the lands belonging to the Land Reform Commission that were decided to be provided to the Sinharaja Forest have been leased out by now ; and

(ii) if so, the institution to which those lands were leased out, the lease period and the lease agreements?

(c) Will he inform this House whether measures will be taken to provide the relevant forests to the Department of Forest Conservation, acting in compliance with the said Cabinet Memorandum?

(d) If not, why?

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු පරිසර අමාත්‍යතුමා.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
අද පරිසර ඇමතිතුමා නැහැ. කල් ඉල්ලන්න වාගෙයි හදන්නේ.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ඇත්ත තමයි. ඇමතිතුමාත් නැහැ, උප ඇමතිතුමාත් නැහැ, ජ්‍යෙෂ්ඨ ඇමතිතුමාත් නැහැ.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ඔබතුමා මට උත්තර දෙන්න යන්න එපා. එතකොට ඔබතුමාත් ජ්‍යෙෂ්ඨ කරයි. සිංහරාජ නැහැ, නකල්ස් නැහැ, මොකුත් නැහැ. ඒකයි වැඩේ. ඔක්කොම බකල් වෙලා තිබෙන්නේ. දැන් සති පහක් විතර කල් ගන්නද හදන්නේ. නැහැ නේද? උත්තරයක් තිබෙනවා. [බාධා කිරීමක්] තවම ඡන්ද පටන් ගත්තේත් නැහැ කට්ටිය ඉලෙක්ෂන් ඩියුටි ගිහිල්ලා.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පරිසර අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දෙනවා.

(අ) (i) හෙක්ටෙයාර 11,187යි.

(ii)

| | | |
|---|---|---|
| මාතර දිස්ත්‍රික්කය | - | එන්සල් වත්ත |
| | - | කුරුළුගල වත්ත |
| | - | බෙවරලි වත්ත |
| | - | හේමගිරි වත්ත |
| රත්නපුර දිස්ත්‍රික්කය | - | මූරකැලේ |
| | - | ඇබර්ෆොයිල් වත්ත |
| | - | කැන්ටර්හිල් වත්ත |
| | - | ඉලුඹකන්ද වත්ත |
| | - | මෝනින්සයිඩ් |
| | - | හේයස් වත්ත |
| | - | ගොංගල අයින |
| | - | දඹහේන |
| | - | ඇබරොක් වත්ත |
| | - | බ්ලැක්ෂයර් වත්ත |
| | - | කෝඳුරුගල |
| ගාල්ල දිස්ත්‍රික්කය මූකලාන | - | හෝම්දොල |

(iii) නැත.

(iv) අත් පත් කර ගැනීමේ කටයුතු ඉඩම් අමාත්‍යාංශය මඟින් කෙරෙමින් පවතී.

(ආ) (i) පරිසර අමාත්‍යාංශයේ විෂය පථයට අදාළ නොවේ.

(ii) පරිසර අමාත්‍යාංශයේ විෂය පථයට අදාළ නොවේ.

(ඇ) ඉඩම් අත් පත් කර ගැනීමේ පනත යටතේ අත් පත් කර ගත යුතු බැවින්, අත් පත් කර ගැනීමේ යෝජනා ඉඩම් අමාත්‍යාංශය වෙත යවා ඇත. දැනට 2 වගන්තිය යටතේ ප්‍රගමණ අනුරේඛණ සකස් කරමින් පවතී.

එසේම එම ඉඩම් 38 (අ) වගන්තිය යටතේ අත් පත් කර ගන්නා ලෙස ඉඩම් අමාත්‍යාංශයෙන් ඉල්ලා යවා ඇත.

(ඈ) පැන නොනඟී.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගරු ඇමතිතුමනි, මේ වන විට මේ සිංහරාජ වනාන්තරයට අයත් ඉඩම්වලින් විශාල ප්‍රමාණයක හෝටල් ඉදි කෙරෙමින් පවතිනවා. ඒ හෝටල් ඉදි කිරීම් සම්බන්ධව විශාල මහ ජන උද්ඝෝෂණ පැවැත්වූවත්, උසාවි මඟින් නඩු තීන්දු අරගෙන තිබුණත්, මේ වන තුරුත් ඒ ක්‍රියාකාරකම් නැවැත්වීම සඳහා කිසිම

[ගරු දයාසිරි ජයසේකර මහතා]

ක්‍රියාමාර්ගයක් අරගෙන නැහැ. මේ සිංහරාජ වනාන්තරය අපට තිබෙන ලෝක උරුමයක්. ඒ විතරක් නොවෙයි, වැසි වනාන්තරවලට අදාළව අපේ රටේ ජලය ඉතුරු කර ගන්න තිබෙන ප්‍රධාන මාර්ගයක් විධියටත් අපි සලකන දෙයක්. ඒ නිසා අනවසර ලෙස ඉදි කර තිබෙන මේ හෝටල් සංකීර්ණ සම්බන්ධව ගන්න පියවර කුමක්ද කියලා මම ඔබතුමාගෙන් දැන ගන්න කැමැතියි.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ ප්‍රශ්නය මම ඇමතිතුමාට යොමු කරන්නම්. ඒ වාගේම මම සඳහන් කරන්න ඕනෑ, සිංහරාජය කියන්නේ අපේ රටට සහ අපේ පැවැත්මට තිබෙන වටිනාම වස්තුවක් කියලා. ඒ නිසා කිසිම පුද්ගලයෙකුට මේ පැවැත්ම හෝ මේ වටිනා වස්තුව විනාශ කිරීමට අපි අනුබලයක් දෙන්නේ නැහැ. රටේ නීතිය, අධිකරණයේ නීතිය ක්‍රියාත්මක කරන්න අප බැඳී සිටිනවා.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
මම ඔබතුමාගෙන් ඉල්ලුවේ තවමත් ඒවා ක්‍රියාත්මක වෙමින් පවතිනවා, ඒක නවත්වන්න ඕනෑ කියන එකයි.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
අධිකරණය නඩු අහන වේගය අනුව තමයි තීන්දුව ප්‍රකාශයට පත් වන්නේ. රටේ නීතියට මටයි, ඔබටයි ඇඟිලි ගහන්න බැහැ. ඔබට අධිකරණයේ පෙනී හිටින්න පුළුවන්. මට පෙනී හිටින්නත් බැහැ.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
දෙවැනි අතුරු ප්‍රශ්නය.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
මා ඊ ළඟට අහන ප්‍රශ්නය මේකයි ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ගරු ඇමතිතුමනි, ඔබතුමා කිව්වා, උසාවියට ඉහළින් කාටවත් ඉන්න බැහැයි කියා.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
බැහැ.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
දැන් මේ නකල්ස් රක්ෂිතයේ, තුන් දෙනෙක් - එක් කෙනෙක්-

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
කොහේද?

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
2011.01.16 වන දින "ලංකා" පත්‍රයේ පළමුවන පිටුවේ බොහොම පැහැදිලිව සඳහන් වෙනවා, නකල්ස් රක්ෂිතයේ අනවසර ලෙස -

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
නකල්ස්. ඒක වෙනත් වනාන්තරයක්.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ඒක තමයි. මා කිව්වේ, වන සංරක්ෂණය සම්බන්ධවමයි.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ඒක වෙනත් වනාන්තරයක්.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
මා දන්නවා. ඒක වෙනත් වනාන්තරයක් කියා මා දන්නවා.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
It has nothing to do with the Sinharaja.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ඔබතුමා මතු කළ කාරණයත් එක්කයි මා කියන්නේ. ඔබතුමා කිව්වා, උසාවියට ඉහළින් කාටවත් ඉන්න විධියක් නැහැයි කියලා. "ලංකා" පත්‍රයේ බොහොම පැහැදිලිව තිබෙනවා, -

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ඔබතුමා අහන්නේ සිංහරාජය ගැනයි.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
මන්ත්‍රීතුමා දැන් ඊ ළඟ අතුරු ප්‍රශ්නය අහන්න.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, -

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
මා ඇමතිතුමාගේ අවධානයට ගෙනෙන්නම්. [බාධා කිරීම්]

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
පරිසර ඇමතිත් නැත්නම්, නියෝජ්‍ය ඇමතිත් නැත්නම්, ජ්‍යෙෂ්ඨ ඇමතිත් නැත්නම් ඉන්න කවුරු හෝ ඇමති කෙනෙක් ආණ්ඩුව වෙනුවෙන් මේකට පිළිතුරු දෙන්නට එපායැ. ඒ තුන් දෙනාගෙන් එක් කෙනකුට උදේට මේ ගරු සභාවට එන්න කියන්න.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
හිටපු ඇමතිතුමාත් ඉන්නවා.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ඇමතිවරු ඉන්නවා. නකල්ස් රක්ෂිතයටත් එක් කෙනකු ඉන්නවා. ගස් බලා ගන්නත් එක් කෙනකු ඉන්නවා. කොළ කඩන්නත් එක් කෙනකු ඉන්නවා.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමා, කරුණාකර මේ ප්‍රශ්නයට අදාළව අතුරු ප්‍රශ්නය අහන්න.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
මේ වන සංරක්ෂණය. පරිසර අමාත්‍යතුමාගෙන් මා මේ ප්‍රශ්නය අහන්නේ. ඔබතුමාගෙන් මා අහන්න කැමතියි, - [බාධා කිරීමක්] අනේ! ඉන්න කෝ. කලබල වන්න එපා. පොඩ්ඩක් ඉන්නකෝ.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
මට අදාළ නැහැ, මේ ප්‍රශ්නය. මේ අතුරු ප්‍රශ්නය අහන්නේ නකල්ස් ගැනයි. සිංහරාජය කියන්නේ ලංකාවේ වෙන තැනක්. [බාධා කිරීම්]

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගරු ඇමතිතුමනි, මා අහන්නේ ඒකයි.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ඔබතුමා තවම අහන්නේ තුන්වන අතුරු ප්‍රශ්නයද?

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
දෙවන අතුරු ප්‍රශ්නය තවම අහගෙන යනවා.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
දෙවන අතුරු ප්‍රශ්නය අහලා දැන් උත්තරය දුන්නා.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
නැහැ. ඒ පළමුවන අතුරු ප්‍රශ්නයටයි.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
නැහැ. නැහැ. දෙවන අතුරු ප්‍රශ්නයටයි.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
හොඳයි. තුන්වන අතුරු ප්‍රශ්නය අහන්නම්.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
තුන්වන අතුරු ප්‍රශ්නය මොකක්ද?

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
දෙවන අතුරු ප්‍රශ්නය මේකයි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. "ලංකා" පත්‍රයේ බොහොම පැහැදිලිව තිබෙනවා, ගුවන් හමුදාපති එයාර් චීෆ් මාර්ෂල් රොෂාන් ගුණතිලක මැතිතුමාගේ සුදාගල වත්ත ප්‍රදේශයෙහි එක් හෝටලයක් හදනවා කියා. ඒක සාදා නිම කර තිබෙනවා. ශ්‍රීලංකන් ගුවන් සමාගමේ අධ්‍යක්ෂවරයකුට අයත් තවත් හෝටලයක් පිටවලයාය ප්‍රදේශයෙහි ඉදි වෙමින් පවතිනවා. ඉළුක්කුඹුර, තෙලිගමුව -

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමා, මේ අවස්ථාව උපයෝගී කර ගෙන වෙන කරුණු ඉදිරිපත් කිරීමක් හෝ කථාවක් පවත්වන්න යන්න එපා.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
නැහැ. නැහැ.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
මේ අහපු ප්‍රශ්නයට අදාළව අතුරු ප්‍රශ්නයක් තිබෙනවා නම් ඒ පිළිබඳව අහන්න.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා අහන්නේ, මේ ප්‍රශ්නයට අදාළ කාරණයක්. මා වෙන දෙයක් කියන්නේ නැහැ. මේක වැරදි නම් මේකට විරුද්ධව නඩු පවරන්න පුළුවන්. කිසි ගැටලුවක් නැහැ. තුන්වන එක තෙලිගමුව ඔය අසල කුඹුරක ඇමති ෆීලික්ස් පෙරේරා මැතිතුමාට අයත් හෝටලයක්ද ඉදි වෙමින් පවතිනවා. මා කියන්නට කැමැතියි, - [බාධා කිරීම්] මේ පත්‍රයේ තිබෙන එක වැරදි නම් කියන්න. මේ රටේ උසාවියටත් උඩින් ඉන්න කවුරුන් හෝ ඇමතිවරයකු ඉන්නවාද කියා මා අහන්න කැමතියි.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමනි, ගරු ෆීලික්ස් පෙරේරා ඇමතිතුමාගේ නම සඳහන් වුණු නිසා එතුමාට මේ පිළිබඳව පැහැදිලි කිරීමට අවස්ථාවක් ලබා දිය යුතුයි.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
එතුමා හොඳ පුද්ගලයෙක්. එතුමා හඳනවා නම් හරියට -

**ගරු ෆීලික්ස් පෙරේරා මහතා (සමාජ සේවා අමාත්‍යතුමා)**
(மாண்புமிகு பீலிக்ஸ் பெரேரா - சமூக சேவைகள் அமைச்சர்)
(The Hon. Felix Perera - Minister of Social Services)
ඔබතුමා මේ ප්‍රශ්නය ඇසීම ගැන මා ඉතාමත්ම ස්තුතිවන්ත වෙනවා. ඒ වාගේම පසු ගිය සතියේ "ලංකා" පත්‍රයේ තිබුණා, ෆීලික්ස් පෙරේරා සහ සමාගම -මටද මා දන්නේ නැහැ. ඒ සමාගම මගේ පවුලේ අයගේ.- නකල්ස් රක්ෂිතය ළඟ හෝටලයක් හදනවාය කියා. අමූලික අසත්‍යයක්. මා ඒ පත්‍රයට පැහැදිලි කිරීමක් කරලා තිබෙනවා. පර්චස් 57ක සින්නක්කර ඉඩමක් තිබෙනවා. හදලා නැහැ. දැන් ගිහින් බලන්න. ගරු මන්ත්‍රීතුමාට මම අභියෝග කරන්නේ නිකම් නොවෙයි; මගේ ඇමතිකමත් එක්කයි. මේ ඇමතිකමත් පරදුවට තියලායි කියන්නේ. ගිහින් බලන්න. අඩු තරමේ ගඩොලක්වත් තිබෙනවා නම්, ගරු නියෝජ්‍ය කථානායකතුමනි, හෙට ප්‍රසිද්ධියේ ඔබතුමාට මගේ ඉවත් වීම දීලා මා ගෙදර යන්න කැමැතියි. ඊට වඩා කැප කිරීමක් කරන්න ඕනෑ නැහැ නේ. [බාධා කිරීම්] එම නිසා අසත්‍ය ප්‍රකාශ කරන්නට එපා.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, -

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
දැන් ඔබතුමාට උත්තරය ලැබුණා.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
එතුමාට මා ස්තුතිවන්ත වනවා.

**ගරු ෆීලික්ස් පෙරේරා මහතා**
(மாண்புமிகு பீலிக்ஸ் பெரேரா)
(The Hon. Felix Perera)
අසත්‍ය ප්‍රකාශ කරන්න එපා.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
එතුමාට මා ස්තුතිවන්ත වනවා.

**ගරු ෆීලික්ස් පෙරේරා මහතා**
(மாண்புமிகு பீலிக்ஸ் பெரேரா)
(The Hon. Felix Perera)
ඉන්න. පොඩ්ඩක් ඉන්න.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
එතුමාට මා ස්තුතිවන්ත වනවා.

**ගරු ෆීලික්ස් පෙරේරා මහතා**
(மாண்புமிகு பீலிக்ஸ் பெரேரா)
(The Hon. Felix Perera)
මේ සේරම ප්‍රලාප කියන අය ඉන්නවා. කයිවාරු ගහන අයත් ඉන්නවා. අප කළොත් හය නැතිව කියනවා, අපි කළාය කියලා. නොකෙරුවොත්, නොකෙරුවාය කියනවා. හැබැයි නොකරන දේවලට කෙරුවාය කිව්වාම ඒ වෙනුවෙන් දිවි හිමියෙන් සටන් කරන්නත් අපි ලැස්තියි.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
බොහොම ස්තුතියි. මා එතුමාට මගේ ගෞරවය පිරි නමනවා. මොකද, එතුමා තමන්ගේ ඇමතිකමත් පරදුවට තියා ඒ ප්‍රකාශය කිරීම ගැන. දැන් තිබෙන හැටියට ඇමතිකම ගඩොලක් තරම්වත් වටින්නේ නැහැ. එම නිසා මා එතුමාට ස්තුතිවන්ත වනවා.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
බොහොම ස්තුතියි, ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා.

## "ගම නැඟුම" ව්‍යාපෘතිය යටතේ කුඩා වැව් සංවර්ධනය: පුත්තලම දිස්ත්‍රික්කය
"கமநெகும" கருத்திட்டத்தின்கீழ் சிறு வாவிகள் அபிவிருத்தி: புத்தளம் மாவட்டம்
DEVELOPMENT OF SMALL TANKS UNDER "GAMA NEGUMA" PROJECT : PUTTALAM DISTRICT

0846/'10

**14. ගරු වික්ටර් ඇන්ටනි මහතා**
(மாண்புமிகு விக்டர் அந்தனி)
(The Hon.Victor Antony)
ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය- (1):

(අ) (i) "ගම නැඟුම" ව්‍යාපෘතිය යටතේ, පුත්තලම් දිස්ත්‍රික්කයේ කුඩා වැව් සංවර්ධනය කිරීමට වෙන් කර ඇති මුදල කොපමණද;

(ii) සංවර්ධනය කරනු ලබන වැව්වල නම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මෙම ව්‍යාපෘතිය යටතේ, පුත්තලම් දිස්ත්‍රික්කය තුළ කුඩා වැව් සංවර්ධනය කිරීම සඳහා අනුමතිය ලබා ගැනීමට ප්‍රාදේශීය ලේකම්, ගොවිජන සේවා නිලධාරී, ගොවිජන සේවා සහකාර කොමසාරිස් හා ගොවිජන සේවා දෙපාර්තමේන්තුවේ ගොවිජන සේවා අධ්‍යක්ෂ ජනරාල් වෙත යොමු කර ඇති බවත්;

(ii) අනුමතිය ලබා ගැනීමේ එම දීර්ඝ ක්‍රියාදාමය නිසා වැව් ප්‍රතිසංස්කරණය කරනු ලබන ගොවි සංවිධානවලට වැසි කාලයට පෙර නියමිත පරිදි තම කටයුතු අවසන් කිරීමට නොහැකිව මහත් අසීරුතාවලට මුහුණ දීමට සිදු වන බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ඇ) (i) කුඩා වැව් සංවර්ධන ව්‍යාපෘති ගොවිජන සේවා නිලධාරී සහ ප්‍රාදේශීය ලේකම් මඟින් පමණක් නිර්දේශ කර ගොවි සංවිධානවලට ලබා දීමටත්;

(ii) එමඟින් සති 2ක් වැනි සුළු කාලයක් තුළ මෙම කුඩා වැව් යෝජනා ක්‍රියාත්මක කළ හැකි කාර්යක්ෂම වැඩ පිළිවෙළක් සැකසීමටත්;

පියවර ගන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නො එසේ නම්, ඒ මන්ද?

பொருளாதார அபிவிருத்தி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) கமநெகும கருத்திட்டத்தின் கீழ் புத்தளம் மாவட்டத்தில் சிறு வாவிகளை அபிவிருத்தி செய்வதற்கு ஒதுக்கப்பட்டுள்ள பணத்தொகை எவ்வளவென்பதையும்,

(ii) அபிவிருத்தி செய்யப்படும் வாவிகளின் பெயர்கள் யாவையென்பதையும்

என்பதை அவர் அறிவிப்பாரா?

(ஆ) (i) இக்கருத்திட்டத்தின் கீழ் புத்தளம் மாவட்டத்தில் சிறு வாவிகளை அபிவிருத்தி செய்வதற்கான அனுமதியைப் பெற்றுக்கொள்வதற்கு பிரதேச செயலாளர், கம நல சேவை உத்தியோகத்தர், கமநல சேவை உதவிப் பணிப்பாளர் மற்றும் கமநல சேவைத் திணைக்களத்தின் கமநல சேவை ஆணையாளர் நாயகம் ஆகியோருக்கு ஆற்றுப்படுத்தப்பட்டுள்ளதென்பதையும்,

(ii) அனுமதியைப் பெற்றுக்கொள்வதற்கான நீண்ட செயற்பாடு காரணமாக வாவிகளை மறுசீரமைக்கும் விவசாய அமைப்புக்களுக்கு மழை காலத்துக்கு முன்பு உரிய விதத்தில் தமது நடவடிக்கைகளை நிறைவு செய்துகொள்ள முடியாமல் பெரும் அசௌகரியங்களை எதிர்காள்ள நேரிடுகின்றதென்பதையும்

அவர் ஏற்றுக்கொள்வாரா?

(இ) (i) சிறிய குளங்களுக்கான அபிவிருத்திக் கருத்திட்டங்களை, கமநல சேவைகள் அதிகாரி மற்றும் பிரதேச செயலாளர் மூலம் மாத்திரம் பரிந்துரை பெற்று, விவசாய அமைப்புக்களுக்கு பெற்றுக் கொடுக்கவும்,

(ii) அதன் மூலம் இரண்டு வார சிறு கால எல்லைக்குள் இச்சிறு குளங்கள் அபிவிருத்தித் திட்டங்களை அமுல்படுத்த முடியுமான வேலைத்திட்டம் ஒன்றை மேற்கொள்ளவும்

அவர் நடவடிக்கை எடுப்பாரா என்பதை இச்சபைக்கு அறிவிப்பாரா?

(ஈ) இன்றேல், ஏன்?

asked the Minister of Economic Development:

(a) Will he state -

(i) the amount of money allocated under the "Gama Neguma" Project for the development of small tanks in the Puttalam District; and

(ii) the names of the tanks that are being developed?

(b) Will he admit that-

(i) under this project, approval has been sought from the Divisional Secretary, the Agrarian Services Officer, the Additional Commissioner of Agrarian Services and the Director General of Agrarian Services of the Department of Agrarian Services to develop small tanks in the Puttalam District; and

(ii) the farmer organizations that are involved in rehabilitating tanks are immensely inconvenienced as they are unable to complete their work as planned before the rainy season, owing to this long procedure in obtaining approval?

(c) Will he inform this House whether he will take steps to-

(i) arrange for the approval for the development of small tanks be given to the farmer organizations only upon the recommendations of the Divisional Secretary and the Agrarian Services Officer; and

(ii) implement an effective programme through which these small tanks development schemes can be carried out within a short period as two weeks?

(d) If not, why?

**ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා (ආර්ථික සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා)**

(மாண்புமிகு லக்ஷ்மன் யாப்பா அபேவர்தன - பொருளாதார அபிவிருத்தி பிரதி அமைச்சர்)

(The Hon. Lakshman Yapa Abeywardena - Deputy Minister of Economic Development)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ආර්ථික සංවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දෙනවා.

(අ) ( i) 2009 - රුපියල් මිලියන 3,500කි.

2010 - රුපියල් මිලියන 15,000කි.

(ii) 2009 - ඇමුණුම 01 නාම ලේඛනය.

2010 - ඇමුණුම 02 නාම ලේඛනය. ඇමුණුම් **සභාගත*** කරනවා. ඔබතුමාට අවශ්‍ය නම් මා එහි කරුණු පැහැදිලි කරන්නම්.

හලාවත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පරප්පන්මුල්ල වැව ප්‍රතිසංස්කරණය කිරීමට රජයේ සම්පූර්ණ දායකත්වය ලබා දීලා තිබෙනවා; රුපියල් 5,90,083.92ක් ලබා දීලා. මාදම්පේ, තඹගල්ල ඉහළ වැව ප්‍රතිසංස්කරණය කිරීමට රුපියල් 2,93,819.60ක්ද, නවගත්තේගම, රඹකනයාගම, කොන්වැව ප්‍රතිසංස්කරණය කිරීමට රුපියල් 3,02,435.28ක්ද, මහකුඹුක්කඩවල, දංගස්වැව ග්‍රාම නිලධාරි වසමේ, ඌරු ළිඳ වැව ප්‍රතිසංස්කරණය කිරීමට රුපියල් 4,01,418.61ක්ද, මහකුඹුක්කඩවල, කරුංගාලි වැව ප්‍රතිසංස්කරණය කිරීමට රුපියල් 6,08,833.27ක්ද, කරුවලගස්වැව, ඉපලෝගම ග්‍රාම සේවක වසමේ, කොන්වැටියාව වැව ප්‍රතිසංස්කරණය කිරීමට රුපියල් 6,24,807.00ක්ද, ආණමඩුවේ, ඉහළ උඩත්තන්කුලම වැව ප්‍රතිසංස්කරණය කිරීමට රුපියල් 5,07,792.21ක්ද අපි වියදම් කර තිබෙනවා.

(ආ) (i) හා (ii) නැත. ඇමුණුම 01හි සහ ඇමුණුම 02 හි සඳහන් වැව් ප්‍රතිසංස්කරණය කිරීමට "ගම නැඟුම" වැඩසටහන යටතේ අනුමත කරන ලද සුළු වාරිමාර්ග 169න් 134ක් මේ වන කොට නිම කර ඇත. 27ක් ක්‍රියාත්මක වෙමින් පවතිනවා. තවමත් ආරම්භ කර නොමැති ගණන 08ක් පමණි.

අවිච්ඡේදවලට ගිහිල්ලා අවශ්‍ය නම් ඒවාත් ආරම්භ කරන්න පුළුවන්.

(ඇ) (i) හා (ii) ගොවිජන සංවර්ධන සහකාර කොමසාරිස්වරයාගේ අධීක්ෂණය යටතේ ප්‍රාදේශීය ලේකම්ගේ නිර්දේශ මත ගොවි සංවිධාන මඟින් කුඩා වාරිමාර්ග ප්‍රතිසංස්කරණ යෝජනා ක්‍රම ක්‍රියාත්මක කරන්න අපි උපදෙස් දී තිබෙනවා.

(ඈ) පැන නොනඟී.

***සභාමේසය මත තබන ලද ඇමුණුම්:**
*சபாபீடத்தில் வைக்கப்பட்ட இணைப்பு க்கள்:*
*Annexes tabled :*

ඇමුණුම 01

## ගම නැගුම සංවර්ධන වැඩසටහන -2009

### පුත්තලම දිස්ත්‍රික්කය

### සුළු වාරි මාර්ග ව්‍යාපෘති ලේඛණය

| ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය | ව්‍යාපෘතියේ නම | ග්‍රාම නිලධාරී වසම | රජයේ දායකත්වය රු. | ප්‍රජා දායකත්වය |
|---|---|---|---|---|
| නලාවත | පරප්පන්මුල්ල වැව | පරප්පන්මුල්ල | 590,083.92 | 148,970.32 |
| මාදම්පේ | තඹගල්ල ඉහළ වැව | තඹගල්ල | 293,819.60 | 86,543.34 |
| නවගත්තේගම | රඹකනයාගම කොන්වැව | රඹකනයාගම | 302,435.28 | 78,269.53 |
| මහකුඹුක්කඩවල | ඌරු ළිඳ වැව | දංගස්වැව | 401,418.61 | 100,738.88 |
| මහකුඹුක්කඩවල | කරුංගාලි වැව | කරුංගාලිචෝලේ | 608,833.27 | 165,297.28 |
| කරුවලගස්වැව | කොන්වැටියාව වැව | ඉපලෝගම | 624,807.00 | 133,033.60 |
| ආණමඩුව | ඉහළ උඩත්තන්කුලම | ඌරියාව | 507,792.21 | 144,375.00 |
| එකතුව | | | 3,329,189.89 | 857,227.95 |

ඇමුණුම 2

## ගම නැගුම සංවර්ධන වැඩසටහන - 2010

### පුත්තලම දිස්ත්‍රික්කය

### සුළු වාරිමාර්ග ව්‍යාපෘති ලේඛණය

| අනු-අංකය | ගොවිජන සේවා බල ප්‍රදේශය | ග්‍රාම නිලධාරී වසම | ව්‍යාපෘතියේ නම | ඇස්තමේන්තු මුදල | |
|---|---|---|---|---|---|
| | | | | රජයේ දායකත්වය රු. | ගොවි දායකත්වය රු. |
| 1 | | | රපියෙල්බැම්ම ඇනිකට් | 350,934.76 | 87,733.69 |
| 2 | | 551 උරලිය | උරලිය වැව | 98,588.86 | 24,647.22 |
| 3 | | 557 තඹගල්ල | දියබුබුල වැව | 28,460.01 | 7,115.00 |
| 4 | මාදම්පේ | 545 ඒ - රත්මල් අගාර | රත්මල්අගාර වැව | 49,953.91 | 12,488.48 |
| 5 | | 546 බී - පනිරෙන්ඩාව | ඉහළ පල්ගස් වැව | 81,561.66 | 20,390.41 |
| 6 | | 556 බී - වලානේන | වලානේන වැව | 75,484.09 | 18,871.02 |
| 7 | | 557 ඒ - දෙමටපිටිය | ලුනුවිල වැව | 44,381.46 | 11,095.36 |
| 8 | | 547 මහගම දකුණ | මහගම වැව | 75,645.37 | 18,911.34 |
| 9 | | 549 කුසවිල | මුණමල්වැටිය වැව | 37,474.44 | 9,368.61 |
| 10 | | 568 මුන්නේශ්වරම | කල්ලනායගම් වැව | 74,556.66 | 18,639.17 |
| 11 | මුන්නේශ්වරම | 569 මුගුණුවටවන | මුගුණුවටවන වැව | 83,280.37 | 20,820.09 |
| 12 | | 548 ඒ - පුලියන්කඩවර | පුලියන්කඩවර වැව | 72,694.55 | 18,173.64 |
| 13 | | 579 ඒ - තිඹිල්ල | තිඹිල්ල වැව | 59,730.40 | 14,932.60 |
| 14 | | 569 ඒ - පරප්පන්මුල්ල | පරප්පන්මුල්ල වැව | 65,662.18 | 16,415.54 |
| 15 | | 570 බී - සනත්තව | සනත්තව වැව | 79,924.88 | 19,981.22 |
| 16 | | 587 වැලිපැලැස්ස | වැලිපැලැස්ස සොංගාවිලිය වැව | 79,113.21 | 19,778.30 |
| 17 | රජකඩලුව | 581 ඒ - දෙමටපිටිය | බෝමුවල වැව | 80,521.46 | 20,130.37 |
| 18 | | 592 ඩී - පන්කුලම | බෝගමුව වැව | 139,980.72 | 34,995.18 |
| 19 | | 498 කොස්වත්ත උ/ | තැබඩ වැව | 63,000.00 | 15,750.00 |
| 20 | නාත්/තබ්බෝව | 505 සඳුනන්ගම | බත්මීගහවැව | 58,496.86 | 14,624.21 |
| 21 | | 500 ඒ සවිචිරව | රත්මල්මිය ඇනිකට් | 33,806.72 | 8,451.68 |
| 22 | | 507 ඒ මයිලෑව | බත්මීගහවැව | 70,115.67 | 17,528.92 |
| 23 | | 517 මුට්ටිබෙන්ඩිවල | වැලි බැම්ම ඇනිකට් | 539,466.74 | 134,866.69 |
| 24 | | 520 මැදගොඩ | එගොඩපිටිය ඇනිකට් | 78,688.00 | 19,672.00 |
| 25 | කුඩාවැව | 521 හැවන | වැරැල්ලගම වැව | 115,360.90 | 28,840.22 |
| 26 | | හට්ටිනිය | හට්ටිනිය වැව | 58,779.55 | 14,694.89 |
| 27 | | 525 හාල්පන්විල උ/ | මිනි වැව | 40,505.02 | 10,126.26 |
| 28 | | 459 යෝගියාන | බත්මීගහ ඇනිකට් | 41,303.90 | 10,325.98 |
| 29 | | 462 ලිහිරියාගම | ලිහිණියාගම ඇනිකට් | 117,026.37 | 29,256.58 |
| 30 | | 463 මල්ලුව | හාගහසඩ ඇනිකට් | 91,449.72 | 22,862.43 |
| 31 | හල්දඩුවන | 464 පොකුවටවන | පස්ඇල අසල ඇනිකට් | 68,000.64 | 17,000.00 |
| 32 | | 470 බුජ්ජම්පොල | හාලින්ද ඇනිකට් | 75,942.99 | 18,985.75 |
| 33 | | 459 ඒ - ජන්කුරවල | ජන්කුරවල වැව | 192,901.97 | 48,225.49 |
| 34 | | 464 ඒ - තුන්දිරාපොල | සුසානභූමිය අසල ඇනිකට් | 137,563.26 | 34,390.81 |
| 35 | | 464 බී - කහටවිල බ/ | කහුකැටිය ඇනිකට් | 236,709.10 | 59,177.28 |
| 36 | | | කුම්බෝද්ර ඇනිකට් | 92,955.47 | 23,238.87 |
| 37 | | 466 ඩී - සිරිමැටියාන උ/ | මැද ඇළ ඇනිකට් | 72,323.20 | 18,080.80 |
| 38 | | | හේරත්ගේ වෙළ ඇනිකට් | 59,178.84 | 14,794.71 |
| 39 | හල්දඩුවන | | මළ පාලුව ඇනිකට් | 62,958.56 | 15,739.64 |
| 40 | | | මැද ඇළ මැද ඇනිකට් | 46,137.95 | 11,534.49 |
| 41 | | 469 ඒ - මොහොට්ටිමුල්ල | මොහොට්ටිමුල්ල ඇනිකට් | 56,894.31 | 14,223.58 |
| 42 | | 471 ඒ - ඇටියාවල ද/ | සමුදුරා ඇනිකට් | 31,313.34 | 7,828.34 |
| 43 | | 475 ඒ - කටුකෙන්ද බ/ | කටුකෙන්ද ඇළ ඇනිකට් | 42,610.40 | 10,652.60 |
| 44 | මදුරන්කුලිය | | රත්මල් අගාර වැව | 92,295.88 | 23,073.97 |
| 45 | | 610 සී - ඉරට්ටහිවිල්ලුව | පල්ලිවාසල් වැව | 58,413.19 | 14,603.30 |
| 46 | වනාතවිල්ලුව | 636/3 ජයපුර හැ/ | කුඩා තම්මැන්නාව වැව | 91,015.82 | 22,753.95 |
| 47 | | | පහන් වැව | 110,714.41 | 27,678.60 |
| 48 | | 614 මෙල්ලන්කුලම | සල්මා වැව | 63,478.12 | 15,869.53 |
| 49 | ආණමඩුව | 652 ආලන්කුලම | බොල්පනාව වැව | 20,201.68 | 5,050.42 |
| 50 | | | ආලන්කුලම වැව | 99,155.84 | 24,788.96 |
| 51 | | 653 කරඹෑව | කරඹෑ/සියඹලාවැව | 13,332.44 | 3,333.11 |
| 53 | | | මහ තම්මැන්නාව | 155,357.29 | 38,839.32 |
| 54 | | | කොන්ගහ වැව | 57,767.04 | 14,441.76 |
| 55 | | 657 වඩත්ත | වදුත්ත ඇනිකට් | 195,985.84 | 48,996.46 |
| 56 | | | රඹේ යාය වැව | 75,275.23 | 18,818.81 |
| 57 | | 659 වඩිගමන්ගාව | කොටු වැව | 68,924.31 | 17,231.08 |
| 58 | | 649 ඒ - විහාරගම | හල්මිල්ලෑව කුඩා වැව | 44,629.10 | 11,157.28 |
| 59 | | | රත්මල්ගහ ඇනිකට් | 51,025.84 | 12,756.46 |
| 60 | | 649 බී - කොට්ටුකච්චිය | ගල්කුලම නවදැල්ල | 64,491.01 | 16,122.75 |
| 61 | | 650 බී - උරියාව | අන්දර වැව | 113,654.18 | 28,413.55 |
| 62 | | | මොරන්කුලම වැව | 164,794.02 | 41,198.51 |
| 63 | | 650 ඩී - පැලියගම | සෙම්බාගම වැව | 38,405.12 | 9,601.28 |
| 64 | | | රඹෑ වැව | 89,179.87 | 22,294.97 |
| 65 | | 653 ඒ - කල්ගස්වැව | වැට්ටේගෙදර වැව | 18,992.06 | 4,748.01 |
| 66 | | 653 බී - ගල්ලෑව | හුරු වැව | 17,480.67 | 4,370.17 |
| 67 | | | ගල්ලෑව වැව | 60,697.70 | 15,174.42 |
| 68 | ආණමඩුව | 653 සී - පේරියකුලම | පෙරියාකුලම මහ වැව | 147,700.90 | 36,925.22 |
| 69 | | | කුන්නාහියාගම වැව | 69,984.71 | 17,496.18 |
| 70 | | | කුඹුරු වැව | 104,759.64 | 26,189.81 |
| 71 | | 653 ඩී - බම්මන්නේගම | පහළ උස්කුව වැව | 23,367.78 | 5,841.94 |
| 72 | | | පලුගහ වැව | 147,261.92 | 36,815.48 |
| 73 | | | ඉහළ උස්කුව වැව | 64,050.45 | 16,012.61 |
| 74 | | 656 සී - පෙරමකුට්ටුව | රත්මල්ගහ වැව | 102,411.73 | 25,602.93 |
| 75 | | 657 ඒ - සියඹලාගස්හේන | කුරුඳු මොට්ටැව වැව | 57,453.48 | 14,363.37 |
| 76 | | 659 ඒ - දානපාලය | මිරියාගම්කුඩ වැව | 78,769.02 | 19,692.26 |
| 77 | | | කොන්ගහ වැව | 69,900.36 | 17,475.09 |
| 78 | | | සියඹලාගස්ලන්ද වැව | 75,899.50 | 18,974.88 |
| 79 | | 659 බී - උප්පලාවත්ත | තබ්බෑව වැව | 72,265.34 | 18,066.34 |
| 80 | | | හිරිගොල්ලාගම වැව | 13,186.74 | 3,296.69 |
| 81 | | 661 ඒ - සංගට්ටිකුලම | ගොම වැව | 19,440.00 | 4,860.00 |
| 82 | | | තම්මැන්නාව වැව | 35,104.29 | 8,776.07 |
| 83 | | | සිංහල තලගම වැව | 417,020.83 | 104,255.21 |
| 84 | | | අලුත් වැව | 22,712.28 | 5,678.07 |
| 85 | | 613 කවයන්කුලම | වැටියේ වැව | 104,690.80 | 26,172.70 |
| 86 | | 658 ගරායක්ගම | පුරක්කුලම වැව | 20,722.05 | 5,180.51 |
| 87 | | 611 ඒ - කරුවලබැද්ද | සියඹලාගහපිටිය වැව | 21,133.39 | 5,283.35 |
| 88 | | | අත්තනපොල වැව | 124,618.23 | 31,154.56 |
| 89 | | 611 ඩී - මහ සෙම්බුකුලිය | මැදගස් වැව | 39,406.97 | 9,851.74 |
| 90 | | 612 ඒ - ආඩිගම | ආඩිගම වැව | 36,682.84 | 9,170.71 |
| 91 | | 612 බී - ගල්කුලිය හැ/ | නැසති හල්මිල්ල වැව | 145,945.24 | 36,486.31 |
| 92 | | 612 ඩී - පුනාවිටිය | පඩියාමඩුව වැව | 113,911.68 | 28,477.92 |
| 93 | මහකුඹුක්කඩවල | 613 බී - මහකුඹුක්කඩවල | අංග හැව | 13,762.34 | 3,440.59 |
| 94 | | 613 සී - සෙම්බුකුලිය | රණවිරා වැව | 49,348.80 | 12,337.20 |
| 95 | | 613 ඊ - දංගස්වැව | පන්සල් වැව | 163,605.26 | 40,901.32 |
| 96 | | 614 බී - සිවුල තරුණ | සිවුල නො.26 වැව | 169,471.04 | 42,367.76 |
| 97 | | | නො.3 වැව | 142,854.85 | 35,713.71 |
| 98 | | 614 එෆ් - සිවුල නො.3 | මැද වැව | 48,558.66 | 12,139.67 |
| 99 | | 658 ඒ - වල්පාලුව | කරලෑව වැව | 44,501.27 | 11,125.32 |
| 100 | | | කෝරගහයාය වැව | 71,248.80 | 17,812.20 |
| 101 | | | කුඩා වැව | 134,757.96 | 33,689.49 |
| 102 | | 591 සී - තමරක්කුලම | පහළ වැව | 67,075.17 | 16,768.79 |
| 103 | | | හල්මිල්ගස් වැව | 47,625.36 | 11,906.34 |
| 104 | | 662 ඒ - කම්මන්දලුව | දෙමළපුරක්කුලම වැව | 35,249.88 | 8,812.47 |
| 105 | සේරුකැලේ | | ඉහළ වැව | 81,733.31 | 20,433.33 |
| 106 | | 662 සී - සියඹලාගස්වැව | ලිංකැටි වැව | 56,300.83 | 14,075.21 |
| 107 | | | අරසන් වැව | 48,593.28 | 12,148.32 |
| 108 | | 662 ඩී - සේරුකැලේ | වදුරැස්ස කොටුව වැව | 54,046.28 | 13,511.57 |
| 109 | | 663 ඒ - මඩවක්කුලම | වරා වැව | 60,919.24 | 15,229.81 |
| 110 | සේරුකැලේ | 663 බී - වැටිය | වැටිය වැව | 68,688.00 | 17,172.00 |
| 111 | | 643 මොරගහ වැව | සිවුල වැව | 64,795.36 | 16,198.84 |
| 112 | | | කුඩා දොඩන්අත්තේ වැව | 46,115.12 | 11,528.78 |
| 113 | | | මොරගහ වැව | 100,568.26 | 25,142.06 |
| 114 | | 644 සිරිමැටියාව | අලුත් වැව | 60,712.67 | 15,178.17 |
| 115 | | 646 තම්මැන්නාවැටියාව | තම්මැන්නාවැටියාව වැව | 75,981.29 | 18,995.32 |
| 116 | නවගත්තේගම | 643/1 මහ මැද්දුව | මැද්දෑව වැව | 132,616.15 | 33,154.03 |
| 117 | | | රළපනාව වැව | 82,346.37 | 20,586.59 |
| 118 | | | වගයාමඩුව වැව | 253,801.29 | 63,450.24 |
| 119 | | 644/3 මියැල්ලෑව | ආවිරිගම වැව | 103,484.69 | 25,871.17 |
| 120 | | 644/3 මියැල්ලෑව | සංගක්කුලම වැව | 307,461.23 | 76,865.30 |
| 121 | | 645/3 මුල්ලේගම | මුල්ලේගම වැව | 95,483.44 | 23,870.86 |
| 122 | | 640 මුරුක්කුවටවන | වෙහෙරගල වැව | 119,369.16 | 29,842.29 |
| 123 | | 648 පලිගම | නෙලිවැව මහ වැව | 122,926.00 | 30,731.50 |
| 124 | | | පලිගම වැව | 66,034.76 | 16,508.69 |
| 125 | පුත්/තබ්බෝව | 640 එෆ් - තබ්බෝව ද/ | බොරපත්තැහැ වැව | 72,503.68 | 18,125.92 |
| 126 | | 648 ඒ - එගොඩපිටිය | පන්සල් වැව | 112,756.60 | 28,189.15 |
| 127 | | | තම්මැන්නාව වැව | 148,910.68 | 37,227.67 |
| 128 | | | ජයන්ති වැව | 115,311.10 | 28,827.77 |
| 129 | | 639 ඉ/පුලියන්කුලම | දෙමට වැව | 38,905.36 | 9,726.34 |
| 130 | | | බෙන්දුරු වැව | 64,711.84 | 16,177.96 |
| 131 | | 638 ඒ - සාලියවැව | දිවුල් වැව | 164,996.08 | 41,249.02 |
| 132 | | 638 ඩී - මුණමල්ගස්වැව | ගල්ලෑව වැව | 64,700.56 | 16,175.14 |
| 133 | | | ගල්ලෑව වැව (ගංවතුරින් හානිවූ) | 104,000.00 | 26,000.00 |
| 134 | | | මුණමල්ගස් වැව | 140,606.26 | 35,151.57 |
| 135 | | | කොටු වැව | 66,955.62 | 16,738.90 |
| 136 | | 639 ඩී - පලුගස්සේගම | කුරටියාව වැව | 117,661.55 | 29,415.39 |
| 137 | | | ලුණු වැව | 66,865.49 | 16,716.37 |
| 138 | | | කහටගස් වැව | 131,037.43 | 32,759.36 |
| 139 | | | මල් අස්න ගල වැව | 74,252.88 | 18,563.22 |
| 140 | | 639 ඒ - අලුත්ගම | බෝගහ වැව | 63,971.46 | 15,992.87 |
| 141 | | | පනස්සා වැව | 49,503.83 | 12,375.96 |
| 142 | ඉහළ පුලියන්කුලම | | සිරිසරවත්ත වැව | 42,414.75 | 10,603.69 |
| 143 | | 642 ඒ - රඹෑවැව | වීර වැව | 41,465.92 | 10,366.48 |
| 144 | | | 05 කණුව ඇනිකට් | 77,026.91 | 19,256.73 |
| 145 | | | ඉහළ රළපනාව වැව | 102,775.20 | 25,693.80 |
| 146 | | 642 ඩී - වීරපුර | දිනකර වැව | 132,346.08 | 33,086.52 |
| 147 | | | වීර වැව | 74,467.83 | 18,616.96 |
| 148 | | | පියංකර වැව | 98,057.26 | 24,514.31 |
| 149 | | 638 ප/පුලියන්කුලම | කඩවත වැව | 115,011.00 | 28,752.75 |
| 150 | | | පලුගහ වැව | 66,373.44 | 16,593.36 |
| 151 | | 639 සී - පහරිය | කුඩා පහරිය වැව | 635,649.36 | 158,912.34 |
| 152 | | 642 බී - කුඹුක්වැව | අලුත් වැව | 45,024.49 | 11,256.12 |
| 153 | | | කුඩා දඹගස් වැව | 61,949.54 | 15,487.38 |
| 154 | | | කුඩා අලුත්ගම වැව | 430,510.61 | 107,627.65 |
| 155 | | 642 ඉපලෝගම | ගාල වැව | 238,376.62 | 59,594.15 |
| 156 | | 606 මානතිව් | විලුක වැව | 115,176.00 | 28,794.00 |
| 157 | | | පෙරියසලන්තල් වැව | 63,491.86 | 15,872.97 |
| 158 | පුත්තලම | | මට්ටුවැලි වැව | 55,273.38 | 13,818.34 |
| 159 | | 615 සී - නෙලුම් වැව | නෙලුම් වැව | 43,750.43 | 10,937.61 |
| 160 | | | තඹරකුලම වැව | 64,757.87 | 16,189.47 |
| 161 | | 615 සෙල්ලන්කන්ඩල් | මහවේලිය වැව | 92,552.04 | 23,138.01 |
| | | | | 15,341,827.70 | 3,835,456.59 |

වැඩ ආරම්භ කර නොමැති ව්‍යාපෘති

| අනු අංකය | ගොවිජන සේවා බල ප්‍රදේශය | ග්‍රාම නිලධාරි වසම | ව්‍යාපෘතියේ නම | ඇස්තමේන්තු මුදල රජයේ දායකත්වය රු. | ගොවි දායකත්වය රු. |
|---|---|---|---|---|---|
| 1 | මාදම්පේ | 542 කරුක්කුවටවන | කුඹුක් වැව | 73,704.74 | 18,426.19 |
| 2 | නාත්/තඹීබෝව | 501 ඒ පලුවෙල්ගාල ද/ | ඉඹිබන්වල ඇනිකට් | 51,712.70 | 12,928.17 |
| 3 | හල්දඩුවන | 466 ඒ - මැද සිරිමැටියාන | නෙලුම් වැව | 121,303.28 | 30,325.82 |
| 4 | මදුරන්කුලිය | 608 ඒ - වේලුසුමනපුර | රත්මල්ගස් වැව | 80,660.74 | 20,165.18 |
| 5 | ආණමඩුව | 649 කොට්ටුකච්චිය | පුලියන්කුලම වැව | 65,332.08 | 16,333.02 |
| 6 | ආණමඩුව | 656 තට්ටෑව | වරා වැව | 69,039.18 | 17,259.80 |
| 7 | මහකුඹුක්කඩවල | 613 බී - මහකුඹුක්කඩවල | කුඹුක්ගහයාය වැව | 14,005.72 | 3,501.43 |
| 8 | ඉහළ පුලියන්කුලම | 642 සී - දංගස්වැව | ඉහළ දංගස් වැව | 70,236.03 | 17,559.00 |
| | | | | 545,994.47 | 136,498.61 |

| | | |
|---|---|---|
| මුළු ව්‍යාපෘති ගණන | 169 | |
| වැඩ අවසන් ව්‍යාපෘති ගණන | 134 | |
| ක්‍රියාත්මක ව්‍යාපෘති ගණන | 27 | |
| ආරම්භ කර නොමැති ව්‍යාපෘති | 8 | 169 |

**ගරු වික්ටර් ඇන්ටනි මහතා**
(மாண்புமிகு விக்டர் அந்தனீ)
(The Hon.Victor Antony)

ස්තුතියි, ගරු ඇමතිතුමනි. වාරිමාර්ග යෝජනා ක්‍රම යටතේ විශාල වැව් හා අමුණු ගණනාවක් සංවර්ධනය වනවා. ඒ අතරතුර වැදගත්ම යෝජනා ක්‍රමයක් තමයි දැදුරු ඔය යෝජනා ක්‍රමය යටතේ ඇති සෙංගල් ඔය යෝජනා ක්‍රමය. ඒකත් ඉක්මනින්ම සංවර්ධනය කරනවාද කියන එක දැන ගන්න කැමැතියි.

**ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் யாப்பா அபேவர்தன)
(The Hon. Lakshman Yapa Abeywardena)

දැනට දිස්ත්‍රික්කයේ වැඩ යෝජනා 08ක් ක්‍රියාත්මක නොවී පවතිනවා. ඒ නිසා ඒක වැදගත්ම වැවක් නම් ඔබතුමා සම්බන්ධීකරණ කමිටුවේ නිර්දේශ කරලා එවන්න. අර මුදල්වලින් මේ වැව කඩිනමින් ප්‍රතිසංස්කරණය කරන්න අවශ්‍ය පියවර ගන්නවා.

**ගරු වික්ටර් ඇන්ටනි මහතා**
(மாண்புமிகு விக்டர் அந்தனீ)
(The Hon.Victor Antony)

ස්තුතියි ගරු ඇමතිතුමනි. සෙංගල්ඔය වාරි යෝජනා ක්‍රමයක්. සෙංගල්ඔය කියන්නේ දැදුරු ඔයෙන් කැඩිලා එන අත්තක් හැටියට තියෙන ඇළ මාර්ගයක්. ඒක විශාල වැව් අමුණු රාශියකට වතුර ගෙන යන ඇළ මාර්ගයක්. ඒක ඉක්මනින් සකස් කර ගන්නයි මගේ ඉල්ලීම.

**ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் யாப்பா அபேவர்தன)
(The Hon. Lakshman Yapa Abeywardena)

ඒක අයත් වෙන්නේ මහා වාරිමාර්ගවලටද, සුළු වාරිමාර්ගවලටද කියා වෙන් කර ගන්න ඕනෑ. සුළු වාරිමාර්ග සඳහා නම් අපේ අමාත්‍යාංශය මඟින් මුදල් දෙන්න පුළුවන්. මහා වාරිමාර්ග සම්බන්ධයෙන් නම් ඒ විධියට කටයුතු කරන්න අමාරුයි. ඒක වාරිමාර්ග හා ජලසම්පත් කළමනාකරණ අමාත්‍යාංශය මඟින් කළ යුතුයි.

**ගරු වික්ටර් ඇන්ටනි මහතා**
(மாண்புமிகு விக்டர் அந்தனீ)
(The Hon.Victor Antony)

ඔබතුමාට ස්තුතියි.

## අධ්‍යාපන අමාත්‍යාංශයෙන් වෙන් කළ මුදල: වයඹ පළාත

## கல்வி அமைச்சினால் ஒதுக்கப்பட்ட நிதி: வடமேல் மாகாணம்

## FINANCIAL ALLOCATION BY MINISTRY OF EDUCATION : NORTH-WESTERN PROVINCE

0856/'10

**15. ගරු අජිත් කුමාර මහතා**
(மாண்புமிகு அஜித் குமார)
(The Hon. Ajith Kumara)
අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) වර්ෂ 2005 - 2010 දක්වා කාල සීමාවේදී වයඹ පළාත සඳහා අධ්‍යාපන අමාත්‍යාංශය මඟින් වෙන් කරන ලද ප්‍රතිපාදන, වාර්ෂිකව, වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) වර්ෂ 2005 - 2010 දක්වා කාල සීමාව තුළ වයඹ පළාතේ පත්වීම් ලබා දුන් ගුරුවරුන් පිළිබඳව වාර්තාවක් සහ වසා දමන ලද පාසල් පිළිබඳ වාර්තාවක් එතුමා වෙන් වෙන් වශයෙන් මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) නො එසේ නම්, ඒ මන්ද?

கல்வி அமைச்சரைக் கேட்ட வினா:

(அ) 2005 - 2010 ஆம் ஆண்டு வரையான கால கட்டத்தில் வடமேல் மாகாணத்திற்காக கல்வி அமைச்சினால் ஒதுக்கப்பட்ட நிதி, வருடாந்த அடிப்படையில் தனித்தனியே எவ்வளவென்பதை அவர் குறிப்பிடுவாரா?

(ஆ) 2005 - 2010 ஆம் ஆண்டு வரையான கால கட்டத்தில் வடமேல் மாகாணத்தில் நியமனம் வழங்கப்பட்ட ஆசிரியர்கள் பற்றிய அறிக்கையையும் மூடப்பட்ட பாடசாலைகள் பற்றிய அறிக்கையையும் தனித்தனியாக அவர் இச்சபையில் சமர்ப்பிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Education :

(a) Will he state the amount of financial allocation made by the Ministry of Education for the North-Western Province in each year during the period from year 2005 to year 2010?

(b) Will he submit to this House separately, a report on the teachers received appointments and a report on the schools that were closed down in the North-Western Province during the period from year 2005 to year 2010?

(c) If not, why?

**ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා (අධ්‍යාපන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா - கல்வி பிரதி அமைச்சர்)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa - Deputy Minister of Education)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ මන්ත්‍රීතුමා සභාවේ හිටියා. මග හැරලා ගිහින් වාගෙයි, ප්‍රශ්නය අහලා. බුද්ධික මන්ත්‍රීතුමා - [බාධා කිරීමක්] අජිත් කුමාර මන්ත්‍රීතුමා.

**ගරු අජිත් කුමාර මහතා**
(மாண்புமிகு அஜித் குமார)
(The Hon. Ajith Kumara)
ඇමතිතුමනි, ඔබතුමාට සැහෙන්න පැටලීලා. මම තුන් පාරක් ඇහුවා.

**ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)
අජිත් කුමාර මන්ත්‍රීතුමා නේද?

**ගරු අජිත් කුමාර මහතා**
(மாண்புமிகு அஜித் குமார)
(The Hon. Ajith Kumara)
මේ මම ඉන්නවා.

**ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)
හරි, හරි. එහෙනම් හරි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අධ්‍යාපන අමාත්‍යතුමා වෙනුවෙන් මම ඒ ප්‍රශ්නයට පිළිතුර දෙනවා.

(අ) ඇමුණුම් අංක 1හි දක්වා ඇත.

(ආ) වයඹ පළාතේ ලබා දුන් ගුරු පත්වීම් පිළිබඳ විස්තර ඇමුණුම් අංක II හි දක්වා ඇත.

වයඹ පළාතේ වසා දමන ලද පාසල් පිළිබඳ විස්තර ඇමුණුම් අංක III හි දක්වා ඇත.

ඇමුණුම් **සභාගත*** කරමි.

(ඇ) අදාළ නොවේ.

***සභාමේසය මත තබන ලද ඇමුණුම්:**
*சபாபீடத்தில் வைக்கப்பட்ட இணைப்புக்கள்:*
*Annexes tabled:*

**ඇමුණුම I**

වයඹ පළාත සඳහා අධ්‍යාපන අමාත්‍යාංශය මගින් වෙන්කරන ලද ප්‍රතිපාදන

| වර්ෂය | ලබාදුන් ප්‍රතිපාදන (මිලියන) |
|---|---|
| 2005 | 1296 |
| 2006 | 1385 |
| 2007 | 2601 |
| 2008 | 1828 |
| 2009 | 2027 |
| 2010 | 2022 |

**ඇමුණුම II**

ගුරු පත්වීම් - වයඹ පළාත
2005.01.01 සිට 2010.12.31 දක්වා

| ගුරු වර්ගය | 2005 | 2006 | 2007 | 2008 | 2009 | 2010 | එකතුව |
|---|---|---|---|---|---|---|---|
| විද්‍යා පීඨ | 286 | 369 | 308 | 232 | 162 | 213 | 1580 |
| උපාධිධාරී | 1420 | 782 | 3 | | 939 | 322 | 3466 |
| අධ්‍යාපනවේදී උපාධි | | | 26 | | 19 | 24 | 69 |
| ඉංග්‍රීසි විෂය උපාධි | 43 | | | 31 | | | 74 |
| [illegible] | | 79 | 19 | 21 | 1 | 25 | 145 |
| ඉංග්‍රීසි ඩිප්ලෝමාධාරී | | | 46 | 45 | 4 | 110 | 205 |
| [illegible] | | | | 192 | | | 192 |
| [illegible] | | | 84 | | | 9 | 93 |
| ගුරු සහායක | | | | 536 | 157 | 26 | 719 |
| මුළු එකතුව | 1749 | 1230 | 496 | 1057 | 1282 | 729 | 6543 |

**ඇමුණුම III**

වැසීගිය පාසල් ලේඛනය (2005 - 2010) වයඹ පළාත

| අනු | අධ්‍යාපන කලාපය | අධ්‍යාපන කොට්ඨාශය | පාසලේ නම | වැසීගිය වර්ෂය |
|---|---|---|---|---|
| | කුරුණෑගල කලාපය | | | |
| 1 | කුරුණෑගල | පොල්ගහවෙල | කු/සැවැන්දන ප්‍රා.වි | 2005 |
| 2 | කුරුණෑගල | පොල්ගහවෙල | කු/බමුණාපොත ප්‍රා.වි | 2008 |
| 3 | කුරුණෑගල | පොල්ගහවෙල | කු/කලුටුවාපැසැස්ස ප්‍රා.වි | 2008 |
| 4 | කුරුණෑගල | පොල්ගහවෙල | කු/සිඩපොල ප්‍රා.වි | 2008 |
| 5 | කුරුණෑගල | පොල්ගහවෙල | කු/ගසේගොඩ ප්‍රා.වි | 2008 |
| 6 | කුරුණෑගල | පොල්ගහවෙල | කු/ඉඹුලාන ප්‍රා.වි | 2008 |
| 7 | කුරුණෑගල | පොල්ගහවෙල | කු/ආරගොඩ සි.සි.වි | 2008 |
| 8 | කුරුණෑගල | පොල්ගහවෙල | කු/මෝරගල වි. | 2008 |
| 9 | කුරුණෑගල | පොල්ගහවෙල | කු/ඉහල සඳගල වි. | 2008 |
| 10 | කුරුණෑගල | පොල්ගහවෙල | කු/යෝගමුවාකන්ද වි. | 2008 |
| 11 | කුරුණෑගල | පොල්ගහවෙල | කු/මාහින්ගමුව වි. | 2008 |
| 12 | කුරුණෑගල | පොල්ගහවෙල | කු/පනාලිය වි. | 2008 |
| 13 | කුරුණෑගල | පොල්ගහවෙල | කු/ඇගල්ල වි. | 2008 |
| 14 | කුරුණෑගල | පොල්ගහවෙල | කු/අඹහැර වි. | 2008 |
| 15 | කුරුණෑගල | පොල්ගහවෙල | කු/තම්මිට වි. | 2008 |
| 16 | කුරුණෑගල | පොල්ගහවෙල | කු/ලිහිණිගිරිය ක.වි | 2009 |
| 17 | කුරුණෑගල | පොල්ගහවෙල | කු/අල්ගම වි. | 2009 |
| 18 | කුරුණෑගල | කුරුණෑගල | කු/මාරගම ප්‍රා.වි | 2008 |
| 19 | කුරුණෑගල | කුරුණෑගල | කු/රත්ගල්ල ක.වි | 2010 |
| 20 | කුරුණෑගල | කුරුණෑගල | කු/විල්බාව ප්‍රා.වි | 2008 |
| 21 | කුරුණෑගල | මාවතගම | කු/දුනුකේවත්ත ප්‍රා.වි | 2008 |
| 22 | කුරුණෑගල | මාවතගම | කු/කෝන්පොල ප්‍රා.වි | 2008 |
| 23 | කුරුණෑගල | මාවතගම | කු/තලම්පිටිය ප්‍රා.වි | 2008 |
| 24 | කුරුණෑගල | මාවතගම | කු/බෝයගොඩ ක.වි | 2008 |
| 25 | කුරුණෑගල | මාවතගම | කු/අටමුණේ ක.වි | 2009 |
| 26 | කුරුණෑගල | මාවතගම | කු/මලුන්දෙනිය ක.වි | 2010 |
| | ගිරිඋල්ල කලාපය | | | |
| 27 | ගිරිඋල්ල | අලව්ව | ගිරි/ලෙව්දෙනිය වි. | 2005 |
| 28 | ගිරිඋල්ල | අලව්ව | ගිරි/හගවත්ත ක.වි | 2006 |
| 29 | ගිරිඋල්ල | අලව්ව | ගිරි/දැලිකනුඅංග ප්‍රා.වි | 2006 |
| 30 | ගිරිඋල්ල | අලව්ව | ගිරි/මාහරගම ප්‍රා.වි | 2007 |
| 31 | ගිරිඋල්ල | අලව්ව | ගිරි/පාංගොල්ල ප්‍රා.වි | 2007 |
| 32 | ගිරිඋල්ල | අලව්ව | ගිරි/ඉහල කලල්පිටිය ප්‍රා.වි | 2010 |
| 33 | ගිරිඋල්ල | අලව්ව | ගි/වෑත්තෑව ක.වි | 2010 |
| 34 | ගිරිඋල්ල | පන්නල | ගිරි/කොටුවැල්ල ක.වි | 2008 |
| | ඉබ්බාගමුව කලාපය | | | |
| 35 | ඉබ්බාගමුව | ඉබ්බාගමුව | ඉ/හාපත්ගමුව ක.වි | 2005 |
| 36 | ඉබ්බාගමුව | ඉබ්බාගමුව | ඉ/ගොඩරත්මලේ ප්‍රා.වි | 2010 |
| 37 | ඉබ්බාගමුව | ගනේවත්ත | ඉ/උඩපලුගමුව ප්‍රා.වි | 2010 |
| | කුලියාපිටිය කලාපය | | | |
| 38 | කුලියාපිටිය | පඩුවස්නුවර | කුලි/උඩුගම්පොල ගෙදර ක.වි | 2005 |
| 39 | කුලියාපිටිය | පඩුවස්නුවර | කුලි/දිද්දෙනිය ප්‍රා.වි | 2005 |
| 40 | කුලියාපිටිය | පඩුවස්නුවර | කුලි/තෙන්ගොඩගෙදර ප්‍රා.වි | 2007 |
| 41 | කුලියාපිටිය | පඩුවස්නුවර | කුලි/දෙමලුදොර ප්‍රා.වි | 2010 |
| 42 | කුලියාපිටිය | පඩුවස්නුවර | කුලි/ඇඹෝගෙදර ප්‍රා.වි | 2006 |
| 43 | කුලියාපිටිය | දැහැනැක්ගෙදර | කුලි/රදලියගොඩ ශ්‍රී සුමන වි. | 2005 |
| 44 | කුලියාපිටිය | කුලියාපිටිය බටහිර | කුලි/උණාලිය ප්‍රා.වි | 2006 |
| | නිකවැරටිය කලාපය | | | |
| 45 | නිකවැරටිය | නිකවැරටිය | නික/මාදුරුගම ක.වි | 2006 |
| 46 | නිකවැරටිය | නිකවැරටිය | නික/මානපාය ප්‍රා.වි | 2006 |
| 47 | නිකවැරටිය | වාරියපොල | නික/වඩුරැස්ස ප්‍රා.වි | 2006 |
| 48 | නිකවැරටිය | කොබෙයිගනේ | නික/උඩේකැලේ ප්‍රා.වි | 2007 |
| 49 | නිකවැරටිය | කොටවෙහෙර | නික/කුරුපොකුණ ප්‍රා.වි | 2007 |
| 50 | නිකවැරටිය | කොටවෙහෙර | නික/තොන්ගස්වලයාගම ප්‍රා.වි | 2007 |
| | හලාවත කලාපය | | | |
| 51 | හලාවත | ආරච්චිකට්ටුව | හලා/මයියාව ප්‍රා.වි | 2010 |
| 52 | හලාවත | ආරච්චිකට්ටුව | හලා/ආනවිලුන්දාව ප්‍රා.වි | 2010 |
| 53 | හලාවත | ආරච්චිකට්ටුව | හලා/බණ්ඩාරහේන ප්‍රා.වි | 2010 |
| 54 | හලාවත | හලාවත | හලා/කඹුකැටිය ප්‍රා.වි | 2010 |
| 55 | හලාවත | හලාවත | හලා/උඩුදියන්දුරුව ප්‍රා.වි | 2010 |
| 56 | හලාවත | හලාවත | හලා/රත්මල්අගාර ප්‍රා.වි | 2010 |
| 57 | හලාවත | නාත්තන්ඩිය | හලා/හාල්පන්විල ප්‍රා.වි | 2010 |
| 58 | හලාවත | නාත්තන්ඩිය | හලා/සාගරගම ප්‍රා.වි | 2010 |
| 59 | හලාවත | වෙන්නප්පුව | හලා/කොලින්ජාඩිය ප්‍රා.වි | 2010 |
| 60 | හලාවත | වෙන්නප්පුව | හලා විලෝවිට ප්‍රා.වි | 2010 |

**ගරු අජිත් කුමාර මහතා**
(மாண்புமிகு அஜித் குமார)
(The Hon. Ajith Kumara)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ පළමුවන අතුරු ප්‍රශ්නය මෙයයි. මේක අතුරු ප්‍රශ්නයකුත් නොවෙයි. ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමා ඉදිරිපත් කළ පිළිතුරට අදාළ ඇමුණුමෙහි සඳහන් පරිදි පසු ගිය වසර පහ තුළ වයඹ පළාතේ වසා දමන ලද පාසල් ප්‍රමාණය කරුණාකරලා කියන්න පුළුවන්ද?

**ගරු ගාමිණී විජිත් විජයමුනි ද සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එය දීර්ඝ ලේඛනයක්.

**ගරු අජිත් කුමාර මහතා**
(மாண்புமிகு அஜித் குமார)
(The Hon. Ajith Kumara)
එකතුව කිව්වා නම් ඇති.

**ගරු ගාමිණී විජිත් විජයමුනි ද සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)
එකතුව සඳහන් කරලා නැහැ.

**ගරු අජිත් කුමාර මහතා**
(மாண்புமிகு அஜித் குமார)
(The Hon. Ajith Kumara)
ගරු ඇමතිතුමනි, එකතුව සඳහන් කර නැත්නම් ඒක අඩුවක්.

**ගරු ගාමිණී විජිත් විජයමුනි ද සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)
ඔබතුමා එකතුව අහලා නැහැ. වසා දමන ලද පාසල් පිළිබඳ වාර්තාවක් තමයි අහලා තිබෙන්නේ.

**ගරු අජිත් කුමාර මහතා**
(மாண்புமிகு அஜித் குமார)
(The Hon. Ajith Kumara)
ඒක විශාල ලේඛනයක්ද? කියවන්න බැරි තරම් දිග ලේඛනයක්ද?

**ගරු ගාමිණී විජිත් විජයමුනි ද සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)
ඒක ඒ තරම්ම දිග නැහැ, ටිකක් පළලයි.

**ගරු අජිත් කුමාර මහතා**
(மாண்புமிகு அஜித் குமார)
(The Hon. Ajith Kumara)
කියවා ගන්න බැරි එකක්ද?

**ගරු ගාමිණී විජිත් විජයමුනි ද සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)
කියවා ගන්න නම් පුළුවන්. ඉතින් තමුන්නාන්සේම කියවා ගන්න. මම ඒක එවන්නම්.

**ගරු අජිත් කුමාර මහතා**
(மாண்புமிகு அஜித் குமார)
(The Hon. Ajith Kumara)
මට හිතෙන්නේ එය කියවා ගන්න බැරි දිග ලේඛනයක් කියලායි. තමුන්නාන්සේට බොහොම ස්තුතියි.

**ගරු ගාමිණී විජිත් විජයමුනි ද සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)
තමුන්නාන්සේට මම ඒක එවන්නම්.

## ක්‍රීඩා අමාත්‍යාංශය යටතේ ඇති ක්‍රීඩා ආයතන: විස්තර

### விளையாட்டுத்துறை அமைச்சின் கீழுள்ள விளையாட்டு அமைப்புக்கள் : விபரம்

### SPORTS BODIES UNDER MINISTRY OF SPORTS: DETAILS

0429/'10

**1. ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ක්‍රීඩා අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2):

(අ) (i) ක්‍රීඩා අමාත්‍යාංශය යටතේ ඇති ක්‍රීඩා ආයතන සංඛ්‍යාව කොපමණද;

(ii) එම ආයතන පිහිටුවා ඇති දිස්ත්‍රික්කවල නම් කවරේද;

(iii) එම ආයතනවල ප්‍රධාන තනතුරු දරන පුද්ගලයන්ගේ නම් කවරේද;

(iv) අනෙකුත් නියෝජිතයන්ගේ සංඛ්‍යාව කොපමණද;

(v) ඔවුන්ගේ උපන් දින කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) නීතියෙන් ස්ථාපිත කර ඇති එබඳු ආයතන සංඛ්‍යාව සහ ඒවායේ නම් කවරේද;

(ii) එක් එක් ආයතනය සඳහා රජය මඟින් ප්‍රදානය කර ඇති මුදල් ප්‍රමාණය කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) 1973 අංක 25 දරන ක්‍රීඩා ආඥාපනත සහ 1993 අංක 47 දරන ක්‍රීඩා සංශෝධන පනත මඟින් (අ)(i) හි සඳහන් ආයතනවල ගිණුම් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතු බවට නියම කර තිබේද;

(ii) එබඳු ආයතනවල ගිණුම් සහ ක්‍රිකට් මණ්ඩලයේ මධ්‍යම ගිණුම් පාර්ලිමේන්තුවට ඉදිරිපත් නොකිරීමට හේතු කවරේද;

(iii) පසුගිය වර්ෂ 5 සඳහා ක්‍රිකට් මණ්ඩලයේ ගිණුම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නො එසේ නම්, ඒ මන්ද?

விளையாட்டுத்துறை அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) விளையாட்டுத்துறை அமைச்சின் கீழ் வரும் விளையாட்டு அமைப்புக்களின் எண்ணிக்கை யாவையென்பதையும்,

(ii) இந்த நிறுவனங்கள் நிறுவப்பட்டுள்ள மாவட்டங் களின் பெயர்கள் யாவையென்பதையும்,

(iii) பிரதான பதவிகளை வகிப்போரின் பெயர்கள் யாவையென்பதையும்,

(iv) ஏனைய பிரதிநிதிகளின் பெயர்கள் யாவையென் பதையும்,

(v) அவர்களின் பிறந்த திகதிகள் யாவையென்பதையும்

அவர் குறிப்பிடுவாரா?

(ஆ) (i) இவற்றுள் சட்டபூர்வமானதாக்கப்பட்டுள்ளவற்றின் பெயர்கள், மற்றும் எண்ணிக்கைகள் யாவையென் பதையும்,

(ii) ஒவ்வொரு நிறுவனத்திற்கும் அரசாங்கம் வழங்கி யுள்ள நிதியினளவு யாதென்பதையும்

அவர் குறிப்பிடுவாரா?

(இ) (i) 1973ம் ஆண்டின் 25ம் இலக்க விளையாட்டுக் கட்டளைச் சட்டத்தின் கீழும் மற்றும் 1993ம் ஆண்டின் 47ம் இலக்க விளையாட்டுத் திருத்தங் களின் கீழும் இந் நிறுவனங்களின் கணக்குகளை பாராளுமன்றத்திற்குச் சமர்ப்பிக்க வேண்டுமா என்பதையும்,

(ii) அவ்வாறான நிறுவனங்களினது கணக்குகளும் கிரிக்கட் சபையின் மத்திய கணக்குகளும் பாராளுமன்றத்திற்கு ஏன் சமர்ப்பிக்கப்படுவதில்லை என்பதையும்,

(iii) கடந்த ஐந்து வருடங்களுக்கான கிரிக்கட் சபையின் கணக்குகளையும்

அவர் அறியத் தருவாரா?

(ஈ) இன்றேல், ஏன்?

0429/'10

asked the Minister of Sports :

(a) Will he state-

(i) the number of sports bodies come under the Ministry of Sports;

(ii) the names of the District in which those institutes have been established;

(iii) the names of the persons holding key positions;

(iv) the number of other representatives; and

(v) their dates of birth ?

(b) Will he also state-

(i) the number and the names of such institutes which have been legislated;

(ii) the amount of money that the Government has granted to each institution?

(c) Will he inform-

(i) whether it is required by Sports Ordinance, No. 25 of 1973 and Sports amendment Act, 47 of 1993 to submit the accounts of institution as per (a) i to the Parliament;

(ii) as to why the accounts of such institutions and central accounts of Cricket Board are not being submitted to Parliament; and

(iii) the accounts of Cricket Board for last 5 years?

(d) If not, why?

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ක්‍රීඩා අමාත්‍යතුමා වෙනුවෙන් එම ප්‍රශ්නයට පිළිතුර මා **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) 04 කි.
1. ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව
2. සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරිය
3. ජාතික ක්‍රීඩා විද්‍යා ආයතනය
4. ක්‍රීඩා වෛද්‍ය ඒකකය

(ii) කොළඹ

(iii) 1. ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව -අධ්‍යක්ෂ ජනරාල්, ජී. හතරසිංහ මහතා
2. සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරිය- සභාපති, රොෂි ඉබ්‍රාහිම් මහතා
3. ජාතික ක්‍රීඩා විද්‍යා ආයතනය - අධ්‍යක්ෂ,එම්. එම්. විජයසේන මහතා (වැ. බ.)
4. ක්‍රීඩා වෛද්‍ය ඒකකය - අධ්‍යක්ෂ ජනරාල්, වෛද්‍ය ගීතාංජන මෙන්ඩිස් මහතා

(iv) සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරිය - 09
(v) 1972.05.20 - සාමාජික
1964.08.16 -සාමාජික
1970.01.28 - සාමාජික
1958.11.11- සාමාජික
1959.08.08 - සාමාජික
අනෙකුත් සාමාජිකයින්ගේ නම් ලැබී නොමැත.

(ආ) (i) 01- සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරිය.
(ii) 1 ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව - රු. 941,828,000
2. සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරිය-රු.125,700,000
3. ජාතික ක්‍රීඩා විද්‍යා ආයතනය - රු. 33,580,000
4. ක්‍රීඩා වෛද්‍ය ඒකකය - රු. 20,034,000

(ඇ) (i) ඔව්.
(ii) ඉදිරියේදී ඉදිරිපත් කිරීමට කටයුතු කරගෙන යයි.
(iii) ආදායම් හා වියදම් ප්‍රකාශය
ශේෂ පත්‍රය
මුදල් ප්‍රවාහ ප්‍රකාශය

(ඈ) පැන නොනගී.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ගරු ඇමතිතුමනි, මා මෙතැන සිටින නිසා, මෙම ප්‍රශ්නයේ (c) (iii) කොටසට දී ඇති පිළිතුර මට දැන ගන්න අවශ්‍යයි.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු මන්ත්‍රීතුමා, කී වෙනි ප්‍රශ්නයද?

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ප්‍රශ්නයේ (ඇ) (iii) කොටසට අදාළ පිළිතුර. ක්‍රිකට් පාලක මණ්ඩලයේ ගිණුම් සම්බන්ධයෙන් අසා ඇති කොටසට අදාළ පිළිතුර. ඒක මෙතැන සභාගත කරනවාය කිව්වා. ඒක ඒ ආකාරයෙන්ම කරනවාද?

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

සම්පූර්ණ විස්තර සභාගත කරනවා.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
මෙම ප්‍රශ්නයේ (ඇ) (i), (ii) සහ (iii) යන කොටස්වලට අදාළ පිළිතුර කියවන්න පුළුවන්ද?

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

(ඇ) (i) ඔව්.

(ii) ඉදිරියේදී ඉදිරිපත් කිරීමට කටයුතු කර ගෙන යයි.

(iii) ආදායම් හා වියදම් ප්‍රකාශය

ශේෂ පත්‍රය

මුදල් ප්‍රවාහ ප්‍රකාශය

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු ඇමතිතුමනි, ක්‍රීඩා ඇමතිතුමාගෙන් අසන්න තිබෙන ප්‍රශ්නය මා ඔබතුමා මඟින් අහනවා. ක්‍රිකට් පාලක මණ්ඩලයේ ගිණුම් පිළිබඳව පමණක් නොව පාලනය සම්බන්ධයෙනුත් ප්‍රශ්න තිබෙනවාය කියන එකත් අප දන්නවා. ඒ ගිණුම් මේ වන තුරු පාර්ලිමේන්තුවට හෙළිදරවු කර නැහැයි කියන එක මේකෙන් ඔප්පු වෙනවා. ඇයි, ඒ කටයුත්ත සිදු කර නැත්තේ?

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ක්‍රිකට් පාලක මණ්ඩලයේ විවිධ අඩු පාඩුකම් තිබෙන නිසා එය ප්‍රතිසංවිධානයකට ලක් කර තිබෙන බව ගරු ඇමතිතුමා දන්නවා. ගරු මන්ත්‍රීතුමා ඔබතුමාට අතිරේක කාරණා විස්තරාත්මකව දැන ගැනීමට අවශ්‍ය නම් ඒ විස්තර සපයන්නය කියලා මා ගරු ඇමතිතුමාට කියන්නම්.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ දෙවන අතුරු ප්‍රශ්නය මේකයි. ක්‍රිකට් පාලක මණ්ඩලය විතරක් නොවෙයි. රගර්, බාස්කට් බෝල් යන මේ සියලු දේම අත් හිටුවලායි තියෙන්නේ. මෙවැනි දේවල් නිසා අද ක්‍රීඩාවේත් ප්‍රශ්න ඇති වෙලා තිබෙනවාය කියන එක ගරු ඇමතිතුමා පිළිගන්නවාද? ඒකට මේ ආණ්ඩුවෙන් සුබ අනාගතයක් තිබෙනවාද?

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ඒකට කෙසේ හෝ සුබ අනාගතයක් ඇති වෙලා තිබෙන බව දන්නවා.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඒක නම් පේනවා, ගංවතුරයි, පොල් ගෙඩියයි, ලූනු ගෙඩියයි - [බාධා කිරීමක්] සුබ අනාගතයක් නම් තිබෙනවා. පොල් ගෙඩියක මිල රුපියල් 70යි. ලූනු මිල රුපියල් 200යි. රට වටේ ගංවතුර.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ලෝක කුසලානය ලොක්කා අරගෙන හිතුවා රජයට අසුබයි කියලා. ලෝක කුසලානය ලොක්කාට අසුබ කරපු එක විතරයි කළේ. එතුමාට තියෙන ගෞරවය එහෙමම ඉතුරු කළා නම් ඊට වඩා හොඳයි. ඒ නිසා ක්‍රිකට් එක්ක දේශපාලනය කරන්න එපා.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
නැහැ, නැහැ.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ක්‍රිකට් හෝ රගර් හෝ ඒ මොනවා එක්කවත් දේශපාලනය කරන්න එපා.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
අර්ජුන රණතුංග මැතිතුමා මේ රටට කීර්ති නාමයක් ගෙනැත් තිබෙනවා. එතුමාගේ පාලන කාලයේ ඇඟිලි ගැසීම් තිබුණු නිසා තමයි මම මේ ප්‍රශ්නය අසන්නේ.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
එතුමා ක්‍රීඩකයෙක්. එතුමා ක්‍රීඩකයෙක් මිස දේශපාලනඥයෙක් නොවෙයි.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඔබතුමන්ලාගේ ආණ්ඩුවෙන් ක්‍රීඩකයෙකුට වෙලා තිබෙන අසාධාරණය නිසා තමයි -

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
දේශපාලනයට ක්‍රීඩාව ඇතුළු කර ගෙන අද ඇති වී තිබෙන තත්ත්වය නිසා -

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ආණ්ඩුවේ ඉන්න කොට හොඳයි. විපක්ෂයට ආවාම නරකයි.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ඔබතුමන්ලා මෙහා පැත්තට චෝදනා කරනවා, මෙහා පැත්ත ඔබතුමන්ලාට චෝදනා කරනවා. අපේ ක්‍රීඩාවට ජීවත් වෙන්න ඉඩ දෙන්න. එයයි අපේ රජය සැලැස්මක් අනුව දියුණු කර ගෙන යන්නේ.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
මගේ අභිලාෂය වන්නේ ඒක තමයි. නමුත් ඒක තමයි මේ නැති කරන්න හදන්නේ.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමා තුන්වෙනි අතුරු ප්‍රශ්නය.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
මම තවම දෙවන අතුරු ප්‍රශ්නයේයි ඉන්නේ. එයට අංග සම්පූර්ණ උත්තරයක් ලැබී නැහැ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ඔබතුමා මේ පාර්ලිමේන්තුවේ හිටියේ නැහැ, අර්ජුනට දුන්නු වධය -[බාධා කිරීමක්] ඔබතුමන්ලා අර්ජුනට වධ දෙන කොට ඔබතුමා පාර්ලිමේන්තුවේ දොරකඩවත් දැකලා නැහැ. කියවලා බලන්න හැන්සාඩ් වාර්තාව.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
මොකක්ද?

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
කියවලා බලන්න හැන්සාඩ් වාර්තාව, තමුන්නාන්සේලා දුන්නු වධය දැන ගන්න ඕනෑ නම්.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
මොකක්ද මේ කියන්නේ?

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
මම කියන්නේ කියන්න ඕනෑ දේ.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඉතින් කියන්න කෝ.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
දන්නේ නැති නිසා.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
කටේ පිට්ටු වාගේ නැතිව ඉතින් කියන්න කෝ මොනවාද කරලා තිබෙන්නේ කියලා.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
අර්ජුන ගැන අද තමුන්නාන්සේලා කථා කළා. ඔබේ ආණ්ඩුව අර්ජුනට දුන්නු වධය ගැන හැන්සාඩ් වාර්තාවේ තිබෙනවා.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
අර්ජුන රණතුංගට උදවු කළේ, එක්සත් ජාතික පක්ෂයෙන් ගාමිණී දිසානායකලා, ලලිත් ඇතුලත්මුදලිලා, රනිල් වික්‍රමසිංහලා -

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
නැහැ. මම රනිල් වික්‍රමසිංහ මහත්මයා ගැන මොනවාවත් කියන්නේ නැහැ. ඔබ හැන්සාඩ් වාර්තාව කියවලා බලන්න. ඔබ එදා පාර්ලිමේන්තුවේ දොරකඩටවත් ඇවිල්ලා නැහැ. [බාධා කිරීමක්] අපි මන්ත්‍රීවරු හැටියට හිටපු නිසායි මතක් කරන්නේ. කියවලා බලන්න.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඒක නොවෙයි නේ දැන් මෙතැන තිබෙන ප්‍රශ්නය.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
එහෙම නම් මොකක්ද?

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
දූෂණය සම්බන්ධයෙන් ඇති වුණ ප්‍රතිවිපාකය සම්බන්ධයෙන් තමයි මෙතැන ප්‍රශ්න අහන්නේ. දැන් මෙතැන පිළිගන්නවා මෙහෙම ගිණුම් දීලා නැහැයි කියලා. ඒ සම්බන්ධයෙන් -

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු ඇමතිතුමා ප්‍රකාශයක් කරලා තිබෙනවා, ප්‍රතිසංවිධානයන් ඇති කරමින්, අඩු පාඩුකම් තිබුණා නම් ඒවා නිවැරදි කරමින් ඉදිරියට යන බව. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ විවෘත ආර්ථිකයේ ප්‍රතිඵල අපට විතරක් නොවෙයි බලපා තිබෙන්නේ. ඉන්දියාවේ Cricket Board එකට අද ඇති වෙලා තිබෙන්නේ කුමක්ද? වෙනත් රටවල ක්‍රීඩා මණ්ඩලවලට ඇති වෙලා තිබෙන්නේ කුමක්ද? ඒ නිසා ඔබ කියන කටයුත්ත කර ගෙන යන්න එය නිරන්තරයෙන් විමර්ශනයට සහ ප්‍රතිසංවිධානයට ලක් විය යුතුයි.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
හරි. ගරු ඇමතිතුමනි, තුන්වෙනි අතුරු ප්‍රශ්නය අහන්නේ දයාසිරි. නමුත් මේ විවෘත ආර්ථිකය ගැන කිව්ව නිසා, තුනෙන් දෙකත් තිබෙනවා. කරුණාකරලා මේක - [බාධා කිරීමක්] කරන්න එහෙම නම්.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
තුන්වෙනි අතුරු ප්‍රශ්නය අහන්න.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
බොරුවට විවෘත ආර්ථිකයට, යූඑන්පී එකට බැණලා ඒක තුළින් ගමන් කරනවා. තුනෙන් දෙකයි, විධායකයයි, ඔක්කොම තිබෙනවා.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ප්‍රශ්නයට අදාළව කථා කරන්න. තුන්වෙනි අතුරු ප්‍රශ්නය. ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
මේක මාර හෙණයක් නේ. බලන්නකෝ දෙන උත්තරයත් හිනා වෙවී දෙන්නේ. ඕක පිළිගන්න දැන්.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, තුන්වන අතුරු ප්‍රශ්නය මම අහන්න කැමතියි. විශේෂයෙන් අද, ලෝක කුසලාන තරගාවලියක් ඇවිල්ලා තිබෙන වෙලාවක්. මේ ලෝක කුසලාන තරගාවලියට ක්‍රීඩකයින් සොයා ගැනීම සඳහා තමයි තිබුණ සාමාන්‍ය "ඒ.බී." තරගාවලිය අත හැරලා දාලා පළාත් මට්ටමෙන් Inter-Provincial Cricket Tournament එක පටන් ගත්තේ. ඒකෙන් තෝරා ගන්නා ක්‍රීඩකයන්ව තමයි ලාංකීය ක්‍රිකට් කණ්ඩායමට තෝරා ගන්නවා කියලා කිව්වේ. ඊයේ තමයි ඉන්දියාව කණ්ඩායම තෝරා ගත්තේ. ඊයේ තමයි දකුණු අප්‍රිකාව කණ්ඩායම තෝරා ගත්තේ. නමුත් අපේ කණ්ඩායම තෝරා ගත්තේ 05 වෙනි දා. 19 වෙනි දා තමයි සාමාන්‍ය දිනය දීලා තිබුණේ. මේකෙන් අසාධාරණයක් සිදු වන්නේ නැද්ද?

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ ප්‍රශ්නයට අදාළ අතුරු ප්‍රශ්නයක් නොවෙයි මේ අහන්නේ.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමනි, මේ ප්‍රශ්නය තුළින් පැන නගින ප්‍රශ්නයක් අහන්න. ඒ ප්‍රශ්නය -

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ඒක තමයි. [බාධා කිරීමක්]

## රජයේ ප්‍රතිශක්තිකරණ වැඩ පිළිවෙළ: පියවර
## அரசின் தடுப்பூசி ஏற்றும் வேலைத்திட்டம்: நடவடிக்கைகள்
## GOVERNMENT IMMUNIZATION PROGRAMME: STEPS TAKEN

0466/'10

2. **ගරු රවි කරුණානායක මහතා (ගරු අජිත් පී. පෙරේරා මහතා වෙනුවට)**
(மாண்புமிகு ரவி கருணாநாயக்க - மாண்புமிகு அஜித் பீ. பெரேரா சார்பாக)
(The Hon. Ravi Karunanayake on behalf of the Hon. Ajith P. Perera)
සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (3) :

(අ) රජයේ ප්‍රතිශක්තිකරණ වැඩ පිළිවෙළ අඩාළ වී ඇති බවත්, ඒ පිළිබඳව විපක්ෂය වග කිව යුතු බවත් හිටපු සෞඛ්‍ය අමාත්‍යවරයා 2010.06.10 දින පාර්ලිමේන්තුවේදී ප්‍රකාශ කළ බව එතුමා පිළිගන්නෙහිද?

(ආ) (i) රජයේ ප්‍රතිශක්තිකරණ වැඩ පිළිවෙළ අඩාළ වී තිබේද;
(ii) එසේ නම්, එයට හේතු කවරේද;
(iii) ප්‍රතිශක්තිකරණ වැඩ පිළිවෙළ අඩාළ වී ඇත්නම්, එය නැවත සාර්ථක ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා ගන්නා පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නො එසේ නම්, ඒ මන්ද?

சுகாதார அமைச்சரைக் கேட்ட வினா:

(அ) அரசின் தடுப்பூசி ஏற்றும் வேலைத்திட்டம் ஸ்தம்பிதம் அடைந்துள்ளதாகவும், அது தொடர்பாக எதிர்க்கட்சி பொறுப்புக் கூறவேண்டும் என்றும் முன்னாள் சுகாதார அமைச்சர் 2010.06.10ஆம் திகதி பாராளுமன்றத்தில் தெரிவித்திருந்தார் என்பதை அவர் ஏற்றுக்கொள் கின்றாரா?

(ஆ) (i) அரசின் தடுப்பூசி ஏற்றும் வேலைத்திட்டம் ஸ்தம்பித மடைந்துள்ளதா என்பதையும்,
(ii) ஆமெனில், அதற்கான காரணங்கள் யாவை என்பதையும்,
(iii) தடுப்பூசி ஏற்றும் வேலைத்திட்டம் ஸ்தம்பிதமடைந் திருப்பின் மீண்டும் வெற்றிகரமான முறையில் அதனைச் செயல்படுத்துவதற்காக மேற்கொள்ளப் படும் நடவடிக்கைகள் யாவை என்பதையும்

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Health:

(a) Will he admit that the former Minister of Health made a statement in Parliament on 10.06.2010 that the immunization programme of the Government was debilitated and the Opposition was responsible for that?

(b) Will he inform this House -
(i) whether the immunization programme of the Government is debilitated;
(ii) if so, the reasons for that; and
(iii) of the steps that will be taken to implement the immunization programme again successfully , if it is debilitated at present?

(c) If not, why?

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, සෞඛ්‍ය අමාත්‍යතුමා වෙනුවෙන් මා මෙම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) එවැනි ප්‍රකාශයක් කළ බව නොදනිමි.

(ආ) (i) නැත.
(ii) පැන නොනඟී.
(iii) සාර්ථක ලෙස ක්‍රියාත්මක වේ.

(ඇ) පැන නොනඟී.

## ත්‍රිකුණාමලය-හබරණ මාර්ගය සංවර්ධන කටයුතු: විස්තර

## திருகோணமலை - ஹபரணை வீதி அபிவிருத்திப் பணிகள்: விபரம்

## DEVELOPMENT WORK OF TRINCOMALEE-HABARANA ROAD: DETAILS

0537/’10

3. ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2) :

(අ) (i) නැඟෙනහිර පළාතේ, ත්‍රිකුණාමලය-හබරණ මාර්ගය සංවර්ධනය කිරීම සඳහා යෝජිත මාර්ගයක්ද;

(ii) එසේ නම්, එම මාර්ගය මේ වන විට සංවර්ධනය කරමින් පවතින්නේද;

යන්න එතුමා දන්වන්නෙහිද?

(ආ) මෙම මාර්ගයේ සංවර්ධන කටයුතු කරනු ලබන්නේ නම්,

(i) එහි දිග කිලෝමීටර් කොපමණද;

(ii) එහි වැඩ අවසන් කිරීමට යෝජිත දිනය කවරේද;

(iii) ඒ සඳහා ඇස්තමේන්තුගත මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) මෙම මාර්ගය ඉදි කිරීම සඳහා ටෙන්ඩර් කැඳවනු ලැබුවේද;

(ii) එසේ නම්, ටෙන්ඩර් ඉදිරිපත් කරන ලද ආයතනවල නම් කවරේද;

(iii) ඒ ඒ ආයතන විසින් ඉදිරිපත් කරන ලද ටෙන්ඩර් මිල ගණන් කවරේද;

(iv) ටෙන්ඩරය පිරිනමන ලද ආයතනය හා අදාළ ටෙන්ඩර් මුදල කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) (i) මෙම මාර්ගය ඉදි කිරීම සඳහා ඇස්තමේන්තුගත මුළු මුදල දේශීය අරමුදල්වලින් ලබා ගත්තේද;

(ii) නො එසේ නම්, විදේශ ආධාර මඟින් ලබා ගත්තේද;

(iii) විදේශ ආධාර ලබා ගත්තේ නම්, ආධාර ලබා දුන් රටේ නම කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඉ) නො එසේ නම්, ඒ මන්ද?

பொருளாதார அபிவிருத்தி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) கிழக்கு மாகாணத்தின், திருகோணமலை - ஹபரணை வீதியானது அபிவிருத்தி செய்வதற்காக உத்தேசிக்கப்பட்டுள்ளதொரு வீதியா என்பதையும்,

(ii) ஆமெனில், இவ்வீதி தற்போது அபிவிருத்தி செய்யப் படடு வருகின்றதா என்பதையும்

அவர் அறிவிப்பாரா?

( ஆ) இவ்வீதியில் அபிவிருத்திப் பணிகள் இடம்பெற்று வருமாயின்,

(i) அதன் நீளம் எத்தனை கிலோ மீட்டர்கள் என்ப தையும்,

(ii) இதன் பணிகளை முடிவுறுத்துவதற்கு உத்தேசிக்கப் பட்டுள்ள திகதி யாதென்பதையும்,

(iii) இதற்காக மதிப்பிடப்பட்டுள்ள தொகை எவ்வளவென்பதையும்

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) (i) இவ்வீதியின் நிர்மாணப் பணிகளுக்காக கேள்விப் பத்திரம் கோரப்பட்டதா என்பதையும்,

(ii) ஆமெனில், கேள்விப்பத்திரங்களைச் சமர்ப்பித்த நிறுவனங்களின் பெயர்கள் யாவை என்பதையும்,

(iii) அந்தந்த நிறுவனங்களால் சமர்ப்பிக்கப்பட்ட கேள்விப்பத்திர விலைகள் யாவையென்பதையும்,

(iv) கேள்விப் பத்திரம் ஒப்படைக்கப்பட்ட நிறுவனம் மற்றும் குறித்த கேள்விப் பத்திரத் தொகை யாதென்பதையும்

அவர் குறிப்பிடுவாரா?

(ஈ) (i) இவ்வீதியை நிர்மாணிப்பதற்காக மதிப்பீடு செய்யப் பட்ட மொத்தத் தொகை உள்நாட்டு நிதியங்களி லிருந்து பெறப்பட்டதா என்பதையும்,

(ii) இன்றேல், வெளிநாட்டு உதவிகளிலிருந்து பெறப் பட்டதா என்பதையும்,

(iii) வெளிநாட்டு உதவி பெறப்பட்டிருப்பின், உதவி வழங்கிய நாட்டின் பெயர் யாதென்பதையும்

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(உ) இன்றேல், ஏன்?

asked the Minister of Economic Development:

(a) Will he inform-

(i) whether the Trincomalee-Habarana road in the Eastern Province is a road proposed for development ;

(ii) if so, whether this road is being developed by now?

(b) If this road is being developed, will he inform this House of-

(i) its length in kilometres ;

(ii) the proposed date for the completion of its work ;

(iii) the amount of money estimated for this purpose?

(c) Will he state-

(i) whether tenders were called for the construction of this road ;

(ii) if so, the names of institutions that submitted tenders ;

(iii) the bids forwarded by the respective institutions ;

(iv) the institution for which the tender was awarded and the price of bid?

(d) Will he inform this House-

(i) whether the total amount of estimated money for the construction of this road was obtained from local funds ;

(ii) if not, whether it was obtained through foreign aid ;

(iii) if foreign aid was obtained, the name of the donor country?

(e) If not, why?

**ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் யாப்பா அபேவர்தன)
(The Hon. Lakshman Yapa Abeywardena)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ආර්ථික සංවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන් මා මෙම ප්‍රශ්නයට පිළිතුර දෙනවා.

(අ) (i) ඔව්. ත්‍රිකුණාමලය-හබරණ මාර්ගය, හබරණ සිට කන්තලේ දක්වා 113 කිලෝමීටරය සිට 156 කිලෝමීටරය දක්වා කොටස ජාතික මහා මාර්ග ආශ්‍රිත ව්‍යාපෘතිය, වරාය හා මහා මාර්ග අමාත්‍යාංශය යටතේ වැඩිදියුණු කර ඇත. කන්තලේ සිට ත්‍රිකුණාමලය කොටස මෙම ව්‍යාපෘතිය මඟින් වැඩිදියුණු කිරීමට යෝජනා වී නොමැත.

(ii) නැත. 2010.08.28 දින සංවර්ධන කටයුතු අවසන් කර ඇත. හබරණ සිට කන්තලේ දක්වා මාර්ගයේ කොටස දැනට සංවර්ධන කටයුතු සහමුලින්ම නිම කර ඇත.

(ආ) හබරණ සිට කන්තලේ දක්වා මාර්ග කොටසට අදාළ තොරතුරු පහත දැක්වේ:

(i) දිග කිලෝමීටර් 43.6 යි.

(ii) 2010.08.28 දින වැඩ අවසන් කර ඇත.

(iii) රුපියල් මිලියන 2,407 (වැට් රහිත)

(ඇ) (i) ඔව්.

(ii) 1. Sinohydro Corporation

2. Maga-CDIG Joint Venture

3. ICC - China Harbour Joint Venture

(iii) 1. Sinohydro Corporation - රුපියල් මිලියන 3,349.93

2. Maga-CDIG Joint Venture - රුපියල් මිලියන 2,589.87

3. ICC - China Harbour Joint Venture - රුපියල්මිලියන 2,407.89

(iv) ICC - China Harbour Joint Venture - රුපියල් මිලියන 2,407.89

(ඈ) (i) මුළු මුදල දේශීය අරමුදල්වලින් ලබා ගෙන නොමැත.

(ii) ඔව්. ආසියානු සංවර්ධන බැංකුව මඟින් ණය ලබා ගෙන ඇත. මුළු මුදලෙන් සියයට 80ක පමණ මුදලක් ආසියානු සංවර්ධන බැංකුව මඟින් ලබා දී ඇති අතර සියයට 20ක මුදල වරාය හා මහා මාර්ග අමාත්‍යාංශය මඟින් වැය කර ඇත.

(iii) ආසියානු සංවර්ධන බැංකුව මඟින් ණය ලබා දී ඇත. විදේශ ණය ප්‍රමාණය ජපන් යෙන් මිලියන 4,460යි. වාර්ෂික ණය පොලිය 0.75යි. දේශීය අරමුදල රුපියල් මිලියන 1,320යි. අර්බුදයට ලක් වූ ප්‍රදේශ පුනරුත්ථාපනය කිරීමේ ව්‍යාපෘතිය යටතේ මුළු ණය ප්‍රමාණය ඇමෙරිකානු ඩොලර් මිලියන 20.18යි. මින් ඇමෙරිකානු ඩොලර් මිලියන 11.43ක් නැඟෙනහිර පළාත සඳහා වැය කර තිබෙනවා. පොලී ප්‍රමාණය වසරකට සියයට 1යි.

ප්‍රංශ ආධාර නියෝජිත ආයතනය, ණය මුදල යුරෝ මිලියන 58.6යි. පොලී ප්‍රමාණය සියයට 1යි.

(ඉ) පැන නොනඟී.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

මේ පාර සම්බන්ධවත් මා අහන්න කැමැතියි. රුපියල් මිලියන 2,407ක් ඒ සඳහා වැය වෙලා තිබෙනවා. මේ ගණන් ඔබතුමා දන්නවා නේ. ඔබතුමා නොවෙයි මේක කළේ. මා ඒක පිළිගන්නවා.

**ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் யாப்பா அபேவர்தன)
(The Hon. Lakshman Yapa Abeywardena)

මම නොවෙයි ආණ්ඩුවයි කළේ. ආසියානු සංවර්ධන බැංකුවයි සල්ලි දුන්නේ.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

ඒක මම දන්නවා. මම අහගෙනයි හිටියේ. [බාධා කිරීමක්] රාජිත සේනාරත්න ඇමතිතුමා කලබල වන්නේ නැතුව පොඩ්ඩක් ඉන්න කෝ. ඔබතුමාත් ඒ කාලයේ මෙහේ ඉඳලා පොත් පෙරළා ගෙන ඕවා ඇහුවා. ඉතින් අපටත් පොඩ්ඩක් අහන්න දෙන්න. ඇමතිතුමා වුණු ගමන් -

**ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා**
(மாண்புமிகு வைத்திய கலாநிதி ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)

පෙරළලා අහන්න. දැන ගෙන අහන්න.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

පෙරළලා තමයි අහන්නේ. ඔබතුමා වාගේ අපිත් කරුණු හොයා ගෙන තමයි අහන්නේ. නිකම් ආවාට ගියාට අහන්නේ නැහැ.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

මන්ත්‍රීතුමා, පෙරළි, පෙරළි ඉන්නේ නැතුව ප්‍රශ්නය අහන්න.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

ඔබතුමාත් දන්නවා, ඊයේත් මේ පාරවල් ගැන ඇහුවාය කියා. ඒ වෙන කාරණයක් හින්දා නොවෙයි. ඔබතුමා කිව්වා අඩු මුදලට දුන්නාම අපි වෙන කොම්පැනියක් ගැන කථා කරනවා කියලා. මට එහෙම කිසිම වුවමනාවක් නැහැ වෙන කොම්පැනිවල -

**ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் யாப்பா அபேவர்தன)
(The Hon. Lakshman Yapa Abeywardena)

ඔය අහපු ප්‍රශ්නය ඊයේ පත්තරයේත් ගිහිල්ලා තිබුණා, මේක රත්තරන්වලින්ද හදන්නේ කියලා. මා ඉතා පැහැදිලිව අද උදේ නිලධාරින් ගෙන්වලා මේ ගැන කථා කළාම ඒ අය ඒ ගැන පැහැදිලි කළා. කරුණාකර මේ රටේ තිබුණු ප්‍රශ්නය ගැන කල්පනා කරන්න. මේ නැඟෙනහිර පළාත වසර 30ක්, 34ක් විනාශ වුණු පළාතක්. ඔබතුමා නොවෙයි අපි කාටවත් යන්න බැරි වුණා. ගංවතුර මෙච්චර ප්‍රමාණයක් ගිහිල්ලාත් පසු ගිය කාලයේ හදපු පාරක් හැටියට -ආණ්ඩුව හදපු පාරක් හැටියට- ඒක කැඩිලාද කියලා බලන්න. මේ විධියට වියදම් කරලා හදපු පාරක්. මොකද, මේවායේ වසර ගණනාවක් මිනිසුන්ට යන්න බැරි වුණා. පාලම

[ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා]

නැහැ. ඒ ගොල්ලන් කිව්ව නිසා අඩි කීපයක් ඉස්සුවා. පාලම් කීපයක් දාලා තිබෙනවා. පැති බැම් බැඳලා තිබෙනවා. ගොඩ කරලා තිබෙනවා. ඒ වාගේම මහා පරිමාණයේ කොන්ක්‍රීට් දමපු තැන් තිබෙනවා. මේ සියල්ලටම එක්ක තමයි මේ මිලියන ගණන වැය කරලා තිබෙන්නේ. මේ කැඩිච්ච පාරේ මේ දවස්වල ලක්ෂ 25ක් යාපනයට ගිහිල්ලා තිබෙනවා. තමුන්නාන්සේලා ලබන අවුරුද්දේ අපෙන් ප්‍රශ්න අසාවි යාපනයේ පාරට මෙච්චර වියදම් කළේ මොකද කියලා.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
නැහැ. මම තවම ප්‍රශ්නය ඇසුවේ නැහැ. ඔබතුමා කිව්ව කථාවටයි මම එහෙම කිව්වේ. වෙන හේතුවක් නිසා නොවෙයි. මොකද ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ විධියට බැලුවාම එක කිලෝමීටරයකට රුපියල් කෝටියක මුදලක් යනවා. එක මීටරයකට රුපියල් ලක්ෂයක් යනවා.

**ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் யாப்பா அபேவர்தன)
(The Hon. Lakshman Yapa Abeywardena)
ඔව්, එක මීටරයක් හදන්න. සමහර විට එහෙම තැන් තිබෙනවා.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
මේ ගණන් හිලවු පිළිබඳව අපට තිබෙන ප්‍රශ්නය මේ පාර තාර දමා පිරෙච්චාද, කොන්ක්‍රීට් කළාද කියන එක නොවෙයි. අපට තිබෙන ප්‍රධාන ප්‍රශ්නය තමයි මෙතැන පාරවල් තිබුණේ නැහැ වාගේ නේ කථා කරන එක.

**ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் யாப்பா அபேவர்தன)
(The Hon. Lakshman Yapa Abeywardena)
තිබුණේ නැහැ තමයි.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමා, කරුණාකරලා ඔබතුමාගේ අතුරු ප්‍රශ්නය අහන්න.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
මේ හබරණ මාර්ගය -

**ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் யாப்பா அபேவர்தன)
(The Hon. Lakshman Yapa Abeywardena)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පාරවල් තිබුණේ නැහැ වාගේ තමයි. තාක්ෂණික උත්තර දෙන්න මට බැහැ.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
මේ පාරවල් තිබුණා. තිබුණු පාරවල් උඩින් තමයි මේක හදා ගෙන ගියේ.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ඔබතුමාගේ ප්‍රශ්නය මොකක්ද කියලා කියන්න?

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
මෙතුමා කියන කථාවට මම මේ කියන්නේ. අපිටත් කථා කරන්න -

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමා, කථාවට උත්තර දීමට නොවෙයි. අතුරු ප්‍රශ්නය අහන්න.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
මම ප්‍රශ්නයක් විධියට අහන්නම් කෝ.

**ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் யாப்பா அபேவர்தன)
(The Hon. Lakshman Yapa Abeywardena)
ඉතින්, අහන්නකෝ.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
මේ පාර හදන්න කලින් එතැන පාරක් තිබුණේ නැද්ද? කැලෑ කපලා අලුතෙන්ද මේ පාර හැදුවේ?

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු නියෝජ්‍ය ඇමතිතුමා, දැන් උත්තරය දෙන්න.

**ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் யாப்பா அபேவர்தன)
(The Hon. Lakshman Yapa Abeywardena)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේවා බිම් බෝම්බ පුපුරපු පාරවල්. අවුරුදු 40ක් පාරක් නැතුව වාගේ තිබුණු පාරවල්. මේවායේ බිම් බෝම්බ තිබුණේ. මේ පාරවල් පුපුරවලා. පසු ගිය කාලයේ මේවා ගැන කථා කරන්න කිසිම ඉඩක් තිබුණේ නැහැ.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
මම කනගාටු වනවා -

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ඔබතුමාගේ දෙවැනි අතුරු ප්‍රශ්නය අහන්න.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
මම දෙවැනි අතුරු ප්‍රශ්නය විධියට අහන්නේ. [බාධා කිරීමක්]

**ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் யாப்பா அபேவர்தன)
(The Hon. Lakshman Yapa Abeywardena)
අනෙක් එක ආණ්ඩුව ටෙන්ඩර් කරලා නොවෙයි -

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමා දෙවැනි අතුරු ප්‍රශ්නය අහන්න.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
මම ගෞරවයෙන් ඉල්ලා සිටිනවා හබරණ-කන්තලේ මාර්ගයේ පුපුරපු එක බෝම්බයක් ගැන කරුණාකරලා මට කියන්න කියලා?

**ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் யாப்பா அபேவர்தன)
(The Hon. Lakshman Yapa Abeywardena)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ එක පාරවක්වත් - [බාධා කිරීමක්]

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
පාර කුඩු වන්න බෝම්බ ගහලා තිබෙනවාද?

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
උත්තරය දෙන්න.

**ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் யாப்பா அபேவர்தன)
(The Hon. Lakshman Yapa Abeywardena)
මේවා රජය ටෙන්ඩර් කරපුවා නොවෙයි. ආසියානු සංවර්ධන බැංකුව ටෙන්ඩර් කරපුවා. [බාධා කිරීම්]

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
මේ පාරේ අඩි කීයක් හැරුණාද?

**ගරු ලලිත් දිසානායක මහතා (සෞඛ්‍ය නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு லலித் திசாநாயக்க - சுகாதார பிரதி அமைச்சர்)
(The Hon. Lalith Dissanayake - Deputy Minister of Health)
බොරු චෝදනා කරනවා.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
අඩි කීයක් හැරුණාද මේ බෝම්බ පිපිරීම නිසා? මේ හබරණ-කන්තලේ මාර්ගයේ අඩි කීයක් ගිලා බැස්සාද?

**ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் யாப்பா அபேவர்தன)
(The Hon. Lakshman Yapa Abeywardena)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙකේ ඇස්තමේන්තුව පිළිබඳව මට තාක්ෂණය අනුව උත්තර දෙන්න බැහැ.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
Order, please! ගරු නියෝජ්‍ය ඇමතිතුමා උත්තර දෙන්න.

**ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் யாப்பா அபேவர்தன)
(The Hon. Lakshman Yapa Abeywardena)
මෙකේ ඇස්තමේන්තුව කොච්චරද, මෙකේ ප්‍රමාණය කොච්චරද කියලා තාක්ෂණය ගැන මට කියන්න බැහැ. ඒවා ආසියානු සංවර්ධන බැංකුවත් එක්ක කථා කරන්න. මට උත්තරය දෙන්න විතරයි පුළුවන්.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
තුන්වැනි අතුරු ප්‍රශ්නය අහන්න.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
මම නැවතත් කියනවා මේ -

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
තුන්වැනි අතුරු ප්‍රශ්නයද අහන්නේ?

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
තුන්වැනි අතුරු ප්‍රශ්නය. ශ්‍රී ලාංකිකයකු විධියට, ශ්‍රී ලංකාවේ ජීවත් වන පුරවැසියකු විධියට මම දන්නවා හබරණ-කන්තලේ මාර්ගය කිසිම බිම් බෝම්බයකට අසු වෙලා නැති - [බාධා කිරීමක්]

**ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் யாப்பா அபேவர்தன)
(The Hon. Lakshman Yapa Abeywardena)
නැත්තේ මොකද?

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
කොහොමද දන්නේ?

**ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் யாப்பா அபேவர்தன)
(The Hon. Lakshman Yapa Abeywardena)
හබරණ-කන්තලේ මාර්ගය බිම් බෝම්බවලට අසු වුණා.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
බෝම්බ පිපිරීම නිසා ගිලා බැස්සේ නැති - [බාධා කිරීමක්]

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
අන්න කොටි. අන්න රහස හෙළි වුණා.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ඔබතුමාගේ අර කොටින්ට තමයි හමු වුණේ.

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
කොටින් එක්ක සම්බන්ධකමක් තිබෙනවාද?

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
මූණ නාලු වන්න හම්බ වෙලා තිබෙන්නේ ගැහැනු ළමයින්ගෙන්ද? කාගෙන්ද හම්බ වුණේ?

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
ඇයි ජයලත් ජයවර්ධන මහත්මයා මදිද?

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ප්‍රශ්න අංක 4-0761/'10-(3), ගරු තිස්ස අත්තනායක මහතා.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු තිස්ස අත්තනායක මහතා වෙනුවෙන් මං එම ප්‍රශ්නය අහනවා.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විදුලි සංදේශ හා තොරතුරු තාක්ෂණ අමාත්‍යතුමා වෙනුවෙන් මං එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා සති දෙකක් කල් ඉල්ලා සිටිනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

## දැදුරු ඔය යෝජනා ක්‍රමය තුළින් පෝෂණය වන වැව්: පුත්තලම් දිස්ත්‍රික්කය
## தெதுரு ஓயாத் திட்டத்தின்கீழ் போஷிக்கப்படுகின்ற வாவிகள் : புத்தளம் மாவட்டம்
## TANKS FED BY DEDURU OYA SCHEME : PUTTALAM DISTRICT

0845/'10

7. **ගරු රවි කරුණානායක මහතා (ගරු වික්ටර් ඇන්තනි මහතා වෙනුවට)**
(மாண்புமிகு ரவி கருணாநாயக்க - மாண்புமிகு விக்டர் அந்தனீ சார்பாக)
(The Hon. Ravi Karunanayake on behalf of the Hon.Victor Antony )
වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) මහින්ද චින්තන වැඩසටහන යටතේ ගංගා 10ක් එක් වර සංවර්ධනය කිරීමේ යෝජනා අනුව ඇරඹි දැදුරු ඔය යෝජනා ක්‍රමය අතිසාර්ථක යෝජනා ක්‍රමයක් බවත්;

(ii) දැදුරු ඔය යෝජනා ක්‍රමය යටතේ ක්‍රියාත්මක සෙංගල් ඔය යෝජනා ක්‍රමයේ වැඩ කටයුතු මේ වන විට නතර වී ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) දැදුරු ඔය යෝජනා ක්‍රමය තුළින් පුත්තලම් දිස්ත්‍රික්කයේ පෝෂණය වන වැව් සංඛ්‍යාව කොපමණද;

(ii) එම වැව්වල නම් කවරේද;

(iii) එම වැව්වලට අදාළ වාරිමාර්ග ක්‍රම සකස් කරන්නේද;

(iv) එම වාරිමාර්ග ක්‍රම තුළින් පුත්තලම් දිස්ත්‍රික්කයේ පෝෂණය වන වපසරිය කොපමණද;

(v) එම යෝජනා ක්‍රමය අවසන් කිරීමට ගත වන කාලය කවරේද;

(vi) මෙම යෝජනා ක්‍රමය කඩිනමින් අවසන් කිරීමට පියවර ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නො එසේ නම්, ඒ මන්ද?

நீர்ப்பாசன, நீர்வள முகாமைத்துவ அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) மஹிந்த சிந்தனை நிகழ்ச்சித்திட்டத்தின் கீழ் 10 ஆறுகளை ஒரே தடவையில் அபிவிருத்திசெய்யும் முன்மொழிவுக்கு இணங்க ஆரம்பிக்கப்பட்ட தெதுரு ஓயாத் திட்டம் மிகவும் வெற்றிகரமான ஒரு திட்டமென்பதையும்,

(ii) தெதுரு ஓயாத் திட்டத்தின்கீழ் செயற்படும் செங்கல் ஒயத்திட்டத்தின் வேலைகள் தற்போது நிறுத்தப்பட்டுள்ளதென்பதையும்

அவர் அறிவாரா?

(ஆ) (i) தெதுரு ஓயாத் திட்டத்தின் கீழ் புத்தளம் மாவட்டத்தில் போஷிக்கப்படுகின்ற வாவிகளின் எண்ணிக்கை யாதென்பதையும்,

(ii) இவ்வாவிகளின் பெயர்கள் யாவையென்பதையும்,

(iii) இவ்வாவிகளுக்கருகில் நீர்ப்பாசனத் திட்டங்கள் அமைக்கப்படுமா என்பதையும்.

(iv) இந் நீர்ப்பாசனத் திட்டத்தின் ஊடாக புத்தளம் மாவட்டத்தில் போஷிக்கப்படும் பரப்பளவு யாதென்பதையும்,

(v) இத்திட்டத்தை நிறைவு செய்யத் தேவைப்படும் காலம் யாதென்பதையும்,

(vi) இத்திட்டத்தை துரிதமாக நிறைவு செய்ய நடவடிக்கை எடுப்பாரா என்பதையும்

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Irrigation and Water Resources Management:

(a) Is he aware that-

(i) the Deduru Oya Scheme, initiated under the scheme of developing 10 rivers simultaneously, under the Mahinda Chintana Programme, is a highly successful scheme ; and

(ii) the development activities of the Sengal Oya Scheme, coming under the Deduru Oya Scheme have been stalled?

(b) Will he inform this House-

(i) the number of tanks in the Puttalam District fed by the waters of the Deduru Oya Scheme;

(ii) the names of those tanks;

(iii) whether irrigation schemes will be constructed in relation to those tanks;

(iv) the extent in the Puttalam District that is fed by these irrigation schemes;

(v) the time that will be taken to complete that scheme; and

(vi) whether steps will be taken to complete this scheme expeditiously?

(c) If not, why?

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යතුමා වෙනුවෙන් මම පිළිතුර **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) ඔව්.

(ii) සෙංගල් ඔය, දැදුරු ඔය ජලාශ ව්‍යාපෘතියට අයත් නොවේ.

(ආ) (i) ප්‍රධාන වැව් 05ක් හා කුඩා වැව් 10ක් පෝෂණය වේ.

(ii) ඉඟිණිමිටිය ජලාශය, රදවිබැදි ඇළ ව්‍යාපෘතිය, තබ්බෝව වැව, මහඋස් වැව, ඌරියාව වැව සහ කුඩා වැව් 10ක්

(iii) දැනටමත් වාරි මාර්ග ක්‍රම ඇත. රදවිබැදි ඇළ ව්‍යාපෘතියේ අක්කර 1000කට පමණ වාරි මාර්ග ක්‍රම ව්‍යාපෘතිය මඟින් සකස් කර ඇත. (අවතැන් වූවන් පදිංචි කරන ලද කුඹුරුවලට)

(iv) පුත්තලම දිස්ත්‍රික්කයේ පෝෂණය වන ව්‍යාපෘතිය දැනට ඇති හෙක්ටයාර් 3715 සහ අලුත් හෙක්ටයාර් 400කි.

(v) 2012 වර්ෂය අවසන් වන විට හෝ 2013 පළමු කාර්තුව අවසන් වීමට ප්‍රථම යෝජනා ක්‍රමය අවසන් වනු ඇත.

(vi) ඔව්.

(ඇ) පැන නොනඟී.

## හම්බන්තොට දිස්ත්‍රික්කයේ මාදැල් ධීවර කර්මාන්තය: විස්තර

## அம்பாந்தோட்டை மாவட்ட கரைவலை மீன்பிடிக் கைத்தொழில்: விபரம்

## SEINE NET FISHING INDUSTRY IN HAMBANTOTA DISTRICT: DETAILS

0868/'10

**9. ගරු රවි කරුණානායක මහතා (ගරු දිලිප් වෙදආරච්චි මහතා වෙනුවට)**
(மாண்புமிகு ரவி கருணாநாயக்க - மாண்புமிகு திலிப் வெதஆரச்சி சார்பாக)
(The Hon. Ravi Karunanayake on behalf of the Hon.Dilip Wedaarachchi )

ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) හම්බන්තොට දිස්ත්‍රික්කයේ ධීවර කර්මාන්තයේ නියැලි පිරිස අතරින් විශාල පිරිසක් මාදැල් ධීවර කර්මාන්තයේ නියැලී සිටි බවත්;

(ii) සුනාමි ව්‍යසනය නිසා සියලුම මාදැල් විනාශයට පත් වූ බවත්;

(iii) කුඩා ධීවර යාත්‍රා ධීවර කර්මාන්තයට හඳුන්වා දීම මඟින් මාදැල් ධීවර කර්මාන්තය පසු බෑමකට ලක්ව ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) හම්බන්තොට දිස්ත්‍රික්කය තුළ මාදැල් ධීවර කර්මාන්තය සිදු කරනු ලබන වරායවල් සංඛ්‍යාව කොපමණද;

(ii) එම ධීවර වරායවල් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) හම්බන්තොට දිස්ත්‍රික්කය තුළ සුනාමි ව්‍යසනයට පෙර මාදැල් ධීවර කර්මාන්තයේ නියැලි ධීවර කාර්මිකයින්ගේ නම් සහ ලියාපදිංචි කර තිබූ මාදැල් සංඛ්‍යාව, එක් එක් වරාය අනුව, වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) සුනාමි ව්‍යසනයෙන් පසු එම ධීවර වරායන් තුළ ලියාපදිංචි මාදැල් සංඛ්‍යාව හා මාදැල් ධීවර කාර්මිකයන්ගේ නම් කවරේද;

(iii) සුනාමි ව්‍යසනය නිසා මාදැල් අහිමි වූ මාදැල් ධීවර කාර්මිකයන් සඳහා රජය ලබා දී ඇති සහන කවරේද;

(iv) එම සහන ලැබුණු අයගේ නම් කවරේද;

(v) එම සහන මෙතෙක් නොලැබුණු මාදැල් ධීවර කාර්මිකයින් සම්බන්ධයෙන් ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නො එසේ නම්,ඒ මන්ද?

கடற்றொழில், நீரக வளமூலங்கள் அபிவிருத்தி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) அம்பாந்தோட்டை மாவட்டத்தில் மீன்பிடிக் கைத்தொழிலில் ஈடுபட்டுள்ளோர் களில் பெருந்தொகையானோர் கரைவலை மீன்பிடிக்கைத் தொழிலில் ஈடுபட்டிருந்தனர் என்பதையும்,

(ii) சுனாமி அனர்த்தம் காரணமாக அனைத்து கரைவலை களும் அழிந்துபோயுள்ளன என்பதையும்,

(iii) சிறு மீன்பிடி வள்ளங்களை மீன்பிடிக்கைத் தொழிலுக்கு அறிமுகப் படுத்தியதன் மூலம் கரைவலை மீன்பிடிக் கைத்தொழில் பின்னடை வைச் சந்தித்துள்ளதென்பதையும்,

அவர் அறிவாரா?

(ஆ) (i) அம்பாந்தோட்டை மாவட்டத்தில் கரைவலை மீன்பிடிக் கைத்தொழில் மேற்கொள்ளப்படும் துறைமுகங்களின் எண்ணிக்கை எவ்வளவென்ப தையும்,

(ii) அந்த மீன்பிடித் துறைமுகங்கள் யாவையென்ப தையும்

அவர் குறிப்பிடுவாரா?

(இ) (i) அம்பாந்தோட்டை மாவட்டத்தில் சுனாமி அனர்த்தத் திற்கு முன்னர் கரைவலை மீன்பிடிக் கைத்தொழி லில் ஈடுபட்டிருந்த மீனவர்களின் பெயர்களும் பதிவு செய்யப்பட்டிருந்த கரைவலைகளின் எண்ணிக்கை யும் ஒவ்வொரு துறைமுகங்களுக்கமைய வெவ் வேறாக யாவையென்பதையும்,

(ii) சுனாமி அனர்த்தத்திற்குப் பின்னர் மேற்படி மீன்பிடித் துறைமுகங்களில் பதிவு செய்யப்பட்டுள்ள கரைவலைகளின் எண்ணிக்கையும், கரைவலை மீனவர்களின் பெயர்களும் யாவையென்பதையும்,

(iii) சுனாமி அனர்த்தம் காரணமாக கரைவலைகளை இழந்த கரைவலை மீனவர்களுக்கு அரசாங்கம் வழங்கியுள்ள நிவாரணங்கள் யாவையென்பதையும்,

(iv) அந்நிவாரணங்கள் கிடைக்கப்பெற்றவர்களின் பெயர்கள் யாவையென்பதையும்,

(v) மேற்படி நிவாரணங்கள் இதுவரை கிடைக்காத கரைவலை மீனவர்கள் தொடர்பாக மேற்கொள்ளப் படும் நடவடிக்கை யாதென்பதையும்

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஈ) இன்றேல், ஏன்?

asked the Minister of Fisheries and Aquatic Resources Development:

(a) Is he aware that-

(i) a large number out of those who engage in fishing industry in the District of Hambantota, engage in seine net fishery ;

(ii) all the seine nets were destroyed due to the Tsunami disaster ; and

(iii) seine net fishing industry has suffered a setback as a result of introduced small fishing vessels to the fishing industry?

(b) Will he state -

(i) the number of harbours within the district of Hambantota where seine net fishing industry is carried out ; and

(ii) the names of those harbours?

(c) Will he inform this House of-

(i) the names of the fishermen who engaged in seine net fishing industry in the district of Hambantota prior to the Tsunami disaster and the number of registered seine nets with relevance to each harbour separately ;

(ii) the number of seine nets registered at those harbours and the names of seine net fishermen, after the Tsunami disaster ;

(iii) the concessions provided by the Government to the seine net fishermen who lost their nets due to the Tsunami disaster ;

(iv) the names of those who received such concessions ; and

(v) the steps that will be taken regarding the seine net fishermen who have not received those concessions so far?

(d) If not, why?

**ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා**
(மாண்புமிகு வைத்திய கலாநிதி ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) ඔව්.

(ii) ඔව්.

(iii) ඔව්.

(ආ) (i) 16

(ii) එම වරායන් පහත දැක්වේ.

(1) පලටුපාන
(2) ඌරණිය
(3) වැටකෙයියාව
(4) හම්බන්තොට නැඟෙනහිර
(5) හම්බන්තොට බටහිර
(6) පට්ටිය වරාය
(7) වැලිපටන්විල
(8) කළමැටිය
(9) කහඳමෝදර
(10) තඹුත්තගෙවරාය
(11) සිරිමන්තුඩාව
(12) කොටුවේගොඩ
(13) පැලවත්ත (කොටදැල්)
(14) මැදකැටිය
(15) මාවැල්ල
(16) කුඩාවැල්ල

(ඇ) (i), (ii) ඇමුණුම 01 බලන්න.

(iii) යාත්‍රා සහ දැල් ආම්පන්න ලබා දී ඇත.

(iv) ඇමුණුම 02 බලන්න.

(v) මේ වන තෙක් සහන නොලැබූ අය අන්‍යෝන්‍ය වශයෙන් ධීවර ආම්පන්න හුවමාරු කර ගනිමින් දැනට රැකියාවේ නිරත වන අතර ඉදිරියේදී මේ සඳහා අරමුදල්/ප්‍රතිපාදන ලැබුණු විට යාත්‍රා හා ආම්පන්න ලබා දිය හැකි වෙයි.

(ඈ) අදාළ නොවේ.

*ඇමුණුම: 1*

<u>හම්බන්තොට දිස්ත්‍රික්කයේ මාදැල් පිළිබඳ විස්තර</u>

| ධීවර පරීක්ෂක කොට්ඨාශය | මාදැල් වරායේ නම | මාදැල් වටවාර (පොළ) අංකය | අයිතිකරුගේ නම |
|---|---|---|---|
| තිරීන්ද | පලටුපාන | 1 | කේ.එච්. සේපාල මයා |
| | | 2 | කේ.එච්. පියතිලක මයා |
| | | 3 | පී. ජිනදාස මයා |
| | | 4 | එම්.කේ. මහින්දපාල මයා |
| | | 5 | ඩබ්.එස්. අතුර මයා |
| | | 6 | කේ.එච්. ප්‍රැන්සිස් මයා |
| | ඌරණිය | 1 | ලායි මොහමඩ් මයා |
| | | 2 | සී/ස සිරියාගම ධී.ස.සමිතිය |
| | | 3 | ආර්පී.ප්‍රේමසිරි මයා / එල්.පී. ප්‍රේමසිරි මයා |
| | | 4 | ලායි මොහමඩ් මයා |
| | වැටකෙයියාව | 1 | ආර්.පී. චමින්ද මයා |
| | | 2 | පී.ජී. ප්‍රසන්න විමුක්ති මයා |
| හම්බන්තොට/නැ | හම්බන්තොට/නැ | 1 | ඉබ්‍රහිම් මොහමඩ් සාජ්‍රින් මයා |
| | | 2 | ඉබ්‍රහිම් මොහමඩ් තැලිබින් මයා |
| | | 3 | ඉසදීන් මොහමඩ් ඉල්හාර් මයා |
| හම්බන්තොට /බ | හම්බන්තොට/බ | 1 | තයිප්ප්‍රදීන් නිසාර්දීන් මයා |
| | | 2 | ජෙයිනුදීන් ඉසදීන් මයා |
| | | 3 | තාජුදීන් අබ්දුල් හමීඩ් අසාර්දීන් මයා |
| | | 4 | තාජුදීන් අබ්දුල් හමීඩ් තසුම්දීන් මයා |
| වැලිපටන්විල | වැලිපටන්විල | 1 | රෝමලින්නෝනා ගලප්පත්ති මිය |
| | | 2 | එස්.ජී.ජී. නෝනාහාමි මිය |
| | | 3 | කේ.පී. සෝමරත්න මයා |

| | | | |
|---|---|---|---|
| | | 4 | පී. සුජිත් කුමාර මයා |
| | | 5 | පී. ජිනදාස මයා |
| | | 6 | ඩබ්.එස්. ගුණදාස මයා |
| | | 7 | ජ්.එම්.ආර්.ජ්. දිමුතු රංගන මයා |
| | | 8 | බෙබිනෝනා විජේතුංග මයා |
| | | 9 | බෙබිනෝනා විජේතුංග මයා |
| | | 10 | බෙබිනෝනා විජේතුංග මයා |
| | | 11 | ඩබ්.එස්. නිශාන්ත මයා |
| | | 12 | එස්.ජ්. ලජිත් රොෂාන් මයා |
| | | 13 | එස්.ජ්. ටෙනිසන් මයා |
| | | 14 | සෝමසිරි එදිරිවීර මයා |
| | | 15 | ඩී.එච්. ප්‍රසන්න මයා |
| | | 16 | ජ්.එම්.ආර්.ජ්. ප්‍රේමසිරි මයා |
| | | 17 | ඩබ්.පී. සිඩ්නි මයා |
| | | 18 | පී. සුගතදාස මයා |
| | | 19 | ජ්.පී. ජයසේන මයා |
| | | 20 | කේ.පී. ආරියපාල මයා |
| | පට්ටියවරාය | 1 | එම්.කේ. මුණිදාස මයා |
| | | 2 | එම්.කේ. පුංචිසිංඤෝ මයා |
| | | 3 | එම්.කේ. මුණිදාස මයා |
| | | 4 | එම්.කේ. පුංචිසිංඤෝ මයා |
| | | 5 | පී. ජිනදාස මයා |
| | | 6 | එම්.කේ. පුංචිසිංඤෝ මයා |
| | | 7 | ජ්.පී. ජයසේන මයා |
| | | 8 | එම්.කේ. නිහාල් මයා |
| | | 9 | එල්.එච්.එම්. තිලන්ත මයා |
| | | 10 | ඩබ්.එස්. නිහාල්චන්ද්‍ර මයා |
| | | 11 | ජ්.පී. ජයසේන මයා |
| | | 12 | ආර්.ජී. ඇන්ඩෲ මයා |
| | | 13 | වයි.ජී. සීතා රංජනී මිය |
| | | 14 | ජ්.පී. ජයසේන මයා |
| | | 15 | ඩී.එච්. ප්‍රසන්න මයා |
| | | 16 | ආර්.ජී. ඇන්ඩෲ මයා |
| | | 17 | එච්.එල්. සිරිසේන මයා |
| | | 18 | ව්‍යාපාරි සංගමය , වාලුරුප්ප |
| | | 19 | විමල්සිරි මතගාවීර මයා |
| | | 20 | එන්.එච්. විජේපාල මයා |
| | | 21 | ඩබ්.කේ. සමින්ද කුමාර මයා |
| | | 22 | කේ. පේමදාස මයා |
| | | 23 | විමල්සිරි මතගාවීර මයා |
| | | 24 | එච්.ඩබ්. නන්දසේන මයා |
| කලමැටිය | කලමැටිය | 1 | කේ.පී. නිමල් මයා |
| | | 2 | කේ.පී. ඩැනී මයා |
| | | 3 | කේ.පී. පීරිස් මයා |
| | | 4 | ඩබ්.කේ. වසන්ත මයා |
| | | 5 | සුජිත් එදිරිවීර මයා |
| | | 6 | ඩබ්.කේ. දාවිත් සිංඤෝ මයා |
| | | 7 | එස්.පී. පේමදාස මයා |
| | | | එම්.ජ්. ජයසූරිය මයා |
| | | | සී. අන්දරගේ |
| | | 8 | කේ.පී. අනුර මයා |
| | | 9 | නිමල් සිරිවර්ධන මයා |
| | | | චන්ද්‍රසේන සිරිවර්ධන මයා |
| | | 10 | කේ.පී. ගැමුණු මයා |
| | | 11 | මහින්ද මතගාවීර මයා |
| | | | විමලසිරි මතගාවීර මයා |
| | | 12 | ජ්.පී. විමලසිලි මිය |
| | | 13 | එස්.පී. පේමදාස මයා |
| | | 14 | එම්.එම්. සුමතිපාල මයා |
| | | 15 | ඩබ්.කේ.සරත් ගාමිණී මයා |
| | | 16 | ඩබ්.කේ. වසන්ත මයා |
| | | | ඩබ්.කේ. ලෙස්ලි මයා |
| | | 17 | ඩබ්. ප්‍රදීප් කුමාර මයා |
| | | 18 | කේ.පී. ලයනල් මයා |
| | | 19 | ඩබ්.කේ. වසන්ත මයා |
| | | 20 | ඩබ්.එස්. පුෂ්ප කුමාර මයා |
| | | 21 | කේ.පී. විලියම් මයා |
| | | | කේ.පී. අනුර මයා |
| | | 22 | කේ.පී. නිශාන්ත මයා |
| | | 23 | ඩබ්. හේමචන්ද්‍ර මයා |
| | | 24 | ජගත් එස්. ගුණසේකර මයා |
| | | | විමලසිරි මතගාවීර මයා |
| | | | අජිත් සුරේකා මයා |
| | | 25 | පී.එම්. සුගත් මයා |
| | | | ජ්.ජ්. චන්ද්‍රසේන මයා |
| | | 26 | ඩබ්.ජී. ආනන්ද මයා |
| | | | ඩබ්.පී. කුමාර මයා |
| | | | වයි.ජී. චන්ද්‍රසිරි මයා |
| | | | ඩබ්.ජී. සේනක මයා |
| | | | ආර්.පී. සනත් මයා |
| | | 27 | එම්.එම්.එස්. කුමාර මයා |
| | | | ඩබ්.ජී. සෝමසිරි මයා |
| | | | ශාන්ත අබේසූරිය මයා |
| | | | කේ.පී. සිඩ්නි මයා |
| | | | ජ්.ජ්. අනුර ශාන්ත මයා |

| | | | |
|---|---|---|---|
| කහදමෝදර | කහදමෝදර | 1 | එල්.එම්.ජ්. ඩර්වින් මයා |
| | | 2 | ජ්.ආර්. මතගාවීර මයා |
| | | 3 | එල්.එම්. චන්ද්‍රපාල මයා |
| | | 4 | ඇල්වින් ජයසිංහ මයා |
| රූකව | සිරිමන්තුඩාව | 1 | දයානන්ද මුතුමාල මයා |
| | තලුන්නගෙ වරාය | 1 | මහින්ද මගාවීර මයා |
| | | 2 | චන්ද්‍රපාල මුතුමාල මයා |
| තංගල්ල | කොටුවේගොඩ (කොටදැල්) | 1 | කරුණාදාස වර්ණකුලසූරිය |
| | | 2 | එස්.ඩබ්. සරත්චන්ද්‍ර මයා මුල් අයිතිකරු |
| | | 3 | ශාන්ත විජේතුංග මයා බී. අප්පුසිංඤෝ |
| | | 4 | ශාන්ත විජේතුංග මයා |
| | | 5 | බදුගේ පීදෝරිස් මයා |
| | පැලවත්ත | 1 | ගුණදාස වික්‍රම කළුතොට මයා |
| | | 2 | ගුණදාස වික්‍රම කළුතොට මයා |
| | | 3 | මහින්දසේන මුතුමාල ජයසූරිය මයා |
| | | 4 | කරුණාදාස වර්ණකුලසූරිය මයා |
| | | 5 | එස්.එච්. ප්‍රේමතිලක මයා |
| | මැදකැටිය | 1 | කේ.එච්. ප්‍රැන්සිස් මයා |
| | | 2 | අජිත් විජේතුංග ඇතුළු පිරිස |
| | | 3 | ටී.එච්. ප්‍රේමචන්ද්‍ර මයා |
| | | 4 | සාලිය වෙදආරච්චි මයා |
| | | 5 | සැමිපාල වෙදආරච්චි මයා |
| | | 6 | කේ.එච්. පියතිලක මයා |
| | | | කේ.එච්. පොඩිසිංඤෝ මයා |
| | | 7 | පීටර් සිරිවර්ධන මයා |
| | | | ඩී.එච්. ගුණපාල මයා |
| | | 8 | ජ්.කේ.ජ්. සෝමසිරි මයා |
| | | 9 | කීර්ති වෙදආරච්චි මයා |
| | | 10 | එම්.ජේ. මහින්දසේන මයා |
| | | 11 | කේ.පී. දිනේෂ් තාරක මයා |
| | | 12 | ටී.එච්. ෂාමිණී දයාශාන්ත මයා |
| | | 13 | ජ්.පී. ජ්. තිලන්ත මයා |
| | | 14 | කේ.එච්. පැටිසිංඤෝ මයා |
| මාවැල්ල | මාවැල්ල | 1 | හාතාගල පටබැඳිගේ පීටර් මයා |
| | | | දෙනගම විතාරනගේ ආරියසේන මයා |
| | | | රත්නවීර පටබැඳිගේ ඇඩ්වින් මයා |
| | | | ඇලන්නෝනා පරණමාන මිය |
| | | | හාතාගල පටබැඳිගේ නෙල්සන් මයා |
| | | | බදුගේ චන්ද්‍රදාස මයා |
| | | | ඩබ්.ජී.එම්. සෝමාවතී මිය |
| | | 2 | බබා සිංඤෝ පරණමාන මයා |
| | | | දෙනගම විතාරනගේ ආරියසේන මයා |
| | | | රත්නවීර පටබැඳිගේ ඇඩ්වින් මයා |
| | | | දෙනගම විතාරනගේ සුගුණපාල මයා |
| | | | ඩබ්.ජී.එම්. සෝමාවතී මිය |
| | | | රට්ටම්බිගේ චන්ද්‍රසිරි මයා |
| | | | රත්නවීර පටබැඳිගේ සරත්චන්ද්‍ර මයා |
| | | | බදුගේ චන්ද්‍රදාස මයා |
| | | | බබාසිංඤෝ ජයවර්ණ මයා |
| | | 3 | ඩැනී වනිගාබදු මයා |
| | | | හාතගල පටබැඳිගේ නෙල්සන් මයා |
| | | | පැන්ච්ස් පරණමාන මයා |
| | | | නැන්සිනෝනා පරණමාන මිය |
| | | | දෙනගම විතාරණගේ සුගතදාස මයා |
| | | | පේමාවතී වනිගාබදු මිය |
| | | | ලයිසිහාමි වනිගාබදු මිය |
| | | | (ජිනසේන එදිරිවීර මයා) |
| | | | ඩබ්.එල්.පී. වැනිස්ටර් ද සිල්වා මයා |
| | | | (මිලිනෝනා වනිගාබදු මිය) |
| | | 4 | රට්ටම්බිගේ විමලදාස මයා |
| | | | සුසන්ත පුෂ්ප කුමාර රත්නවීර මයා |
| | | | රට්ටම්බිගේ ගාමිණී මයා |
| | | | කල්‍යානි වනිගාබදු මිය |
| | | | අමරසේන මුදියන්සේලාගේ සාලිය ප්‍රභාත් කුමාර මයා |
| | | | විජේතුංග ලියන පටබැඳිගේ ලෙස්ලි මයා |
| | | 5 | රට්ටම්බිගේ ඩැනී මයා |
| | | | ඇඩ්වින් රත්නවීර මයා |
| | | | පරණමානගේ සුජිත් රෝහණ මයා |
| | | | දෙනගම විතාරණගේ පීටර් මයා |
| | | | මැන්ච්ස් ගලප්පත්ති මයා |
| | | | බියුටි රමණී විජේතුංග මිය |
| | | | රමණී සෝමලතා රට්ටම්බි මිය |
| | | | විනීතා ගලප්පත්ති මිය |
| | | 6 | ඩැනී වනිගාබදු මයා |
| | | | ඇඩ්වින් රට්ටම්බි මයා |
| | | | උල්ව්ස් හේවාගේ සැම් මයා |
| | | | විජේතුංග ලියන පටබැඳිගේ හෙන්ද්‍රි මයා |
| | | | දෙනගම විතාරණගේ සුගතපාල මයා |
| | | | රත්නවීර පටබැඳිගේ ජීවන්ති මිය |
| | | | කේ.එම්. වීරසේන මයා |
| | | | ඩේවිඩ් රට්ටම්බි මයා |
| | | 7 | රට්ටම්බිගේ ඇඩ්වින් මයා |
| | | | විලියම් මුතුමාල මයා |
| | | | පීරිස් විජේතුංග මයා |
| | | | වර්ජා ගින්නදිගේ පොඩිසිංඤෝ මයා |
| | | | වනිගාබදුගේ මිලී කුසුමා මිය |
| | | | රට්ටම්බිගේ ලලිතා මිය |
| | | | දෙනගම විතාරණගේ සුගතදාස මයා |
| | | | ලැන්ච්ස් විජේතුංග මයා |

| | | | |
|---|---|---|---|
| | | 8 | විලියම් මුතුමාල මයා |
| | | | රට්ටම්බිගේ ඇඩ්වින් මයා |
| | | | බබාසිංඤ්ඤෝ පරණමාන මයා |
| | | | ඩැනිස්ටර් විජේතුංග මයා |
| | | | හාතගල පටබැඳිගේ දාවිත් සිංඤ්ඤෝ මයා |
| | | | රත්නවීර පටබැඳිගේ ඇඩ්වින් මයා |
| | | | දෙනගම විතාරණගේ සුගුණපාල මයා |
| | | | සිරිපාල වනිගාබඳු මයා |
| | | 9 | දෙනගම විතාරණගේ සුගතදාස මයා |
| | | | තංගල්ල මානගේ පීටර් මයා |
| | | | දෙනගම විතාරණගේ සුගුණපාල මයා |
| | | | පරණමානගේ බබාසිංඤ්ඤෝ මයා |
| | | | රත්නවීර පටබැඳිගේ ඇඩ්වින් මයා |
| | | | රත්වීර පටබැඳිගේ පියසේන මයා |
| | | | ආබුහම් ගලප්පත්ති ලොයිඩ් මයා |
| | | | උල්විස් හේවාගේ පීරිස් අප්පු මයා |
| | | | රට්ටම්බිගේ විමලදාස මයා |
| | | 10 | පරණමානගේ බබාසිංඤ්ඤෝ මයා |
| | | | රට්ටම්බිගේ ඇඩ්වින් මයා |
| | | | උල්විස් හේවාගේ සැමී මයා |
| | | | දෙනගම විතාරණගේ සුගතදාස මයා |
| | | | දෙනගම විතාරණගේ ආරියසේන මයා |
| | | | රත්නවීර පටබැඳිගේ සරත්චන්ද්‍ර මයා |
| | | | විජේතුංග ලියන පටබැඳිගේ ලෙස්ලි මයා |
| | | | පොඩිසිංඤ්ඤෝ වර්ෂා හැත්තඳි මයා |
| | | | රට්ටම්බිගේ චන්ද්‍රසිරි මයා |
| | | 11 | ඇඩ්වින් රත්නවීර මයා |
| | | | විජේතුංග ලියන පටබැඳිගේ විල්සන් මයා |
| | | | හාතගල පටබැඳිගේ දාවිත් සිංඤ්ඤෝ මයා |
| | | | රත්නවීර පටබැඳිගේ සදුන් මයා |
| | | | රට්ටම්බිගේ ගාමිණී මයා |
| | | | රට්ටම්බිගේ ගාමිණී මයා |
| | | | දෙනගම විතාරණගේ ආරියසේන මයා |
| | | | දෙනගම විතාරණගේ සුගුණපාල මයා |
| | | | කාසිගේ පේමදාස මයා |
| කුඩාවැල්ල | මිදිඅත්ත | 1 | ඩී.වී. සෝමසිරි මයා ඇතුළු පිරිස |

ඇමුණුම 02

<u>හම්බන්තොට දිස්ත්‍රික්කයේ මාදැල් පිළිබඳ විස්තර</u>

| ධීවර පරීක්ෂක කොට්ඨාශය | මාදැල් වරායේ නම | අයිතිකරුගේ නම | සුනාමියෙන් විනාශ වී ඇත/නැත | සුනාමි ප්‍රතිපූර්ණය විය/ නැත |
|---|---|---|---|---|
| හම්බන්තොට/නැ | හම්බන්තොට/නැ | ඉබුහිම් මොහමඩ් සාජුින් මයා | ඇත. | විය. |
| | | ඉබුහිම් මොහමඩ් තැලිබින් මයා | ඇත. | විය. |
| | | ඉසදින් මොහමඩ් ඉල්හාර් මයා | ඇත. | විය. |
| හම්බන්තොට /බ | හම්බන්තොට/බ | නයිජුදින් නිසාර්දින් මයා | ඇත. | විය. |
| | | ජෙයිනුදින් ඉසදින් මයා | ඇත. | විය |
| | | තාජුදින් අබ්දුල් හමීඩ් අසාර්දින් මයා | ඇත. | විය, |
| | | තාජුදින් අබ්දුල් හමීඩ් තසුමිදින් මයා | ඇත. | විය. |
| වැලිපටන්විල | වැලිපටන්විල | රොමලින්නෝනා ගලප්පත්ති මිය | ඇත. | විය. |
| | | එස්.ජ්.ජී. නෝනාහාමි මිය | ඇත. | විය. |
| | | කේ.පී. සෝමරත්න මයා | ඇත. | විය. |
| | | පී. සුජිත් කුමාර මයා | ඇත. | විය. |
| | | පී. ජිනදාස මයා | ඇත. | විය. |
| | | ඩබ්.එස්. ගුණදාස මයා | ඇත. | විය. |
| | | ජ්.එම්.ආර්.ජ්. දිමුතු රංගන මයා | ඇත. | විය. |
| | | බේබිනෝනා විජේතුංග මයා | ඇත. | විය. |
| | | බේබිනෝනා විජේතුංග මයා | ඇත. | විය. |
| | | ඩබ්.එස්. නිශාන්ත මයා | ඇත. | විය. |
| | | එස්.ජ්. වෙනිසන් මයා | ඇත. | විය. |
| | | සෝමසිරි එදිරිවීර මයා | ඇත. | විය. |
| | | ඩී.එච්. ප්‍රසන්න මයා | ඇත. | විය. |
| | | ජ්.එම්.ආර්.ජ්. ප්‍රේමසිරි මයා | ඇත. | විය. |
| | | ඩබ්.පී. සිඩ්නි මයා | ඇත. | විය. |
| | | පී. සුගතදාස මයා | ඇත. | විය. |
| | | ජ්.පී. ජයසේන මයා | ඇත. | විය |
| | | කේ.පී. ආරියපාල මයා | ඇත. | විය. |
| | පට්ටියවරාය | එම්.කේ. මුණිදාස මයා | ඇත. | විය. |
| | | එම්.කේ. ප්‍රාවිසිංඤ්ඤො මයා | ඇත. | විය. |
| | | පී. ජිනදාස මයා | ඇත. | විය. |
| | | ජ්.පී. ජයසේන මයා | ඇත. | විය. |
| | | එම්.කේ. නිහාල් මයා | ඇත. | විය. |
| | | එල්.එච්.එම්. තිලන්ත මයා | ඇත. | විය. |
| | | ඩබ්.එස්. නිහාල්නන්ද මයා | ඇත. | විය. |
| | | ආර්.ජී. ඇන්ඩෘ මයා | ඇත. | විය, |
| | | වයි.ජී. සීතා රංජනී මිය | ඇත. | විය. |
| | | ඩී.එච්. ප්‍රසන්න මයා | ඇත. | විය. |
| | | ආර්.ජී. ඇන්ඩෘ මයා | ඇත. | විය. |
| | | එච්.එල්. සිරිසේන මයා | ඇත. | විය, |
| | | ව්‍යාපෘති සංගමය , වාදුරුප්ප | ඇත. | විය. |
| | | විමල්සිරි මතහවීර මයා | ඇත. | විය. |
| | | එන්.එච්. විජේපාල මයා | ඇත. | විය. |
| | | ඩබ්.කේ. සමින්ද කුමාර මයා | ඇත. | විය. |
| | | කේ. පේමදාස මයා | ඇත. | විය. |
| | | විමල්සිරි මතහවීර මයා | ඇත. | විය. |
| | | එච්.ඩබ්. නන්දසේන මයා | ඇත. | විය. |
| කලමැටිය | කලමැටිය | කේ.පී. නිමල් මයා | ඇත. | විය. |
| | | කේ.පී. ඩැනී මයා | ඇත. | විය. |
| | | කේ.පී. පීරිස් මයා | ඇත. | විය. |
| | | ඩබ්.කේ. වසන්ත මයා | ඇත. | විය. |
| | | සුජිත් එදිරිවීර මයා | ඇත. | විය. |
| | | ඩබ්.කේ. දාවිත් සිංඤ්ඤො මයා | ඇත. | විය. |
| | | එස්.පී. පේමදාස මයා | ඇත. | විය. |
| | | එම්.ජ්. ජයසූරිය මයා | ඇත. | විය. |
| | | සී. අන්දරගේ | ඇත. | විය, |
| | | කේ.පී. අනුර මයා | ඇත. | විය. |
| | | නිමල් සිරිවර්ධන මයා | ඇත. | විය. |
| | | චන්ද්‍රසේන සිරිවර්ධන මයා | ඇත. | විය. |
| | | කේ.පී. ගැමුණු මයා | ඇත. | විය. |
| | | මහින්ද මතහවීර මයා | ඇත. | විය. |
| | | විමලසිරි මතහවීර මයා | ඇත. | විය. |
| | | ජ්.පී. විමලසිලි මිය | ඇත. | විය. |
| | | එස්.පී. පේමදාස මයා | ඇත. | විය. |
| | | එම්.එම්. සුමතිපාල මයා | ඇත. | විය. |
| | | ඩබ්.කේ.සරත් ගාමිණී මයා | ඇත. | විය, |
| | | ඩබ්.කේ. ලෙස්ලි මයා | ඇත. | විය. |
| | | ඩබ්. ප්‍රදීප් කුමාර මයා | ඇත. | විය. |
| | | කේ.පී. ලයනල් මයා | ඇත. | විය, |
| | | ඩබ්.එස්. පුෂ්ප කුමාර මයා | ඇත. | විය, |
| | | කේ.පී. විලියම් මයා | ඇත. | විය, |
| | | කේ.පී. අනුර මයා | ඇත. | විය. |
| | | කේ.පී. නිශාන්ත මයා | ඇත. | විය. |
| | | ඩබ්. හේමචන්ද්‍ර මයා | ඇත. | විය. |
| | | ජගත් එස්. ගුණසේකර මයා | ඇත. | විය. |
| | | විමලසිරි මතහවීර මයා | ඇත. | විය. |
| | | අජිත් සුරේකා මයා | ඇත. | විය. |
| | | පී.එම්. සුගත් මයා | ඇත. | විය. |
| | | ජ්.ජ්. චන්ද්‍රසේන මයා | ඇත. | විය, |
| | | ඩබ්.ජී.,ආනන්ද මයා | ඇත. | විය. |
| | | ඩබ්.පී. කුමාර මයා | ඇත. | විය. |
| | | වයි.ජී. චන්ද්‍රසිරි මයා | ඇත. | විය. |
| | | ඩබ්.ජී. සේනක මයා | ඇත. | විය. |
| | | ආර්.පී. සනත් මයා | ඇත. | විය. |
| | | එම්.එම්.එස්. කුමාර මයා | ඇත. | විය. |
| | | ඩබ්.ජ්. සෝමසිරි මයා | ඇත. | විය. |
| | | ශාන්ත අබේසූරිය මයා | ඇත. | විය. |
| | | කේ.පී. සිඩ්නි මයා | ඇත. | විය. |
| | | ජ්.ජ්. අනුර ශාන්ත මයා | ඇත. | විය. |
| කහදමෝදර | කහදමෝදර | 01. එල්.එම්.ජ්. ඩර්වින් මයා | ඇත. | විය. |
| | | 02. ජ්.ආර්. මතහවීර මයා | ඇත. | විය, |
| | | 03. එල්.එම්. චන්ද්‍රපාල මයා | ඇත. | විය. |
| | | 04. ඇලඩින් ජයසිංහ මයා | ඇත. | විය. |
| රූකව | සිරිමන්තුඩාව තුඩුන්නගෙ වරාය | 01. දයානන්ද මුතුමාල මයා | ඇත. | විය, |
| | | 01. මහින්ද මගහවීර මයා | ඇත. | විය. |
| | | 02. චන්ද්‍රපාල මුතුමාල මයා | ඇත. | විය. |
| තංගල්ල | මැදකැටිය | 02. අජිත් විජේතුංග ඇතුළු පිරිස | ඇත. | විය. |
| | | 03. වී.එච්. ප්‍රේමචන්ද්‍ර මයා | ඇත. | විය. |
| | | 04. සාලිය වෙදආරච්චි මයා | ඇත. | විය. |
| | | 05. සැමීපාල වෙදආරච්චි මයා | ඇත. | විය. |
| | | 06. කේ.එච්. පියතිලක මයා | ඇත. | විය. |
| | | කේ.එච්. පොඩිසිංඤ්ඤො මයා | ඇත. | විය. |
| | | 07. පීටර් සිරිවර්ධන මයා | ඇත. | විය. |
| | | ඩී.එච්. ගුණපාල මයා | ඇත. | විය. |
| | | 09. කීර්ති වෙදආරච්චි මයා | ඇත. | විය. |
| මාවැල්ල | මාවැල්ල | 03. ඩැනී වනිගාබඳු මයා | ඇත. | විය. |
| | | හාතගල පටබැඳිගේ නෙල්සන් මයා | ඇත. | විය. |
| | | පැන්ටිස් පරණමාන මයා | ඇත. | විය. |
| | | නැන්සිනෝනා පරණමාන මිය | ඇත. | විය. |
| | | දෙනගම විතාරණගේ සුගතදාස මයා | ඇත. | විය. |
| | | පේමාවති වනිගාබඳු මිය | ඇත. | විය. |
| | | ලයිසිහාමි වනිගාබඳු මිය | ඇත. | විය. |
| | | (ජිනසේන එදිරිවීර මයා) | ඇත. | විය. |
| | | ඩබ්.එල්.පී. වින්ස්ටර් ද සිල්වා මයා | ඇත. | විය. |
| | | (මිලිනෝනා වනිගාබඳු මිය) | ඇත. | විය. |

## ලංකාවේ රූපවාහිනී ආයතන: විස්තර
## இலங்கையிலுள்ள தொலைக்காட்சி நிலையங்கள்: விபரம்
## TV STATIONS IN SRI LANKA: DETAILS

0593/'10

10. ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

නමාධ්‍ය හා ප්‍රවෘත්ති අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) රට පුරා ක්‍රියාත්මක සියලු රූපවාහිනී ආයතනවල නම් සහ ඒවායේ හිමිකරුවන්ගේ හා අධ්‍යක්ෂවරුන්ගේ නම් කවරේද;

(ii) එම රූපවාහිනී ආයතන වෙත නිකුත් කොට ඇති සංඛ්‍යාත සංඛ්‍යාව හා ඒවායේ නාලිකා අංක කවරේද;

(iii) එම එක් එක් ආයතනයේ සේවයේ නියුතු පුද්ගලයන් සංඛ්‍යාව කවරේද;

(iv) එම එක් එක් ආයතන ක්‍රියාත්මක වීම ආරම්භ කළ දිනය කවරේද;

(v) පසුගිය වර්ෂ පහක කාලය තුළ එක් එක් වර්ෂයේදී ඉහත සඳහන් රූපවාහිනී ආයතන විසින් ගෙවන ලද බදු ප්‍රමාණය කවරේද;

(vi) එක් එක් නාලිකාව මගින් ආනයනය කරන ලද විදේශ චිත්‍රපට වෙනුවෙන් පසු ගිය වර්ෂ පහ තුළ ගෙවන ලද බදු ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නො එසේ නම්, ඒ මන්ද?

வெகுசன ஊடக, தகவல் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) நாட்டில் இயங்கும் சகல தொலைக்காட்சி நிலையங்களினது பெயர்களையும் அவற்றின் உரிமையாளர்களினதும், பணிப்பாளர்களினதும் பெயர்களையும்,

(ii) அத்தொலைக்காட்சி நிலையங்களுக்கு வழங்கப் பட்டுள்ள அலைவரிசைகளின் எண்ணிக்கையி னையும் அவ்வலைவரிசைகளின் இலக்கங்களை யும்,

(iii) அவை ஒவ்வொன்றிலும் பணியாற்றும் ஆட்களின் எண்ணிக்கையினையும்,

(iv) அந்நிலையங்கள் ஒவ்வொன்றும் இயங்கத் தொடங்கிய திகதியினையும்,

(v) மேற்குறிப்பிட்ட தொலைக்காட்சி நிலையங்களி னால் கடந்த 5 வருடங்களில் செலுத்தப்பட்டுள்ள வரிகளின் தொகையினை வருடாந்த அடிப்படை யிலும்,

(vi) வெளிநாட்டுப் படங்களின் இறக்குமதிக்காக ஒவ்வொரு ஒளிபரப்புச் சேவையினாலும் கடந்த 5 வருடங்களாகச் செலுத்தப்பட்டுள்ள வரிகளின் தொகையினை வெவ்வேறாகவும்,

அவர் அறியத் தருவாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Mass Media and Information:

(a) Will he state-

(i) the names of all the TV stations operating in the country and the names of the Owners and Directors of those TV stations;

(ii) the number of frequencies issued to those TV stations and what the channel numbers are;

(iii) the number of people working in each of those stations;

(iv) the dates from which each of the stations are operating ;

(v) the amount of taxes paid by the aforesaid TV stations for the last 5 years on per year basis; and

(vi) the amount of taxes paid on import of foreign films by each channel for last five years separately?

(b) If not, why?

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ජනමාධ්‍ය හා ප්‍රචාරක අමාත්‍යතුමා වෙනුවෙන් මම පිළිතුර **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) කරුණාකර ඇමුණුම 01 බලන්න.

(ii) කරුණාකර ඇමුණුම 02 බලන්න.

(iii) කරුණාකර ඇමුණුම 03 බලන්න.

(iv) කරුණාකර ඇමුණුම 04 බලන්න.

(v) ප්‍රශ්නය පැහැදිලි නැත. කුමන ආයතනයක් වෙත ගෙවන ලද කුමන බදු මුදලක්ද යන්න සඳහන් නොවේ.

(vi) විදේශීය චිත්‍රපට, විදේශීය ටෙලි නාට්‍ය සහ විදේශීය වෙළඳ දැන්වීම් වෙනුවෙන් අය කරන ලද මුදල් ප්‍රමාණ සඳහා කරුණාකර ඇමුණුම 05 බලන්න.

(ආ) අදාළ නොවේ.

ඇමුණුම 01

**රටතුළ ක්‍රියාත්මක රූපවාහිනී ආයතනවල නම් සහ ඒවායේ හිමිකරුවන්ගේ හා අධ්‍යක්ෂවරුන්ගේ නම්**

| රූපවාහිනී ආයතනය | හිමිකරුගේ /අධ්‍යක්ෂවරුන්ගේ නම් |
|---|---|
| 01. ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව *(Sri Lanka Rupavahini Corporation)* | සභාපති - සරත් කෝන්ගහගේ මහතා |
| | අධ්‍යක්ෂ - ආචාර්ය රෝහන ලක්ෂ්මන් පියදාස මහතා |
| | අධ්‍යක්ෂ - ජේ.එච්.ජේ. ජයමහ මහතා |
| | අධ්‍යක්ෂ - එඩ්වඩ් ජයකොඩි මහතා |
| | අධ්‍යක්ෂ - වසන්ත ද සිල්වා මහතා |
| 02. ස්වාධීන රූපවාහිනී සේවය *(Independent Televition Networks Ltd.)* | සභාපති - රොස්මන්ඩ් සේනාරත්න මහතා |
| | අධ්‍යක්ෂ - පී.පී. දසනායක මහතා |
| | අධ්‍යක්ෂ - හසීම් ඕමාර් මහතා |
| | අධ්‍යක්ෂ - මාපලගම විමලරත්න මහතා |
| | අධ්‍යක්ෂ - ජේ. දේවපිරාග් මහතා |
| 03. ටෙල්ශාන් නෙට්වර්ක් පුද්ගලික ආයතනය *(Teleshan Network Pvt.Ltd.)* | සභාපති - ෂාන් වික්‍රමසිංහ මහතා |
| | අධ්‍යක්ෂ - එස්. තිලකාන්ති වික්‍රමසිංහ මිය |
| | අධ්‍යක්ෂ - එන්. මරීසියා වික්‍රමසිංහ මහතා |
| | අධ්‍යක්ෂ - බන්දුමතී වික්‍රමසිංහ මිය |
| | අධ්‍යක්ෂ - ආර්. හිරාජ් වික්‍රමසිංහ මහතා |
| | අධ්‍යක්ෂ - සන්පී තැකඩ මහතා |
| | අධ්‍යක්ෂ - හියොෆම් ඉගෝරි මහතා |
| | අධ්‍යක්ෂ - වසන්ත ලේල්වල ගුරුගේ මහතා |
| | අධ්‍යක්ෂ - හේමක සෙනරත් අමරසූරිය මහතා |
| | අධ්‍යක්ෂ - කේ.ඒ. විරතුංග මහතා |
| 04. අයිඩබ්ලිව්එස් හෝල්ඩිං පුද්ගලික ආයතනය *(IWS Holding Pvt.Ltd.)* | සභාපති - ආතර් සේනානායක මහතා |
| | අධ්‍යක්ෂ - අයි.ඩබ්. සේනානායක මිය |
| | අධ්‍යක්ෂ - ඒ.එච්.ඩබ්. සේනානායක මිය |
| | විකල්ප අධ්‍යක්ෂ - අශෝක ද සොයිසා ගුණසේකර මහතා, අයි.ඩබ්. සේනානායක මිය හා ඒ.එච්.ඩබ්. සේනානායක මිය වෙනුවට |

| | |
|---|---|
| 05. ඊඒපී නෙට්වර්ක් පුද්ගලික ආයතනය (EAP Networks Pvt.Ltd.) | සභාපති - ආචාර්ය සෝමා එදිරිසිංහ මිය |
| | අධ්‍යක්ෂ - ජීවක හේමාල් එදිරිසිංහ මහතා |
| | අධ්‍යක්ෂ - නාළක ප්‍රේමලාල් එදිරිසිංහ මහතා |
| | අධ්‍යක්ෂ - දීපා අන්ජලී එදිරිසිංහ මිය |
| | අධ්‍යක්ෂ - අසංක ශ්‍රීමාල් එදිරිසිංහ මහතා |
| | අධ්‍යක්ෂ - අමල් මැක්ෂන් ප්‍රනාන්දු මහතා |
| 06. මහාරාජා ඕගනයිසේෂන් පුද්ගලික ආයතනය (MTV Channel Pvt.Ltd.) | සභාපති - රාජේන්ද්‍රම් රාජාමහේන්ද්‍රන් මහතා |
| | අධ්‍යක්ෂ - මහාරාජා අරුන් ප්‍රදීප් මහතා |
| | අධ්‍යක්ෂ - සී. හිමල් සකීර්තනායගම් මහතා |
| | අධ්‍යක්ෂ - ඩබ්. විවියන් මනෝ මහතා |
| | අධ්‍යක්ෂ - බී. රුද්‍රානි මහතා |
| | අධ්‍යක්ෂ - ඒ. විල්සන් ෆිට්ස්රෝයි ශ්‍රීලාල් මහතා |
| | අධ්‍යක්ෂ - එල්. ක්ලයිව් විලියම් මහතා |
| | අධ්‍යක්ෂ - එම්. ඉෂානි චම්පිකා මිය |
| | අධ්‍යක්ෂ - ඩබ්. කපිල ඉන්දික විරක්කොඩි මහතා |
| | අධ්‍යක්ෂ - ආර්. ශෂිධරන් මහතා |
| | අධ්‍යක්ෂ - ඕහාරා මන්මෝහන් මහතා |
| | අධ්‍යක්ෂ - පී. ඇන්ජලෝ මහාරාජා මහතා |
| | අධ්‍යක්ෂ - සී. කගනාදන් මහතා |
| | අධ්‍යක්ෂ - කේ.එස්. ලන්කේෂ බුන්මදත්ත මහතා |
| | අධ්‍යක්ෂ - ඩබ්. හිංකොලා කැරන් ගීඩා මහතා |
| | අධ්‍යක්ෂ - ඩබ්. සුසිල් චන්ද්‍ර මහතා |
| | අධ්‍යක්ෂ - කේ. සිරුබාහරන් මහතා |
| | අධ්‍යක්ෂ - ඩබ්. චන්දිම රොඩ්රිගෝ මහතා |
| | අධ්‍යක්ෂ - පී.බී.ඩබ්. අනුරාධ ජයසිංහ මහතා |
| | අධ්‍යක්ෂ - එම්.ජේ.එස්.බී.ඩබ්. වීරපරාක්‍රම මහතා |
| 07. එම්ජීඑම්ආර් නෙට්වර්ක් පුද්ගලික ආයතනය (MGMR Networks Pvt.Ltd.) | සභාපති - මහින්ද රාමනායක මහතා |
| | අධ්‍යක්ෂ - එච්.ඊ. ශ්‍රියානි රාමනායක මිය |
| | අධ්‍යක්ෂ - එම්.පී.ජේ. කුමාර රාමනායක මහතා |
| | අධ්‍යක්ෂ - ආර්.ඩී. එදිරිසිංහ මහතා |
| | අධ්‍යක්ෂ - එම්.පී.ඩී.සී. රාමනායක මහතා |
| | අධ්‍යක්ෂ - එම්.පී.සී.වී. එදිරිසිංහ මිය |
| | අධ්‍යක්ෂ - එම්.එම්.එල්.කේ. රාමනායක මිය |

| | |
|---|---|
| 08. පවර් හවුස් පුද්ගලික ආයතනය (Power House Pvt.Ltd.) | සභාපති - ලක්සිරි වික්‍රමගේ මහතා |
| | අධ්‍යක්ෂ - ඩබ්.සොනාලි ප්‍රනාන්දු මිය |
| | අධ්‍යක්ෂ - ඩී. සුසන්ත ජයවීර මිය |
| 09. ටෙලිවිෂන් ඇන්ඩ් රේඩියෝ නෙට්වර්ක් (Television and Radio Network) | සභාපති - බී.ඊ.සී. අබේවර්ධන මහතා |
| | අධ්‍යක්ෂ - කේ.එම්.ඩී.ආර්.එස්. ජයතිලක මහතා |
| 10. පීපල්ස් මීඩියා නෙට්වර්ක් පුද්ගලික ආයතනය (People's Media Network Pvt.Ltd.) | සභාපති - විපිත විජේසූරිය මහතා |
| | අධ්‍යක්ෂ - ජේ.සී. පෙරේරා ජයසිංහ මහතා |
| | අධ්‍යක්ෂ - එම්.ඩබ්.ඒ.ඩී. හිහල් විජේසූරිය මහතා |
| | අධ්‍යක්ෂ - එන්.පී. සූරියආරච්චි මහතා |
| | අධ්‍යක්ෂ - එම්.පී. ජයසිංහ මහතා |
| 11. වොයිස් ඔෆ් ඒෂියා නෙට්වර්ක් පුද්ගලික ආයතනය (Voice of Asia Network Pvt.Ltd.) | සභාපති - ප්‍රියන්ත කාරියප්පෙරුම මහතා |
| | අධ්‍යක්ෂ - පී. රුක්මලි කිරිආරච්චි මහතා |
| | අධ්‍යක්ෂ - ටී. මිල්රුක්ෂි ද සිල්වා මහතා |
| 12. ඩයලොග් ටෙලිවිෂන් පුද්ගලික ආයතනය (Asset Radio Broadcasting Pvt.Ltd.) (Dialog Television Pvt.Ltd.) | ප්‍ර. විධායක නිලධාරී - නුෂාඩ් පෙරේරා මහතා |
| | අධ්‍යක්ෂ - රමේෂ් ස්කැෆ්ටර් මහතා |
| | අධ්‍යක්ෂ - ටී.ඊ.එම්.එස්. ස්කැෆ්ටර් මහතා |
| | අධ්‍යක්ෂ - පී.ඊ. ස්කැෆ්ටර් මහතා |
| | අධ්‍යක්ෂ - දිනේෂ් ස්කැෆ්ටර් මහතා |
| | අධ්‍යක්ෂ - මංජුල මැතිව්ස් මහතා |
| 13. විස් බ්‍රෝඩ්කාස්ට්ං පුද්ගලික ආයතනය (VIS Broadcasting Pvt.Ltd.) | සභාපති - කස්සප සෙනරත් මහතා |
| | අධ්‍යක්ෂ - වී. රංගනී හෙට්ටිආරච්චි මිය |
| | අධ්‍යක්ෂ - කේ.ඩී.එන්. දිමුලාන සිලනාත මහතා |

ඇමුණුම 02

## රූපවාහිනී ආයතන වෙත නිකුත්කොට ඇති සංඛ්‍යාත සංඛ්‍යාව හා ඒවායේ නාලිකා අංක

| රූපවාහිනී ආයතනය | සංඛ්‍යාත සංඛ්‍යාව | ස්ථානය | සේවය | සංඛ්‍යාතය (MHz) / CH අංකය |
|---|---|---|---|---|
| 01. ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව (Sri Lanka Rupavahini Corporation) | 20. | කොළඹ | TV / UHF | 39 |
| | | කොළඹ | TV / UHF | 41 |
| | | කොළඹ | TV / UHF | 52 |
| | | දෙණියාය | TV / UHF | 39 |
| | | දෙණියාය | TV / UHF | 41 |
| | | යාපනය | TV / UHF | 21 |
| | | යාපනය | TV / UHF | 23 |
| | | යාපනය | TV / UHF | 43 |
| | | කළුතර - හිගුලකන්ද | TV / UHF | 51 |
| | | කළුතර - පද්දාගල | TV / UHF | 52 |
| | | නුවර - හන්තාන | TV / UHF | 39 |
| | | නුවර - ප්‍රිම්රෝස් | TV / UHF | 39 |
| | | මඩුකන්ද | TV / UHF | 30 |
| | | තමුනුකුල | TV / UHF | 52 |
| | | යටියන්තොට | TV / UHF | 43 |
| | | නුවර | TV / VHF III | 10 |
| | | තමුනුකුල | TV / VHF III | 10 |
| | | නුවරඑළිය | TV / VHF III | 05 |
| | | නුවරඑළිය | TV / VHF III | 07 |
| | | සූරියකන්ද | TV / VHF III | 11 |
| 02. සී / ස ස්වාධීන රූපවාහිනී සේවය (Independent Television Networks Ltd.) | 09 | කොළඹ | TV / UHF | 24 |
| | | හුන්නස්ගිරිය | TV / UHF | 24 |
| | | යාපනය | TV / UHF | 25 |
| | | සූරියකන්ද | TV / UHF | 24 |
| | | කොළඹ | TV / VHF III | 10 |
| | | දෙණියාය | TV / VHF III | 09 |
| | | කරගහතැන්න | TV / VHF III | 09 |
| | | හයාබැද්ද | TV / VHF III | 12 |
| | | යටියන්තොට | TV / VHF III | 12 |
| 03. ටෙල්ෂාන් නෙට්වර්ක් පුද්ගලික ආයතනය (Teleshan Network Pvt.Ltd.) | 09 | බදුල්ල | TV / UHF | 21 |
| | | කොළඹ | TV / UHF | 21 |
| | | ගාල්ල | TV / UHF | 26 |
| | | නුවර | TV / UHF | 26 |
| | | රත්නපුර | TV / UHF | 26 |
| | | නුවරඑළිය | TV / VHF I | .04 |
| | | පිළියන්දල | TV / VHF I | 03 |
| | | පොල්ගහවෙල | TV / VHF I | 03 |
| | | කරගහතැන්න | TV / VHF III | 11 |
| 04. අයිඩබ්ලිව්එස් හෝල්ඩිං පුද්ගලික ආයතනය (IWS Holding Pvt.Ltd.) | 03 | කොළඹ | TV / UHF | 28 |
| | | යාපනය | TV / UHF | 36 |
| | | නුවර | TV / UHF | 52 |
| 05. ඊඒපී නෙට්වර්ක් පුද්ගලික ආයතනය (EAP Networks Pvt.Ltd.) | 12 | බදුල්ල | TV / UHF | 35 |
| | | කොළඹ | TV / UHF | 31 |
| | | කොළඹ | TV / UHF | 35 |
| | | ගම්මඩුව | TV / UHF | 37 |
| | | ගොන්ගල | TV / UHF | 37 |
| | | හුන්නස්ගිරිය | TV / UHF | 40 |
| | | කළුතර | TV / UHF | 40 |
| | | නුවර | TV / UHF | 22 |
| | | මාගල්කන්ද | TV / UHF | 40 |
| | | හයාබැද්ද | TV / UHF | 40 |
| | | නුවරඑළිය | TV / UHF | 33 |
| | | රත්නපුර | TV / UHF | 22 |
| 06. මහාරාජා ඕගනයිසේෂන් පුද්ගලික ආයතනය (MTV Channel Pvt.Ltd.) | 14 | කොළඹ | TV / UHF | 58 |
| | | කොළඹ | TV / UHF | 23 |
| | | කොළඹ | TV / UHF | 25 |
| | | ගම්මඩුව | TV / UHF | 23 |
| | | ගම්මඩුව | TV / UHF | 25 |
| | | ගොන්ගල | TV / UHF | 25 |
| | | ගොන්ගල | TV / UHF | 29 |
| | | හුන්නස්ගිරිය | TV / UHF | 51 |
| | | හුන්නස්ගිරිය | TV / UHF | 58 |
| | | යාපනය | TV / UHF | 46 |
| | | නුවර | TV / UHF | 29 |
| | | නුවර | TV / UHF | 51 |
| | | නුවරඑළිය | TV / UHF | 27 |
| | | නුවරඑළිය | TV / UHF | 34 |

| | | | | |
|---|---|---|---|---|
| 07. එම්ජීඑම්ආර් නෙට්වර්ක් පුද්ගලික ආයතනය (MGMR Networks Pvt.Ltd.) | 02 | කොළඹ | TV / UHF | 30 |
| | | නුවර | TV / UHF | 56 |
| 08. පවර් හවුස් පුද්ගලික ආයතනය (Power House Pvt.Ltd.) | 09 | කොළඹ | TV / UHF | 37 |
| | | ගම්මඩුව | TV / UHF | 28 |
| | | ගොන්ගල | TV / UHF | 31 |
| | | යාපනය | TV / UHF | 31 |
| | | කළුතර | TV / UHF | 56 |
| | | නුවර | TV / UHF | 32 |
| | | කොකාවිල් | TV / UHF | 34 |
| | | හයාබැද්ද | TV / UHF | 32 |
| | | නුවරඑළිය | TV / UHF | 36 |
| 09. ටෙලිවිෂන් ඇන්ඩ් රේඩියෝ නෙට්වර්ක් (Television and Radio Network) | 06 | කොළඹ | TV / UHF | 48 |
| | | කොළඹ | TV / UHF | 51 |
| | | ගොන්ගල | TV / UHF | 48 |
| | | හුන්නස්ගිරිය | TV / UHF | 53 |
| | | ලග්ගල | TV / UHF | 48 |
| | | හයාබැද්ද | TV / UHF | 53 |
| 10. පීපල්ස් මීඩියා නෙට්වර්ක් පුද්ගලික ආයතනය (People's Media Network Pvt.Ltd.) | | කොළඹ | TV / UHF | 53 |
| | | කරගහතැන්න | TV / UHF | 41 |
| 11. වොයිස් ඔෆ් ඒෂියා නෙට්වර්ක් පුද්ගලික ආයතනය (Voice of Asia Network Pvt.Ltd.) | 08 | කොළඹ | TV / UHF | 32 |
| | | කොළඹ | TV / UHF | 46 |
| | | ගම්මඩුව | TV / UHF | 21 |
| | | ගම්මඩුව | TV / UHF | 31 |
| | | ගොන්ගල | TV / UHF | 23 |
| | | නුවර | TV / UHF | 35 |
| | | නුවරඑළිය | TV / UHF | 42 |
| | | නුවරඑළිය | TV / UHF | 49 |
| 12. ඩයලොග් ටෙලිවිෂන් පුද්ගලික ආයතනය (Asset Radio Broadcasting Pvt.Ltd.) (Dialog Television Pvt.Ltd.) | 05 | කොළඹ | TV / UHF | 44 |
| | | කොළඹ | TV / UHF | 50 |
| | | ගොන්ගල | TV / UHF | 50 |
| | | මඩොල්සිම | TV / UHF | 54 |
| | | මාගල්කන්ද | TV / UHF | 50 |
| 13. විස් බ්‍රෝඩ්කාස්ට්ං පුද්ගලික ආයතනය (VIS Broadcasting Pvt.Ltd.) | 02 | කොළඹ | TV / UHF | 22 |
| | | කොළඹ | TV / UHF | 29 |

ඇමුණුම 03

## රටතුළ ක්‍රියාත්මක රූපවාහිනී ආයතනවල සේවයේ නියුතු සේවක සංඛ්‍යාව

| රූපවාහිනී ආයතනය | සේවක සංඛ්‍යාව |
|---|---|
| 01. ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව (Sri Lanka Rupavahini Corporation) | 920 |
| 02. සී /ස ස්වාධීන රූපවාහිනී සේවය (Independent Televition Networks Ltd.) | 562 |
| 03. ටෙල්ශාන් නෙට්වර්ක් පුද්ගලික ආයතනය (Teleshan Network Pvt.Ltd.) | 115 |
| 04. අයිඩබ්ලිව්එස් හෝල්ඩිං පුද්ගලික ආයතනය (IWS Holding Pvt.Ltd.) | 47 |
| 05. ඊඒපී නෙට්වර්ක් පුද්ගලික ආයතනය (EAP Networks Pvt.Ltd.) | 404 |
| 06. මහාරාජා ඕගනයිසේෂන් පුද්ගලික ආයතනය (MTV Channel Pvt.Ltd.) | 671 |
| 07. එම්ජීඑම්ආර් නෙට්වර්ක් පුද්ගලික ආයතනය (MGMR Networks Pvt.Ltd.) | 26 |
| 08. පවර් හවුස් පුද්ගලික ආයතනය (Power House Pvt.Ltd.) | 283 |
| 09. ටෙලිවිෂන් ඇන්ඩ් රේඩියෝ නෙට්වර්ක් (Television and Radio Network) | 16 |
| 10. පීපල්ස් මීඩියා නෙට්වර්ක් පුද්ගලික ආයතනය (People's Media Network Pvt.Ltd.) | තොරතුරු ලබා දී නැත. |
| 11. වොයිස් ඔෆ් ඒෂියා නෙට්වර්ක් පුද්ගලික ආයතනය (Voice of Asia Network Pvt.Ltd.) | 93 |
| 12. ඩයලොග් ටෙලිවිෂන් පුද්ගලික ආයතනය (Asset Radio Broadcasting Pvt.Ltd.) (Dialog Television Pvt.Ltd.) | තොරතුරු ලබා දී නැත. |
| 13. විස් බ්‍රෝඩ්කාස්ට්ං පුද්ගලික ආයතනය (VIS Broadcasting Pvt.Ltd.) | තොරතුරු ලබා දී නැත. |

ඇමුණුම 04

## රටතුළ ක්‍රියාත්මක රූපවාහිනී ආයතන ක්‍රියාත්මකවීම ආරම්භ කළ දින

| රූපවාහිනී ආයතනය | ආරම්භ කළ දිනය |
|---|---|
| 01. ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව (Sri Lanka Rupavahini Corporation) | 1982.02.15 |
| 02. සී /ස ස්වාධීන රූපවාහිනී සේවය (Independent Televition Networks Ltd.) | 1979.06.05 |
| 03. ටෙල්ශාන් නෙට්වර්ක් පුද්ගලික ආයතනය (Teleshan Network Pvt.Ltd.) | 1993.06.21 |
| 04. අයිඩබ්ලිව්එස් හෝල්ඩිං පුද්ගලික ආයතනය (IWS Holding Pvt.Ltd.) | 2003.07.21 |
| 05. ඊඒපී නෙට්වර්ක් පුද්ගලික ආයතනය (EAP Networks Pvt.Ltd.) | 1996.04.30 |
| 06. මහාරාජා ඕගනයිසේෂන් පුද්ගලික ආයතනය (MTV Channel Pvt.Ltd.) | 1992.05.08 |
| 07. එම්ජීඑම්ආර් නෙට්වර්ක් පුද්ගලික ආයතනය (MGMR Networks Pvt.Ltd.) | 2007.01.07 |
| 08. පවර් හවුස් පුද්ගලික ආයතනය (Power House Pvt.Ltd.) | 2005.10.11 |
| 09. ටෙලිවිෂන් ඇන්ඩ් රේඩියෝ නෙට්වර්ක් (Television and Radio Network) | 2005.12.05 |
| 10. පීපල්ස් මීඩියා නෙට්වර්ක් පුද්ගලික ආයතනය (People's Media Network Pvt.Ltd.) | 2008.01.11 |
| 11. වොයිස් ඔෆ් ඒෂියා නෙට්වර්ක් පුද්ගලික ආයතනය (Voice of Asia Network Pvt.Ltd.) | 2009.09.17 |
| 12. ඩයලොග් ටෙලිවිෂන් පුද්ගලික ආයතනය (Asset Radio Broadcasting Pvt.Ltd.) (Dialog Television Pvt.Ltd.) | 2007.05.01 |
| 13. විස් බ්‍රෝඩ්කාස්ට්ං පුද්ගලික ආයතනය (VIS Broadcasting Pvt.Ltd.) | 2010.05.22 |

ඇමුණුම 05

**2006.06.15 දින සිට 2010.12.31 දින දක්වා එක් එක් රූපවාහිනී ආයතන විසින් විදේශීය චිත්‍රපට, විදේශීය ටෙලිනාට්‍ය සහ විදේශීය වෙළඳ දැන්වීම් වෙනුවෙන් ගෙවන ලද බදු**

| රූපවාහිනී ආයතනය | ගෙවන ලද වර්ෂය | | | | | මුළු බදු මුදල |
|---|---|---|---|---|---|---|
| | 2006 | 2007 | 2008 | 2009 | 2010 | |
| 01. ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව *(Sri Lanka Rupavahini Corporation)* | 8,540,500.00 | 20,435,000.00 | 23,163,850.00 | 19,209,770.00 | 18,259,500.00 | 89,608,620.00 |
| 02. සී /ස ස්වාධීන රූපවාහිනී සේවය *(Independent Televition Networks Ltd.)* | 2,682,000.00 | 5,366,000.00 | 5,897,000.00 | 11,504,000.00 | 24,683,800.00 | 50,132,800.00 |
| 03. ඊඒපී නෙට්වර්ක් පුද්ගලික ආයතනය - ETV *(EAP Networks Pvt.Ltd.)* | 4,145,000.00 | 10,975,000.00 | 6,570,000.00 | 7,782,024.00 | 5,369,000.00 | 34,841,024.00 |
| 04. ඊඒපී නෙට්වර්ක් පුද්ගලික ආයතනය - ස්වර්ණවාහිනී *(EAP Networks Pvt.Ltd.)* | 5,450,000.00 | 2,150,000.00 | 17,320,000.00 | 33,820,000.00 | 4,850,000.00 | 63,590,000.00 |
| 05. මහාරාජා ඕගනයිසේෂන් පුද්ගලික ආයතනය *(MTV Channel Pvt.Ltd.)* | 49,213,000.00 | 123,998,500.00 | 79,053,300.00 | 75,623,750.00 | 61,248,350.00 | 389,136,900.00 |
| 06. එම්ජීඑම්ආර් නෙට්වර්ක් පුද්ගලික ආයතනය *(MGMR Networks Pvt.Ltd.)* | | 1,200,000.00 | | | | 1,200,000.00 |
| 07. පවර් හවුස් පුද්ගලික ආයතනය *(Power House Pvt.Ltd.)* | 3,205,000.00 | 2,375,000.00 | 750,000.00 | 1,380,000.00 | 5,750,000.00 | 13,460,000.00 |
| 08. වොයිස් ඔෆ් ඒෂියා නෙට්වර්ක් පුද්ගලික ආයතනය *(Voice of Asia Network Pvt.Ltd.)* | | | | | 39,000.00 | 39,000.00 |
| 09. ආර්ට් ටෙලිවිෂන් බ්‍රෝඩ්කාස්ටිං කෝ. පුද්ගලික ආයතනය *(Art Television Broadcasting Co. Pvt.Ltd.) (IWS)* | 4,229,000.00 | 3,502,174.00 | | 1,790,412.00 | 6,104,000.00 | 15,625,586.00 |
| 10. ඉලෙක්ට්‍රෝටෙක්ස් ග්ලෝබල් නෙට්වර්ක් පුද්ගලික ආයතනය *(Electroteks Global Networks Pvt.Ltd.)* | | 200,000.00 | | 300,000.00 | | 500,000.00 |
| මුළු එකතුව | 77,464,500.00 | 170,201,674.00 | 132,754,150.00 | 151,409,956.00 | 126,303,650.00 | 658,133,930.00 |

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු ඇමතිතුමනි, පිළිතුර සභාගත කරන්න. (අ) (i), (v), (vi) කොටස්වලට උත්තර දෙන්න.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
වෙනුවෙන් නේ ප්‍රශ්නය අහන්නේ. පිළිතුර සභාගත කළා.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
නැහැ, මමයි අහන්නේ. මගේ ප්‍රශ්නය.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු රවි කරුණානායක මන්ත්‍රීතුමා.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ආපසු කියනවා රවි කරුණානායක කියලා. මමයි අහන්නේ. ඒකෙත් ඇමති, නියෝජ්‍ය ඇමති, ජ්‍යෙෂ්ඨ ඇමති තුන් දෙනාම නැත.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
කොහේද?

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
අපි බලා ගන්නම්.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඔබතුමා බලා ගන්න ඕනෑ නැහැ නේ. ඔබතුමා මේ janitorial service කරනවාය?

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
මේක දීර්ඝ පිළිතුරක්.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඒක තමයි. ඒකේ (අ) (i) කොටසට පිළිතුර කියන්න කරුණාකරලා.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ඇමුණුමක්. දීර්ඝ ඇමුණුමක්.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඒකේ stations දහයයි නේ තිබෙන්නේ ඇමතිතුමා.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ඔව්. මේක කියවන්න ගියොත් සෑහෙන වේලාවක් යනවා. දැන් වේලාව දෙක පසු වී විනාඩි දහයයි. හරි නම් අපි 2.00ට නවත්වන්න ඕනෑ. ඉතින් ඔබතුමාට සම්පූර්ණයෙන් බලා ගන්න පුළුවන් මම මේක සභාගත කරලා ලේඛනය එවන්නම්.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
(අ) (vi)ට උත්තරය කියන්න.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ඒකත් තිබෙනවා. ඒකටත් පිළිතුර දී තිබෙනවා.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගිය අවුරුද්දේ ගෙවපු බදු ප්‍රමාණය විතරක් කියන්න.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
මුළු බදු මුදල එකතුව දෙදහස් -

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
එකතුව නොවෙයි -

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු ඇමතිතුමා, සභාගත කරන්න. කාලය යනවා.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
දීර්ඝ ලේඛනයක්. සභාගත කරලායි තිබෙන්නේ.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
It is already 2.15 p.m.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
නමුත් මගේ පළමුවන අතුරු ප්‍රශ්නය මෙසේයි. වෙට්රි රූපවාහිනී නාළිකාවේ අධ්‍යක්ෂවරයෙකුගේ නම මේ මොහොතේදී කියන්න පුළුවන්ද?

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ටෙල්ශාන් නෙට්වර්ක් පුද්ගලික ආයතනය.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ටෙල්ශාන් නොවෙයි මා ඇහුවේ. වෙට්රි රූපවාහිනී නාළිකාවේ.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ටෙල්ශාන් ගැන අහගන්න කැමැති නැද්ද?

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඒක බලා ඒකේ අයිතිය අපි දන්නවා. [බාධා කිරීමක්] ඒක අපි දන්නේ නැහැ. ආරක්ෂා කර තිබෙන නිසායි කිසි ප්‍රශ්නයක් නැත්තේ. මේවා අපි ආරක්ෂා කර තිබෙන ස්වාධීන ආයතන. කඬේ යන ඒවා ගැන අපි බලන්නේ නැහැ.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
නෙට්වර්ක් ගැනද අහන්නේ?

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
වෙට්රි නෙට්වර්ක්.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
MGMR Networks (Pvt.) Limited ඒකද අහන්නේ?

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
Who are the directors at this particular moment?

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, දීර්ඝ ලේඛනයක් තිබෙන්නේ.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
නම් හතර පහයි. අධ්‍යක්ෂවරු හතර පස් දෙනායි. ඇමතිතුමාට කියන්න අමාරුද?

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ඔහොම ඉන්න. කියන්න කිසිම අමාරුවක් නැහැ. සභාපති - මහින්ද රාමනායක මහතා. අධ්‍යක්ෂ - එච්.ඊ. ශ්‍රියානි රාමනායක මිය. අධ්‍යක්ෂ -එම්.ජී.ජේ. කුමාර රාමනායක මහතා.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
නැහැ. වෙට්රි ආයතනය. Hon. Minister, we only know the station goes as "Vettri".

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
නෙට්වර්ක් කියන එකද?මෙහි තිබෙන ලේඛනය මා කියවන්නම්. ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව, සී/ස. ස්වාධීන රූපවාහිනී සේවය, ටෙල්ශාන් නෙට්වර්ක් පුද්ගලික ආයතනය, අයිඩබ්ලිව්එස් හෝල්ඩිං පුද්ගලික ආයතනය, ඊඒපී නෙට්වර්ක් පුද්ගලික ආයතනය, මහාරාජා ඕගනයිසේෂන් පුද්ගලික ආයතනය, එම්ජීඑම්ආර් නෙට්වර්ක් පුද්ගලික ආයතනය, පවර් හවුස් පුද්ගලික ආයතනය, ටෙලිවිෂන් ඇන්ඩ් රේඩියෝ නෙට්වර්ක්, පීපල්ස් මීඩියා නෙට්වර්ක් පුද්ගලික ආයතනය, වොයිස් ඔෆ් ඒෂියා නෙට්වර්ක් පුද්ගලික ආයතනය, ඩයලොග් ටෙලිවිෂන් පුද්ගලික ආයතනය, වීඅයිඑස් බ්‍රෝඩ්කාස්ටිං පුද්ගලික ආයතනය.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
අදාළ අමාත්‍යවරයා නැති නිසා ඊට වඩා ප්‍රශ්න කිරීම අසාධාරණයි. වෙට්රි ආයතනයේ අධ්‍යක්ෂවරුන් කවුද කියන එක අදාළ ඇමතිතුමා මඟින් එන සුමානේ පාර්ලිමේන්තුවට හෙළිදරවු -

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ඔබ මතු කරන ප්‍රශ්නය ඇමතිතුමාගේ අවධානයට ගෙනෙන්නම්; එසේ උත්තරයක් දිය යුතු බලපත්‍රයක් පවතිනවාද කියා.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා දෙවන අතුරු ප්‍රශ්නය අහනවා. රූපවාහිනී නාළිකා තුළින් එවලා තිබෙන බදු ප්‍රමාණ සඳහන් ඇමුණුම ඔතැන තිබෙනවාද?

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ඒක මෙතැන තිබෙනවා. මම කලින් කිව්වා ඒක සභාගත කරන්නම් කියලා. ඒක ඔබතුමාට බලා ගන්න පුළුවන්.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
මී ළඟට ස්ථාවර නියෝග 23(2) යටතේ ප්‍රශ්නය. ගරු රනිල් වික්‍රමසිංහ මහතා.

## පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය
தனி அறிவித்தல் மூல வினா
QUESTION BY PRIVATE NOTICE

### ස්වාභාවික ආපදා හේතුවෙන් ජනතාව මුහුණ දෙන දුෂ්කරතා
இயற்கை அனர்த்தங்களினால் மக்கள் எதிர்நோக்கும் கஷ்டங்கள்
DIFFICULTIES FACED BY PEOPLE DUE TO NATURAL DISASTERS

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා (විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා)**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க - எதிர்க்கட்சி முதல்வர்)
(The Hon. Ranil Wickremasinghe - Leader of the Opposition)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඔබතුමාගේ ඉල්ලීම අනුව මගේ ප්‍රකාශය මම කෙටි කරලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, දැනට ලැබී ඇති වාර්තා අනුව මේ වන විට ජල ගැලීම් හා අයහපත් කාලගුණ තත්ත්වයන් හේතුවෙන් ලක්ෂ දොළහකට ආසන්න සංඛ්‍යාවක් පීඩාවට පත්ව තිබෙනවා. ඒ අනුව මෙය ශ්‍රී ලංකාවේ මුළු ජනගහනයෙන් සියයට පහකටත් වඩා ප්‍රමාණයකට බලපෑමක් කළ බරපතළ ව්‍යසනයක්. හානියට පත් වූ නිවාස සංඛ්‍යාව 25,000කට ආසන්නයි. ජීවිත 43ක් මේ වන විට අහිමි වෙලා. අක්කර ලක්ෂ ගණනක් වගාවන් විනාශයට පත් වෙලා. ආපදා කළමනාකරණ අමාත්‍ය මහින්ද අමරවීර මහතාම පවසන පරිදි මේ ව්‍යසනය දෙවැනි වන්නේ සුනාමි ව්‍යසනයට පමණි.

ව්‍යසනකාරී තත්ත්වයන්ට මුහුණ දී ඒ තත්ත්වයන් නිසි ලෙස කළමනාකරණය කරන්නට අවශ්‍ය අණපනත් අප මේ ගරු සභාවේ සම්මත කර දී තිබෙනවා. ව්‍යසන කළමනාකරණය පිළිබඳ ජාතික සභාවක් හා ව්‍යසන කළමනාකරණ කේන්ද්‍රයක් ඒ අණපනත් මඟින් ස්ථාපිත කර තිබෙනවා. ව්‍යසන කළමනාකරණ කේන්ද්‍රය සහ ජාතික සභාව ඔස්සේ කළ යුතු කාර්යයන් කිසිවක් ආණ්ඩුව නිසි ලෙස ඉටු කර නැති බව මෙහිදී පෙන්වා දෙන්නට සිදු වෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම උදාහරණ කීපයක් පෙන්වන්නම්. ශ්‍රී ලංකා ව්‍යසන කළමනාකරණ පනතෙහි 4 වන වගන්තිය යටතේ පෙර ව්‍යසන සැලසුම්, අවදානම් කළමනාකරණය, සූදානම් වීම් ආදිය සඳහා ව්‍යසන කළමනාකරණය පිළිබඳ ජාතික ප්‍රතිපත්තියක් සහ වැඩ පිළිවෙළක් සකස් කළ යුතුයි. එසේම හදිසි අවස්ථාවන්ට මුහුණ දීම සඳහා ජාතික හදිසි අවස්ථා මෙහෙයුම් සැලැස්මක් සකස් කළ යුතුයි. මේ සැලසුම් කිසිවක් ආණ්ඩුව සකස් කළේ නැහැ.

ඇත්ත වශයෙන්ම මම කරුණු ගණනාවක් ගැන අහන්නයි හිටියේ. මෙහි සඳහන් කරුණුවලට අමතරව ඔබතුමාගේ අවධානය පිණිස තවත් වැදගත් කරුණක් ඉදිරිපත් කරන්නට මා කැමැතියි. මම අහලා තිබෙන කාරණා ඔක්කොම එතැන තිබෙනවා.

ආපදා කළමනාකරණ අමාත්‍යාංශය විසින් "Towards a Safer Sri Lanka - A Road Map for Disaster Risk Management" නමැති ප්‍රකාශනය 2005 දී නිකුත් කළා. එම වාර්තාවේ 4 වන පිටුවේ 3 වන සටහනට අනුව 1974 සිට 2004 දක්වා කාල පරිච්ඡේදය තුළ නැඟෙනහිර පළාතේ ගංවතුර නිසා අවතැන් වූ පුද්ගලයන්ගේ සංඛ්‍යාව දසලක්ෂ විසිහයදහසක් වශයෙන් සඳහන් වෙනවා. පළාතක් වශයෙන් ගත් විට මෙම ප්‍රමාණය අනුව

ශ්‍රී ලංකාවේ ජනතාව අතරින් නැඟෙනහිර ජනතාවට ගංවතුරින් වැඩි බලපෑමක් ඇති වී ඇති බව පෙනී යයි. ඒ දිහා බැලුවාම බස්නාහිර පළාතටත් වඩා හානිය වෙලා තිබෙන්නේ නැඟෙනහිර පළාතටයි. එසේම ආපදා කළමනාකරණය සම්බන්ධයෙන් ගත හැකි උපාය මාර්ගයන්ද එම වාර්තාවේ සඳහන් වෙනවා. ඒ අනුව කිසියම් අවදානම් ස්ථානයක පිහිටීමේ ස්වභාවය සහ එහි බැරෑරුම් බව එම ආපදාවන් වැළැක්වීම හෝ ඒ සඳහා සහන ක්‍රියා කිරීමට ඇති සම්පත් හඳුනා ගැනීම පාලනය කළ හැකි ආපදාවේ ප්‍රමාණය සඳහන් වනවා. ආපදාවකදී ගත හැකි උපාය මාර්ග ලෙසට ඔවුන් සඳහන් කරන්නේ හැම ගංගාවක් ආශ්‍රිතවම ගංගා නිම්න ආකෘතියක් සැකසීම හා ජල ගැල්ම වැළැක්වීමට පියවර ගැනීමයි. ඊට අමතරව මෙම කරුණු සම්බන්ධයෙන් වැය වෙතැයි අපේක්ෂා කරන ඇස්තමේන්තුගත මුදල් ප්‍රමාණය ඒ අමාත්‍යාංශ යටතේ පෙන්වන්න තිබෙනවා. කාල වකවානු සහ ඒවාට සහාය වශයෙන් ගත හැකි ආයතන ගැන විශේෂයෙන් සඳහන් කර තිබෙනවා. මෙහි සැලසුම් සකස් කර කෙටි කාලීන වැඩසටහනට ඇතුළත් කිරීමට හා මේ පිළිබඳව ආණ්ඩුව කිසිම පියවරක් ගත්තේ නැහැ. එසේ කළා නම් මෙය අවම කර ගන්න තිබුණා. එසේ නොකළ නිසායි මේ ආපදාව සිදු වුණේ. එකී වාර්තාවේ පිටපතක් හැන්සාඩ් වාර්තාවට ඇතුළත් කිරීම සඳහා මා **සභාගත*** කරනවා.

මා දන්නේ නැහැ, මේ වාර්තාවේ ගරු ඇමතිතුමාගේ අමාත්‍යාංශයත් තිබෙනවාද කියලා. මේ වාර්තාවේ සිංහල කොපියක් තවම ලැබුණේ නැහැ.

**ගරු මහින්ද අමරවීර මහතා (ආපදා කළමනාකරණ අමාත්‍යතුමා)**

(மாண்புமிகு மஹிந்த அமரவீர - அனர்த்த முகாமைத்துவ அமைச்சர்)

(The Hon. Mahinda Amaraweera - Minister of Disaster Management)

ඔබතුමා කථා කරන්න. [බාධා කිරීමක්]

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා**

(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)

(The Hon. Ranil Wickremasinghe)

මේ වාර්තාවේ සිංහල කොපියක් ඉල්ලුවා. ඒක ලැබුණේ නැහැ. Early Warning Centre එක ගැන ඔබතුමා අපට කියනවා නම් අපි ඒ ගැන විශේෂයෙන්ම ස්තුතිවන්ත වනවා.

ඒ විතරක් නොවෙයි. 2009 ජූලි 26 වන දා කැබිනට් මණ්ඩල රැස්වීමේදී ගත් තීරණයක් අනුව අම්පාර සහ මඩකළපුව දිස්ත්‍රික්කයන් ඇතුළුව මුළුමහත් රට පුරාම ගංවතුර ආපදා අවම කිරීම සඳහා සැලැස්මක් සකස් කරන ලෙස ව්‍යසන කළමනාකරණ කේන්ද්‍රයට උපදෙස් දුන්නා. ඒ සැලැස්ම ව්‍යසන කළමනාකරණය පිළිබඳ ජාතික සභාවට ඉදිරිපත් කර ඇත්තේ දෙසැම්බර් වෙනිදායි. සැලැස්ම සකස් කර ඉදිරිපත් කිරීමට අවුරුද්දයි, මාස 5 ක් ගත කිරීමට හේතුව කුමක්ද කියා ඇමතිතුමා අපට කියනවාද?

සැලැස්ම සකස් කර ඉදිරිපත් කිරීමට එපමණ කාලයක් නාස්ති කළ ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය ඊට මුදල් ප්‍රතිපාදන ලබා ගැනීම සඳහා ජාතික සැලසුම් ක්‍රියාත්මක කිරීමේ දෙපාර්තමේන්තුව හා විදේශ සම්පත් දෙපාර්තමේන්තුව සමඟ සාකච්ඡා කිරීමට අනුමැතිය ලබා ගත්තේත් 2010 දෙසැම්බර් 28 වැනි දායි. මමත් මේ මණ්ඩලයේ සාමාජිකයෙක්. මා ඒ රැස්වීමට සහභාගි වෙලා තිබුණේ නැහැ. රැස්වීම් දෙකක් තිබුණා. ඒ රැස්වීම් කල් දමා තමයි, දෙසැම්බර් 28 වන දා රැස්වීම ඔබතුමන්ලා පැවැත්වූවේ. ඔවුන් සාකච්ඡා කරන්නට සූදානම් වෙද්දී ව්‍යසන සියල්ලක්ම සිදු වී හමාරයි. ව්‍යසන කළමනාකරණ මධ්‍යස්ථානය මොක තරම් අලස සහ කුසීත ලෙස වැඩ කරනවාද කියන එකට මීට වඩා හේතු සාධක අවශ්‍ය නැහැ.

ව්‍යසන කළමනාකරණය පිළිබඳ ජාතික සභාව 2010 අවුරුද්දටම රැස් වී තිබෙන්නේ එකම එක වතාවක් පමණයි. ඒ දෙසැම්බර් මස 28 වැනි දා. ඒ අවස්ථාවේත් මෙවැනි ව්‍යසනකාරී තත්ත්වයක් මධ්‍යයේ එහි ප්‍රමුඛත්වය දී තිබුණේ කුමකටද? ව්‍යසන කළමනාකරණ පනත සංශෝධනය කිරීමටයි. ඇත්ත වශයෙන්ම මෙම ව්‍යසනය කළමනාකරණය කිරීම සඳහා පනත සංශෝධනය කිරීමේ කිසිදු අවශ්‍යතාවක් නැහැ. දැනට ක්‍රියාත්මක වන පනතට ව්‍යසන කළමනාකරණය කිරීමට අවශ්‍ය සියලු බලතල පවරා දී තිබෙනවා. ව්‍යසනය ගෙයි දොරකඩටම ඇවිල්ලා ඉදිරියේ තත්ත්වය තව තවත් භයානක බව ලෝක කාලගුණ විද්‍යාඥයන් පවසනවා. කලාපයේ වෙනත් රටවල් ඊට සූදානම් වෙනවා; ජනතාව දැනුවත් කරනවා; ඔවුන්ගේ සුබසාධනයට පියවර ගන්නවා; මුදල් හා සම්පත් සොයා ගන්නවා. නමුත් අපි පනත් සංශෝධනයට වෙහෙස වෙනවා. ඒ විතරද? ජාතික සභාවේ දෙසැම්බර් 28 වැනි දා න්‍යාය පත්‍රයේ තිබුණු සමහර කරුණු අප විමතියට පත් කරන ඒවා. එහිදී මූලිකත්වය ලබා දී තිබුණේ ජනතාවට සහන සැලසීම සඳහා නොවෙයි, කොන්ත්‍රාත් නිලධාරීන් ස්ථිර කිරීමටයි. ව්‍යසන කළමනාකරණ පනතේ 11 වැනි වගන්තිය යටතේ ජාතික ව්‍යසන තත්ත්වයක් ප්‍රකාශයට පත් කොට කඩිනම් හා හදිසි පියවර ගැනීමට අවශ්‍ය බලතල ලබා දී තිබෙනවා. ඇත්ත වශයෙන්ම ඒක යටතේ ජනාධිපතිතුමාට, නැත්නම් කැබිනට් මණ්ඩලයට ඒක ප්‍රකාශ කරන්න පුළුවන්. එහෙම තත්ත්වයක් තමයි එදා ලංකාවේ තිබුණේ. එහෙත් ඇයි ඒක ප්‍රකාශ කළේ නැත්තේ? එමඟින් සාමාන්‍ය පරිපාලනයට ලබා ගත හැකි වත්කම් හා සම්පත් ඉක්මවා යෑමට අවශ්‍ය නෛතික ප්‍රතිපාදන සැලසීමට ජනාධිපතිවරයාට බලතල ලබා දී තිබෙනවා. ජනාධිපතිවරයා හෝ ආණ්ඩුව එවැනි පියවරක් ගත්තේ නැහැ.

මේ ව්‍යසනය සම්බන්ධයෙන් ජාතික ව්‍යසන තත්ත්වයක් ප්‍රකාශ කළේ නම් සාමාන්‍ය චක්‍රලේඛ තුළ හිර නොවී ජනතාවට අවශ්‍ය සහන සැලසීම සඳහා අවශ්‍ය සියලු පියවර නීත්‍යනුකූලව ගැනීමේ බලතල නිලධාරින්ට හිමි වනවා. නමුත් ආණ්ඩුව එසේ නොකොට නිලධාරින්ට දොස් පැවරීමෙන් පමණක් මේ ව්‍යසනයෙන් ගොඩ ඒමට රුකුලක් ලැබෙන්නේ නැහැ.

ආණ්ඩුව විසින් ආපදා කළමනාකරණය සඳහා වෙන් කර තිබුණු මුදල් කප්පාදු කර තිබෙනවා. සුළු ප්‍රමාණයක් නොවෙයි. 2009 වසරේ බිලියන 2.2ක මුදලක් ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය සඳහා වෙන් කර තිබුණා. ඒත් 2011 වසර සඳහා වෙන් කළේ බිලියන 1ක මුදලක් පමණයි. IMF සංවිධානයේ බලපෑම නිසා එම මුදල් අඩු කළා. නමුත් ආණ්ඩුව IIFA උළෙල ශ්‍රී ලංකාවේ පැවැත්වීමට මීට වඩා විශාල මුදලක් වැය කළා. එදා පාර්ලිමේන්තුවේ දී අපට කිව්වේ බිලියන 1.1ක් වියදම් කළා කියලායි. ඊට අමතරව, විදේශ රටවල ආණ්ඩුව වෙනුවෙන් සුදු හුනු ගාන්න Bell Pottinger සමාගමටත්, Hale Bugg සමාගමටත් මීට වඩා වැඩි ප්‍රමාණයක් වෙන් කරලා තිබෙනවා. ඒත් කියනවා ආපදා කළමනාකරණයට මුදල් නැහැ කියලා. තිබෙන මුදල් සියයට 50කින් අඩු කළා. පුදුමයක්ද මේ තත්ත්වය ඇති වුණ එක? වෙන් කර තිබුණු මුදල් කප්පාදු කරලා දැන් එක්සත් ජාතීන්ගේ සංවිධානය ඇතුළු ලෝකයේ රටවලින් අපි මුදල් ඉල්ලනවා. අපි මේ සල්ලි වියදම් කරනවා Hale Buggට, Pottingerට, IIFA එකට. ඊට පස්සේ හිඟා ගෙන යනවා. ඒ වාගේම ඒ රටවලට බණිනවා.

---

**** කථාව අවසානයේ පළ කර ඇත.***

** உரையினிறுதியில் தரப்பட்டுள்ளது.*

** Produced at end of speech.*

[ගරු රනිල් වික්‍රමසිංහ මහතා]

ඒ විතරක් නොවෙයි. ව්‍යසනය සිදු වීමෙන් පසුවවත් විධිමත් සම්බන්ධීකරණයකින් යුතු සුබසාධන වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කිරීමට ආණ්ඩුව අසමත් වෙලා තිබෙනවා. ජනවාරි 11 වන දා සෞඛ්‍ය ඇමතිවරයා ඉල්ලා සිටියේ, විපතට පත් වූවන්ට ආධාර දිස්ත්‍රික් හා ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට භාර දෙන ලෙසයි. ජනවාරි 13 වන දා ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය ඉල්ලා සිටියා, ආධාර උපකාර ඔරුගොඩවත්තේ ගබඩාවට භාර දෙන ලෙස. ජනවාරි 14 වන දා පෙරවරුවේ වෙළඳ අමාත්‍යාංශය ඉල්ලා සිටියේ වොක්ෂෝල් වීදියේ සමුපකාර අමාත්‍යාංශයට ආධාර ලබා දෙන ලෙසයි. එදිනම රාත්‍රියෙහි ජ්‍යෙෂ්ඨ අමාත්‍ය රත්නසිරි වික්‍රමනායක මහතා ප්‍රකාශ කර සිටියේ විපතට පත් වූවන්ට ආධාර කිරීම සඳහා ජ්‍යෙෂ්ඨ අමාත්‍යවරුන්ගේ වෙනමම වැඩ පිළිවෙළක් තිබෙන බැවින් ආධාර තමන්ගේ කාර්යාලයන්ට භාර දෙන ලෙසයි. ඒ විශ්‍රාම පාය තවම ඇති කරලා තිබෙනවාද?

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
මධ්‍යස්ථානය.

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremasinghe)
මධ්‍යස්ථානය. [බාධා කිරීම්] හරි, හරි. ජනවාරි 15 වන දා ආධාර එකතු කිරීමේ තරගයට ජනාධිපති කාර්යාලයත් එක් වනවා. ඔවුන් කිව්වේ ජනාධිපති කාර්යාලයට ආධාර භාර දෙන ලෙසයි. ඉන් පසු ආරක්ෂක අමාත්‍යාංශයත් තරගයට එක් වනවා. ඔවුන් කිව්වේ ආධාර ආසන්නම යුද, නාවික, ගුවන් කඳවුරුවලට හෝ පොලිස් ස්ථානවලට භාර දෙන්න කියායි. කිසිම සම්බන්ධීකරණයක් නැහැ. ආපදා කළමනාකරණ අමාත්‍යාංශයක් තිබෙනවා. සමාජ සේවා අමාත්‍යාංශයක් තිබෙනවා. එහෙත් ඉන්දියාවෙන් ලැබෙන මානුෂික ආධාර තොගය භාර ගත්තේ ආර්ථික සංවර්ධන ඇමතිවරයායි. ආපදා කළමනාකරණ අමාත්‍යවරයා සහ නියෝජ්‍ය ඇමතිවරයා පැත්තකට වී බලා සිටිනවා. ඒක තමයි ඉතින් ගිය මාස කීපයේදී කළේ.

එක් එක් ඇමතිවරු තම තමන්ට හිතෙන හිතෙන විධියට ප්‍රකාශ කරනවා; වැඩ කරනවා. සමහර අය කියන්නේ විශ්වාසනීයම ආධාර එකතු කිරීමේ වැඩසටහන කරන්නේ තමන් කියායි. තමන්ගේම සහෝදර ජනතාව විපතට පත් වෙලා. උන් හිටි තැන් අහිමි වෙලා. ඒ අතර ආණ්ඩුවේ අය ආධාර එකතු කරන්න තරග කරනවා. "විශ්වාසනීයම වැඩ පිළිවෙළක් තියෙන්නේ මටයි" කියකියා තරග කරනවා. මොන තරම් කනගාටුදායක තත්ත්වයක්ද?

|---|---|---|---|
| **1. Early Warning Centre** | | | |
| Timely and end-to-end Early Warning (EW) on potential natural disaster events provided | <u>Outputs</u>:<br>i. Establishment of the Early Warning Centre<br><br><u>Activities</u>:<br>- Establishment of the Multi-hazard EW Division of DMC at Department of Meteorology (DoM) premises. Managerial arrangements to be decided by DG/DMC, DG/DoM and by other stakeholders.<br>- Institutionalizing of inter agency arrangements for national early warning with relevant lead agencies<br>- Establishment of coordinating mechanism with improvement/ establishment of a proper communication system for dissemination of warnings<br>- Formalized dissemination arrangements through parallel SLRCS radio communication | 0.28 (S) | **DMC,** DoM, GSMB, NBRO, MASL, NARA, ID, CEB, CCD, AEA, Defence and other relevant stakeholders such as SLRC |
| **2. Meteorological Observation and Forecasting** | | | |
| Better weather and storm forecasting provided | <u>Outputs</u>:<br>i. Improved meteorological observation and prediction capabilities<br><br><u>Activities</u>:<br>- Development of 35 new automatic weather observation stations with data processing and display system at DoM, Colombo linked with a real-time communication system<br>- Enhancement of prediction capabilities for coastal floods | 2.2 (Total)<br><br><br>1.0 (S)<br><br><br>1.2 (M) | **DoM** |
| **3. Flood Monitoring and Forecasting** | | | |
| Flood monitoring and prediction capabilities in flood-prone river basins enhanced | <u>Outputs</u>:<br>i. Improvement of hydrometric network for enhancing flood monitoring and forecasting capabilities<br><br><u>Activities</u>:<br>- Establishment of effective flood hazard EW system for priority basins, which includes development of 25 new stations with telemetry facilities<br>- Enhancement of communication and dissemination capabilities | 0.865 (Total)<br><br><br>0.36 (S)<br>0.50 (M) | **ID,** CEB, MASL, DoM |





| Outcomes | Outputs/ Activities | Budget (USD million) Time frame 1-2 Short (S) 3-5 Medium (M) 6-10 Long (L) | Partners (Lead Agency in Bold) |
|---|---|---|---|
| **4. Landslide Prediction and Early Warning** | | | |
| Landslide prediction and EW capabilities developed and established for communities at-risk | <u>Outputs</u>:<br>i. Improvement of landslide prediction and EW capabilities<br><br><u>Activities</u>:<br>- Development and Establishment of a landslide forecasting system (S)<br>- Validation and fine-tuning of the system (M)<br>- Development of an evaluation and dissemination programme (L) | 0.17 (Total)<br><br><br>0.08 (S)<br>0.045 (M)<br>0.045 (L) | **NBRO,** DMC, DoM |
| **5.Drought Monitoring and Forecasting** | | | |
| Information on potential events of drought/ inconsistencies in rainfall made available to agriculture and associated sectors as an advanced decision support mechanism | <u>Output</u>:<br>i. Yield forecast of major food crops in each growing season with a sufficient lead time (S,M)<br>ii. Development of long and medium term drought forecasting and monitoring system for agriculture and associated sectors (S,M)<br><br><u>Activity</u>:<br>- Establishment of a crop weather watch group/ forecasting unit<br>- Enhancement of drought prediction capacity<br>- Development of drought EW dissemination and end-to-end feedback and response system<br>- Upgrading and provision of communication facilities | 0.27 (Total)<br><br><br>0.21 (S)<br>0.06 (M) | **DOA,** ID , MASL, Dept. of Agrarian Services, DoM |
| **6. Cyclone Tracking, Storm Surge** | | | |
| Effective mechanism for cyclone tracking and storm surge warning established to facilitate timely EW | <u>Output</u>:<br>i. An effective cyclone tracking, storm surge warning system<br><br><u>Activities</u>:<br>- Enhancement of collaborative arrangements with neighboring countries for cyclone tracking (S)<br>- Enhancement of prediction capabilities for storm surge (M) | 0.21 (Total)<br><br><br>0.01 (S)<br>0.20 (M) | **DoM** |
| **7. Seismic Monitoring** | | | |
| Enhanced seismic monitoring capacity | <u>Output</u>:<br>i. Development of a Unified Seismic Monitoring and Data Processing and Archival Network<br><br><u>Activities</u>:<br>- Networking of local seismographic stations (University network and proposed seismographs of major dams)<br>- Improvement of broadband seismic network<br>- Establishment of a seismic data processing and archival unit<br>- Enhancement of monitoring and data capturing | 2.62 (Total)<br><br><br>0.75 (M)<br>1.87 (L) | **GSMB,** DMC |





| Outcomes | Outputs/ Activities | Budget (USD million) Time frame 1-2 Short (S) 3-5 Medium (M) 6-10 Long (L) | Partners (Lead Agency in Bold) |
|---|---|---|---|
| **8. EW Systems for Major Dams** | | | |
| EW for hazards associated with major dams provided | <u>Outputs</u>:<br>i. Establishment of EW Systems for major dams<br>ii. Computerized data gathering system<br>iii. Improved Surveillance & Monitoring (S&M) of 210 medium & large dams in the country<br><br><u>Activities</u>:<br>- Establishment of Supervisory Control and Data Acquisition (SCADA) system | 0.5 (M) | **MASL** |
| **9. Oceanographic Monitoring System** | | | |
| Oceanographic monitoring - recording of sea level fluctuations constantly monitored and alertness increased | <u>Outputs</u>:<br>i. Development of oceanographic monitoring system- Real time data on oceanographic parameters<br>ii. Bathymetric data and Nautical Chart<br>iii. Simulation of tsunami's characteristics (height and run-up) along the coast of Sri Lanka and risk assessment for different areas along the country's coastline.<br>iv. Inundation and sensitive coastal habitat maps<br><br><u>Activities</u>:<br>- Base line survey and gap analysis<br>- Establishment of effective sea level monitoring network of 12 automatic tide gauges<br>- Enhancement of communication, processing and archival systems<br>- Networking of system to transmit real time sea level data to EW Division<br>- Enhancement of coordination mechanism | 2.0 (M) | **NARA,** DMC |
| **10. Nuclear / Radiological Monitoring** | | | |
| Timely and coordinated response to nuclear/radiological accidents ensured | <u>Output</u>:<br>i. Establishment of an EW/ response system for nuclear accidents and monitoring of environmental radiation (S,M,L)<br><br><u>Activities</u>:<br>- Establishment of monitoring stations<br>- Purchase of required monitoring and measuring equipment<br>- Data collection and analysis<br>- Environmental sample analysis | 0.46 (Total)<br><br><br>0.39 (M)<br><br>0.06 (L) | **AEA** |

## 2.5 Preparedness and Response Plans

**Key Issues**

The objective of disaster preparedness plans is to minimize the adverse effects of a hazard through effective precautionary actions and adequate responses to ensure the timely and coordinated delivery of relief and assistance following a disaster.

Preparedness involves the development and regular testing of warning systems (linked to multi-hazard EW Systems) and plans for evacuation or other measures to be taken during a disaster alert period. It also involves the education and training of officials, intervention teams and communities. Establishment of policies, standards, organizational arrangements and operational plans to be applied following a disaster are also crucial. Effective plans also consider securing resources, possibly including stockpiling supplies and earmarking funds. These plans are being supported through the provisions of the DM Act.

Some of the key issues arising from the interactions and planning arrangements for response and preparedness plans centre around organizing funding capacities for immediate response; and systematically building capacity across all levels. They also include clearly defining the roles for involved agencies in order to avoid mismanagement, overlaps and gaps in response to disasters and emphasizing the coordination of all such recognized agencies. It is also important to ensure reliable lines of communication as well as alternative lines for emergency communications; sensitize the media to the importance of correct information and ensure informant mechanisms for the same. The logistics channel is to be kept geared for an immediate impact, with needs assessment in the aftermath of a disaster; and a clear role for nation-wide NGOs such as the SLRCS is to be defined in government response plans.

**Strategy**

The identified issues and needs for this theme can be addressed through the following suggested strategies in the short-medium term:

- Provisions in annual budgets of respective line ministry/ agency through the DM Plan.
- Identification of skills / knowledge required and developing an HRD plan.
- Provide equipment and train staff/ volunteers to use them.
- Mapping of available resources and materials with public and private sector.
- Regulations in place to utilize such equipments as desired by the DM Plan
- Develop and enforce / gazette standard operating procedures for all activities.





- Drills and simulation, to check the system.
- Incident Command System should be well defined.
- Bring clarity about roles and responsibility amongst various actors.
- All stakeholders are aware of each other's role and responsibilities.
- Declaration and dissemination of disaster situation at various levels.
- Legal provisions to ensure ownership of media actions.
- Government body to provide standard communication messages.
- One government body to specify items, describe quantities required and expected date of delivery.
- Develop specifications of emergency items, as may be required under different disaster situations.
- Gazettes notification/ incorporation of institutional mandate.
- Inclusion of SLRCS for specified duties/ responsibilities under Standing Orders.
- Inclusion of NGOs/I-NGOs for specified duties/ responsibilities under Standing Orders/ response plans.

**Key Interventions**

The following components have been identified as key to developing a comprehensive action plan for disaster preparedness at the national, sub national and local levels:

- Development of DM (preparedness and response) plans by each ministry/ department and districts/ divisions;
- Developing emergency response capacities at Provincial, Municipality and Urban council level;
- Establishing a competent cadre of emergency response & DM coordinators at all levels to extend support to DMC/ District Emergency Operations Rooms;
- Development of district level emergency services network; Establishment of Hospital Emergency preparedness mechanism;
- Resource network for emergency response
- Procedure for sharing of information, manpower and resources

In addition, the following have been prioritized for immediate attention in order to situate longer term activities within a sustainable framework:

*i. Developing and Maintaining a National Emergency Preparedness and Response Plan*
Development of a National Disaster Response Plan will help various line ministries, departments and agencies, to collaborate in providing needs-based efficient responses to those in need. This will also help identify a role for organizations like SLRCS, and International NGOs, in various stages of disaster management, by defining the mandates of DMC and concerned line ministries,





departments, agencies and other organizations, in managing various disasters. The plan will define functional roles and responsibilities to each of these ministries and departments, through the different stages of disasters. Further, this will allow response plans to be prepared for each district, division and vulnerable community, to be linked to the National Disaster Response Plan (NDRP). Since there are various levels of operation and administration, this plan will formulate Standard Operating Procedures (SoPs), defining the control and directions in managing the disaster response.

*ii. Establishing National Emergency Operation Centre and District Emergency Operation Rooms*
This will involve the setting up of an institutional framework for a Response Operation, from triggering action, providing direction and control, up till service delivery through existing ministry departments/ agencies. Similarly, EOC at district level will form a decentralized mechanism for response operations, while maintaining a standard approach. This will also emphasize development of Standing Orders/ Standard Procedures, to provide legal status to concerned agencies in order to carry out tasks, while working under EOC authority.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු ඇමතිතුමා පිළිතුරු දෙන්න.

**ගරු මහින්ද අමරවීර මහතා**
(மாண்புமிகு மஹிந்த அமரவீர)
(The Hon. Mahinda Amaraweera)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ ආපදාව සිදු වුණාට පස්සේ පළමුවැනි වතාවට ගරු විපක්ෂ නායකතුමා අද මේ වාගේ ප්‍රකාශයක් කරන එක පිළිබඳවත්, එතුමාට දැන් හරි මේ පිළිබඳව මතක් වෙච්ච එක පිළිබඳවත් මම සතුටු වනවා. ඒ වාගේම මම සඳහන් කරන්න කැමැතියි, එතුමා ව්‍යසන අවම කිරීම සඳහා වූ ජාතික සභාව පිළිබඳව කථා කළා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ සභාවේ රැස්වීමට විපක්ෂ නායකතුමා ඇතුළු මන්ත්‍රීවරු හතර දෙනෙකුටත්, ජනතා විමුක්ති පෙරමුණේ මන්ත්‍රීවරයෙකුටත් නිල වශයෙන් ආරාධනා කළා. නමුත් මේ කිසිදු මන්ත්‍රීවරයෙකු එයට සහභාගි නොවුණු බව මම ඉතාමත් වග කීමෙන් ප්‍රකාශ කරන්න කැමැතියි. නැත්නම් ඒ අනික් සියලු පක්ෂ - [බාධා කිරීම්]

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
TNA එකෙන් ආවා.

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremasinghe)
28 වැනි දා මම හිටියේ නැහැ.

**ගරු මහින්ද අමරවීර මහතා**
(மாண்புமிகு மஹிந்த அமரவீர)
(The Hon. Mahinda Amaraweera)
ඒ රැස්වීම දෙසැම්බර් මාසයේ 28 වැනි දා තිබුණේ. සුනිල් හඳුන්නෙත්ති මන්ත්‍රීතුමාට ඊට සහභාගි වන ලෙස නිල වශයෙන් යැවූ ආරාධනා පත්‍රය තිබෙනවා. ඒ විතරක් නොවෙයි, මේ මන්ත්‍රීතුමන්ලාට දුරකථනයෙනුත් කථා කරලා කිව්වා. අවසාන මොහොතේත් ගරු ජයසූරිය නියෝජ්‍ය නායකතුමා ඒ රැස්වීමට එනවා කියලා කිව්වා. රවි කරුණානායක මැතිතුමාටත් කථා කළා. ඒ වාගේම සුනිල් හඳුන්නෙත්ති මන්ත්‍රීතුමාටත් අපේ ලේකම්තුමා කථා කරලා තිබුණා. [බාධා කිරීම්]

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremasinghe)
දෙවරක් cancel කරලා 28 වැනි දාට දැම්මා. මම 28 වැනි දා හිටියේ නැහැ.

**ගරු මහින්ද අමරවීර මහතා**
(மாண்புமிகு மஹிந்த அமரவீர)
(The Hon. Mahinda Amaraweera)
නැහැ, නැහැ. ඔබතුමන්ලාට කථා කළාම නියෝජිතයෝ එවනවා කියලා අවසාන මොහොත දක්වා කිව්වා. [බාධා කිරීම්]

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එම රැස්වීම තිබුණා නම් පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් කැඳවා තිබෙනවා නම්, එය පාර්ලිමේන්තුවේ කටයුත්තක් නම් එය පාර්ලිමේන්තුව රැස් වන- [බාධා කිරීම්]

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremasinghe)
මම එකක් කියන්න කැමැතියි. දෙසැම්බර් මාසයේ හය වැනි දාද, හත් වැනි දාද රැස්වීමක් දැම්මා. එහෙත් ඒක හදිසියේ අවලංගු කරලා අපට ආපහු දෙසැම්බර් මැද දිනයක් දුන්නා. ඒ දිනයත් කල් දැම්මා. 28 වැනි දා තිබෙන බව කියන කොට අපි හිටියේ නැහැ. [බාධා කිරීමක්]

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු ඇමතිතුමාගේ පිළිතුරු කථාව කරන්න.

**ගරු මහින්ද අමරවීර මහතා**
(மாண்புமிகு மஹிந்த அமரவீர)
(The Hon. Mahinda Amaraweera)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ ව්‍යසන කළමනාකරණය සඳහා වූ ජාතික සභාවේ සභාපතිවරයා විධියට සිටින්නේ අතිගරු ජනාධිපතිතුමා. ඒ වාගේම මේ පාර්ලිමේන්තුව පත් කර තිබෙනවා, එහි සාමාජිකයන්. එහි සාමාජිකයන් හැම කෙනෙකුටම - ගරු අජිත් පී. පෙරේරා මන්ත්‍රීතුමාට, ඒ වාගේම ගරු රනිල් වික්‍රමසිංහ මැතිතුමාට. - ලිඛිතව සහ දුරකථන මාර්ගයෙන් දැනුම් දුන්නා. එය මා ඉතාමත් වග කීමෙන් කියනවා. ගරු රනිල් වික්‍රමසිංහ මැතිතුමා ලංකාවේ හිටියේ නැහැ. අප පිළිගන්නවා. ඒ වෙනුවට ගරු කරු ජයසූරිය මන්ත්‍රීතුමාට කථා කළාම එතුමා එනවාය කියා භාර ගත්තා. අඩු ගණනේ එන්නේ නැහැ කියා කිව්වා නම් අපට වෙනත් දවසකට මේක කල් දමන්න හෝ තිබුණා.

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremasinghe)
කල් දමන්න- [බාධා කිරීම්]

**ගරු මහින්ද අමරවීර මහතා**
(மாண்புமிகு மஹிந்த அமரவீர)
(The Hon. Mahinda Amaraweera)
නැහැ. පොඩ්ඩක් ඉන්නකෝ.

ඊ ළඟට ටීඑන්ඒ එකේ ගරු එම්.ඒ. සුමන්තිරන් මන්ත්‍රීතුමා මේකට සම්බන්ධ වුණා. මා ස්තුතිවන්ත වනවා. මුස්ලිම් කොංග්‍රසය ඇතුළු සියලුම ආණ්ඩුවේ මැති ඇමතිවරු සම්බන්ධ වුණා. ඒ වාගේම ගරු රවි කරුණානායක මන්ත්‍රීතුමාත් මේකේ සාමාජිකයෙක්. ආරාධනා යවා තිබුණා. සම්බන්ධ වුණේ නැහැ. ඒ වාගේම ජනතා විමුක්ති පෙරමුණේ සුනිල් හඳුන්නෙත්ති මන්ත්‍රීතුමාට ඒ පිළිබඳව දුරකථනයෙන් දැනුම් දුන්නාම සහභාගි වන බව දැනුම් දී සහභාගි නොවීමයි තිබෙන්නේ. ගරු සුනිල් හඳුන්නෙත්ති මන්ත්‍රීතුමාට තැන පිළිබඳව ප්‍රශ්නයක් තිබුණා නම් ඒ අවස්ථාවේ අපට කියන්නට තිබුණා. මේ අවස්ථාවේදී මා කියන්නේ, මේ වාගේ ජාතික කටයුත්තකට සම්බන්ධ වන්නට බැරි නම් අද නිකම් බොරුවට පුවත් පත් සාකච්ඡා තියතියා මේක විවේචනය කිරීමේ තේරුමක් නැහැ කියායි. පාර්ලිමේන්තුවේ මේ ගැන දැන් කිව්වා. චක්‍රලේඛ වෙනස් කර ගන්න ඕනෑ නම් මේ සහන ලබා දීම් වෙනස් කර ගන්න ඕනෑ නම්, ඒක කියන්න තිබුණු හොඳම තැන තමයි මේ ජාතික සභාව; පාර්ලිමේන්තුවෙන් පත් කළ සභාව. ඒකට සම්බන්ධ නොවී දැන් මෙතැන නිකම් කයිවාරු ගැහුවාට වැඩක් වන්නේ නැහැ.

**ගරු ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரியெல்ல)
(The Hon. Lakshman Kiriella)
රීති ප්‍රශ්නයක්.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
Order, please! රීති ප්‍රශ්නයක්.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரியெல்ல)
(The Hon. Lakshman Kiriella)
එතුමා කියනවා ඒ ජාතික සභාව පැවැත්වූවාය කියා. ඒ ජාතික සභාවෙන් සාකච්ඡා කළේ මොනවාද කියා මේ පාර්ලිමේන්තුවට දැන් ඉදිරිපත් කරන්න minutes ටික. ඒකේ සාකච්ඡා වුණේ ගරු නියෝජ්‍ය කථානායකතුමනි,- [බාධා කිරීම්]

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ඒක රීති ප්‍රශ්නයක් නොවෙයි. [බාධා කිරීම්] ගරු ඇමතිතුමා කථා කරන්න. [බාධා කිරීම්]

**ගරු මහින්ද අමරවීර මහතා**
(மாண்புமிகு மஹிந்த அமரவீர)
(The Hon. Mahinda Amaraweera)
පොඩ්ඩක් ඉන්න. [බාධා කිරීමක්] මෙතුමා පැත්තක ඉඳ ගෙන හැම එකකටම කට දමනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විපක්ෂ නායකතුමා කිව්වා, මේකේ කාරණා දෙකයි කථා කළේ කියා. ඒ කියන්නේ එකක්; ආර්ථික සංවර්ධන ඇමතිවරයා මේ කමිටුවට ඇතුළත් කිරීම. [බාධා කිරීම්]

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremasinghe)
නැහැ. මා කිව්වේ එහෙම - [බාධා කිරීම්]

**ගරු මහින්ද අමරවීර මහතා**
(மாண்புமிகு மஹிந்த அமரவீர)
(The Hon. Mahinda Amaraweera)
ඔබතුමා කිව්වේ. ඔබතුමා දුන්න ප්‍රකාශයේ තිබෙනවා.

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremasinghe)
දැන් මෙතුමා ආර්ථික සංවර්ධන ඇමතිතුමාගේ- [බාධා කිරීම්]

**ගරු මහින්ද අමරවීර මහතා**
(மாண்புமிகு மஹிந்த அமரவீர)
(The Hon. Mahinda Amaraweera)
නැහැ, එහෙම ප්‍රශ්නයක් නැහැ.

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremasinghe)
ඔබතුමා අද කිව්ව කථාව මා කිව්වේ නැහැ. [බාධා කිරීම්]

**ගරු මහින්ද අමරවීර මහතා**
(மாண்புமிகு மஹிந்த அமரவீர)
(The Hon. Mahinda Amaraweera)
ඔබතුමා ලිඛිතව භාර දුන් ප්‍රකාශයේ තිබෙනවා. මා ඒකයි කිව්වේ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එතුමා පක්ෂ නායකයකු විධියට දැන්වත් හැසිරුණොත් ඔය විපක්ෂ නායකකම ආරක්ෂා කර ගන්නට පුළුවන්. ඒ වගකීම -[බාධා කිරීම්] එතුමා ඉදිරිපත් කළ ප්‍රකාශය -[බාධා කිරීම්] දැන් උත්තර දෙන්න ඉඩ දෙන්න.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු ඇමතිතුමා උත්තර දෙන්න. [බාධා කිරීම්]

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremasinghe)
මම එහෙම කිව්වේ- [බාධා කිරීමක්] ඔබතුමා හරියට- [බාධා කිරීමක්]

**ගරු මහින්ද අමරවීර මහතා**
(மாண்புமிகு மஹிந்த அமரவீர)
(The Hon. Mahinda Amaraweera)
නැහැ. හරි මා ගහ ගන්නම්. ඔබතුමා ලිඛිතවත් මේක ඉදිරිපත් කර තිබෙනවා. [බාධා කිරීම්]

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremasinghe)
සංශෝධනය- [බාධා කිරීම්]

**ගරු මහින්ද අමරවීර මහතා**
(மாண்புமிகு மஹிந்த அமரவீர)
(The Hon. Mahinda Amaraweera)
ඔබතුමා සංශෝධනය කරන්න- [බාධා කිරීමක්]

ආයෙත් ඊ ළඟට මොකක්ද කිව්වේ? [බාධා කිරීම්] කිසිම ගහ ගැනිල්ලක් නැහැ. ඔබතුමා නියමෙට මේ පක්ෂය ගෙනි යනවා. ඔබතුමාගේ නායකත්වය මුළු එක්සත් ජාතික පක්ෂය එක හිතින් පිළිගන්නවා. ඒ පිළිබඳව අපට තිබෙන්නේ, ආඩම්බරයක්. ඔබතුමා පොඩ්ඩක් පස්ස බලන්නේ නැහැ. පස්සෙන් මොනවාද වෙන්නේ කියා පොඩ්ඩක් පරිස්සමින් ඉන්න. ඉස්සරහ විතරක් බලා ගෙන ඉන්නේ නැතිව පස්ස පැත්ත බලා ගෙන ඉන්නය කියා මා ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා.

එම නිසා ගරු නියෝජ්‍ය කථානායකතුමනි, තව කාරණයක් කිව්වා. කොන්ත්‍රාත් සේවකයන් දිර්ඝ කිරීම පිළිබඳවයි කථා වුණේ කියා. මා මේ කාරණය කියන්නට කැමැතියි. ගරු කිරිඇල්ල මන්ත්‍රීතුමා -හිටපු ඇමතිතුමා- කිව්වා, මොනවාද කථා කළේ කියා. කාරණා 20ක් ගැන කථා කළා ගරු නියෝජ්‍ය කථානායකතුමනි. මේ සම්බන්ධව එක පැත්තකින් බැලුවොත් මේ කොන්ත්‍රාත් සේවකයින් දීර්ඝ කිරීමේ බලය තිබෙන්නේත් වෙන කාටවත් නොවෙයි. මේ ජාතික සභාවටයි. ඒක පවා කථා කළා තමයි. ඊට අතිරේකව 2005 අංක 13 දරන පනතේ සංශෝධන පිළිබඳව කථා කළා. මොකද ඒ පනත සාදන විට මේ අමාත්‍යාංශය තිබුණේ නැහැ. අමාත්‍යවරයාගේ කාර්ය භාරය, ව්‍යසනයක් ඇති වුණොතින් අමාත්‍යවරයාට ප්‍රාදේශීයව ව්‍යසන තත්ත්වයක් ප්‍රකාශ කිරීමේ බලය ඇති කර ගැනීම, ඒ වාගේම ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ කටයුතු විධිමත් කිරීම, ව්‍යසන කළමනාකරණය කිරීමේ ජාතික සභාවේ ආයතනික කටයුතු මේ ආදී කාරණා 20ක් පිළිබඳව සාකච්ඡා කළා. නිකම් බොරුවට කැඳෙව්වේ නැහැ. මේක ඉතාමත් වැදගත් සාකච්ඡාවක්. අමාත්‍යවරු සියලු දෙනා, මහ අමාත්‍යවරු ඒ විතරක් නොවෙයි මීට අතිරේකව සියලු අමාත්‍යාංශවල මේකට වග කියන්න ඕනෑ ලේකම්වරුන්ගෙන් -

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
හදිසි තත්ත්වයක් ප්‍රකාශ කරන්න කිව්වේ නැහැ නේ?

**ගරු මහින්ද අමරවීර මහතා**
(மாண்புமிகு மஹிந்த அமரவீர)
(The Hon. Mahinda Amaraweera)
හරි, මම දන්නවා, ඔබතුමන්ලාටත් විපක්ෂ නායකතුමාටත් බොහොම ඕනෑකමක් තිබෙන බව ආපදා තත්ත්වයක් රටේ ප්‍රකාශයට පත් කරවන්න. ඒ වෙන එකක් නිසා නොවෙයි. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ ආපදා තත්ත්වය ප්‍රකාශයට පත් කිරීමට විරුද්ධ පාර්ශ්වයට තිබෙන වුවමනාව මොකක්ද? මේ රටේ තිබෙන මේ සංචාරක ව්‍යාපාරයට පහර ගහන්න වුවමනා නිසා තමයි ආපදා තත්ත්වයක් ප්‍රකාශයට පත් කරන්න කියන්නේ. මොකද, එතකොට සංචාරකයෝ මේ රටට එන්නේ නැහැ. ආපදා තත්ත්වයක් මේ රටේ ප්‍රකාශයට පත් කළාම මේ රටේ ආර්ථිකය පහළට දමන්න තිබෙන වුවමනාව මත තමයි එක්සත් ජාතික පක්ෂය හැම වෙලාවේම ආපදා තත්ත්වයක් ගැන කථා කරන්නේ. ආපදා තත්ත්වයට සහන දෙන්න කිසිම බාධාවක් අපට වුණේ නැහැ.

අද කථා කළ විරුද්ධ පාර්ශ්වයේ නායකතුමාගෙන් මම අහන්න කැමැතියි, "ඔබතුමා මේ ආපදා තත්ත්වයනට ලක් වුණු ප්‍රදේශවල ජනතාව බලන්න කී වතාවක් ගියාද?" කියලා. එක්සත් ජාතික පක්ෂය මේ වෙනුවෙන් අඩු ගණනේ හාල් හුංඩුවක් ගෙනිහිල්ලා දුන්නාද? කිසිම දායකත්වයක් දැක් වූයේ නැති බව මම ඉතාමත් වග කීමෙන් කියනවා. මේ සිදු වීම සිදු වුණු දවසේ උදේ පාන්දර ජනාධිපතිතුමා මේකට මැදිහත් වුණා; මට කථා කළා. මම ඒ ප්‍රදේශවල ගියා; මඩකළපුවේ ගියා; අම්පාරේ ගියා. ඒ වාගේම අපේ නියෝජ්‍ය අමාත්‍යතුමා ත්‍රිකුණාමලයේ ගියා. පොළොන්නරුවේ ගිහිල්ලා -

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
දැන් කොහෙද ඉන්නෙ?

**ගරු මහින්ද අමරවීර මහතා**
(மாண்புமிகு மஹிந்த அமரவீர)
(The Hon. Mahinda Amaraweera)
මොකක්ද?

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
දැන් කොහෙද ඉන්නේ?

**ගරු මහින්ද අමරවීර මහතා**
(மாண்புமிகு மஹிந்த அமரவீர)
(The Hon. Mahinda Amaraweera)
කවුද?

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ජනාධිපතිතුමා.

**ගරු මහින්ද අමරවීර මහතා**
(மாண்புமிகு மஹிந்த அமரவீர)
(The Hon. Mahinda Amaraweera)
මොකටද? ඔබතුමන්ලාගේ ගෙදර නම් අපේ කවුරුවත් නැහැ.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
අපි ගිහින් හැම තැනම ආධාර බෙදලා තිබෙනවා. ඔබතුමන්ලා තමයි දැන් ආණ්ඩුවේ ඉන්නේ.

**ගරු මහින්ද අමරවීර මහතා**
(மாண்புமிகு மஹிந்த அமரவீர)
(The Hon. Mahinda Amaraweera)
අතිගරු ජනාධිපතිතුමා මේ වෙනුවෙන් මැදිහත් වුණා විතරක් නොවෙයි, එතුමා මේ ප්‍රදේශ කරා යන්න උත්සාහ දරලා පොළොන්නරුවට ගියා. අනෙක් ප්‍රදේශවලට යන්න අවස්ථාව තිබුණේ නැහැ, කාලගුණ තත්ත්වය යහපත් නැති නිසා. නමුත් එතුමා පොළොන්නරුවේදී ඉතාමත් පැහැදිලිව කිව්වා, "මේ ජනතාව බඩගින්නේ තියන්නේ නැතුව හැම කෙනකුටම ආහාරපාන ලබා දීමේ වැඩ පිළිවෙළ ආරම්භ කරන්න" කියලා. එතුමාගේ උපදෙස් අනුව මමයි, නියෝජ්‍ය අමාත්‍යතුමායි දෙන්නාම ඒ ප්‍රදේශවලට ගිහිල්ලා දිසාපතිතුමන්ලා ඇතුළු ඒ සියලුම සම්බන්ධීකරණ කමිටු කැඳවලා අපි ඉතාමත් පැහැදිලිව කිව්වේ, "ජනාධිපතිතුමාගේ උපදෙස් ක්‍රියාත්මක කරන්න, කිසිදු කෙනෙක් බඩගින්නේ තියන්නේ නැතුව මේ ජීවිත බේරා ගැනීමේ වැඩ පිළිවෙළට දායක වෙන්න" කියන එකයි.

රනිල් වික්‍රමසිංහ මැතිතුමා කියනවා, මේ තත්ත්වය පිළිබඳව ලෝක කාලගුණ විද්‍යාඥයෝ දැනුම් දුන්නායි කියලා. ලෝක කාලගුණ විද්‍යාඥයෝ අපට දැනුම් දීලා තිබෙනවා; අනතුරු ඇඟවීම් කරලා තිබෙනවා. හැබැයි මේ කාලය තුළ මේ ප්‍රදේශයේ මේ වාගේ තත්ත්වයක් ඇති වෙනවායි කියලා ඒ අය අපට දැනුම් දීලා නැති බව මම වග කීමෙන් කියන්න කැමැතියි.

ඒ නිසා මේ තත්ත්වය අසාමාන්‍ය තත්ත්වයක්. මේක ලංකාවේ ඇති වුණ තත්ත්වයක් විතරක් නොවෙයි. බ්‍රසීලයේ ඇති වුණු තත්ත්වය පිළිබඳවත් ඔබතුමාට වැටහීමක් තිබෙනවා. ඕස්ට්‍රේලියාවේ ඇති වෙච්ච තත්ත්වය පිළිබඳවත් ඔබතුමාට වැටහීමක් තිබෙනවා. ලෝකයේ බොහෝ රටවල ඇති වුණා වාගේම අපේ රටෙත් මේ ඇති වුණු තත්ත්වය පිළිබඳව මම ඔබතුමාට කියන්න කැමැතියි. දෙසැම්බර් මාසයේ පළමුවන දා ඉඳලා අද දක්වා මඩකළපුව වර්ෂාපතනය මිලිමීටර් 1,907ක්. අහගන්න, මිලිමීටර් 1,907ක් වැස්සා. සාමාන්‍ය වාර්ෂික වර්ෂාපතනය වන්නේ මිලිමීටර් 1,652යි. එතකොට ඔබට පෙනෙනවා, අවුරුද්දකට වහින ප්‍රමාණයටත් වැඩි වර්ෂාපතනයක් මේ දින ගණන ඇතුළත මඩකළපුව ප්‍රදේශයට ඇද හැලුණායි කියලා. මේක සාමාන්‍ය තත්ත්වයක්ද? අම්පාර තත්ත්වයත් ඒකයි. ඒ වාගේම ත්‍රිකුණාමලයේ තත්ත්වයත් ඒකයි. පොළොන්නරුවේ, අනුරාධපුරයේත් මේ වාගේ අධික වර්ෂාවක් ඇති වුණාම එය පාලනය කර ගන්න යම් අපහසුතාවක් තිබෙනවා. නමුත් ඒ සඳහා අපට වැඩ පිළිවෙළක් තිබුණු නිසා තමයි ඒ තත්ත්වය පාලනය කර ගන්න පුළුවන්කම අපට ලැබුණේ. 1913 දී තමයි මඩකළපුවට වැඩිම වර්ෂාවක් ලැබුණේ. ඊට පස්සේ එක දිනක වැඩිම වර්ෂාපතනය මේ වතාවේ තමයි මඩකළපුවෙන් වාර්තා වන්නේ. 1913න් පස්සේ ඉතිහාසයේ එක දවසක වැඩිම වර්ෂාපතනයක් අපට වාර්තා වුණේ මේ අවුරුද්දෙයි. ඒ නිසා "මේක නිකම් සාමාන්‍ය තත්ත්වයක්, මේකට සූදානමින් සිටියේ නැහැ, මේක ගැන බැලුවේ නැහැ"යි කියලා කියනවා නම් ඒක ඔබතුමන්ලාගේ දැනුම පිළිබඳ ප්‍රශ්නයක් මිසක් වෙන මොකක්වත් නොවෙයි.

අප රට තුළ යම් ආපදා තත්ත්වයක් ඇති වීමේ අනතුර පිළිබඳව අපි දැන ගෙන සිටියා. ඕනෑම මොහොතක එන ආපදාවකට මුහුණ දෙන්න වැඩ පිළිවෙළක් අපි සකස් කරලා තිබුණා. ඒ නිසා තමයි, සුනාමිය ඇති වුණාට පස්සේ නැවත සුනාමියක් ඇති වුණොත් ඒ ඕනෑම වේලාවක මුහුණ දීම සඳහා අපි පෙර අනතුරු ඇඟවීම් පද්ධති රට පුරා ස්ථාපිත කරලා තිබෙන්නේ. ඒ වාගේම මේ වතාවේත් ඒ පෙර අනතුරු ඇඟවීම් පද්ධති ක්‍රියාත්මක වුණු බව අපට දැන ගන්නට ලැබුණා. ඒ එක්කම ආපදා කළමනාකරණ අමාත්‍යාංශය මඟින් ජාතික මට්ටමේ ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය, ඒ වාගේම දිස්ත්‍රික් ආපදා කළමනාකරණ ඒකකය, ප්‍රාදේශීය මට්ටමේ ප්‍රාදේශීය ආපදා කළමනාකරණ කමිටුව, ග්‍රාමීය මට්ටමේ අනු කමිටු 05ක් අපි මේ ප්‍රදේශවල සකස් කරලායි තිබුණේ කියන එක අපි සඳහන් කරන්න කැමැතියි. මෙම අනු කමිටු විධියට සඳහන් කළේ අනතුරු ඇඟවීමේ කමිටුව, හදිසි ප්‍රතිචාර කමිටුව, ප්‍රථමාධාර කමිටුව, ආරක්ෂක කමිටුව හා සුබසාධක කඳවුරු කමිටුවයි. ඒ වාගේ කමිටු ගණනාවක් අපි ගම් මට්ටමින් හදලා තිබුණා. ඒකෙන්ම ඔබතුමන්ලාට වැටහෙනවා ඇති එන ඕනෑම අවදානමකට මුහුණ දෙන්න අපි සූදානමින් සිටියාය කියන එක. ඒක ඉතාමත් හොඳින් වැටහෙනවා. රනිල් වික්‍රමසිංහ මහත්මයා කියන්නේ මේ ගැන අපේ කිසිම සූදානමක් තිබුණේ නැහැ කියලායි. අපේ සූදානමක් තිබුණු නිසා තමයි මේ සා විශාල ගංවතුර තත්ත්වයක් ඇති වෙලාත් මරණ ප්‍රමාණය අඩු කර ගන්න පුළුවන්කම ලැබුණේ. අපේ ආරක්ෂක හමුදාවේ රණ විරුවන් ක්‍රියාත්මක වුණා. ඒ රණ විරුවන් ගිහින් කටයුතු කළේ කොහොමද කියන එක පිළිබඳව ඔබතුමන්ලාට වැටහීමක් තිබෙනවා. ඔවුන් ගුවන් යානා යොදවා ගස් උඩ ඉඳපු මිනිසුන් බේරා ගත්තා. ගෙවල්වල වහලවල් මත හිටපු මිනිසුන් හෙලිකොප්ටර් යොදවා බේරා ගත්තා. ඒ විධියට අපේ ගුවන් හමුදාව එක දිනකදී විතරක් 300කට වැඩි ජනතාවක් අනතුරින් මුදා ගන්න කටයුතු කළා. ධීවර අමාත්‍යාංශයේ බෝට්ටු, නාවික හමුදාවේ බෝට්ටු විතරක් නොවෙයි අපේ අමාත්‍යාංශයේ තිබුණු බෝට්ටුත් ඒ ප්‍රදේශවලට යවා ඒ ජනතාව මුදා ගැනීමේ කටයුතුවලට දායක වුණා. එහෙම නොවෙන්නට මේ ජනතා විනාශය දහස් ගණනකට වැඩි වෙන්නට තිබුණා. අද මේ වාර්තා වන ප්‍රමාණය වුණත් මම කියන්න කැමැතියි, මේ ගංවතුර නිසාම නොවෙයි විනාශ වුණේ කියා. නොසැලකිල්ලෙන් කටයුතු කිරීම, ඒ වාගේම වෙනත් ස්වාභාවික හේතූන් මත, ඒ වාගේම ඒ කඳවුරුවල ඇති වුණු තත්ත්වයන් නිසාත් මිය ගිය ප්‍රමාණයත් එක්ක තමයි මේ ප්‍රමාණය වැඩි වුණේ. අපි සකස් කරපු ඒ වැඩ පිළිවෙළේ ප්‍රතිඵලයක් හැටියට තමයි අපට මේ මරණ ප්‍රමාණය අඩු කර ගන්න පුළුවන්කම ලැබුණේ.

අනික් චෝදනාව තමයි, 2009 වර්ෂයේදී කැබිනට් මණ්ඩලය හදපු මඩකලපුව, අම්පාර ප්‍රදේශවල ආපදා වැළැක්වීම පිළිබඳ කමිටුවේ වාර්තාව ප්‍රමාද වුණාය කියන එක. ගංවතුර පාලනය සහ ඒ ප්‍රදේශයේ ආපදා වැළැක්වීම පිළිබඳව වාර්තාවක් සකස් කරන එක එතුමා කියන විධියට මාසයකින් දෙකකින් කරන්න බැරි බව මේ මුළු සභාවම දන්නවා. ඒකට යම් කාල පරිච්ඡේදයක් අවශ්‍යයි. නමුත් ඒ කමිටුව ඒ වාර්තාව සකස් කරලා අවසන් වෙලා එය බාර දුන්නා පමණක් නොවෙයි, ඒ වාර්තාව බාර දෙන්නට පෙර දැනටමත් මේ මාසය අවසාන වන කොටම අම්පාර ප්‍රදේශයේ ඇළ මාර්ග පවිත්‍ර කිරීම සඳහා යන්ත්‍රෝපකරණ ඒකකයක් අරගෙන යන්නට අපි සූදානමින් සිටින බව මා සඳහන්

[ගරු මහින්ද අමරවීර මහතා]

කරන්න කැමැතියි. Barges, tractors, excavators ඇතුළු ඒ උපකරණ අරගෙන ගිහින් අම්පාර ප්‍රදේශයෙන් ඒ කටයුතු පටන් අරගෙන මඩකලපුව දක්වා ඒ කටයුතු කර ගෙන යන්න බලාපොරොත්තු වෙනවා. ඒ කටයුතු පටන් ගත්තා වාගේම ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි දැනටමත් විදේශ ආධාර සඳහා මේ වාර්තාව ඉදිරිපත් කර තිබෙනවාය කියන එක මා ඔබතුමාගේ දැන ගැනීම සඳහාත්, මේ සභාවේ දැන ගැනීම සඳහාත් සඳහන් කරන්න කැමැතියි.

ඒ වාගේම මේ ව්‍යසන කළමනාකරණ කමිටුවේ රැස්වීමේදී අපි ඉතා වැදගත් තීන්දු රාශියක් ගත්තා. එයින් එකක් විධියට කඳුකර ප්‍රදේශවල නාය යෑම් පිළිබඳව මා සඳහන් කරන්න කැමැතියි. ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මන්ත්‍රීතුමා ඇහුවා, මොකක්ද කතා කළේ කියලා. එතුමන්ලාගේ ගම්වල නාය යන ප්‍රදේශ පිළිබඳව අපි තීන්දුවක් ගත්තා. මීට පසුව ඒ අවදානම් ප්‍රදේශවල ඉදි කිරීම් කරනවා නම් අපේ අමාත්‍යාංශය යටතේ තිබෙන ගොඩනැඟිලි පර්යේෂණ ආයතනයෙන් අනුමතියක් අරගෙන මිසක් හිතුමතේට ඉදි කිරීම් කටයුතු කරන්න දෙන්නේ නැහැ කියන තීන්දුව පළමුවෙන්ම අරගෙන එය කැබිනට් මණ්ඩලයට යොමු කරලා එහි අනුමතිය අරගෙන තිබෙනවා. දැන් අපි තීන්දු කරලා තිබෙනවා, මීට පසුව කඳුකර ප්‍රදේශවල ඉදි කිරීම් කරනවා නම් ආපදාවට ලක් නොවන, නාය යෑම් සිදු නොවන ප්‍රදේශවල පමණක් ඒ ඉදි කිරීම් සඳහා ඉඩ දෙන්නට. එහෙම නැතුව හිතුමතේට ඉදි කිරීම් කරන්න ඉඩ දීලා ඒ ජනතාවගේ ජීවිත විනාශ වෙන්න ඉඩ දෙන්නේ නැහැ කියන එකත් මා සඳහන් කරන්න කැමැතියි. අප එවැනි තීන්දුවක් ගත්තාය කියා ගරු මන්ත්‍රීතුමා දැන ගෙන සිටියේ නැහැ නේ.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එතුමා මගේ නම සඳහන් කළා. ඔය ඔක්කොම තීන්දු ගත්තේ මේ වැඩේ වුණායින් පසුවයි.

**ගරු මහින්ද අමරවීර මහතා**
(மாண்புமிகு மஹிந்த அமரவீர)
(The Hon. Mahinda Amaraweera)
නැහැ. ඔබතුමාට අන්දකයිප්පු කැවිලා.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, -

**ගරු මහින්ද අමරවීර මහතා**
(மாண்புமிகு மஹிந்த அமரவீர)
(The Hon. Mahinda Amaraweera)
ඔබතුමා මගේ කතාවෙන් පසුව කතා කරන්න.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
He mentioned my name. So, I have to reply.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ඔබතුමාගේ නම සඳහන් වෙච්ච කාරණය සම්බන්ධයෙන් පමණක් පැහැදිලි කිරීමක් කරන්න පුළුවන්.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු ඇමතිතුමා 2005 පනත ගැන පෙන්නුම් කළා. 2005 පනත සම්මත වුණායින් පසුව -

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
පනත සම්බන්ධයෙන් නොවෙයි ගරු මන්ත්‍රීතුමනි. ඔබතුමාගේ නම සඳහන් කරපු කාරණය සම්බන්ධයෙන් පමණක් පැහැදිලි කිරීමක් කරන්න.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
But it is relevant. එතුමා කිව්වා නේ දැනුයි දැන ගත්තේ කියලා. 2005 පනත සම්මත වුණායින් පසුව ඊ ළඟ රැස්වීම තිබුණේ 2010 දීයි.

**ගරු මහින්ද අමරවීර මහතා**
(மாண்புமிகு மஹிந்த அமரவீர)
(The Hon. Mahinda Amaraweera)
නැහැ, නැහැ. ඒක සම්පූර්ණ අසත්‍යයක්.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ පනත ගැන දන්නේත් නැති, මේ කමිටුවටත් අදාළ නැති මෙතුමාගේ මේ කතාවෙන් වැඩක් නැහැ. මීට කලින් මේ සභාව රැස් වුණා; අපේ අග්‍රාමාත්‍යතුමාගේ ප්‍රධානත්වයෙනුත් රැස් වුණා. මම ඒ වාර්තාව කියෙව්වා. ඒ නිසා මේ සභාවේදී පට්ටපල් අසත්‍ය කියන්න එපා. දැන් කියන්න එපා, ප්‍රමාද වුණාය කියා. ප්‍රමාද වෙලා හරි අපි ඒ තීන්දුව අරගෙන තිබෙනවා. තමුන්නාන්සේ කියන්නේ, මීට පසුව ඔවැනි දේවල් සිද්ධ වෙන්නේ නැහැ කියලාද? එහෙම නම් තමුන්නාන්සේලාගේ ආණ්ඩුව කාලයේදී ඔය තීන්දු ගන්න තිබුණේ නැද්ද? ඒවා ගැන හිතලාවත් තිබුණාද? මේ අමාත්‍යාංශය හැදුව වෙලාවේත්, මෙහෙම අමාත්‍යාංශයක් හැදුවේ මොකටද කියලා මේ අමාත්‍යාංශය ගැන හැම තැනම විවේචනය කළා. මෙහෙම අමාත්‍යාංශයක් හදලා මේ වාගේ පනත් ගෙනැල්ලා මේ වාගේ පෙර සූදානම් වැඩ පිළිවෙළක් හදලා තිබුණේ නැත්නම් මේ ගංවතුරෙන් දහස් ගණනකගේ ජීවිත විනාශ වන බව මම සඳහන් කරන්නට කැමැතියි. අපි පැහැදිලිව ගත්ත ඒ තීන්දු නිසා තමයි ඒවා අවම කර ගන්න පුළුවන් වුණේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අනෙක් අතට කිව්වා, මේ සඳහා පෙර සූදානමක් තිබුණේ නැහැයි කියලා; භාණ්ඩ රැස් කර තිබුණේ නැහැයි කියලා. මම සඳහන් කරන්න කැමැතියි, මේ පිළිබඳව අපට තිබුණු අවබෝධය නිසාම අවදානමට ලක් වන බොහෝ ප්‍රදේශවල අප දැනටමත් භාණ්ඩ රැස් කර තිබෙන බව; භාණ්ඩ ගබඩා කර තිබෙන බව. මේ ප්‍රදේශවලත් යම් ප්‍රමාණයක භාණ්ඩ රැස් කර තිබුණා. ඒ විතරක් නොවෙයි. අපේ ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයට අයත්, ඔරුගොඩවත්තේ තිබෙන ගබඩාවේත් ඒ අවශ්‍ය භාණ්ඩ අප රැස් කර තිබුණා. අපි ක්ෂණයකින් ලොරි හතරකින් ඒ ප්‍රදේශවලට ගිහිල්ලා, කූඩාරම් ඇතුළුව ඒ අවශ්‍ය දේවල් බෙදා දෙන්න කටයුතු කළා. ඊට අතිරේකව භාණ්ඩ මිල දී ගැනීම සඳහා අපි හැම දිසාපති කාර්යාලයකටම මුදල් ප්‍රමාණයක් වෙන් කර තිබුණා. අපි හැම දිසාපති කාර්යාලයකටම කියලා තිබුණා, අවශ්‍යතාවක් වුණොත් ඒ භාණ්ඩ මිල දී ගන්න කටයුතු කරන්නය කියලා. මඩකළපුවේත් ඒ

සල්ලි තිබුණා. පොළොන්නරුවේත් ඒ සල්ලි තිබුණා. ත්‍රිකුණාමලයේත් ඒ සල්ලි තිබුණා. හැම දිසාපති කාර්යාලයකම සල්ලි තිබුණා. භාණ්ඩ මිල දී ගන්නය කියලා අප උපදෙස් ලබා දුන්නා. සල්ලි දීලා තිබුණා. ඒ විතරක් නොවෙයි. අවශ්‍ය වුණොත් යන්ත්‍රෝපකරණ ලබා ගැනීමේ වැඩ පිළිවෙළක් අපි සකස් කර තිබුණා. ඒකට අවශ්‍ය සල්ලි අපි ලබා දීලා තිබුණා. ජනතාව ප්‍රවාහනය කරන්න අවශ්‍ය වුණොත් ඒ කටයුතු සඳහාත් අපි මුදල් දීලා තිබුණා. ඒකට අවශ්‍ය වාහන සොයා ගෙන ඉන්නය කියලා අප කියා තිබුණා. මේ අනතුරට නොවෙයි ඕනෑම අනතුරකට මුහුණ දෙන්න අපි සූදානමින් සිටියා. ඒ විතරක් නොවෙයි. මේ සිද්ධිය වුණු වහාම අතිගරු ජනාධිපතිතුමා අපට කිව්වේ කන්න බොන්න අඩු පාඩු තිබෙනවා නම් කොළඹින් හරි අරගෙන යන්නය කියලායි. ඒ අනුව අපි රාජ්‍ය ආයතනයක් වන සතොස ආයතනයෙන් බඩු ගෙනිහිල්ලා ඒ ප්‍රදේශවල ජනතාවට ලබා දෙන්න කටයුතු කළා. ඒ ජනතාවට ඒ බඩු ලබා දෙන්න අපි අවශ්‍ය පියවර ගත්තාය කියන එක මා සඳහන් කරන්න කැමැතියි. එහෙම නම් කොහොමද ඔබතුමන්ලා පෙර සූදානමක් නැහැයි කියන්නේ? පෙර සූදානමක් තිබුණු නිසා තමයි අපි ගම් මට්ටමෙන් කමිටු පත් කර තිබුණේ. මේ ආධාර බෙදන්න ගියාම දැනටත් අපට සමහර වෙලාවට කියන දෙයක් තමයි "අපට කන්න හම්බ වුණේ නැහැ. අපට කන්න දුන්නේ ගමේ ග්‍රාම සංවර්ධන සමිතිය. අපට කන්න දුන්නේ ගමේ පන්සලෙන්. අපට කන්න දුන්නේ ගමේ පල්ලියෙන්." කියන එක. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි හදපු සැලැස්ම තමයි අපි කිව්වේ. ගමේ කමිටුවලට අපි කියලා තිබුණා, ආපදාවක් වුණොත් රජය එනකන් ඉන්න එපා; වහාම අවශ්‍ය කටයුතු කරන්නය කියලා. ග්‍රාම සංවර්ධන සමිතියේ සල්ලි තිබෙනවා නම් ප්‍රයෝජනයට ගන්න; පල්ලියේ සල්ලි තිබෙනවා නම් ප්‍රයෝජනයට ගන්න; පන්සලේ සල්ලි තිබෙනවා නම් ප්‍රයෝජනයට ගන්න; ඒ මුදල් අරගෙන වහාම පළමුවෙනි වේලේ ඉඳලා ආහාර ලබා දෙන්න; අපි ඇවිල්ලා ඒ සල්ලි නැවත ලබා දෙන්න කටයුතු කරනවාය කියලා අපි කියා තිබුණා. ඒ සියලු දෙනාගේ ආහාර වෙනුවෙන් කරපු වියදම් අපි මේ වන විටත් ග්‍රාම නිලධාරිවරයා හරහා පියවා තිබෙනවාය කියන එකත් මා සඳහන් කරන්න කැමැතියි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ වාගේම චක්‍රලේඛ අපි බාධාවක් කර ගත්තේ නැහැ, මේ ජනතාවට කෑම ලබා දෙන්න. චක්‍රලේඛවල තිබුණු ඒවාට එහා ගිහිල්ලා අපි කටයුතු කළා. කඳවුරේ ඉන්න ජනතාවට තමයි චක්‍රලේඛයේ හැටියට කෑම ලබා දීමට තිබුණේ. නමුත් අපේ ජනාධිපතිතුමා දුන්න උපදේශය අනුව, කඳවුරේ නොවෙයි ආපදාවට ලක් වෙලා ගෙදර සිටියා නම් ඒ අයටත් කෑම දෙන්න අපි කටයුතු කළාය කියන එක මා ඉතාමත් වග කීමෙන් කියනවා. ඒ නිලධාරින්ට ගැටලුවක් ඇති වන නිසා මා ඒ සඳහා කැබිනට් පත්‍රිකාවක් කැබිනට් මණ්ඩලයට ඉදිරිපත් කරලා පිට ප්‍රදේශවල ඉන්න ජනතාවට කෑම ලබා දීම සඳහාත් අපි අනුමැතිය ලබා ගත්තාය කියන එකත්, නිලධාරින්ට කිසි හිරිහැරයක් නොවෙන්න, බාධාවක් නොවෙන්න ඒ නීතිරීති වෙනස් කරන්න අවශ්‍ය අනුමැතියත් අපි අරගෙන තිබෙනවාය කියන එකත් මා ඉතාමත් ආඩම්බරයෙන් සඳහන් කරන්න කැමැතියි. විරුද්ධ පක්ෂයේ මන්ත්‍රීවරු වාද විවාදවලට ගිහිල්ලා කිව්වා, "දැන් ඔය ජනාධිපතිතුමා කට ඇරලා කිව්වාට වැඩක් නැහැ. ඇමති කිව්වාට වැඩක් නැහැ. චක්‍රලේඛයට පිටින් කටයුතු කරන්න එපා. එහෙම වුණෝතින් රක්ෂාව නැති වෙයි." කියලා. මොකද එහෙම කිව්වේ? බොහොම අයට චූවමනාවක් තිබුණා, මේ මිනිසුන් බඩගින්නේ තියන්න; මේ මිනිසුන් අපහසුතාවට පත් කරන්න. ඒ නිසා තමයි එහෙම කිව්වේ. පරණ චක්‍රලේඛයක් පෙන්වමින් ඒ අය කථා කරලා කිව්වා, රුපියල් හැත්තෑවයි කන්න දෙන්නේ කියලා; බිස්කට් පැකට් එකයි පවුලේ හය දෙනාට හම්බ වුණේ කියලා. කිසිම දෙයක් දුන්නේ නැහැයි කියලා පට්ටපල් අසත්‍ය කිව්වා. මම ඒ වෙලාවේ කිව්වා, "විරුද්ධ පක්ෂයේ මන්ත්‍රීවරුන්ගේත් වග කීමක් තිබෙනවා. ඒ, කන්න බොන්න දෙන එක නොවෙයි. එතුමන්ලා විරුද්ධ පක්ෂයේ ඉන්න නිසා එතුමන්ලාට ඒක කරන්න බැරි වෙයි. නමුත් එතුමන්ලාටත් වග කීමක් තිබෙනවා, මේ කඳවුරුවලට යන්න" කියලා. ඒ විධියට මම එතුමන්ලාට ආරාධනාවක් කළා, ඒ කඳවුරුවලට යන්නය කියලා. ඒ කඳවුරුවලට ගිහිල්ලා මට දුරකථනයෙන් කථා කරලා කන්න නැති මිනිස්සු ඉන්නේ මොන කඳවුරේද කියලා කියන්නය කිව්වා. මම දුරකථනය ක්‍රියාත්මක කර ගෙන ඉන්නවා, කන්න නැති මිනිස්සු ඉන්නේ මොන කඳවුරේද කියන එක මට කියන්නය කියලා හැම විවාදයකදීම හැම වැඩසටහනකදීම මම කිව්වා. විපක්ෂයේ ඕනෑම මන්ත්‍රීවරයෙක් කඳවුරකට ගිහිල්ලා, ඒ කඳවුරේ කන්න නැති මිනිහෙක් ඉන්නවා නම් මට දැනුම් දෙන්න; මම ඒ වගකීම බාර ගන්න සූදානම්ය කියලා මම කිව්වා. අපේ අතිගරු ජනාධිපතිතුමාගේ මැදිහත් වීම මම ඉතාමත් ආඩම්බරයෙන් සඳහන් කරනවා. එතුමා දවසකට දෙසැරයක් මට කථා කළා. ගරු බැසිල් රාජපක්ෂ මැතිතුමා විදේශ සම්බන්ධතා බොහොමයක් තබා ගෙන ඒ මතින් ආධාර සොයා ගන්නා ගමන් නිරන්තරයෙන් මට කථා කරලා අවශ්‍ය සහයෝගයන් ලබා දුන්නා. ඒ වාගේම අපේ ගරු අගමැතිතුමාගේ ඉඳලා ආණ්ඩුවේ මැති ඇමතිවරු සියලු දෙනාම මේ කාරණයට මැදිහත් වුණා. මම මේ ගම්මානවලට යන කොට ඒ ප්‍රදේශවල සිටි ඇමතිවරු අපිත් එක්ක ඇවිල්ලා ඒ අඩු පාඩු සොයන්න සම්බන්ධ වුණා. නමුත් අවාසනාවකට වාගේ ආණ්ඩු පක්ෂයෙන් හැරෙන්න ඒකට මැදිහත් වෙන්න වෙන කවුරුවත් ආවේ නැහැ. මම TNA එකට ස්තුතිවන්ත වනවා. එක පැත්තකින් TNA එකේ මන්ත්‍රීවරු ඇවිල්ලා ඒ බොහෝ දේවල්වලට සම්බන්ධ වුණා. යම් යම් අතපසු වීම් සම්බන්ධව ඒ අය ඇවිල්ලා අපට කිව්වා. ඒක තමයි කරන්න ඕනෑ. විපක්ෂයේ කාර්ය භාරය ඒකයි. නිකම් බොරුවට ප්‍රවෘත්ති සාකච්ඡා තියතියා විවේචනය කිරීම නොවෙයි; චක්‍රලේඛන පෙන්ව පෙන්වා සිටීම නොවෙයි කළ යුත්තේ. හරි නම් විපක්ෂයේ වගකීම තමයි අඩු පාඩු හොයලා ආණ්ඩුවට දැනුම් දීම. ඒක විපක්ෂයෙන් කළා නම් ඒ, වෙන කවුරුවත් නොවෙයි, TNA එකේ මන්ත්‍රීවරු. ඒ වාගේම අපිත් එක්ක ආණ්ඩුවේ ඉන්න මුස්ලිම් කොංග්‍රසයේ මන්ත්‍රීවරු බොහෝ කටයුතුවලට මැදිහත් වුණා. අපේ ආණ්ඩුවේ සියලු මැති ඇමතිවරු ඒවාට මැදිහත් වුණා. ඒ ප්‍රදේශවලට ගියා. අද වෙනකම් විපක්ෂයේ ඔබට, ඔබගේ කණ්ඩායමට ඒ ප්‍රදේශයේ ජනතාවට උදව්වක් කරන්න හෝ අඩු ගණනේ ගිහින් මේ තොරතුරු විමසන්න හෝ නොහැකි වීම පිළිබඳව මම කනගාටු වනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, වෙන දා මෙවැනි ආපදා අවස්ථාවකදී තිබුණු තත්ත්වය අනුව දිස්ත්‍රික් ලේකම්වරයා සල්ලි වියදම් කර, සල්ලි ඉල්ලා ලියුම් ගහන්න ඕනෑ; දුරකථන ඇමතුම් ලබා දෙන්න ඕනෑ. නමුත් මගේ උපදෙස් අනුව අපේ ගණකාධිකාරිවරයා හැම දාම උදේ මේ ආපදා සිදු වුණ ප්‍රදේශවල දිසාපතිවරුන්ට කථා කරනවා. අපේ අමාත්‍යාංශයේ ගණකාධිකාරිවරයා කථා කරලා අහනවා ආපදා වුණු අයට සහන ලබා දෙන්න කොපමණ සල්ලි ඕනෑද කියලා. එහෙමයි ඇහුවේ. ඒ ඇහුවා විතරක් නොවෙයි, ඉල්ලන සැණින් ඒ සල්ලි ලබා දුන්නා. මම මඩකලපුවේ රැස්වීමට යන කොට ඊට කලින් දවසේ එතැනට රුපියල් මිලියන පහක් දුන්නා. ඒක මදි කියලා කිව්වා. අපි පැය දෙකක් ඇතුළත මඩකලපුවේ දිසාපතිවරයාට රුපියල් මිලියන විස්සක් මුදල් වශයෙන් සහ අනුමැතිය අරගෙන දුන්නා. එහෙමයි අපි සල්ලි දුන්නේ. වෙන දා කවදාවත් රජයේ ආයතනයකින් එහෙම සල්ලි දුන්නේ නැහැ. සල්ලි ප්‍රශ්න තිබෙන කොට අතිගරු ජනාධිපතිතුමා ක්ෂණිකව මැදිහත් වුණා. මහා භාණ්ඩාගාරයේ ලේකම්වරයාට ඉල්ලා සිටි පමණින් මුදල් ලබා දෙන්න කියලා උපදෙස් දුන්නා. කිසිදු අඩුවක් කරන්නේ නැතිව මේ ජනතාවට කන්න බොන්න ටික දෙන්න අවශ්‍ය දේවල් කිරීමට එතුමා කටයුතු කිරීම පිළිබඳව අපි සතුටු වනවා.

ඒ වාගේම දැන් මේ අවාසනාවන්ත සිදු වීම වෙලා තිබෙනවා. දැන් ඊ ළඟට කරන්න තිබෙන කාර්යයන් පිළිබඳවත් අපේ අවධානය යොමු විය යුතු වෙනවා. මේ ව්‍යසනය සිදු වුණු

[ගරු මහින්ද අමරවීර මහතා]

ප්‍රදේශවල ජනතාවගේ ජීවිත යථා තත්ත්වයට පත් කිරීමේ වගකීම අපට තිබෙනවා. ඒ සඳහා දැනටමත් අපි රජය විධියට ගන්න පුළුවන් ක්‍රියාමාර්ග ගන්නා අතරේ රාජ්‍ය නොවන සංවිධාන සමඟ සාකච්ඡා බොහොමයක් පවත්වා තිබෙනවා.

ඔබතුමන්ලා සතුටට පත් වුණේ නැති වුණාට ඊයේ ආපු එක්සත් ජාතීන්ගේ සංවිධානයේ -UN එකේ- මානව කටයුතු පිළිබඳ නියෝජ්‍ය සහකාර ලේකම්තුමිය ඊයේ තිබුණ රැස්වීමේදී ලෝකයේ කිසිම රටකට වැඩිය ඉක්මනට මේ රටේ ජනතාව බේරා ගන්නා වැඩ පිළිවෙළට දායක වුණා වාගේම මේ ජනතාව බඩගින්නේ තියන්නේ නැතිව කටයුතු කිරීම පිළිබඳව විශේෂ ස්තුතියක් එතුමිය අපේ රජයට කළා කියන එක මම සඳහන් කරන්න කැමැතියි. ඒක එතුමියගේ මතය නොවෙයි. එතුමියගේ නිලධාරින් ඒ ප්‍රදේශවලට ගිහින් සොයා බලා ගත්ත වාර්තා අනුව තමයි එතුමිය ඒ ප්‍රකාශය කළේ. ඒ විතරක් නොවෙයි විදේශ කණ්ඩායම් අපි මුණ ගැහුණ හැම වෙලාවේම කිව්වේ ලෝකයේ කිසිම රටකට බැරි වුණ ආකාරයට මේ ව්‍යසනය කළමනාකරණය කර ගන්න ඔබගේ ආණ්ඩුවට, ඔබගේ රජයට පුළුවන්කම ලැබුණා කියන එකයි. ඒ ගෞරවය ඒ අය අපේ රජයට හිමි කළා. අපට විපක්ෂයෙන් මේ ගෞරවය නොලැබුණාට, විපක්ෂය මේ පිළිබඳව චෝදනා, මඩ ප්‍රහාර එල්ල කළාට ජාත්‍යන්තරය සහ මේ පිළිබඳව අවබෝධ කර ගත්ත, සොයා බැලුව කණ්ඩායම්වල ප්‍රශංසාව අපට හිමි වුණා. ඒ වාගේම ජනතාවගේ ප්‍රශංසාව ඒ වෙනුවෙන් හිමි වෙලා තිබෙනවා කියන එකත් මම සඳහන් කරන්න කැමැතියි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ ප්‍රදේශවල විතරක් නොවෙයි රටේම ආපදා වැළැක්වීම සඳහා පියවර ගන්න දැනටමත් අපි සැලසුම් කරලා තිබෙනවා. මම මේ අමාත්‍යාංශයේ වැඩ බාර ගත්ත දවසේත් මගේ නියෝජ්‍ය අමාත්‍යතුමාත්, අපිත් ගිහිල්ලා එදාම කිව්වේ මීට පස්සේ ව්‍යසනයක් ඇති වුණාම උදවු උපකාර කිරීමට අතිරේකව වැඩි අවධානයක් යොමු කරන්නේ ව්‍යසනය වළක්වා ගන්න සහ ව්‍යසනයෙන් වන හානිය අවම කර ගැනීමේ වැඩ පිළිවෙළවලට දායක වීමටයි කියන එකයි. ඒ අනුව දැන් අපේ අමාත්‍යාංශය නව දර්ශනයක් සහිතව අපි ඉදිරියට ගෙන යනවා. මේ අමාත්‍යාංශයේ කටයුතු මෙහෙයවන්නට මට පහසු වුණේ හිටපු අමාත්‍යවරුන් විධියට ෆවුසි අමාත්‍යතුමාත්, මහින්ද සමරසිංහ අමාත්‍යතුමාත් ගෙන ගිය වැඩ පිළිවෙළවල් නිසායි. එම වැඩ පිළිවෙළවල් අපි ඒ ආකාරයෙන්ම ගෙන යන ගමන් අනාගතයේදී තවත් පිම්මක් ඉස්සරහට තබන්නට අපි කටයුතු කළා. ඒ තමයි, ව්‍යසන අවම කිරීම සඳහාත්, වැළැක්වීම සඳහාත් කටයුතු කිරීම. ඒ අනුව අපි දැනටමත් ඒ සඳහා වැඩ පිළිවෙළක් සකස් කර තිබෙනවා. එක උදාහරණයක් මා කියන්න කැමැතියි. එනම් අපි එහි ප්‍රතිඵල ලබපු එක් අවස්ථාවක් ගැන. ඇත්තෙන්ම ගරු බැසිල් රාජපක්ෂ මැතිතුමාට අප එහි ගෞරවය හිමි කරන්නට ඕනෑ. පසු ගිය දවස්වල බොහෝ ප්‍රදේශවල ගංවතුර තත්ත්වයක් ඇති වුණා. ගම්පහ දිස්ත්‍රික්කයටත් ධාරානිපාත වර්ෂාවක් ඇති වුණා. නමුත් ගම්පහ දිස්ත්‍රික්කයේ ගංවතුර තත්ත්වයක් ඇති වුණේ නැහැ. මොකද, එතුමා යන්ත්‍රෝපකරණ ගණනාවක් යොදවලා ඒ ඇළවල් ටික සුද්ධ කරලා දුන්නා. ඒ ඇළවල් සුද්ධ කිරීමේ ප්‍රතිඵලයක් විධියට ගම්පහ දිස්ත්‍රික්කය ගංවතුරින් වළක්වා ගන්නට පුළුවන් වුණා. ඒක අපිට හොඳ ආදර්ශයක්. අපි රටේ අනෙකුත් හැම ප්‍රදේශවලමත් එම ආදර්ශය ක්‍රියාත්මක කරන්නට බලාපොරොත්තු වනවා.

ඒ විතරක් නොවෙයි. මේ ගෙවල් කැඩුණු අයට අපි නිවාස ඉදි කර දීමේ වැඩ පිළිවෙළක් සකස් කර ගෙන යනවා. ඒ සඳහා අපේ අමාත්‍යාංශයෙන් අපි උදවු කරනවා. ඒ වාගේම ගරු බැසිල් රාජපක්ෂ මැතිතුමාගේ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය, ඒ වාගේම විදේශ රටවල් අපට ආධාර උපකාර කරනවා. අපට ආධාර උපකාර කරන්නට ආපු විදේශ රටවල් හැමෝටම අපි කිව්වේ, අපට මේ නිවාස ඉදි කර ගැනීමේ වැඩ පිළිවෙළට උදවු උපකාර කරන්නය කියලායි.

මා මීට වැඩිය යමක් කථා කරන්නට බලාපොරොත්තු වන්නේ නැහැ. ඔබතුමන්ලාට මම කියන්න කැමැතියි, ඉදිරි කාලය තුළත් අපි රජයක් විධියට අතිගරු ජනාධිපතිතුමාගේ මේ වැඩ පිළිවෙළ ඉදිරියට ගෙන යන්නට කටයුතු කරන බව. අපේ ජනතාව බේරා ගන්න, පළමුවන තැනට ජනතාවගේ ආරක්ෂාව වෙනුවෙන් කැප වීමෙන් කටයුතු කරන නායකයකු සිටින මේ රටේ, ජනතාවගේ ආරක්ෂාව වෙනුවෙන් ගන්න පුළුවන් හැම ක්‍රියා මාර්ගයක්ම අපි ඉදිරියේ දී ගන්නවා. ඒ සඳහා දේශීයව අරමුදල් සපයා ගැනීමට අපි දැනට ව්‍යාපෘති වාර්තා සකස් කර ඉදිරිපත් කර තිබෙනවා. ලක්ෂ්මන් කිරිඇල්ල මන්ත්‍රීතුමා කිව්වා, මේ පනත ගෙනෙන්න පරක්කු වුණාය කියලා. මා කියන්න කැමැතියි, නාය යෑම් පිළිබඳව US Dollars මිලියන 50ක වාර්තාවක් විදේශ සම්පත් දෙපාර්තමේන්තුවට මේ වන විටත් ඉදිරිපත් කර තිබෙන බව. ඒ වාගේම කැබිනට් මණ්ඩලයට එය යොමු කර තිබෙනවා. අනෙකුත් ප්‍රදේශ සඳහාත් වාර්තා සකස් කරලා අපි කැබිනට් මණ්ඩලයට යොමු කරලා, ජනතාවට හිතකර විධියට මේ සේවාවන් ලබා දෙන්නට කටයුතු කරනවා. ඒ වාගේම අනාගතයේදීත් එම ජනතාව රැක ගන්න කටයුතු කරනවා. අපේ අමාත්‍යවරුන් ඒ ප්‍රදේශවලට ගියා. නිමල් සිරිපාල ද සිල්වා ඇමතිතුමා, එස්.එම්. චන්ද්‍රසේන ඇමතිතුමා එම අමාත්‍යාංශවල කටයුතු සම්බන්ධීකරණය කරන්න එහි ගියා. ඒ වාගේම අනෙකුත් අමාත්‍යවරුන් ගිහිල්ලා ඒ කටයුතු කළා. අපි එකමුතුව කණ්ඩායමක් විධියට රජයේ අමාත්‍යාංශ සියල්ල එකතු වෙලා රටේ ජනතාව යථා තත්ත්වයට පත් කරන්නට මේ වැඩ පිළිවෙළ ගෙන යනවාය කියන එක සඳහන් කරමින්, ඔබතුමාට ස්තුතිවන්ත වෙමින් මා නිහඬ වනවා.

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ ප්‍රශ්නය පිළිබඳව අපිට දීර්ඝ පිළිතුරක් ලැබුණා. නමුත් විපක්ෂ නායකතුමා ඉදිරිපත් කරපු චෝදනා සියල්ලටම උත්තර දුන්නේ නැහැ. මා කියන්නේ මේකයි. මේ සඳහා දවසක විවාදයක් මේ පාර්ලිමේන්තුවේ පැවැත්විය යුතුයි. මොකද, මෙවැනි දේවල් නැවතත් සිදු නොවෙන්න අපි වැඩ පිළිවෙළ සකස් කර ගත යුතුයි. මම ගරු සභානායකතුමාගෙන් ඉල්ලීමක් කරනවා, කරුණාකර ඒ සඳහා ඉක්මන් දිනයක් අපි තීරණය කරමු කියලා.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

මී ළඟට ගරු එස්.එම්.චන්ද්‍රසේන ඇමතිතුමා. ඉතාම කෙටියෙන් ඔබතුමාගේ -

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremasinghe)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ ඇමතිතුමා සැලසුම් ටික සභාගත කළේ නැහැ. හදිසි අවස්ථා සැලැස්මයි, ජාතික සැලැස්මයි සභාගත කළේ නැහැ. [බාධා කිරීම්]

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

මී ළඟට ගරු එස්.එම්.චන්ද්‍රසේන ඇමතිතුමා. ඉතාම කෙටියෙන් විනාඩි පහකින් ඔබතුමාගේ කථාව කරන්න.

**ගරු එස්.එම්. චන්ද්‍රසේන මහතා (ගොවිජන සේවා හා වනජීවී අමාත්‍යතුමා)**
(மாண்புமிகு எஸ்.எம். சந்திரசேன - கமநல சேவைகள், வனசீவராசிகள் அமைச்சர்)
(The Hon. S.M. Chandrasena - Minister of Agrarian Services and Wildlife)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, වාරිමාර්ග හා සුළු වාරිමාර්ග පිළිබඳවත් -

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

Sir, I rise to a point of Order.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

Order, please! What is the point of Order?

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ස්ථාවර නියෝග 25 යටතේ මේ පාර්ලිමේන්තුවේ ජනවාරි මාසයේ 06 වෙනි දා මා ප්‍රශ්නයක් ඇහුවා. ඒ ප්‍රශ්නය ඇසූ අවස්ථාවේ දී ලැබුණේ ඊට හාත්පසින්ම වෙනස් පිළිතුරක්.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා මෙවැනි කාරණයක් සම්බන්ධව ගරු කථානායකතුමා - [බාධා කිරීමක්] ඒක හදිසි වෙන්න බැහැ නේ, ඔබතුමාට කලින් දීපු උත්තරයක් සම්බන්ධව නේ කියන්නේ. ගරු කථානායකතුමා දැනුවත් කොට මෙම ප්‍රශ්නය ඉදිරිපත් කරන්න කියලා මම දැනුම් දෙනවා. You can raise the matter after having discussed it with the Hon. Speaker. ගරු එස්.එම්. චන්ද්‍රසේන ඇමතිතුමා කථා කරන්න.

**ගරු එස්.එම්. චන්ද්‍රසේන මහතා**
(மாண்புமிகு எஸ்.எம். சந்திரசேன)
(The Hon. S.M. Chandrasena)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ ගංවතුර තත්ත්වය තුළ වාරි මාර්ගවලට, කෘෂිකර්මයට, වී වගාවට වන හානිය සහ තවත් නොයෙකුත් දේවල් ගැන අපේ ගරු විපක්ෂ නායකතුමා විසින් කරුණු ඉදිරිපත් කළා. ඒවායේ සාවද්‍ය තොරතුරුත් බොහොම තිබෙනවා. ඒ නිසා මමත් කාරණා කීපයක් ඉදිරිපත් කරන්න කැමැතියි. විශේෂයෙන්ම මේ ගංවතුර නිසා ඇති වුණු තත්ත්වය අපි දැන ගන්න ඕනෑ. මහ බැංකු වාර්තා සහිතව මම මේ සත්‍යය-

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremasinghe)

Sir, I rise to a point of Order.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

What is the point of Order?

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremasinghe)

I have directed a Question and the Minister concerned has answered. If you make it a Debate, then I must also be given time to reply. I did not ask him for anything. That Minister is of no concern to me. I only wanted to know why he did not give the plans. That is all. According to the Standing Orders, එක් කෙනෙකුට විතරයි පිළිතුරු දෙන්න පුළුවන්. දෙන්නෙකුට බැහැ.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

That is what is in the Standing Orders.

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremasinghe)

The Minister concerned has replied . එක් කෙනෙක් පිළිතුරු දුන්නා. දෙන්නෙකුට බැහැ. Debate එකක් නම් මටත් කථා කරන්න දෙන්න. Let me reply to him.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

ගරු චන්ද්‍රසේන ඇමතිතුමා, ඔබතුමාට කථා කරන්න අවස්ථාව ලබා දුන්නාම ඒ අවස්ථාවේදී පැහැදිලි කිරීම කරන්න.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

Sir, I rise to a point of Order.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

The Hon. Chandrasena will speak only when he is given time. He will not proceed now.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

Sir, I raised a point of Order.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

What is the point of Order?

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපේ විපක්ෂ නායකතුමා ඒ ප්‍රකාශය කළාට පස්සේ ඒකට පිළිතුරු දෙන්න පුළුවන් ඇමතිතුමාට. තවත් අය කරුණු පැහැදිලි කරන්න ගියාම මේක Debate එකක් වනවා.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ඒ පිළිබඳව අපි තීන්දුවක් ගත්තා.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
This is going to be another Debate. - [*Interruption.*] Yes, we will have another date for a Debate.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
The point is taken. දැන් අපි ගරු ඇමතිතුමාව දැනුවත් කළා එතුමාගේ කථාව කරන අවස්ථාවේදී ඒ පිළිබඳව පැහැදිලි කරන්න කියලා. ගරු චන්ද්‍රසේන ඇමතිතුමා වාඩි වන්න. ඔබතුමාගේ කථාවේදී ඒ පැහැදිලි කිරීම කරන්න.

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremasinghe)
Thank you very much.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
මී ළඟට නොපැමිණීමේ අවසරය පිළිබඳ යෝජනාව.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
මම ස්ථාවර නියෝග 23(2) යටතේ ප්‍රශ්නයක් මතු කිරීම සඳහා දැනුම් දීලා තිබෙනවා.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
නැහැ, අද නැහැ.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ඇමතිතුමා සූදානම් වෙලාත් ඉන්නවා.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
අද 23(2) යටතේ ඔබතුමාගේ ප්‍රශ්නයක් නැහැ. ඔබතුමාට ඊයේයි තිබුණේ.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
නැහැ, අද තිබෙන්නේ.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
නැහැ. අද දින න්‍යාය පත්‍රයට ඇතුළත් කරලා නැහැ.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ඊයේ දවල් 12ට පෙර මහ ලේකම් කාර්යාලයට ලබා දීලා තිබෙනවා.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
කෙසේ වෙතත් අද න්‍යාය පත්‍රයට ලැබිලා නැහැ. ගරු සුමන්තිරන් මන්ත්‍රීතුමා ඔබතුමා යෝජනාව ඉදිරිපත් කරන්න.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒක මගේ වරදක් නොවෙයි. මට කරුණාකරලා මයික් එක දෙන්න. ඒක මගේ වරද නොවෙයි. මම නියමිත පරිදි ලේකම්තුමාට ලබා දීලා තිබෙනවා. ඒක ඇමතිතුමාටත් ලැබිලා තිබෙනවා. නියෝජ්‍ය ඇමතිතුමා මෙතැන ඉන්නේ ඒ ප්‍රකාශයට පිළිතුරු ලබා දීමට සූදානමින්.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
Let the Secretary-General ascertain whether he has received such a letter.

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
අස්වර් මන්ත්‍රීතුමාට ඉස කුඩිච්චියක් දාලා.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
කවුද තට්ටේ පැළුවේ? [බාධා කිරීම්] නෝනාගෙන් ඔළුව පැළෙන්න හම්බ වෙලා තිබෙනවා.

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
අනේ! කට වහ ගෙන ඉන්න. නෝනා ගැහුවා නම් කමක් නැහැ. Sir, we will proceed with the other matters in the Order Paper. The House cannot be brought to a standstill, it must proceed. Ask him to make that Statement tomorrow, Sir. [බාධා කිරීම්]

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ඇත්ත වශයෙන්ම මොකක්ද ඔය වෙලා ඇත්තේ? ඇත්ත වශයෙන්ම මොකක්ද වෙලා තිබෙන්නේ? [බාධා කිරීම්] ඒක එතුමා තීරණය කරාවි. පොඩ්ඩක් ඉන්න. [බාධා කිරීම්]

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

ගරු අනුර දිසානායක මන්ත්‍රීතුමා, ඔබතුමාගේ ලිපියක් මහ ලේකම්තුමාගේ කාර්යාලයට ලැබිලා නැහැ.

ගරු සුමන්තිරන් මන්ත්‍රීතුමා ඔබතුමා නිවාඩු ඉල්ලීමේ යෝජනාව ඉදිරිපත් කරන්න. [බාධා කිරීමක්] ගරු අනුර දිසානායක මන්ත්‍රීතුමනි, දැන් තීරණයක් අරගෙන තිබෙන්නේ. [බාධා කිරීම්] Hon. Sumanthiran, you may now move the Motion.

## නොපැමිණීමේ අවසරය : ගරු රාජවරෝදියම් සම්පන්දන් මහතා
## வராதிருக்க அனுமதி: மாண்புமிகு இராஜவரோதயம் சம்பந்தன்
## LEAVE OF ABSENCE : HON. RAJAVAROTHIAM SAMPANTHAN

**ගරු එම්.ඒ. සුමන්තිරන් මහතා**
(மாண்புமிகு எம்.ஏ. சுமந்திரன்)
(The Hon. M.A. Sumanthiran)

I move,

"That Hon. R. Sampanthan, Member of Parliament for Trincomalee Electoral District, be granted leave under Article 66(f) of the Constitution to be absent from the Sittings of Parliament for a period of three months from 21st January, 2011."

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## පාර්ලිමේන්තුවේ කටයුතු
## பாராளுமன்ற அலுவல்
## BUSINESS OF THE PARLIAMENT

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"න්‍යාය පත්‍රයේ ප්‍රධාන කටයුතුවල අංක 3 දරන විෂය පිළිබඳ වැඩ අද දින රැස්වීමේදී අංක 23 දරන ස්ථාවර නියෝගයෙහි විධිවිධානයන්ගෙන් නිදහස් විය යුතු ය."

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

යෝජනා පිළිබඳ දැනුම් දීම සහ දිනට නියමිත කටයුතු.

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද දින න්‍යාය පත්‍රයේ විෂය අංක 1 දරන වැඩිහිටි තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ (සංශෝධන) පනත් කෙටුම්පත හා අංක 2 දරන සමථ මණ්ඩල (සංශෝධන) පනත් කෙටුම්පත යන පනත් කෙටුම්පත් දෙකම විවාදයට ගෙන අවසානයේදී ඡන්දය විමසීමටත්, ඉන් අනතුරුව පක්ෂ නායක රැස්වීමේ දී එකඟ වූ පරිදි හදිසි නීතිය දීර්ඝ කිරීම පිළිබඳ යෝජනාවට ඡන්දය ගැනීමටත් යෝජනා කරනවා.

## වැඩිහිටි තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ (සංශෝධන) පනත් කෙටුම්පත
## முதியோரின் உரிமைகளைப் பாதுகாத்தல் (திருத்தச்) சட்டமூலம்
## PROTECTION OF THE RIGHTS OF ELDERS (AMENDMENT) BILL

*දෙ වන වර කියවීමේ නියෝගය කියවන ලදී.*
*இரண்டாம் மதிப்பிற்கான கட்டளை வாசிக்கப்பட்டது.*
*Order for Second Reading read.*

[අ. .භා. 3.18]

**ගරු ෆීලික්ස් පෙරේරා මහතා (සමාජ සේවා අමාත්‍යතුමා)**
(மாண்புமிகு பீலிக்ஸ் பெரேரா - சமூக சேவைகள் அமைச்சர்)
(The Hon. Felix Perera - Minister of Social Services)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, "වැඩිහිටි තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ (සංශෝධන) පනත් කෙටුම්පත දැන් දෙවන වර කියවිය යුතුය"යි මා යෝජනා කරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද අපි වැඩිහිටි තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ පනතට සංශෝධන කිහිපයක් ඉදිරිපත් කරනවා.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

Order, please! The Hon. Deputy Chairman of Committees will now take the Chair.

*අනතුරුව නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, නියෝජ්‍ය කාරක සභාපතිතුමා [ගරු මුරුගේසු චන්ද්‍රකුමාර් මහතා] මූලාසනාරූඪ විය.*

*அதன் பிறகு, பிரதிச் சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் [மாண்புமிகு சந்திரகுமார் முருகேசு] தலைமை வகித்தார்கள்.*

*Whereupon* MR. DEPUTY SPEAKER *left the Chair, and* MR. DEPUTY CHAIRMAN OF COMMITTEES [THE HON. MURUGESU CHANDRAKUMAR] *took the Chair.*

**ගරු ෆීලික්ස් පෙරේරා මහතා**
(மாண்புமிகு பீலிக்ஸ் பெரேரா)
(The Hon. Felix Perera)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, වැඩිහිටි තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ පනතට සංශෝධන කිහිපයක් අපි අද ඉදිරිපත් කරනවා. ඔබතුමා දන්නවා ඇති මේ රටේ වර්තමාන

[ගරු ෆීලික්ස් පෙරේරා මහතා]

ජනගහනයෙන් ලක්ෂ 20ක් විතර ඉන්නේ වැඩිහිටියන් බව. එය ප්‍රතිශතයක් වශයෙන් බලද්දී සියයට 11ක් පමණ වනවා. මේ වෙද්දී අපි ගණන් බලා තිබෙනවා, ඒ ප්‍රතිශතය 2018 වෙද්දී සියයට 25ක් දක්වා වැඩි වෙයි කියලා. 2050 වෙද්දී ඒක දෙගුණයක් වනවා කියලා තමයි උපකල්පනයක් තිබෙන්නේ. වැඩිහිටියෝ කියන්නේ වැඩි කාලයක් ජීවත් වෙච්ච අයයි. ජීවිතයේ වැඩි කාලයක් ගත කරපු අයයි. ඒ අය ප්‍රබුද්ධයෝ. ඒ විතරක් නොවෙයි ඒ අයට හොඳ විඥානයක් තිබෙනවා; හැකියාවක් තිබෙනවා. වයස 60 පැන්නායින් පස්සේ වැඩිහිටිභාවයට පත් වුණත් ක්‍රියාකාරිත්වය අඩු වන්නේ නැහැ. ඒ ගොල්ලන්ගේ සෞඛ්‍ය හොඳ නම්, වැඩිහිටියෙක් විධියට නම් කෙරුණත් ක්‍රියාකාරකම්වල විශාල වශයෙන් යෙදෙනවාය කියන එක අපි මතක් කරන්න ඕනෑ. විශේෂයෙන් මාධ්‍යවේදියෝ, කලාකාරයෝ, සංගීතඥයෝ වැඩි හරියක් වැඩිහිටි අයයි. ඉන්දියාවේ දේශපාලනඥයෝ වැඩිහිටි අයට තමයි ගොඩක් සලකලා තිබෙන්නේ. එක එක රටවල එක එක සම්ප්‍රදායන් තිබෙනවා. අපේ ආණ්ඩුව මේ වැඩිහිටි අය සම්බන්ධයෙන් විශාල වශයෙන් කල්පනා කර බලා නොයෙකුත් වැඩ පිළිවෙළවල් දැන් හදමින් පවතිනවා. මට සුළු කාලයක් තිබෙන නිසා මම ඒ ගැන පසුව කථා කරන්නම්. කෙසේ වෙතත් අද කරන්නේ ප්‍රධාන ප්‍රඥප්තිය සංශෝධනය කිරීමයි. මුල් පනතේ පූර්විකාවක් තිබුණේ නැහැ. නව සංශෝධන පනත මඟින් වැඩිහිටි තැනැත්තන්ගේ අයිතිවාසිකම් සපුරාලීම සඳහා සහාය වීමේ රජයට ඇති කාර්ය භාරය පිළිගැනීම පිණිස පූර්විකාවක් ඇතුළත් කර තිබෙනවා.

ඊ ළඟට ප්‍රධාන ප්‍රඥප්තියේ 3 වන වගන්තිය සංශෝධනය කරන්න අප ලැස්ති කර තිබෙනවා. ජාතික සභාවට පූර්ණ කාලීන උප සභාපතිවරයෙකු කමිටු සාමාජිකයන් අතරින් පත් කරන්න තමයි මේ සංශෝධනයෙන් අදහස් කරන්නේ. ඒකට හේතුව මෙයයි. ප්‍රධාන ප්‍රඥප්තිය සම්මත කළ අවධියේ ජාතික වැඩිහිටි මහ ලේකම් කාර්යාලය ක්‍රියාත්මක වුණේ සමාජ සේවා දෙපාර්තමේන්තුව යටතේයි. අපට තමයි තිබුණේ. නමුත් අද ඒක නැහැ. අද ඒක තිබෙන්නේ වෙනත් අමාත්‍යාංශයකට. එහෙයින් සමාජ සේවා අධ්‍යක්ෂවරයා සභාවේ ලේකම්වරයා ලෙස නිල වශයෙන් පත් කෙරුණා, ඒ කාලයේ තිබුණු නීතියේ හැටියට. පසුව ජාතික වැඩිහිටි මහ ලේකම් කාර්යාලය සමාජ සේවා දෙපාර්තමේන්තුවෙන් වෙන් කර ගෙන ඒක වෙන පැත්තකට දීපු නිසා දෙපාර්තමේන්තු අධ්‍යක්ෂවරයෙකු යටතේ වෙනම ආයතනයක් ලෙස ස්ථාපිත කළා. ඒ අනුව සභාවේ ලේකම් වශයෙන් පත් කළ යුත්තේ ජාතික වැඩිහිටි මහ ලේකම් කාර්යාලයේ අධ්‍යක්ෂවරයා බැවින් යථෝක්ත සංශෝධනය සිදු කරන්න අපි කල්පනා කරනවා.

4 වන වගන්තිය මඟින් ප්‍රධාන ප්‍රඥප්තියේ 14 වන වගන්තිය සංශෝධනය කරනු ලබනවා. වැඩිහිටි තැනැත්තන් සඳහා වන ජාතික මහ ලේකම් කාර්යාලය විසින් වැඩිහිටියන් සඳහා නිකුත් කරන ලද වැඩිහිටි හැඳුනුම් පත බලාත්මක කිරීම, ග්‍රාමීය මට්ටමින්, ප්‍රාදේශීය මට්ටමින්, දිස්ත්‍රික් මට්ටමින් හා පළාත් මට්ටමෙන් පිහිටුවනු ලබන වැඩිහිටි කමිටු බලාත්මක කිරීම, වැඩිහිටි තැනැත්තන්ගේ ප්‍රශ්න විමසීමේදී සහාය වීම පිණිස සමථ නිලධාරින් පත් කිරීම, වෘද්ධ චිකිත්සාව ප්‍රචලිත කිරීම, වැඩිහිටියන් සඳහා සලසන විවිධ සේවාවන් විධිමත් කිරීම අරමුණු කොට ගෙන මෙම සංශෝධනය කරන්න අපි බලාපොරොත්තු වෙනවා.

5 වන වගන්තියෙන් ප්‍රධාන ප්‍රඥප්තියේ 15 වන වගන්තිය සංශෝධනය කරන්න බලාපොරොත්තු වනවා. වියපත් වීම හේතු කොට ගෙන කිසිම වැඩිහිටියකු කවර ආකාරයකින් හෝ පිටු දැකීමකට හෝ ප්‍රතික්ෂේප වීමකට ලක් නොවීමට තවදුරටත් සහතික වීම පිණිස තමයි මෙම සංශෝධනය සිදු කරන්නේ. වැඩිහිටිභාවයට පත් වුණාට පසුව ප්‍රතික්ෂේප කරන්න බැහැ. ඔහුට නොසලකා ඉන්නත් බැරි තත්ත්වයකට පත් කිරීම හා සමාජයේ අසාධාරණයට ලක් නොවීමට තමයි අපි මෙසේ කටයුතු කර තිබෙන්නේ.

6 වන වගන්තියෙන් ප්‍රධාන ප්‍රඥප්තියේ 16 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම බලාපොරොත්තු වෙනවා. දැනට පවතින පනත යටතේ වැඩිහිටි නිවාස ලියාපදිංචි කිරීම අනිවාර්යය කර නැහැ. වැඩිහිටි නිවාස තිබෙනවා. නමුත් ලියාපදිංචිය අනිවාර්යය කර නැහැ. මෙම සංශෝධනය මඟින් ඒක අනිවාර්යය කරන්න අප බලාපොරොත්තු වනවා. ඒක බොහොම හොඳ දෙයක්. දිවයින පුරා ක්‍රියාත්මකව පවතින වැඩිහිටි නිවාසවල කටයුතු අධීක්ෂණය කිරීම හා විමර්ශනය කිරීමේ බලය සභාවට හෝ ජාතික වැඩිහිටි මහ ලේකම් කාර්යාලයට මෙතෙක් ලැබී නැති නිසා මෙම බලය, වගකීම සභාව වෙත පැවරීමට තමයි මේ සංශෝධනය කරන්නේ. මම හිතන්නේ මේකට කාටවත් විරුද්ධ වෙන්න බැහැ. ඉතාමත්ම හොඳ ක්‍රියාවක් විධියට තමයි අපි මේක දකින්නේ.

8 වන වගන්තියෙන් ප්‍රධාන ප්‍රඥප්තියේ 24 වන වගන්තිය සංශෝධනය කිරීම සිදු කෙරෙනවා. නඩත්තු මණ්ඩලයේ සංයුතිය හා එය පත් කිරීම විධිමත් කිරීම පිණිස මෙම සංශෝධනය සිදු කර තිබෙන බව ගරු සභාවට දන්වන්න කැමැතියි.

9 වන වගන්තියෙන් ප්‍රධාන ප්‍රඥප්තියේ 24 (අ) වන වගන්තිය බලාත්මක කිරීම සිදු කෙරෙනවා. දැනට නඩත්තු හිමිකම් සමථකරණය සඳහා සමථ නිලධාරියකු වෙත ඉදිරිපත් කිරීමක් සිදු වන්නේ නැහැ. එහෙත් නඩත්තු හිමිකම් සමථකරණය සඳහා සමථ නිලධාරියකු පත් කිරීමට අවකාශ සැලසීමෙන් කටයුතු වඩාත් පහසු වෙනවා. ඒ සඳහා මෙම සංශෝධනය සිදු කොට තිබෙනවා. නඩත්තු හිමිකම් සමථය කරන්න දැනට කවුරුවත් නැහැ. ඒක සමථයකට පත් කිරීමට සමථ නිලධාරියකු පත් කරන්න අප තීරණය කර තිබෙනවා. එතකොට ඒවා සමථයකට පත් කර ගන්න පුළුවන් වනවා. ඇත්ත වශයෙන්ම උසාවි ගිහිල්ලා විශාල මුදලක් වියදම් කරනවාට වඩා ඒක සමථයක් කර ගත්තාම හොඳයි. ඒ කාර්යය ඉෂ්ට කර ගැනීම අපි මේ සංශෝධනය තුළින් බලාපොරොත්තු වනවා.

10 වන වගන්තිය මඟින් ප්‍රධාන ප්‍රඥප්තියේ 28 වන වගන්තිය සංශෝධනය කිරීම සිදු කෙරෙනවා. නඩත්තු මුදල් සඳහා ඇප නියම කිරීමට මණ්ඩලයට ඇති බලය වඩාත් විධිමත් කිරීම හා මුල් පනතේ ඇතුළත් වන පරිදි ඉල්ලුම්කරුට නොව වගඋත්තරකරුට වගකීම් පැවරීම හා වගඋත්තරකරු විසින් නඩත්තු මුදල් ගෙවීම පැහැර හැරීම වළක්වාලනු පිණිස මෙම සංශෝධනය සිදු කර තිබෙනවා. ඉල්ලුම්කරුට නොව වගඋත්තරකරුට වගකීම පවරන්නයි හදන්නේ. ඒකත් හොඳ දෙයක්. මේ කාරණා ටික තමයි අපි සංශෝධනය කරන්න බලාපොරොත්තු වන්නේ.

මා අමාත්‍යාංශය භාර ගත්තාට පසුව මම කිව්වා, මගේ අරමුණ වැඩිහිටි නිවාස වැඩි කිරීම නොවෙයි කියා. අපේ රට බෞද්ධ රටක්. මේ රටේ බෞද්ධයෝ අම්මාට තාත්තාට කරුණාව දක්වනවා. ඒ වාගේම මවුපිය සෙවණේ හැදෙන්න කැමැතියි. අම්මලා තාත්තලා දරුවන් බලා ගන්නවා. මවු පිය සෙනෙහස අපට උපතින්ම ලැබෙනවා. නමුත් ඒ අය වැඩිහිටියන් බවට පත් වුණාට පසුව බටහිර රටවල නම් ඒ අය වැඩිහිටි නිවාස වලට භාර දෙනවා. ඒ අය වැඩිහිටි නිවාසවලට දමලා ඒකෙන් නිදහස් වනවා. හරියට බරකින් නිදහස් වනවා වගෙයි. අපේ රටේ එහෙම නොවෙයි. දරුවොත් බලලා ඒ දරුවන්ගේ දරුවොත් බලන්න තරම් අපේ වැඩිහිටියෝ වාසනාවන්ත වෙලා තිබෙනවා. අම්මලා තාත්තලා දරුවනුත් බලා, ඒ දරුවන්ගේ දරුවොත් බලන්න තරම් වාසනාවන්ත වෙලා තිබෙනවා. ආර්ථික අතින් අඩු තත්ත්වයක ඉන්න අය සම්බන්ධව උත්සාහයක් අරගෙන ඒ අයට යම් කිසි දීමනාවක් ගෙවලා දරුවන්ට බරක් නොවී ජීවත් වීමට අවකාශය

සලසන්නයි අපි බැලුවේ. ඒ අය වැඩිහිටි නිවාසවලට ගෙනෙන්නේ නැතුව තමුන්ගේ ගෙදර ඉඳීමේ අවකාශය ලබා දීමට කටයුතු කරන්නයි අපි බලාපොරොත්තු වන්නේ. Pension එකක් තිබුණාම තාත්තාටයි අම්මාටයි දරුවෝ එක්ක බරක් නැතුව ජීවත් වන්න පුළුවන්. ඒ, pension එක තිබෙන නිසායි. එහෙම වුණාම දරුවන්ට ඔවුන් නඩත්තු කරන්න වන්නේ නැහැ. මේ වාගේ ප්‍රශ්න සම්බන්ධව තමයි අපේ අමාත්‍යාංශය කටයුතු කරගෙන යන්නේ. බොහොම සමාදානව පක්ෂ භේදයෙන් තොරව, වර්ග භේදයෙන්, කුල භේදයෙන් තොරව තමයි අප කටයුතු කර ගෙන යන්නේ. අපි දැක්කා, මේ රටේ තනි මවුපියෝ විතරක් සියයට 10කට වැඩිය ඉන්න බව. එක්කෝ අම්මා නැහැ. එහෙම නැත්නම් තාත්තා නැහැ. සල්ලි තියෙන පවුලකට නම් ඒක දරා ගන්න පුළුවන්. සමහර පවුල්වලට ඒක දරා ගන්න බැහැ.

උදාහරණයක් වශයෙන් ගත්තොත් නැඟෙනහිර පළාතේ 45,000ක් පමණ ඉන්නවා, ඒ අයගේ එක්කෝ අම්මා නැහැ; එක්කෝ තාත්තා නැහැ. යුද්ධයේ ආනිශංස තමයි ඔවුන්ට විඳින්න සිදු වෙලා තිබෙන්නේ. මොනවා වුණත් සියයට 10ක් වැඩිහිටියෝ. සියයට 7ක් ආබාධිතයෝ. සියයට 10ක් තනි මවුපියෝ. රටක ආර්ථික සංවර්ධනය කොතරම් ඉදිරියට ගියත් මේ පිරිස නොසලකා හැරීමෙන් ආර්ථිකය සංවර්ධනය වන බව පෙනෙන්නේ නැහැ; දර්ශනය වන්නේ නැහැ. ඒක highlight වන්නේ නැහැ. මේ ගරු සභාවේ තරුණ මන්ත්‍රීවරුන් ඉන්නවා. එතුමන්ලාගේ අදහස් අරගෙන -

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Order, please! Hon. Minister, your time is over. Please wind up now.

**ගරු ෆීලික්ස් පෙරේරා මහතා**
(மாண்புமிகு பீலிக்ஸ் பெரேரா)
(The Hon. Felix Perera)
මට තව වෙලාව දෙන්න. මා විෂය භාර අමාත්‍යවරයා. තවත් විනාඩි 5ක් මට දෙන්න.

මේක අපි අවබෝධ කර ගනිමු. මේකට විවේචන අවශ්‍ය නැහැ. චෝදනා නැතුව යෝජනා ටික දෙන්න. අපි එකට එකතු වෙලා ඒවා ක්‍රියාත්මක කර ගෙන යමු. අපි කවුරුත් වැඩිහිටියෝ බවට පත් වනවා; වයෝවෘද්ධභාවයට පත් වනවා. ඒකත් ලොකු වාසනාවක්. මා ඉස්සෙල්ලා කිව්වා වාගේ වැඩිහිටියෝ කියන්නේ වැඩිය ජීවත් වන අය. අද බලන්න, තමුන්නාන්සේලාගේ වැඩිහිටියන් ආරක්ෂා කරන්න -එක්සත් ජාතික පක්ෂයේ රනිල් වික්‍රමසිංහ මැතිතුමා ආරක්ෂා කරන්න- ජෝන් අමරතුංග මන්ත්‍රීතුමා, ජෝශප් මයිකල් පෙරේරා මන්ත්‍රීතුමා, ජයලත් ජයවර්ධන මන්ත්‍රීතුමා වැනි වැඩිහිටියෝ ලැහැස්ති වෙලා සිටිනවා.

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
දයාසිරි කොහොමද?

**ගරු ෆීලික්ස් පෙරේරා මහතා**
(மாண்புமிகு பீலிக்ஸ் பெரேரா)
(The Hon. Felix Perera)
දයාසිරි මන්ත්‍රීතුමා තරුණ උදවිය ආරක්ෂා කිරීමේ ක්‍රියා මාර්ගය අරගෙන යනවා නේ. කෙසේ වෙතත් මා කියනවා. වැඩිහිටියෝ අපිට ප්‍රශ්නයක් නොවෙයි කියා. ඒක ආශීර්වාදයක් විධියටයි අපි දකින්නේ. වැඩිහිටියෝ පැත්තකට දමන්නත් හොඳ නැහැ. ඒ අය අයින් කරන්නත් හොඳ නැහැ. ඒ ගොල්ලන්ගෙන් වැඩක් ගන්න ඕනෑ. සහස්‍ර වර්ෂයේ තිබෙන ඉලක්කවලට ඒ ගොල්ලන් අපි අරගෙන යනවා. විශේෂයෙන්ම ආබාධිත අය. ආබාධිත අය පැත්තකට දමන්න බැහැ. ආබාධිත අයට සමාජයේ සම තැන දීමට කටයුතු කරන්න ඕනෑ.

මට දීර්ඝ වශයෙන් කියන්න කරුණු රාශියක් තිබෙනවා. අප විසින් කරපු යෝජනා, අප විසින් සකස් කරපු සැලැස්ම ක්‍රියාත්මක කරමින් මේ අමාත්‍යාංශය ගෙන යන්න ඕනෑ. දේශපාලනය කරන්නේ මොකටද කියා ඕනෑ කෙනෙක්ගෙන් ඇහුවාම අපට දෙන පළමු වන උත්තරය තමයි සමාජයට සේවය කිරීම. අපි තමුන්නාන්සේලා ඕනෑ කෙනෙකුට පක්ෂ භේදයෙන් තොරව ඒක පොදුයි. ඒ නිසා පොදු මතයකට ඇවිත් මට උදවු කරන්න. මා තමුන්නාන්සේලා වෙනුවෙන් එහි නායකත්වය ගන්නම්. කිසිම ප්‍රශ්නයක් නැතුව ඔබට සහයෝගය ලබා දෙන්න පුළුවන්. අනෙක් මැති-ඇමතිතුමන්ලාටත් අදහස් දක්වන්න අවස්ථාවක් දෙන්න ඕනෑ. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මගේ වෙලාව හරිද නැත්නම් වෙලාව වැඩිපුර ගත්තාද?

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
You have taken 14 minutes.

**ගරු ෆීලික්ස් පෙරේරා මහතා**
(மாண்புமிகு பீலிக்ஸ் பெரேரா)
(The Hon. Felix Perera)
තව මිනිත්තුවක් තිබෙනවා.

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
නැහැ. ඔක්කොම අයගේ වෙලාව අඩු කළා.

**ගරු ෆීලික්ස් පෙරේරා මහතා**
(மாண்புமிகு பீலிக்ஸ் பெரேரா)
(The Hon. Felix Perera)
එහෙනම් කමක් නැහැ. මම නවතිනවා. මේ සංශෝධනය ගැන මීට වඩා යමක් දැන ගන්න ඕනෑ නම් අපේ Consultative Committee එකේදී මේ ගැන තමුන්නාන්සේලාගේ අදහස් දක්වලා එක ගමනක් යන්න අපි ලැස්ති වෙමු කියලා ඉල්ලමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

***ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.***
*வினா எடுத்தியம்பப்பெற்றது.*
*Question proposed.*

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
The next speaker is the Hon. Dayasiri Jayasekara. You have got 25 minutes.

**ගරු රවුෆ් හකීම් මහතා (අධිකරණ අමාත්‍යතුමා)**
(மாண்புமிகு றவூப் ஹகீம் - நீதி அமைச்சர்)
(The Hon. Rauff Hakeem - Minister of Justice)
Sir, I have to present the Mediation Boards (Amendment) Bill as well, because today we are taking both the Bills together. So, the Hon. Dayasiri Jayasekara can commence his speech after me.

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Okay, then, you can start now.

[අ. භා. 3.30]

**ගරු රවුෆ් හකීම් මහතා (අධිකරණ අමාත්‍යතුමා)**
[மாண்புமிகு றவுப் ஹக்கீம் - நீதி அமைச்சர்)
(The Hon. Rauff Hakeem - Minister of Justice)

*බිස්මිල්ලාහිර් රහ්මානිර් රහීම්.*

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අද අපි විවාදයට ගන්නා මේ පනත් කෙටුම්පත් අතරේ අප අමාත්‍යාංශයෙන් ඉදිරිපත් කර තිබෙන සංශෝධන පනත් කෙටුම්පතක් තිබෙනවා. 1988 අංක 72 දරන සමථ මණ්ඩල පනතට සංශෝධන කීපයක් අපි අද ඉදිරිපත් කරනවා. කවුරුත් දන්නා පරිදි මේ රටේ ආරාවුල් විසඳා ගැනීමේ කර්තව්‍යයේ ව්‍යුහාත්මක වෙනසක් ඇති කිරීමට අපි 1988 දී සම්මත කර ගත් සමථ මණ්ඩල ක්‍රමය රුකුලක් වුණා. මෙකේ ප්‍රධාන අරමුණ වුයේ පාර්ශ්වකරුවන් අතර ඇති වන සුළු අපරාධ හා සිවිල් ආරාවුල් අධිකරණ ක්‍රියා මාර්ගයෙන් පරිබාහිරව විසඳා ගැනීමට අවශ්‍ය පහසුකම් සැලසීමයි. දැනට සමථ මණ්ඩල ක්‍රමය දිවයිනේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 293ක ක්‍රියාත්මක වෙනවා. එසේම සමථකරුවන් 6,800කට ආසන්න සංඛ්‍යාවක් සමථ මණ්ඩලයන්හි ස්වේච්ඡාවෙන් සේවය කරනවා. 2008 වසර තුළ දී පමණක් දිවයිනේ සියලු සමථ මණ්ඩල සඳහා වාර්තා වූ ආරාවුල් සංඛ්‍යාව 1,14,000ක් වෙනවා. 2009 දී මේක 1,20,000ක් හැටියට වර්ධනය වුණා. අධිකරණමය සහනයන් ලබා ගැනීමට පෙර අනිවාර්යයෙන්ම සමථ මණ්ඩලය වෙත යොමු කළ යුතු දණ්ඩ නීති සංග්‍රහයේ දන්වා ඇති අපරාධ, පනතේ තුන්වන උපලේඛනයේ ඇතුළත් වෙනවා. ඒ වාගේම අපරාධ නොවන වෙනත් ආරාවුල් සම්බන්ධයෙන් වන විට ආරාවුලේ වටිනාකම රුපියල් 25,000 නොඉක්මවන චංචල හෝ නිශ්චල දේපළක් හෝ ණයක් අලාභයක් හෝ ඉල්ලීමක් සම්බන්ධයෙන් වූ ආරාවුලක් නම් එකී ආරාවුල අධිකරණමය සහනයක් ලබා ගැනීමට පෙර සමථ මණ්ඩල වෙත අනිවාර්යයෙන්ම වාර්තා කළ යුතු වෙනවා. මේක පනතේ 7.(1) (අ) වගන්තියේ සඳහන් වෙනවා. මෙම ආරාවුල් සඳහා වන රුපියල් 25,000ක මූල්‍යමය සීමාව 1988 දී පනත සම්මත කරනු ලැබූ අවස්ථාවේ පැනවූ සීමාවක් වෙනවා. පසු ගිය කාලය තුළ සමථ මණ්ඩල වෙත වාර්තා වන ආරාවුල්වල ස්වරූපය හා ප්‍රමාණය සැලකීමේදී මෙකී රුපියල් විසිපන්දහසේ මූල්‍යමය සීමාව වැඩි කළ යුතු බව පෙනී ගොස් තිබෙනවා. එබැවින් විශේෂයෙන් රාජ්‍ය බැංකු හා පෞද්ගලික බැංකු මඟින් ණය ලබා ගැනීම සම්බන්ධයෙන් සමථ මණ්ඩල වෙත යොමු කරන ආරාවුල් පසු ගිය වසර පහක කාලය තුළ විශාල වශයෙන් වර්ධනය වී තිබෙන බවත් අපි දකිනවා. එසේම සුළු ව්‍යාපාරික කටයුතුවලදී ඇති වන ආරාවුල්ද වැඩි වශයෙන් සමථ මණ්ඩල වෙත යොමු වෙමින් පවතිනවා. මෙවැනි තත්ත්වයක් තුළ එකී රුපියල් 25,000ක මූල්‍යමය සීමාව රුපියල් 2,50,000 දක්වා වැඩි කිරීමට මේ සංශෝධනය හරහා අපි අපේක්ෂා කරනවා. මෙමඟින් සිවිල් අධිකරණ සඳහා දැනට යොමු වන සුළු ආරාවුල් අධිකරණ වෙත නොගොස් සමථ මණ්ඩල මඟින් විසඳා ගැනීමට පාර්ශ්වකරුවන්ට අවස්ථාව ලැබෙනවා. මෙමඟින් අධිකරණයන්හි පවතින නඩු සංඛ්‍යාව අවම කිරීමටත්, පාර්ශ්වකරුවන්ට වියදමකින් තොරව හා කඩිනමින් ආරාවුල් විසඳා ගැනීමටත් අවස්ථාව ලැබෙනවා. මෙය, මෙරටෙහි සුළු ව්‍යාපාරික ප්‍රජාවටද සහනයක් වනු ඇතැයි අපි බලාපොරොත්තු වනවා. එබැවින් 1988 අංක 72 දරන සමථ මණ්ඩල පනතේ 7. (1) (අ) වගන්තිය යටතේ දැක්වෙන චංචල හෝ නිශ්චල දේපළක් හෝ ණයක්, අලාභයක් හෝ ඉල්ලීමක් සම්බන්ධයෙන් වන ආරවුලක් සමථ මණ්ඩලයට අනිවාර්යයෙන්ම යොමු කළ යුතු අරමුදලේ වටිනාකම වන රුපියල් 25,000 සීමාව රුපියල් 2,50,000 දක්වා වැඩි කිරීමට අපි යෝජනා කරනවා.

ඒ වාගේම අපි තවත් සංශෝධනයක් ඉදිරිපත් කරනවා. එනම් ඒ වගන්තියේ සඳහන් වන අනිකුත් දේවල්වලට අමතරව දණ්ඩ නීති සංග්‍රහයේ 367 හෝ 368 ආ වගන්තිය යටතේ සිදු කරන ලද වරදක් නම්, ඒ වරද, වටිනාකම රුපියල් පන්දහස නොඉක්මවන යම් දේපළක් සම්බන්ධයෙන්, වයස අවුරුදු දහඅටට අඩු තැනැත්තකු විසින් කර තිබෙන අපරාධයක් නම් ඒකත් අපි සමථ මණ්ඩලවලට යොමු කළ යුතුයි කියලා යෝජනා කරනවා. අපි ඉදිරිපත් කර තිබෙන කෙටුම්පතේ මුද්‍රිත දෝෂයක් නිසා එය රුපියල් පනස්දහස කියා සඳහන් වෙලා තිබෙනවා. තුන්වන වර කියවීමේදී ඒ රුපියල් පනස්දහස කියන එක රුපියල් පන්දහස හැටියට සංශෝධනය කරන්න බලාපොරොත්තු වනවා.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
[மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
Is it “Rupees five thousand”?

**ගරු රවුෆ් හකීම් මහතා**
[மாண்புமிகு றவுப் ஹக்கீம்)
(The Hon. Rauff Hakeem)
That is in English but in the Sinhala one it has been mentioned as “රුපියල් පනස්දහස”.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
[மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
No, it says, “…..the value of which does not exceed rupees five”

**ගරු රවුෆ් හකීම් මහතා**
[மாண்புமிகு றவுப் ஹக்கீம்)
(The Hon. Rauff Hakeem)
“Rupees five”? - [*Interruption*.] That is a very serious one. Anyway, all of these will be amended because we have looked at them.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
[மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
So, what will be the amount?

**ගරු රවුෆ් හකීම් මහතා**
[மாண்புமிகு றவுப் ஹக்கீம்)
(The Hon. Rauff Hakeem)
It is Rupees 5,000. Rupees 5,000 is the amount but there have been a printing mistakes in both the Sinhala and English copies. So, I will try to correct them during the Committee Stage.

Mr. Deputy Chairman of Committees, in this country’s history of dispute resolution, we have recourse to courts for cases. Then, we have the arbitration proceedings and we have also introduced the procedure of going before the Mediation Boards. This was introduced in 1988 but it came into operation somewhere in 1999. When I started this Debate, I explained in Sinhala that we have a history of almost 20 years of experience in the Mediation Board system. In 2009, two years ago, almost 124,000 cases had gone before the

Mediation Boards and a recent survey has indicated that almost 60 per cent of the cases that go before the Mediation Boards get resolved. Therefore, this is a very good system.

This morning, in my Ministry, the officials of the British High Commission and the officials of the Asia Foundation were present in having prepared a trainers' manual and a trainee manual for the Members of the Mediation Board and they have been presented to us. It was done after a careful study of the functioning of the Mediation Boards in this country and I would dare say that the Mediation Board system is a success story of our nation. For the last 20 years, when you look at the way in which we have functioned and the amount of cases that have gone before them, the surveys also indicate the satisfactory levels, and the users of the Mediation Board process have also indicated to us the success levels and you can see that this is indeed a success story in our country.

**ගරු විජයදාස රාජපක්ෂ මහතා**
[மாண்புமிகு விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. Wijeyadasa Rajapakshe)

Hon. Minister, the system of Conciliation Boards which prevailed in 1950s had been abolished and it was reintroduced in 1988.

**ගරු රවුෆ් හකීම් මහතා**
[மாண்புமிகு றவுப் ஹகீம்)
(The Hon. Rauff Hakeem)

Thank you, very much. In fact, this replaced that. The President’s Counsel, my Colleague, the Hon. Wijeyadasa Rajapakshe reminded me about the Conciliation Boards. As you know, this came into being after the Conciliation Boards were done away with. Now, we find that our system has been taken as a model for countries like China, Nepal and they have begun to study the system of Mediation Boards in our country and have decided to adopt our model to try and introduce this alternate dispute resolution mechanism. This is a new discipline in many universities as well. Dispute resolution and meditation has become a very specialized field of study and having looked at the functioning of our Mediation Boards, the Ministry decided to engage the Asia Foundation under the auspices of the British High Commission to prepare a trainers' manual as well as a trainee manual and we would use that in order to train both the officials of the Mediation Board as well as our trainers. In fact, we conduct a five-day training programme for mediators the moment the Members of the Mediation Board are selected. The selection process is done after a Gazette Notification. There again, we find that there are certain recommendations that have been made to improve the system further, and maybe during the course of the year they will be implemented.

This morning I met the former Supreme Court Judge, Hector Yapa, the Chairman of the Mediation Boards Commission.

In fact, we discussed this matter in the morning when these manuals were presented. I told him our Ministry will take steps to introduce further amendments to improve the standard quality and service delivery of the Mediation Boards in this country, and hopefully towards the latter part of the year, having discussed this matter with the necessary stakeholders, I would like to introduce further amendments. In the meantime, we have also recognized certain shortcomings in diversity among mediators and mediator trainers. We have responded with plans to overcome these challenges. These plans have not been rigorously applied as yet while the Ministry of Justice has clearly recognized gender and ethnic diversity as important issues. There is also a need to consider diversity in terms of expertise and profession among the mediators as well as engaging youth in this programme.

As a matter of fact, we are also now looking at the possibility of introducing the Mediation Board mechanism into our university systems. As you see, we find many disputes arising within the universities. Therefore, the young and radical university population in our country often get on to the streets for protesting about various administrative problems. We would like to see whether we could try and introduce this system within the university area so that this could be an alternate dispute resolution mechanism that could bring some relief in those areas.

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
[குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)

Order, please! Hon. Member, your have only two more minutes.

**ගරු රවුෆ් හකීම් මහතා**
[மாண்புமிகு றவுப் ஹகீம்)
(The Hon. Rauff Hakeem)

I know I have to wind up. Please give me one or two minutes just to say a few words in Tamil as well, Hon. Deputy Chairman of Committees because what I am going to say is relevant to your area, the Northern Province.

இந்த மத்தியஸ்த சபைகள் (திருத்தம்) சட்டமூலத்தினூடாக எதைச் செய்யவிருக்கின்றோம் என்பது சம்பந்தமாக நான் சொல்லிவந்தேன். குறிப்பாக, யுத்தம் நடைபெற்ற காலத்திலே வட மாகாணத்தின் பல இடங்களில் இந்த மத்தியஸ்த சபைகளை உருவாக்குகின்ற சந்தர்ப்பம் வாய்க்கவில்லை. இப்பொழுது ஒரு வர்த்தமானி அறிவித்தல் வெளியிடப்பட்டிருக்கின்றது. முழு வன்னிப் பெருநிலப் பரப்பிலும் இருக்கின்ற எல்லாப் பிரதேச செயலக எல்லைகளுக்குள்ளும் மத்தியஸ்த சபைகளை அமைப்பதற்கான ஆரம்பவேலைகளை நாங்கள் மேற்கொண்டிருக் கின்றோம். அதன்படி வன்னிப் பிரதேசத்திலிருந்து விண்ணப் பங்கள் கோரப்பட்டிருக்கின்றன. அந்த விண்ணப்பங்களைப் பொறுத்து, பொருத்தமானவர்களை மத்தியஸ்த சபைகளுக்கு நியமிப்பதன்மூலம் அவற்றின் செயற்பாடுகளை நாங்கள் நாடு தழுவியரீதியில் விஸ்தரிப்பதற்குத் தயாராகிக்கொண்டிருக் கின்றோம். இந்த நாட்டிலே நீதி, நிருவாக சேவைக்கு வெளியிலே பிணக்குகளை தீர்த்துக்கொள்வதற்கான ஒரு மாற்றுவழியாக இவ் வாறான செயற்றிட்டத்தினை அறிமுகப்படுத்தியிருக்கின்றோம்.

[ගරු රවුෆ් හකීම් මහතා]

இதனுடைய கடந்த 20 வருடகாலச் செயற்பாடுகளை அவதானிக்கின்றபோது, இந்த நாட்டிலே அமுல்படுத்தப்பட்டிருக்கின்ற நல்ல, வெற்றிகரமான ஒரு நடைமுறையாக இதை நாங்கள் காண்கின்றோம். குறிப்பாக, மத்தியஸ்த சபைகளுக்கு முன்னால் கொண்டுவரப்படுகின்ற பிணக்குகளில் ஏறத்தாழ 60 சதவீதமான பிணக்குகள் தீர்த்துவைக்கப்படுகின்றன. அத்தோடு, பிணக்குகளைத் தீர்த்துக்கொள்வதற்காக வருகின்ற பொதுமக்களுக்கு எந்தவிதச் செலவுமில்லாமல் தங்களுடைய பிணக்குகளைத் தீர்த்துக்கொள்ளக்கூடிய வழிவகை இதன்மூலம் செய்யப்பட்டிருக்கின்றது. அதுமட்டுமல்லாமல், சமூகத்திலே தராதரமுள்ளவர்கள் சுயேச்சையாக - சுய விருப்பத்தின்பேரில் - முன்வந்து எந்தவிதக் கொடுப்பனவுகளும் இன்றி இந்த மத்தியஸ்த சபைகளின் உறுப்பினர்களாக இருந்து சிறப்பான பணியினை ஆற்றிக் கொண்டிருக்கின்றார்கள். இந்த வருட நடுப்பகுதிக்குள் 7,000க்கும் மேற்பட்ட உறுப்பினர்கள் நாடு முழுவதிலும் செயற்படுகின்ற ஒரு வலைப்பின்னலாக இந்த மத்தியஸ்த சபைகளின் வலைப்பின்னல் அமையப்போகின்றது என்ற நல்ல செய்தியையும் சொல்லிக்கொள்ள விரும்புகின்றேன்.

வடக்கு தவிர்ந்த இன்னுமொரு குறிப்பிட்ட பிரதேசம் கோரளைப்பற்று மத்திய பிரதேசமாகும். கோரளைப்பற்று மத்தி, வாழைச்சேனைப் பிரதேசத்திலே அமைந்திருக்கின்ற பிரதேச செயலக எல்லைக்குள்ளும் மத்தியஸ்த சபைகளை நாங்கள் இன்னும் அமைக்கவில்லை. அண்மையிலே பிரகடனப்படுத்தப்பட்ட அந்தப் பிரதேச சபை எல்லைக்குள்ளும் ஒரு மத்தியஸ்த சபையை அமைப்பதற்கு வர்த்தமானி அறிவித்தலைக் கொடுத்திருக்கின்றோம் என்பதையும் நான் சொல்லிக்கொள்ள விரும்புகின்றேன். இந்தச் சட்டத் திருத்தத்தின்மூலம் 2,50,000 ரூபா வரையிலான பெறுமானமுள்ள சிவில் பிணக்குகளை மத்தியஸ்த சபைகளுக்கு முன்னால் கொண்டுவர முடியும். எனவே, இனிமேல் நீதிமன்றங்களுக்குப் போகின்ற வழக்குகள் குறைவடைந்து, மத்தியஸ்த சபைகளின்மூலம் அவற்றைத் தீர்க்கக்கூடிய வழிவகை செய்யப்படுகின்றது. இதன்மூலம் பொது மக்களுக்குத் தேவையற்ற செலவினங்கள் இல்லாமல் தங்களுடைய தகராறுகளை, பிணக்குகளைத் தீர்த்துக்கொள்ளும் வாய்ப்பு ஏற்படுமென்பதை நாங்கள் பெருமையோடு சொல்லிக்கொள்ள விரும்புகின்றோம்.

அதனோடு உள்ளிட்டதாக இன்னுமொரு திருத்தத்தையும் முன்மொழிந்திருக்கிறேன். அதாவது தண்டனைச் சட்டக்கோவையில் குறிப்பிட்ட பகுதியின்கீழ் வருகின்ற, 18 வயதுக்குக் குறைந்தோர் சிறு திருட்டுக்களில் ஈடுபடுகின்றபோது அந்தத் திருட்டுப் பொருளின் பெறுமானம் 5,000 ரூபாவுக்குக் குறைவாக இருந்தால், அவ்வாறான வழக்கையும் மத்தியஸ்த சபைக்கு முன்னால் கொண்டுவரக்கூடியதாக அந்தத் திருத்தம் அமைந்திருக்கிறது. இவ்வாறான சட்டத் திருத்தங்களின்மூலம் இந்த நாட்டிலே நீதிமன்றங்களிலே தேங்கிக்கிடக்கின்ற வழக்குகளை விரைவிலே முடிவுக்குக் கொண்டுவர வேண்டிய அவசியம் நிவர்த்திக்கப்படுகின்றது என்பதை நாங்கள் இங்கே சொல்லியாக வேண்டும். எனவே, இந்தச் சட்டத் திருத்தங்களை இந்தச் சபை ஏற்றுக்கொள்ள வேண்டும் என்று முன்மொழிந்து, நான் என்னுடைய உரையை நிறைவுசெய்கின்றேன். நன்றி.

[අ. භා. 3.49]

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අද ඉතාම වැදගත් පනත් කෙටුම්පත් දෙකක් සංශෝධන සහිතව ඉදිරිපත් කර තිබෙනවා. අලුතින් වැඩ පටන් ගත් අලුත් ඇමති මණ්ඩලයක් යටතේ, මා හිතන්නේ ඉතාම වැදගත් ඇමතිවරු දෙදෙනෙක් යටතේ එම කාරණා සම්බන්ධව කථා කරන කොට, මූලික වශයෙන් 2000 අංක 09 දරන වැඩිහිටි තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පත සම්බන්ධව මා කථා කරන්නට කැමැතියි.

විශේෂයෙන් අපි දන්නවා අද මේ සංශෝධන පනත් කෙටුම්පත තුළ විශාල වෙනස්කම් ගණනාවක්, වැදගත් වෙනස්කම් ගණනාවක් සිදු වෙලා තිබෙනවාය කියා. පූර්ණ කාලීන සභාපතිවරයෙක් පත් කරලා, ඒ වාගේම ජාතික මහ ලේකම් කාර්යාලයේ අධ්‍යක්ෂවරයා මෙහි ලේකම්වරයා බවට පත් කරලා, එතැනින් පස්සේ සෑම වැඩිහිටියෙකුම ආරක්ෂා කර ගන්න අවශ්‍ය කරන වැඩිහිටි නිවාස ලියාපදිංචිය අනිවාර්ය කිරීම වාගේ කාරණා ගණනාවක් තුළ ලංකාවේ වැඩිහිටියන් සම්බන්ධව යම් කිසි දත්ත ඒක රාශි කිරීමේ සහ ඔවුන් සම්බන්ධව ක්‍රියා කිරීමේ වැඩ පිළිවෙළකට ආණ්ඩුව ගමන් කරමින් ඉන්නවා. මේක ඉතාම වටිනා කාර්ය භාරයක් විධියට මම දකිනවා. පාර්ලිමේන්තුව තුළ ගෙන ආපු වැදගත් වෙනස්කමක් විධියට විශේෂයෙන් මම මේක දකිනවා. මේ කාරණය සම්බන්ධව ආණ්ඩුව ක්‍රියා කරන්න අවශ්‍ය කරන කාරණා ටික ගැන ඔවුන් හිතලා තිබෙනවා. විශේෂයෙන් පාර්ලිමේන්තුවේ පවා දේශපාලනයේ දී ආණ්ඩුව විසින්ම ජ්‍යෙෂ්ඨ අමාත්‍යවරුන් පත් කරලා, ඔවුන් සම්බන්ධ විශේෂ රැක බලා ගැනීමේ ක්‍රියාදාමයක් ආරම්භ කරන්න අවශ්‍ය කටයුතු ටිකක් ලැහැස්ති කර තිබෙන වෙලාවක තමයි, රටේ වැඩිහිටියන් සම්බන්ධවත් ක්‍රියා කරන්න ඔවුන් කටයුතු කරලා තිබෙන්නේ. අපේ රටේ සමහර ජ්‍යෙෂ්ඨයන්ට සාමාන්‍යයෙන් විශ්‍රාම කාලයක් ලබා දී තිබෙනවා. ඒ කියන්නේ අවුරුදු 60, 65 දක්වා ඔවුන්ට ක්‍රියා කරන්න පුළුවන් කාලයක්. හැබැයි දේශපාලනයේ දී අපි වයස්ගතභාවය ඒ තරම් තීරණය කරන්නේ නැහැ. ගරු ඇමතිතුමාම කිව්වා වාගේ ඉන්දියාවේ නම් වයස යන්න යන්න තමයි ඔවුන්ට තිබෙන පරිණතභාවයෙන් ප්‍රයෝජන ගන්නේ. ඒ වාගේම ඔබතුමා කිව්වා වාගේ සංගීතයේදීත්, ඔබතුමා වාගේම ඉන්දියාවේ වයස්ගත අයට විශාල කාර්ය භාරයක් දී තිබෙනවා. නමුත් අපේ රටේ වයස්ගත අයව, වයස්ගත ඇමතිවරුන්ව කිසිම චක්‍රලේඛයකින් තොරව විශ්‍රාම යැවීමට ආණ්ඩුව තීරණය කර තිබෙනවා. ඒක ජනාධිපතිතුමා ඒකමතිකව තීරණය කරලා වැඩිහිටි ලේකම් කාර්යාලයකුත් ස්ථාපිත කර තිබෙනවා. වයස්ගත වූවන් සම්බන්ධ පනත් කෙටුම්පත ගෙන එන්න කලින් වෙනම කාර්යාලයක් ස්ථාපිත කරලා නීති ක්‍රියාදාමයන් ගෙන එන්නේ නැතිව ජනාධිපතිතුමා තනිවම තීරණය කර තිබෙනවා ඒ අය විශ්‍රාම යා යුතුයි කියා. ඒ නිසා අසාධාරණයට ලක් වන අයත් සිටිනවා. අපි හිතනවා විශේෂයෙන් මේ පනත් කෙටුම්පත තුළින් බැරි නම් ඔබතුමන්ලාගේ කැබිනට් මණ්ඩලය තුළ හෝ සාකච්ඡා කරලා ඒ සම්බන්ධව යම් කිසි ක්‍රියා මාර්ගයක් ගනීවි කියා. මොකද, මේ රට යුද්ධයෙන් බේරා ගත් නායකයා විධියට අපේ ජෙනරල් සරත් ෆොන්සේකා මැතිතුමා විශ්‍රාම ගන්වලා අද අඩි දහයයි දාහතරේ කාමරයකට යවලා තිබෙනවා. වැලිකඩ බන්ධනාගාරයේ අඩි දහයයි දාහතරේ කාමරයකට යවා තිබෙනවා. යුද වීරයා, ඒ වාගේම රට බේරා ගත් නායකයා බලෙන් විශ්‍රාම යවලා අඩි දහයයි දාහතරේ කාමරයකට යවා තිබෙනවා. නමුත් මේ ජ්‍යෙෂ්ඨ ඇමතිවරුන්ට ඊට වඩා ලොකු මහල් නිවාසයක් හදලා, ඒක "විශ්‍රාම පාය" කියා නම් කරලා, සරත් ෆොන්සේකා මහත්මයාට සලකනවාට වඩා හොඳ විධියට සලකලා තිබෙනවා. මම හිතනවා ඒකත් වැදගත් කියා.

මම දැන් අදාළ කාරණයට එන්නම්. [බාධා කිරීමක්] නැහැ, ඒක මට වැදගත් නැහැ. මම කියන්න කැමැතියි අද ඇති වෙලා තිබෙන තත්ත්වයත් එක්ක - [බාධා කිරීමක්] අපි දැන් අදාළ කාරණයට යමු. මොකද, මේ වාගේ පනත් කෙටුම්පතක් ගෙන එන්න තරම් -

**ගරු ෆීලික්ස් පෙරේරා මහතා**
(மாண்புமிகு பீலிக்ஸ் பெரேரா)
(The Hon. Felix Perera)

ඒ කාලයේ තරුණයකු වශයෙන් ඒ කාමරයේ මමත් සිටියා, Naxalite - [බාධා කිරීම්]

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

ආ! Naxalite. ඒ තරුණ කාලයේ කරපු - [බාධා කිරීම්] ෆීලික්ස් පෙරේරා මැතිතුමාට ඇත්තටම අපි ගරු කරනවා. එතුමා තරුණ කාලයේ මේ රටේ ප්‍රජාතන්ත්‍රවාදය වෙනුවෙන්, මානව හිමිකම් වෙනුවෙන් අරගල කරන්න ගිහින්, Naxalite චෝදනා ලබා තමයි එතැනට ගියේ. මා එතුමාට කියනවා, අද ප්‍රජාතන්ත්‍රවාදය වෙනුවෙන්, වැරදි වෙනුවෙන් නැඟිටියොත් එතුමාටත් අඩි 10 X 14 කාමරයක් තමයි ඉතුරු වන්නේ කියලා.

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)

Order, please! Will an Hon. Member propose the Hon. Alhaj A.H.M. Azwer to take the Chair?

**ගරු ෆීලික්ස් පෙරේරා මහතා**
(மாண்புமிகு பீலிக்ஸ் பெரேரா)
(The Hon. Felix Perera)

I propose that the Hon. Alhaj A.H.M. Azwer do now take the Chair.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව නියෝජ්‍ය කාරක සභාපතිතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා මූලාසනාරූඪ විය.***

*அதன் பிறகு, குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர் அவர்கள் தலைமை வகித்தார்கள்.*

*Whereupon* MR. DEPUTY CHAIRMAN OF COMMITTEES *left the Chair, and* THE HON. ALHAJ A.H.M. AZWER *took the Chair.*

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

මා කියන්න කැමැතියි, අද ඇති වෙලා තිබෙන තත්ත්වයත් එක්ක බැලුවාම විශේෂයෙන් සංවර්ධිත රටවලට වඩා සංවර්ධනය වෙමින් පවතින රටවල්වල, විශේෂයෙන් ආසියාවේ රටවල්වල වයස්ගත ජන සංඛ්‍යාව විශාල වශයෙන් වැඩි වීමේ මහා දැවැන්ත අර්බුදයක් තිබෙනවාය කියන එක. ඒ ගැන ඔබතුමා දැනුවත්ව ඉන්නවාය කියා මා විශ්වාස කරනවා. අනික් රටවල්වල වයස්ගත ජන සංඛ්‍යාවේ ප්‍රතිශතය ගත්තාම, බංග්ලාදේශයේ සියයට 4.9යි; භූතානයේ සියයට 6.5යි; ඉන්දියාවේ සියයට 7.6යි; නේපාලයේ සියයට 5.8යි. ශ්‍රී ලංකාවේ වයස්ගත ජන සංඛ්‍යාවේ සියයට 9.8ක් දක්වා දැවැන්ත වර්ධනයක් ඇති වී තිබෙනවාය කියලා මේ සංඛ්‍යා ලේඛනවලින් බොහොම පැහැදිලිව පෙන්නුම් කරන්න පුළුවන්. ඒ වාගේම මධ්‍යස්ථ වයසේ පසු වන අයගේ ප්‍රමාණය දවසින් දවස අඩු වෙමින්, වයස්ගත ප්‍රමාණය දවසින් දවස වැඩි වෙමින් තිබෙන තත්ත්වයක් තමයි අපට දකින්න තිබෙන්නේ. මා හිතන විධියට විශේෂයෙන්ම අපේ රටේ තිබෙන සෞඛ්‍ය තත්ත්වයන් හොඳ වීම නිසා අපේ ජනතාවගේ ආයු කාලය වර්ධනය වෙලා තිබෙනවා. ඒ නිසා ආයු කාලයේ වර්ධනයත් එක්ක තරුණ අයට වැඩිය, ළමා අනුපාතයට වැඩිය වයස්ගත ප්‍රමාණය දවස ගණනේ වර්ධනය වෙමින් තිබෙන තත්ත්වයකුයි පවතින්නේ. රටක් විධියට අපට ඒක මහා බරක්. එය බරක් වෙලා තිබෙන්නේ වෙන හේතුවක් නිසා නොවෙයි, ඔවුන්ගෙන් ගන්නට තිබෙන ප්‍රයෝජනය නිසි පරිදි ගන්නවාද කියන ප්‍රශ්නය මතු වී තිබෙන නිසායි. උදාහරණයක් ගනිමු. අපි දන්නවා රාජ්‍ය අංශයේ සේවකයන්ගෙන් සියයට විශාල ප්‍රමාණයක් අවුරුදු 55න්, 60න් විශ්‍රාම යන බව. අවුරුදු 60න් විශ්‍රාම ගියත් ඔවුන් අතරින් ඇත්තටම දක්ෂ අයත් ඉන්නවා, නැවත රාජ්‍ය අංශයේ සේවය කරන. හැබැයි විශ්‍රාම ගිය අය එසේ රාජ්‍ය අංශයේ සේවය කිරීම සම්බන්ධයෙනුත් අප දකින ගැටලුවක් තිබෙනවා. මා එය වෙන කාරණයක් විධියට අර ගෙනයි කියන්නේ. රාජ්‍ය අංශයේ සේවකයන්ගෙන් දක්ෂතාව තිබෙන අය කොයි තරම් ප්‍රමාණයක් විශ්‍රාම ගියත් ආණ්ඩුවට වුවමනා අය තමයි, එහෙම නැත්නම් ආණ්ඩුව සනසන අය තමයි සේවයෙහි යොදවා ගන්නේ. පරිපාලන නිලධාරීන් අතර වුණත්, වෙනත් අය අතර වුණත් සිටින දක්ෂයන්ගෙන් නොවෙයි අවුරුදු 60 පැන්නාට පස්සේ ප්‍රයෝජන ගන්නේ. එසේ ප්‍රයෝජන ගන්නේ ආණ්ඩුවට වුවමනා, ආණ්ඩුවත් එක්ක ඇයි හොඳයිකම් පවත්වන අයගෙන් වීම නිසා දැවැන්ත ප්‍රශ්නයක් ඇති වෙලා තිබෙනවා. අවුරුදු 65ට එහා ගිය විශ්‍රාමිකයන්ගෙන් ප්‍රයෝජනයක් ගත හැකි වුවත් ඔවුන්ගෙන් නිවැරදි විධියට ප්‍රයෝජන ගන්නා වැඩ පිළිවෙළකට, ඔවුන්ගේ දක්ෂතාව අනුව ප්‍රයෝජන ගන්නා වැඩ පිළිවෙළකට නොව දේශපාලන වුවමනා එපාකම් මත ඔවුන්ව තබා ගැනීමේ වැඩ පිළිවෙළකට තමයි ආණ්ඩුව තල්ලු වෙලා තිබෙන්නේ. ඒක ලොකු වැරැද්දක් විධියට අපි දකිනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා මෙතැනදී කියන්න කැමැතියි අවුරුදු 60 ඉක්ම වූවන්ගේ වර්ධනය හා වියපත් වූවන් මුළු ජනගහනයේ ප්‍රතිශතයක් විධියට දවස ගණනේ වැඩි වීමේ තත්ත්වයක් තමයි අපට දකින්නට තිබෙන්නේ කියන කාරණය. 2001 දී ඒ ප්‍රමාණය වශයෙන් තිබුණේ 19,07,000ක් විතර ප්‍රමාණයක්. 2011 හෙවත් මේ අවුරුද්ද වන කොට ඒක 27,42,000ක් දක්වා වර්ධනය වෙලා තිබෙනවා. 2031 වන කොට ඒක ලක්ෂ 50 ඉක්මවපු තත්ත්වයක් දක්වා වර්ධනය වෙලා තිබෙනවා. ඇත්තටම මුළු ජන ගහනයෙන් සියයට 21.9ක් 2031 දී වයස්ගත පුද්ගලයන්ගේ කාණ්ඩයට වැටෙන තත්ත්වයකට පත් වෙලා තිබෙනවා. ඒ විතරක් නොවෙයි. හැම අවුරුද්දකම ඒ ගොල්ලන්ගේ සියයට 2.4ක වර්ධන අනුපාතයක් අපට දකින්නට ලැබෙනවා. මේක දැවැන්ත ප්‍රශ්නයක්. 2011 දී මුළු ජනගහන වර්ධනය සියයට 0.93ක් වෙද්දී 2031 වන කොට ඒක 0.35කට අඩු වනවා. නමුත් වැඩිහිටියන්ගේ වර්ධනය සියයට 2.4 දක්වා වැඩි වනවා. 2011 දී සියයට 13.1ක් වන අවුරුදු 60 ඉක්ම වූවන්ගේ ප්‍රතිශතයෙහි 2031 දී සියයට 21.9 දක්වා වූ දැවැන්ත වර්ධනයක් සිද්ධ වෙමින් තිබෙන තත්ත්වයක් තමයි දකින්නට තිබෙන්නේ.

**ගරු ෆීලික්ස් පෙරේරා මහතා**
(மாண்புமிகு பீலிக்ஸ் பெரேரா )
(The Hon. Felix Perera )

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට මතකයි නේ ඉස්සර "පුංචි පවුල රත්තරං" කියලා උප්පත්ති පාලනයක් කළා? ඒ නිසා තමයි මේ කාර්යය සිද්ධ වෙමින් යන්නේ.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

ඒක තමයි. මා මෙහිදී අදහස් කරන්නේ මේකයි. ආණ්ඩුවලින් එක එක කාල වකවානුවල සිද්ධ වුණු ක්‍රියාකාරකම් උඩ තමයි දැන් මෙහෙම වෙලා තිබෙන්නේ. විශේෂයෙන්ම ස්වාමිපුරුෂයන් හමුදා සේවයේ යෙදී සිටියදී මිය යෑම නිසා වැන්දඹු වූ කාන්තාවන්ට තුන්වන දරුවා ඉපදවීම සඳහා අවශ්‍ය කරන සහයෝගය මේ අය වැයෙන් පවා දීලා තිබෙනවා. මා දන්නේ නැහැ කොහොමද ඒ තුන්වන දරුවා හම්බ වන්නේ කියලා. නමුත් මිය ගිය හමුදා සෙබළුන්ගේ වැන්දඹුවන් ගැන හිතපු සිතිවිල්ල

[ගරු දයාසිරි ජයසේකර මහතා]

ලංකාවේ සාමාන්‍ය කාන්තාවන් සම්බන්ධයෙන් හිතනවා නම් ඔබතුමාගේ ප්‍රශ්නයට පිළිතුරක් ලැබෙනවාය කියලා මා හිතනවා ගරු ඇමතිතුමනි. මොකද තුන් දෙනෙක් ඉක්මවා දරුවන් ලබන කාන්තාවන්ට ඒ වාගේ සහනයක් දුන්නා නම් ඒක මීට වඩා හොඳයි කියලායි මා විශ්වාස කරන්නේ. හමුදාවට සැලකීම් කරන්න ගිහිල්ලා අවසානයේදී කරපු දෙයෙහි ප්‍රතිඵලයක් නැති තත්ත්වයකට, අර හිල් කුඩෙන් වතුර ඇද්දා වාගේ තත්ත්වයකට තමයි අද පත් වෙලා තිබෙන්නේ. අද ජනගහනයේ ආයු අපේක්ෂාව ගත්තාම දවසින් දවස ප්‍රජා විද්‍යාත්මකව සිදු වන වෙනස්වීම්වලට ගැළපෙන ආර්ථික, සමාජයීය තත්ත්වයන්වල වර්ධනයත් එක්ක -

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
හොඳයි නේද?

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
හොඳයි, වර්ධනය වනවා. 1980 වර්ෂය වන කොට මුළු ජනගහනයෙන් සියයට 6ක ප්‍රමාණයේ තිබුණු වයස්ගත ජනගහනයේ ප්‍රතිශතය මේ වර්ෂය වන විට සියයට 13 දක්වා වර්ධනය වෙලා තිබෙනවා. වසර 10ක් ඇතුළත සියයට 18ක් දක්වාත්, ඒ වාගේම 2025 දී ලංකාවේ සමස්ත ජනගහනයෙන් සියයට 25ක් මේ වර්ධනීය අවස්ථාවන්වලට, ඒ කියන්නේ අවුරුදු 60ට වඩා වැඩි තත්ත්වයට පත් වන්න තිබෙන ඉඩකඩ වැඩියි. ඒ කියන්නේ වර්ෂ 2025 විතර වන විට සමස්ත ජනගහනයෙන් සියයට 25ක පමණ පිරිසක් -අවුරුදු 60ට වැඩි වැඩිහිටියන් පිරිසක් - පාලනය කරන්න සිද්ධ වන තැනකට ලංකාවේ තත්ත්වය පත් වෙමින් තිබෙනවා කියන එකයි.

ඒ අනුව රැකවරණය, සෞඛ්‍ය අවශ්‍යතා, ප්‍රවාහන අවශ්‍යතා සපුරා ගැනීම ආදී යැපුම් තත්ත්වයන්ගේත් විශාල වර්ධනයක් සිද්ධ වනවා. ඒ වෙනත් හේතුවක් නිසා නොවෙයි. මේ වැඩිහිටියන් කොච්චර පිරිසක් සාමාන්‍ය පුද්ගලයන් විසින් බලා ගන්න ඕනෑද කියන කාරණය ගත්තොත්, 2011 සියයට 20.4ක් වන වැඩිහිටි යැපුම් අනුපාතය 2031 වන විට සියයට 36 දක්වා වැඩි වන නිසා. සියයට 35.6ක්ව තිබුණ ළමා යැපුම් අනුපාතය සියයට 28.4 දක්වා අඩු වන නිසා. එතකොට සිද්ධ වන්නේ ළමයින් බලා ගැනීමේ කාර්ය භාරය ඇති පවුලක ඒ වගකීම වැඩිහිටියන් බලා ගැනීමේ කාර්ය භාරයක් බවට පත් වීමයි. එතකොට ඇත්ත වශයෙන් මහා දැවැන්ත සමාජයීය ප්‍රශ්නයක් ඇති වනවා. ඒ පවුලට ඒ අය නඩත්තු කර ගත නොහැකි තත්ත්වයක් නිර්මාණය වෙනවා. උදාහරණයක් විධියට කිව්වොත් වැඩිහිටියන්ගේ සංඛ්‍යාව වැඩි වන්න, වැඩි වන්න කුඩා ළමයකුට වුවමනා ප්‍රමාණයට වඩා වැඩි මුදල් සංඛ්‍යාවක්, වැඩි කාල වේලාවක්, වැඩි සම්පත් ප්‍රමාණයක් අපේ රටේ සාමාන්‍ය පවුල්වලට දරන්න සිද්ධ වන තත්ත්වයක් තමයි ඇති වන්නේ.

ඒ වාගේම අද අපි දන්නවා ලංකාවේ ජනගහනයෙන් සියයට 53ක් ඉන්නේ කාන්තාවන් බව. සියයට 53ක් වන කාන්තාවන්ගෙන් සියයට70කට වැඩි ප්‍රමාණයක් පිරිමින්ට වඩා වයස්ගත කාන්තාවන් බවට පත් වෙලා තිබෙනවා. ඒකට හේතුව පිරිමින්ගේ ආයු කාලයට වඩා වැඩි ආයු කාලයක් කාන්තාවන්ට තිබෙන නිසායි. එම නිසා විශේෂයෙන් ස්ත්‍රී- පුරුෂභාවය සම්බන්ධයෙන් - gender-wise - සලකා බැලුවත් වැඩිහිටි මහ ලේකම් කාර්යාලය තුළින් වැඩි ආවරණයක්, වැඩි සමාජ ආරක්ෂණයක් ලබා දෙන්න වෙන්නේ කාන්තාවන් වෙනුවෙන් කියලා මම කියන්න කැමැතියි. මේ පනත් කෙටුම්පත තුළිනුත් අපට ඒක කරන්න සිද්ධ වනවා.

ඒ වාගේම අනෙක් පැත්තෙන් වැන්දඹු ස්ත්‍රී-පුරුෂභාවය ගත්තොත්, 1994 දී සිදු කරන ලද විද්‍යාත්මක ප්‍රජා සමීක්ෂණයකට අනුව අවුරුදු 75 ඉක්මවූ වැන්දඹු පුරුෂයන්ගේ ප්‍රතිශතය සියයට 18ක් වන විට ස්ත්‍රීන් සම්බන්ධව එම ප්‍රතිශතය සියයට 55.5ක් වනවා. වැන්දඹුවන් සම්බන්ධව කථා කරන විට එය ඉතාම වැදගත් කාරණයක් බවට පත් වනවා. පිරිමි සියයට 18ක් වන විට ස්ත්‍රීන් සියයට 55.5ක් බව අපි මේකෙන් හඳුනා ගෙන තිබෙනවා. ඒ අනුව අද මේ පනත් කෙටුම්පතේ වැදගත්කම කොච්චර ද කියලා ගරු ඇමතිතුමා විශේෂයෙන් කල්පනා කරලා තිබෙනවා.

ආණ්ඩුවක් විධියට මේ කාලෝචිත පනත් කෙටුම්පත ගෙනැවිත් වැඩිහිටියන් සම්බන්ධව ස්ථිරසාර වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරන්නට අවශ්‍ය කටයුතු කිරීම ගැන මම ස්තුතිවන්ත වනවා. මොන ආණ්ඩුවක්ද තිබෙන්නේ කියන එක නොවෙයි වැදගත් වන්නේ. මේ ඡන්ද කාලයේ මගේ මේ ප්‍රකාශය අර ගෙන දයාසිරි ජයසේකර ආණ්ඩුවට ස්තුති කළා කියලා ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාවෙන් ප්‍රචාරය කරන්න එපා. මේක ආණ්ඩුව ගෙනාපු හොඳ පනත් කෙටුම්පතක් විධියට අප දකිනවා. ඒ කාරණය විශේෂයෙන් මෙහිදී මම මතක් කරන්න කැමැතියි.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඒක මමත් අනුමත කරනවා.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
බොහොම ස්තුතියි.

ඒ වාගේම අනෙක් කාරණය තමයි, වයස්ගත ජනතාව බලා ගැනීමට ඉන්න මැදි වයසේ අයගේ ප්‍රමාණය. තමන්ගේ අම්මා තාත්තා අවුරුදු 60 ඉක්මවලා ගිහිල්ලා තිබෙනවා කියලා අපි හිතමු. එතකොට ඒ අම්මායි තාත්තායි බලා ගන්න ඒ පුතාලාට, දුවලාට සිද්ධ වනවා. එහි ප්‍රතිශතය ගත්තොත්, 2001 දී මැදි වයසේ අයගේ ප්‍රමාණය සියයට 28.8යි. 2001 ඔවුන්ට බලා ගන්නට තිබෙන අවුරුදු 15-60 අතර ජනගහනය සියයට 48.8යි. 2011 වන විට මැදි වයසේ ජනගහනය සියයට 32.5යි. අවුරුදු 15-60ත් අතර ජනගහනය සියයට 46යි. 2031 වන විට මේක දැවැන්ත වෙනසකට පරිවර්තනය වනවා. පළමුවැනි වතාවට මධ්‍යස්ථ වයසේ ජනගහනයේ ප්‍රමාණය 39.5ක් වන විට, ශ්‍රම බල කායෙන් අවුරුදු 15-60ත් අතර ජනගහනය සියයට 39.4ක් වන තත්ත්වයට පත් වෙනවා. මැදි වයසේ ජනගහනය දවසින් දවස අඩු වනවා විතරක් නොවෙයි, වයස්ගත අයගේ ප්‍රමාණය වර්ධනය වනවා. ඒ අනුව මැදි වයසේ ඉන්න අයට තමන්ගේ අම්මලා තාත්තලා බලා ගැනීමේ දැවැන්ත බරක්, මහා කාර්ය භාරයක් පැවරිලා තිබෙනවා.

මෙහිදී අපි දකින විශේෂ කාරණයක් තමයි, පසු ගිය අවුරුදු ගණනාව තුළම ලංකාවේ ගම් බිම් හැර දමමින් නගරවලට මිනිස්සු සංක්‍රමණය වෙන්න පටන් ගැනීම. වෙන දා අපි ජීවත් වුණු කුටුම්බ සංස්කෘතිය වෙනුවට අද තාත්තායි අම්මායි වෙනම තමන්ගේ ගමේ පරණ මහ ගෙදර ජීවත් වන තත්ත්වයක් දකින්න තිබෙනවා. තමන්ගේ පුතාලා දුවලා කොළඹට ඇවිල්ලා, නගර ආශ්‍රිත ප්‍රදේශවලට ඇවිල්ලා දරුවෝ ලබලා පදිංචි වෙලා ඉන්නවා. ඔවුන් නාගරීකරණයට ලක් වෙලා. ශ්‍රී ලංකාවේ පවුල් ජීවිතය අද මහා වෙනස්කම් රාශියකට පරිවර්තනය වෙලා තිබෙනවා. ඒ නිසා අම්මාටයි, තාත්තාටයි තමන්ගේ මුල් නිවාසවලම හුදෙකලා වන්න සිද්ධ වෙලා තිබෙනවා.

ඒ වාගේම තමන්ගේ අම්මා තාත්තා ලංකාවේ ඉන්න කොට පුතාලා, දුවලා -එංගලන්තයේ වෙන්න පුළුවන්, කැනඩාවේ

වෙන්න පුළුවන්, ඇමෙරිකාවේ වෙන්න පුළුවන්- විදේශගත වෙලා සිටිනවා. ඒ විධියට තමන්ගේ දුවා දරුවන්ගෙන් ඈත් වෙච්ච අම්මලා තාත්තලා පිරිසක් අද ඉතුරු වෙලා ඉන්නවා. මේ නිසා අවසාන ප්‍රතිඵල ගණනාවක් ඇති වෙමින් තිබෙනවා. තමන්ගේ තනිකම, ආතතිය, කාන්සිය මකා ගන්න විධියක් නැතිව වැඩිහිටියන් විශාල සංඛ්‍යාවක් අද ගම්මාන ඇතුළේ නැත්නම් තමන්ගේ මහ ගෙවල්වල හිර වෙච්ච තත්ත්වයක් තමයි දකින්න තිබෙන්නේ. මම ඒකයි කිව්වේ, 2031 වසර වන කොට අනිවාර්යයෙන් ලංකාවේ ජනගහනයෙන් ලක්ෂ 50කට වැඩි ප්‍රමාණයක් බලා ගන්න සිද්ධ වන තැනකට පත් වෙලා තිබෙනවා කියලා. මේක සමස්ත ජනතාවට තිබෙන ප්‍රශ්නයක් විතරක් නොවෙයි, ආණ්ඩුවකට, රටකට බලපාන ප්‍රශ්නයක් විධියටයි අපි දකින්නේ.

ඒ වාගේම විශේෂ කාරණයක් තමයි වැඩිහිටියන් සම්බන්ධව නිවාස ඉදි කරලා තිබෙන්නේ තවමත් සියයට එකකටත් අඩුවෙන් වීම. දැන් මෙතැනදී තමයි අපේ ගරු ඇමතිතුමාට මුහුණ දෙන්න වෙන ප්‍රධාන ප්‍රශ්නය ඇති වෙලා තිබෙන්නේ. මොකද විශේෂයෙන් වැඩිහිටි නිවාස සම්බන්ධව වැඩිහිටියන්ගේ -

**ගරු ෆීලික්ස් පෙරේරා මහතා**
(மாண்புமிகு பீலிக்ஸ் பெரேரா)
(The Hon. Felix Perera)
වැඩිහිටියන්ට ආදායම් මාර්ගයක් නැත්නම්, දීමනාවක් දීලා ගෙදරදීම බලා ගන්න ක්‍රමයක් හැදුවොත් අර සංස්කෘතිය වෙනස් වනවා. ඒ හන්දා ඒකට අපි උදවු වෙමු.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
මේ සම්බන්ධයෙන් එතුමා කියන කාරණය ඉතාම හොඳයි. අම්මලාට, තාත්තලාට මහ ගෙදරම ඉන්න පුළුවන් තත්ත්වයක් හදලා දෙන්න පුළුවන් නම් ඒක හොඳයි.

දැන් ලංකාවේ වැඩිහිටි නිවාස සංඛ්‍යාව ගත්තාම රජයේ වැඩිහිටි නිවාස විධියට තිබෙන්නේ තුනක් පමණයි. එකක් මීරිගම, අනෙක් දෙක අනුරාධපුරය හා යාපනය ප්‍රදේශවල. ඊට අමතරව කුටි නිවාස 25ක් දිස්ත්‍රික් පාලනය යටතේ පවත්වා ගෙන යනවා. වැඩිහිටි නිවාස සංඛ්‍යාව 158යි. ඒවායේ සේවාලාභීන් සංඛ්‍යාව 5,500යි. කුටි නිවාස 25යි. ඒවායේ සේවාලාභීන් සංඛ්‍යාව 125යි. මම හිතන හැටියට මේ කුටි නිවාස කියන එක ගැන වෙන්න ඇති ගරු ඇමතිතුමා සමහර වෙලාවට අවධාරණය කරන්නේ.

දැනට තිබෙන දිවා සුරැකුම් මධ්‍යස්ථාන සංඛ්‍යාව 67යි. ඒවායින් 2,200 දෙනෙක් ප්‍රයෝජනය ලබනවා. සමස්ත ප්‍රමාණය ගත්තාම ලංකාවේ ක්‍රියාත්මක වැඩිහිටි නිවාස 250ක් විතර තිබෙනවා. ඇත්ත වශයෙන්ම අපි ඒවා තුළින් දැනට බලා ගන්නේ වැඩිහිටියන් 7,825ක විතර පිරිසක්. දවසින් දවස වියපත් වන ප්‍රමාණය මේ වන විට ලක්ෂ හතරක්, පහක් විතර වන කොට ඒකෙන් 2,500ක් බලා ගන්න තමයි අද වන කොට ආණ්ඩුවෙන් පහසුකම් සලසා තිබෙන්නේ.

ඒ වාගේම පෞද්ගලික ආයතන නැත්නම් ස්වේච්ඡා සංවිධාන මූල්‍යාධාර ඇතුව හෝ නැතිව මේ වන කොට වැඩිහිටි නිවාස 155ක්, වැඩිහිටි දිවා සුරැකුම් මධ්‍යස්ථාන 67ක් පවත්වා ගෙන යනවා. සමාජ සේවා දෙපාර්තමේන්තුව යටතේ තවත් වැඩිහිටි නිවාස 91ක් ලියාපදිංචි වෙලා තිබෙනවා. මම හිතන හැටියට ලංකාවේ වැඩිහිටි නිවාස කොපමණ තිබෙනවාද, ඒවා ලියාපදිංචි වෙලාද, හරිහමන් විධියට ඒ තුළ මේ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක වනවාද කියලා හරිහමන් සංගණනයක් තවමත් නැහැ. [බාධා කිරීමක්] ඔව්, මේකෙන් අනිවාර්යයෙන් කෙරෙනවා.

ඉතින් අපි අලුත් සංවර්ධනයක්, අලුත් රටක් ගැන කථා කරනවා. නමුත් අවුරුදු ගණනාවක් තිස්සේ මේ ප්‍රශ්න තිබෙනවා. මේක එක ආණ්ඩුවකට විතරක් කරන චෝදනාවක් නොවෙයි. සියලු ආණ්ඩුවලට මේ වැඩිහිටියන් සම්බන්ධව තිබුණු ආකල්පය වෙනුවට, ඔවුන් සම්බන්ධයෙන් සිදු වන ආකල්පමය වෙනසක් මේ කාරණාත් එක්ක අපි බලාපොරොත්තු වනවා.

ඒ විතරක් නොවෙයි. මේ එක්, එක් නේවාසිකයාට මසකට ගෙවන්නේ රුපියල් 300යි. එතකොට මේ මධ්‍යස්ථාන ඇතුළේ ඉන්න 7,825 දෙනෙකුට රුපියල් 300 බැගින් ගෙවීම් සිද්ධ කරන්න තමයි අපට අද හැකියාව ලැබිලා තිබෙන්නේ. නමුත් මේ මුදල වැඩි කිරීම සඳහා අවශ්‍ය කරන කටයුතු ටික ලැස්ති කළොත් මීට වැඩිය හොඳ තත්ත්වයක් අපට ලබා ගන්න පුළුවන් වෙයි කියලා මම හිතනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම 2001 වන කොට විශ්‍රාම වැටුප් ලබන සංඛ්‍යාව තුන්ලක්ෂ අසූතුන්දහස් අටසිය තිස්අටක ප්‍රමාණයක් සිටියා. ඔවුන්ට මිලියන විසිපන්දහස් අටසිය හතළිස්හතක් ගෙවා තිබුණා. ඒ වාගේම 2006 වන කොට මේ තුන්ලක්ෂ අසූ තුන්දාහේ ප්‍රමාණය හාරලක්ෂ තිස්එක්දහස් එකසිය පණස්තුන දක්වා වැඩි වුණා. ඔවුන්ට ගෙවීම් කටයුතුත් යම් කිසි විධියකින් වැඩි වෙලා තිබෙනවා. ඒ අනුව 2010 දෙවැනි කාර්තුව වන විටත් විශ්‍රාම වැටුප් ගන්න පුද්ගලයින් සංඛ්‍යාව හාරලක්ෂ හැට දෙදහස් හයසිය දහනවයක් බවට පත් වෙලා තිබෙනවා. ඒ වාගේම රාජ්‍ය විශ්‍රාම වැටුප් විතරක් නොවෙයි, එතැනින් එහාට ගිහින් විවිධ කාලවකවානුවලදී රාජ්‍යයන් විසින් විශේෂයෙන් කෘෂිකර්ම, ධීවර, ස්වයං රැකියා ආදී අංශවලටත් මේ විශ්‍රාම වැටුප් ලබා දීම සිදු කර තිබෙනවා. පසු ගිය අය වැය කථාවේදී ඒක විදේශ ශ්‍රමිකයන් දක්වා වර්ධනය කළා. ඒවායේ තිබෙන අඩු පාඩු දුර්වලතා ගණනාවක් අපි දකිනවා. මේ ලියාපදිංචි වීමේ චාරිකය අඩු වයස් කාණ්ඩයේදී අඩු වී, වැඩි වයස් කාණ්ඩයේදී වැඩි වී තිබෙනවා. ගරු ඇමතිතුමනි, ඇත්ත වශයෙන් සිද්ධ වෙන්න ඕනෑ, අඩු වයස් කාණ්ඩයේදී මේක වැඩි වීමත්, වැඩි වයස් කාණ්ඩයේදී අඩු වීමත්. මොකද, මුල් කාලයේදී තමන්ට උපයා සපයා ගන්න පුළුවන් මුදල ඔවුන්ට ඒකට ගෙවන්න පුළුවන්. ක්‍රය ශක්තිය තිබෙනවා. ඔවුන්ගේ ආදායම් මාර්ග තිබෙනවා. නමුත් වයසට යන කොට ඔවුන් තමන්ගේ ආදායම් මාර්ග ගැන කල්පනා නොකරන්නත් පුළුවන්. ඒ නිසා කුඩා වයසේදී නැත්නම් තරුණ වයසේදී යම් කිසි අවබෝධයක් දී යම් කිසි වැඩ පිළිවෙළක් එක්ක මේ සඳහා සමාජය හුරු කරන්න පුළුවන් වුණොත්, ඔබත් දවසක වැඩි වියට පත් වුණායින් පස්සේ ඔබව බලා කියා ගන්න කෙනෙක් නැත්නම් අපි සූදානම් ඒ වගකීම භාර ගන්න කියන මාතෘකාව ඔස්සේ මේ කටයුතු ටික කර ගන්න පුළුවන් වුණොත් මා හිතන්නේ -

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, තමුන්නාන්සේගේ වගකීම දැන් අවසන් කිරීමයි.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
වගකීම තව ටිකක් තිබෙනවා. හොඳ දේවල් -

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
හොඳ දේවල් කියැවුණා. හුඟක් දේවල් කියැවුණා. තමුන්නාන්සේ හොඳට අධ්‍යයනය කරලා තිබෙනවා.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ඔව්. ඒක තමයි. මම හොඳ කරුණු ටිකක් කථා කරලා -

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
බොහොම හොඳයි. ඔබතුමාට නියමිත කාලය අවසානයි.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
වේලාව ඉවර නම් අපේ ගරු හරින් ප්‍රනාන්දු මන්ත්‍රීතුමාගේත් විනාඩි පහක් විතර තිබෙනවා. ඒකත් මට ගන්නය කියලා කිව්වා. ඒ වෙලාවත් අරගෙන තමයි කථා කර ගෙන යන්න තිබෙන්නේ.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
නැහැ. හරින් ප්‍රනාන්දු මන්ත්‍රීතුමාගේ නම කපලා.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
එහෙම තිබෙනවාද? නැද්ද?

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ඔව්, ඔව්. හරි ඉතින් මේක ගැන තමුන්නාන්සේ හොඳට අධ්‍යයනය කරලා කථා කළා. දැන් නවත්වමු.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට තව විනාඩි කිහිපයක් අරගෙන මා කියන්නට කැමැතියි -

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
විනාඩියකින් අවසන් කරන්න.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
එක විනාඩියකින් අවසන් කරන්නම්. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දිවයින පුරා ඇති වැඩිහිටි නිවාස පවත්වා ගෙන යාම සඳහා ආධාර සැපයීම සම්බන්ධයෙන් මා කියන්නට කැමැතියි. 2007 වර්ෂයේදී තිබෙන වැඩිහිටි නිවාස ප්‍රමාණය; නිවාස 39 පවත්වා ගෙන යාමට රුපියල් මිලියන තිස්එක්දහස් හයසිය අනූ එකක් වෙන් කර තිබුණා. 2008 වර්ෂයේදී ඒක මිලියන නවදහස් දෙසිය හැත්තෑහත දක්වා අඩු වෙලා තිබෙනවා. ඒ විතරක් නොවෙයි. දිවා සුරැකුම් මධ්‍යස්ථාන ආරම්භ කිරීම සඳහා වැඩිහිටියන්ට ස්වයං රැකියාවල නිරත වීම සඳහා රුපියල් 10,000 බැගින් ආධාර ලබා දීමේ වැඩ පිළිවෙළක් තිබෙනවා. ගරු ඇමතිතුමනි, බලන්න. 2007 වර්ෂයේදී ආරම්භ කරන ලද මධ්‍යස්ථාන සංඛ්‍යාව 43යි. මූල්‍යාධාර ලබා දීම දසලක්ෂ හතළිස්තුන්දහස් හතළිස්හතරයි. 2008 වර්ෂය වන කොට මෙය අටලක්ෂ අසූ එක්දහස දක්වා අඩු වෙලා තිබෙනවා ගරු ඇමතිතුමනි. මේකත් වැදගත් කාරණයක් විධියටයි අපි දකින්නේ. එම නිසා ඒ සම්බන්ධව මුදල් වැඩි ප්‍රමාණයක් ලබා දෙන්න අවශ්‍ය කටයුතු ටික කරන්නය කියා මා ඔබතුමාගෙන් ගෞරවයෙන් ඉල්ලනවා. ඒ විතරක් නොවෙයි. ජාතික වැඩිහිටි මහ ලේකම් කාර්යාලය සඳහා වාර්ෂික වියදම බලන විට, ඇත්ත වශයෙන් අනුමත ඇස්තමේන්තු ප්‍රමාණයත් එක්ක ගත්තාම දවසින් දවස ඔවුන්ගේ වියදම් ප්‍රමාණය අඩු කරලායි තිබෙන්නේ. එම මුදල් ප්‍රමාණය වැඩි වේවිය කියලා මා විශ්වාස කරනවා. කාල වේලාව අනුව මා ඒ ගැන කථා කරන්නට ගියොත්, අනෙක් කරුණු ගැන මට කථා කරන්න වේලාව නොමැති වෙනවා.

ඊට අමතරව, විශේෂයෙන් ගරු රවුෆ් හකීම් ඇමතිතුමා විසින් ඉදිරිපත් කළ පනත් කෙටුම්පත ගැනත් එක විනාඩියක් මම කථා කරන්න ඕනෑ. මම මේ කාරණය ගැන ක්‍රියාත්මක වන්නටය කියා ගරු ඇමතිතුමාගෙන් ගෞරවයෙන් ඉල්ලනවා. මේ සමථ මණ්ඩල පිළිබඳව ලංකා ඉතිහාසයේ ඉතාම නරක තත්ත්වයක් තිබුණා. මොකද රුපියල් 25,000 ප්‍රමාණය දාලා තිබෙන කොට, රුපියල් 25,000ට උඩින් ප්‍රමාණයක් දාලා පොලීසිවලින් සමහර වෙලාවට මේ නඩු සමථ මණ්ඩලයට නොදමන තත්ත්වයක් ඇති කරලා තිබුණා. මේ නඩු සියල්ලම සමථ මණ්ඩලයට දමන්නේ නැති තත්ත්වයක් තිබුණා. පස්සේ තමයි මහේස්ත්‍රාත්වරයාට සිද්ධ වෙන්නේ ඔහුගේ අභිමතානුසාරී බලය අනුව මේක නැවත සමථ මණ්ඩලයට දමන්න. නමුත් මේ අනුව දෙලක්ෂ පණස්දහසක මට්ටමකට මේක ගෙන ඒම තුළ මා හිතන්නේ විශාල නඩු කටයුතු සංඛ්‍යාවක් සමථ මණ්ඩලය මඟින් අවසන් කිරීම සඳහා අවශ්‍ය කටයුතු ලැහැස්ති කර තිබෙනවා. එතැනදී මා විශේෂයෙන් මේ කාරණය කියන්නට කැමැතියි. සමථ මණ්ඩලය ඇතුළතදී සිද්ධ වන ක්‍රියාදාමය තමයි දෙපාර්ශ්වයම ඇවිත් මේ ප්‍රශ්නය අවසන් කර ගන්න, දෙපාර්ශ්වයම සම්බන්ධ වීම. සමහර වෙලාවට දේශපාලන වශයෙන් විශාල බලපෑම් තිබෙන කොට සමහර වෙලාවට මේ සමථ මණ්ඩලයට එන්නේ නැහැ. එන්නේ නැතිව ඔවුන් නඩු කටයුත්ත සමථ මණ්ඩලයෙන් සමාදාන වන එක නතර කර, ආපසු ඒක අධිකරණයටම ඉදිරිපත් කරන තුරු ඉන්නවා. ඒ නිසා මම මෙතැනදී ගෞරවයෙන් ඉල්ලන්න කැමැතියි, යම් කිසි පාර්ශ්වයක් හෝ තැනැත්තෙක් සමථ මණ්ඩලයට යම් කිසි වාර ගණනක් සම්බන්ධ වුණේ නැත්නම්, ඒ කාරණය උසාවියට ඉදිරිපත් කිරීමේ කාර්ය භාරය හැර, ඒ සම්බන්ධයෙන් ඔවුන්ගේ තීරණය ලබා දෙන්න සමථ මණ්ඩලයට අවස්ථාවක් දෙන්න කියලා. එයින් සමථ මණ්ඩලයේ කාර්ය භාරය පුළුල් වනවා පමණක් නොවෙයි, උසාවිවල රස්තියාදු වන ප්‍රමාණය අවම වීමේ තත්ත්වයකුත් ඇති වෙයි කියලා මම විශ්වාස කරනවා. මට මේ අවස්ථාව ලබා දුන් එක ගැන ඔබතුමාට මගේ ගෞරවයත්, ස්තුතියත් පුද කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා. බොහොම ස්තුතියි.

[අ. භා. 4.16]

**ගරු ලලිත් දිසානායක මහතා (සෞඛ්‍ය නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு லலித் திசாநாயக்க - சுகாதார பிரதி அமைச்சர்)
(The Hon. Lalith Dissanayake - Deputy Minister of Health)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ප්‍රථමයෙන්ම අපේ ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා කිව්ව දෙයක් සම්බන්ධයෙන් පැහැදිලි කිරීමක් කරන්නට කැමැතියි. අපේ අතිගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කළ අය වැය ලේඛනයෙන් රණ විරුවන්ට ලබා දෙන දීමනාවක් සම්බන්ධයෙන් එතුමා කථා කළා. ඒක වැන්දඹු හා කාන්තා රණ විරුවන් වෙනුවෙන් ලබා දීමක් කියලා එතුමා ඒ ගැන හැඳින්වීමක් කළා. නමුත් එතුමා දන්නේ නෑ, වැන්දඹුවක් කියන්නේ කවුද කියන එක. මිය ගිය

රණ විරුවාගේ බිරිඳ වැන්දඹුවක් විධියට සලකලා ඒක බොහොම හාස්‍යජනක විධියට කථා කරපු එක ගැන මම බොහොම කනගාටු වනවා. අතිගරු ජනාධිපතිතුමා රජයේ අය වැයෙන් ඒ මුදල් වෙන් කර තිබෙන්නේ එහෙම නොවෙයි. අය වැය ලේඛනයේ ඒ ගැන සඳහන් වන්නේ මේ ආකාරයටයි:

"අපගේ බොහෝ වීර සෙබළ සෙබළියන් ජීවිත පරිත්‍යාග කළා. සමහර අය තුවාල ලැබුවා. තවත් සමහර අය ආබාධිත තත්ත්වයට පත් වුණා. ඔවුන්ගේ දිගුකාලීන සුබසාධනය අපේ වගකීමයි. එබැවින් ගරු කථානායකතුමනි, එම අයගේ සහ ඔවුන්ගේ පවුල්වල ආර්ථික දුෂ්කරතා විසඳීමට තුන් අවුරුදු වැඩ පිළිවෙළක් යටතේ රුපියල් මිලියන 3,000ක් වෙන් කිරීමට මා මුලින් යෝජනා කරනවා. ආරක්ෂක හමුදාවල සෙබළ සෙබළියන්ගේ පවුල් පරිසරය ගොඩනැගීම සඳහා සෑම පවුලකටම උපදින තුන්වන දරුවා වෙනුවෙන් රුපියල් 100,000 ක ආධාරයක් දීමට ද මම යෝජනා කරනවා."

එතකොට මෙලෙස මේ ලබා දී තිබෙන්නේ වැන්දඹු අය වෙනුවෙන් නොවෙයි කියන එක මම මේ අවස්ථාවේදී මතක් කර දෙනවා. නැත්නම් වැරදි වැටහීමක් ඇති වනවා. මොකද, කාන්තාව, ඒ වීරෝදාර රණ විරුවන්ගේ පවුල්, දේශපාලන බලය තුළ අපි අපහාසයට ලක් කරන්න හොඳ නැහැ. මොකද, රණ විරුවන්ගේ කැප කිරීම නිසා තමයි අද සාමකාමී සමාජයක් තුළ අපි ජීවත් වන්නේ. ගරු මන්ත්‍රීතුමා කිව්ව දේ නිවැරදි කිරීම ආණ්ඩු පක්ෂයේ නියෝජ්‍ය ඇමතිවරයෙක් හැටියට මගේ වග කීමක්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඉතාම කාලෝචිත සංශෝධනයක් අද ගරු අධිකරණ ඇමතිතුමා මේ සභාවට ගෙනත් තිබෙන්නේ. 1988 අංක 72 දරන සමථ මණ්ඩල පනතටයි මේ සංශෝධනය ඉදිරිපත් කරන්නේ.

අද කවුරු මොනවා කිව්වත් මේ සමාජය තුළ කථිකාවක් තිබෙනවා, අධිකරණවල නඩු ප්‍රමාද වීමක් ගැන. මොකද, ඒ නඩු ප්‍රමාද වීම කොටස් දෙකකට සිදු වනවා. ඒ අපරාධ අධිකරණවල සහ සිවිල් අධිකරණවලයි. අපරාධ අධිකරණවලට වැඩිය සිවිල් අධිකරණවල නඩු තමයි ප්‍රමාද වන්නේ. මොකද, ලිපි ලේඛන කටයුතු සම්බන්ධව ගොඩක් වැඩ තිබෙන නිසා මෙලෙස ප්‍රමාදයට ලක් වනවා. අවුරුදු 20, 30 ප්‍රමාද වුණු සමහර නඩු තිබෙනවා. ඒ නිසා මේ සමථ මූල මණ්ඩල ක්‍රියාත්මක වීම තුළ අධිකරණවල නඩු තදබදය අඩු වන්නට කටයුතු සිදු වුණා කියන එක අපි කියන්න ඕනෑ. ඒක අපි අවිවාදයෙන් පිළිගන්න ඕනෑ.

මේ තොරතුරු දිහා බැලුවාම 1988 අංක 72 දරන සමථ මණ්ඩල පනත ඇති කළාට පස්සේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 293ක මේ සමථ මූල මණ්ඩල ක්‍රියාත්මක වුණා. ඒ වාගේම මේ සඳහා සමථකරුවන් හැටියට 6,800ක පුද්ගලයන් රැසක් මේ සමථ මූල මණ්ඩලවල කටයුතු කරනවා. ඔවුන් අපි අගය කරන්නට ඕනෑ. මොකද, ඔවුන් සමාජයට ඉතාමත් හොඳ සේවාවක් ඉටු කරන්නේ. මේ 6,800ක් වන පිරිස සමාජයේ අත් දැකීම් තිබෙන, සමාජය තුළ යම් සේවාවක් කරන්න පුළුවන් වැදගත් පිරිසක්. අපි ඇත්තෙන්ම ඔවුන්ගේ සේවාව අගය කරන්නට ඕනෑ, ඔවුන්ට ගරු කරන්නට ඕනෑ. මේ සමථ මූල මණ්ඩලවල සේවය කරන ඔවුන් අද මේ සමාජය තුළ ඇති වන යම් කිසි ප්‍රශ්නයකට ස්වේච්ඡාවෙන් තමාගේ ශ්‍රමය, කාලය හා අත් දැකීම දායක කරන පුද්ගලයන් හැටියට කටයුතු කරනවා. 2008 අවුරුද්ද බැලුවාම ආරාවුල්1,14,000ක් විසඳලා තිබෙනවා. 2009 අවුරුද්ද බැලුවාම ආරාවුල් 1,20,000ක් විසඳලා තිබෙනවා. එහෙම නම් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ ආරාවුල් 1,20,000ම නඩු බවට පත්වුණා නම් මම හිතන්නේ ඒ සේවාදායකයින් උසාවියක් තුළ, එහෙමත් නැත්නම් සිවිල් අධිකරණයක් තුළ තමන්ගේ කාලය හා ධනය කැප කරන්න ඕනෑ. ඒ නිසා මේ සමථ මූල මණ්ඩලවල කෙරෙන ක්‍රියාදාමය අපි අගය කරන්න ඕනෑ. එය ඇති කිරීම ඉතා හොඳ දෙයක්. ඒ වාගේම එය ඇති කිරීම තුළ උසාවිය තුළ නඩු ගොඩ ගැසීම අද අඩු වෙලා තිබෙනවා.

ඒ වාගේම රජයක් හැටියට අපි සතුටු වනවා, දහතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පැමිණීමත් සමඟම බලය විමධ්‍යගත වීමක් සිද්ධ වෙලා තිබීම ගැන. එදා ප්‍රධාන අධිකරණ කීපයක් හැර අනෙක් හැම අධිකරණයක්ම කොළඹට සීමා වෙලා තිබුණා. නමුත් ඒ අධිකරණත් අද පළාත්බදට ගිහින් තියෙනවා. අද පළාත්බද මහාධිකරණ, පළාත්බද අභියාචනාධිකරණ තිබෙනවා. එදා අභියාචනා නඩුවක් තිබුණාම අපේ දෙමව්පියන්, වැඩිහිටියන් කොළඹට එන්න ඕනෑ. ඒකට බොහොම වියදමක් දරන්න ඕනෑ. මොකද, කොළඹට එන්න ඕනෑ; පෙරකදෝරු මහත්තුරුන්ට ලොකු මුදලක් ගෙවන්න ඕනෑ. ඒ සඳහා විශාල ධනයක් වැය කරන්න සිද්ධ වෙනවා, විශාල කැප කිරීමක් කරන්න ඕනෑ. නමුත් අද, බලය විමධ්‍යගත වීම තුළ අධිකරණ බලයත් විමධ්‍යගත වෙලා තිබීම නිසා අභියාචනාධිකරණ බලයත් දිස්ත්‍රික් මට්ටමට පැමිණීම තුළින් මම හිතන්නේ යම් කිසි සහනයක් ජනතාවට ලැබිලා තිබෙන බවයි.

මෙහිදී පැහැදිලිවම මෙන්න මේ කරුණු කාරණා කියන්න ඕනෑ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අධිකරණයට අදාළව සමථ මූල මණ්ඩල ගැන කතා කරන කොට මා තවත් දෙයක් කියන්න ඕනෑ. මේ රටේ අධිකරණ දෙකක් තිබුණා. දැනට සිටින විපක්ෂය ආණ්ඩු කළ අවුරුදු දෙක තුනක කාලය තුළ ප්‍රභාකරන්ගේ -එල්ටීටීඊ එකේ- අධිකරණය ක්‍රියාත්මක වුණා, පොලිසියකුත් තිබුණා. නමුත් මා සතුටු වෙනවා, මා නියෝජනය කරන රජය හැටියට, මා නියෝජනය කරන රජයේ නායකයා හැටියට අතිගරු ජනාධිපතිතුමන්, අවුරුදු 30ක් තිස්සේ මේ රටේ පැවති යුද්ධය අවසන් කරලා, මේ රටේ දෙවුන්දර තුඩුවේ සිට පේදුරුතුඩුව දක්වා අද එක අධිකරණ පද්ධතියක් ක්‍රියාත්මක කරන්න කටයුතු කිරීම ගැන. අද අධිකරණ දෙකක් නැහැ. අද මේ රටේ නඩේසන් කියන කොටි පොලිස්පතිලා නැහැ. අද මේ රටේ තිබෙන්නේ එක රජයයි. එහෙම නම් මේ රජය මේ රටේ අද එක අධිකරණ පද්ධතියක් ක්‍රියාත්මක කර තිබෙනවා. ඒ රජය නියෝජනය කරන නියෝජ්‍ය ඇමතිවරයෙකු හැටියට ඒ ගැන අද අපට සතුටු වෙන්න පුළුවන්.

අද මේ සංශෝධනය තුළින් මුදල් වටිනාකම -සිවිල් බලය- රුපියල් 2,50,000 දක්වා වැඩි කර තිබීම වැදගත් වෙනවා. ඒ සිවිල් වටිනාකම වැඩි කිරීම නිසා රුපියල් 25,000ක මුදල් වටිනාකමක් තිබියදී ආපු නඩු සංඛ්‍යාවට වඩා විශාල නඩු සංඛ්‍යාවක් එන්න පුළුවන්. සිවිල් අධිකරණයක බලය සම්බන්ධයෙන් කතා කරන විට රුපියල් 2,50,000 කියන්නේ ලොකු වටිනාකමක්. ඒ අනුව සිවිල් අධිකරණයකට යන්නේ නැතුව අදාළ පුද්ගලයන්ට සමථ මණ්ඩලය තුළදීම ඒ ආරාවුල් විශාල සංඛ්‍යාවක් විසඳා ගැනීමට හැකියාවක් තිබෙනවා. පහුගිය දවසක සමථ මණ්ඩල නියෝජිත මහතෙක් හමු වූ අවස්ථාවකදී මම ඔහුගෙන් ඇහුවා, "මේ සමථ මණ්ඩලවල තිබෙන අඩු පාඩු මොනවාද?" කියා. එහිදී ඔහු එක දෙයක් කිව්වා. ඒ තමයි එතුමන්ලා කැඳවීම් කළාම නො එන අය සම්බන්ධයෙන් කිසිදු විකල්පයක් නැහැ කියන එක. ඒ කියන්නේ නො එන අය සම්බන්ධයෙන් කිසිදු දඬුවමක්, අවවාදයක් මේ සඳහා ආ යුතුයි කියන බලපෑම කරන්නට මේ සංශෝධනය තුළින් මේ නීති පද්ධතිය ඇතුළත කිසියම් ක්‍රමවේදයක් සකස් කළ යුතුයි කියන එකයි. එතකොට අර සමථ මූල මණ්ඩලයට තිබෙන වටිනාකම වැඩි වෙනවා. ඒ නිසා මම ගරු ඇමතිතුමාට යෝජනා කරනවා, සමථ මූල මණ්ඩලයේ කැඳවීම අනුව නොපැමිණෙන අය සම්බන්ධයෙන් අධිකරණමය කටයුත්තක් කරන්න කිසියම් ක්‍රමවේදයක් සකස් කරන්න ඕනෑය කියා. ඊ ළඟට දණ්ඩ නීති සංග්‍රහයේ 367 සහ 368 වගන්ති ගැන කතා කළොත් 367 වගන්තිය අදාළ වෙන්නේ සොරකම සම්බන්ධයෙනුයි. සොරකමට අදාළ දඬුවම වශයෙන් තිබෙන්නේ අවුරුදු තුනක සිරගත කිරීමකුයි. 368 වගන්තියෙන් කියවෙන්නේ කෘෂිකාර්මික භෝග සහ සත්වයන් සම්බන්ධව සොරකමයි. මේ සොරකම් දෙක සම්බන්ධයෙන් වයස අවුරුදු 18ට අඩු කෙනෙක් ඊට අදාළ වැරදි

[ගරු ලලිත් දිසානායක මහතා]

කළොත් යම් කිසි සහනයක් ලැබෙනවා. ඒක වැදගත්. ඒ අනුව රුපියල් 5,000කට අඩු වටිනාකමක් දීලා, අවුරුදු 18ට අඩු පුද්ගලයෙක් කළ එවැනි අපරාධයක් සම්බන්ධයෙන් සමථ මූල මණ්ඩලයට වගකීම ලබා දීලා, වරද නිවැරදි කරලා, සමාජගත වීමේ අවස්ථාව ලබා දී තිබෙනවා. හිරේට ගිහිල්ලා, වෙනත් වැරදි පැත්තක යනවාට වඩා අධිකරණයට යන්නේ නැතුව, මේ සමථ මණ්ඩලයට පැමිණිලා තමන් කළ වරද නිවැරදි කර ගන්න සමථ මූල මණ්ඩලය තුළින් අවස්ථාවක් ලැබෙනවා. ඒක මේ සංශෝධනය තුළ මා දකින ඉතා වැදගත් දෙයක්. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ නිසා අධිකරණ අමාත්‍යවරයා විසින් ඉදිරිපත් කරන ලද 1988 අංක 72 දරන සමථ මණ්ඩල පනත සංශෝධනය කරන්න ඉදිරිපත් කළ සමථ මණ්ඩල (සංශෝධන) පනත් කෙටුම්පතට අදාළ මෙන්න මේ කරුණු කාරණා ඉතාම කාලෝචිත, වැදගත් දෙයක් හැටියට මා දකිනවා.

ඒ වාගේම වැඩිහිටි තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ (සංශෝධන) පනත් කෙටුම්පත සම්බන්ධයෙන් කතා කරන විට ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා "වැඩිහිටියා" කියන කාරණය දැක්කේ කරදරයක් විධියටයි. එතුමා වැඩිහිටියාගේ අගය කිව්වේ නැහැ. ඇත්තෙන්ම අද මේ සමාජය තුළ අපේ වර්තමානය ගොඩ නඟා තිබෙන්නේ වැඩිහිටියාගේ දහඩිය, මහන්සිය, කඳුළු තුළිනුයි. එතුමා ඒ ගැන කිව්වේ නැහැ. එතුමාගේ කතාව තුළින් වැඩිහිටියා කියන එක කියවුණා. නමුත් ඉදිරියේ ඇති වන වැඩිහිටි ජනගහනය අපට කරදරයක් ලෙසටයි එතුමාගේ කතාවෙන් කියවුණේ. ඒක එතුමාගේ දර්ශනය වෙන්න ඇති. ඒ නිසා මා පැහැදිලිව කියන්න ඕනෑ, වැඩිහිටියා කියන එක අපට කරදරයක් නොවෙයි කියන එක. අද මේ නිර්මාණ ඇති කර තිබෙන්නේ, මේ තත්ත්වය ඇති කර තිබෙන්නේ, මේ මන්දිර බිහි කර තිබෙන්නේ වැඩිහිටියාගේ කාලය, ධනය සහ ශ්‍රමය කැප කරලායි. අද මම දකිනවා, මගේ මව මට ආදර්ශයක් වුණු බව. ඒ, මීට අවුරුද්දකට කලින් මගේ මව මිය යන්නට කලින්. මොකද, හේතුව? මගේ මව මට ලොකු ශක්තියක් වුණා. මගේ මව මගේ නිවසේ ආරක්ෂකයා වුණා. අපේ ගෞරවනීය ස්වාමීන් වහන්සේ නමක් මට පිටුපසින් මේ සභාවේ සිටිනවා. බෞද්ධ දර්ශනය වෙන්න පුළුවන්, හින්දු දර්ශනය වෙන්න පුළුවන්, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා අදහන ඉස්ලාම් දහම වෙන්න පුළුවන්, එහෙම නැත්නම් කිතු දහම වෙන්න පුළුවන් මේ සෑම දර්ශනයකින්ම "වැඩිහිටියා" ඉතා අගය කර තිබෙනවා. අප කුමන ආගමකට අයත් වුණත් ශ්‍රී ලාංකික සංස්කෘතිය තුළ වැඩිහිටියාට හිමි වන්නේ ලොකු වැදගත්කමක්. ඒ නිසා අපේ අම්මා, තාත්තා අපේ පවුලට බරක් නොවෙයි. මේ පාර්ලිමේන්තුවේ සේවය කරන අයවලුන් ගත්තත් තමන්ගේ අම්මා, තාත්තා ගෙදර ඉන්නවා නම් ඒ අයට කිසි බයක් නැතුව පුංචි දරුවා ගෙදර තියා එන්න පුළුවන්. රැකීයට ගියත් ඒ දරුවා ගැන අම්මා, තාත්තා ඒ තරමම වග කීමක් දරනවා. ඒ නිසා ඒ දරුවන් දිවා සුරැකුම් මධ්‍යස්ථානවලට දමන්න අවශ්‍ය වන්නේ නැහැ.

ඒ නිසා වැඩිහිටියා වැදගත්. මේ වැඩිහිටියා බරක් නොවෙයි. ගහට තමන්ගේ ඵල බරක් නොවනවා වාගේම, ඒ ඵල දරන්න ශක්තියක් දුන්න ගහ අපට වැදගත්. ඒ නිසා මේ වැඩිහිටියා මේ සමාජ තලයට වැදගත් පුද්ගලයෙක්. බටහිර ලෝකයට වැඩිහිටියා බරක් වෙන්න පුළුවන්. බටහිර අදහස් තිබෙන අයට වැඩිහිටියා බරක් වෙන්න පුළුවන්. බටහිර සංස්කෘතියට අනුව හැදුණු වැඩුණු අයට වැඩිහිටියා බරක් වෙන්න පුළුවන්. නමුත් මම පැහැදිලිව කියනවා, වැඩිහිටි ජනගහනය වැඩිවීම අපට බරක් නොවන බව. ශ්‍රී ලාංකික සංස්කෘතියට අනුව වැඩිහිටියන් අපට ආශීර්වාදයක් වෙනවා. ඔවුන් තමයි නිවසට තිබෙන ලොකුම ශක්තිය හා ආදර්ශය. ඔවුන් වෙනුවෙන් -ඔවුන්ගේ අර හැඳුනුම් පත් සම්බන්ධයෙන්- ගරු ඇමතිතුමා ඉදිරිපත් කළ මේ සංශෝධනය වටිනාකමක් තිබෙනවා. එය වැදගත් වෙනවා. අපි දන්නවා, මේ සමාජ තලය තුළ "සුදු නෙළුම්" හැඳුනුම් පත් තිබෙනවා; රණ විරු හැඳුනුම් පත් තිබෙනවා. මේ ආදී වශයෙන් විවිධ හැඳුනුම් පත් නිකුත් කර තිබෙනවා. මේ වැඩිහිටි හැඳුනුම් පතට නීතිමය වටිනාකමක් දෙනවා වාගේම, මේ වැඩිහිටියාට ගරු කරන්න, සමාජ තලය තුළ ඔහුට වැදගත් තැනක් දෙන්න අපි මේ සමාජය දැනුවත් කරන්න ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ පනත් කෙටුම්පත් දෙක තුළින් ගෙන එන මේ සංශෝධනයන් ඉතාමත් කාලෝචිත සංශෝධනයන් බව ප්‍රකාශ කරමින් මට මේ අවස්ථාව ලබා දීම ගැන ඔබතුමාට ස්තුතිවන්ත වෙමින් මා නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

[අ. භා. 4.27]

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දින ඉදිරිපත් කර තිබෙන මේ ඉතාමත් වැදගත් පනත් කෙටුම්පත් දෙක සම්මත කිරීමට අපේ සහයෝගය ලැබෙන බව මා පළමුව ප්‍රකාශ කළ යුතුයි. මා පළමුවෙන්ම සමථ මණ්ඩල (සංශෝධන) පනත් කෙටුම්පත පිළිබඳව අදහස් ප්‍රකාශ කරන්නට කැමැතියි. මෙම සමථ මණ්ඩල ක්‍රියාදාමය 1988 අංක 72 දරන සමථ මණ්ඩල පනතෙන් ආරම්භ වුණා. ප්‍රායෝගිකව මේ ක්‍රියාවලිය ස්ථාපනය වෙන්න තවත් අවුරුදු දෙකක් පමණ ගත වුණා. එදා ඉඳලා අවුරුදු 20කට ආසන්න කාලයක් සමථ මණ්ඩල ක්‍රමය මේ රටේ ක්‍රියාත්මක වීම තුළ රටේ අපරාධ සහ සිවිල් ආරාවුල් විශාල ප්‍රමාණයක් සාර්ථක ලෙස විසඳා ගැනීමට හැකි වෙලා තිබෙනවා. සාර්ථකත්වයේ ප්‍රතිශතය සියයට 65කට වැඩි බව වාර්තා වෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, රටක ආරාවුල් විකල්ප ක්‍රමවලින් විසඳා ගන්න තිබෙන හැකියාව අධිකරණයට නොගිහින් සාකච්ඡාවෙන් සම්මුතියෙන් විසඳා ගන්න තිබෙන හැකියාව ඒ රටේ මිනිසුන්ගේ තිබෙන ගුණාත්මකභාවය, ඒ රටේ මිනිසුන්ගේ තිබෙන දූරදක්නා නුවණ, ඒ රටේ මිනිසුන්ගේ තිබෙන හැදියාව පෙන්නුම් කරන එක අවස්ථාවක්. ඒ නිසා මම දකින්නේ සමථ මණ්ඩල ක්‍රමය මේ රටේ සාර්ථක වීම -මේ රටේ ශ්‍රී ලාංකික ජනතාව; සිංහල, දෙමළ සහ මුස්ලිම් ජනතාව ජාති භේදයක් නැතිව ආගම් භේදයක් නැතිව සමථ මණ්ඩල ක්‍රමය කෙරෙහි විශ්වාසයක් ඇති කර ගෙන, දුප්පත් පොහොසත් භේදයක් නැතිව සමථ මණ්ඩල ක්‍රමය කෙරෙහි විශ්වාසයක් ඇති කර ගෙන ඒ සමථ මණ්ඩල ක්‍රමයට අනුගතවීම- අනාගතයේ මේ රටේ අධිකරණය තුළ ඇති වෙලා තිබෙන ප්‍රමාදය වැළැක්වීම උදෙසා සකස් කරන්නා වූ අලුත් ක්‍රමවේදයන් පිළිබඳව කල්පනා කර බලන කොට අප විසින් සැලකිල්ලට ගතයුතු ඉතාම වැදගත් කාරණයක් කියලායි. මෙම පනත් කෙටුම්පතෙන් අපේක්ෂා කරන්නේ දැනට රුපියල් 25,000ක් වෙච්ච දිසා අධිකරණයක නඩු පැවරීමට පූර්වයෙන් අනිවාර්යයෙන්ම සමථ මණ්ඩලයට යා යුතු වූ වටිනාකම රුපියල් 2,50,000ක් දක්වා සංශෝධනය කිරීමයි. හැබැයි මේකෙන් අදහස් වෙන්නේ නැහැ, රුපියල් 2,50,000ට වඩා වැඩි ආරාවුල් පිළිබඳව සමථ මණ්ඩලයට යන්න බැහැයි කියන කාරණය. ඕනෑම මූල්‍යමය වටිනාකමක් තිබෙන කාරණයක් ගැන සමථ මණ්ඩලයට යා හැකියි. සමාජය තුළ දුර්මතයක් තිබෙනවා, සමථ මණ්ඩලයට යා හැක්කේ රුපියල් 25,000කට වඩා අඩු වටිනාකමක් ඇති ආරාවුලක් ගැන පමණක්ය කියලා. ඒක වැරදියි. ඒ වාගේම මේ යෝජිත සංශෝධනයෙන් පස්සේ සමථ මණ්ඩලයට යා හැක්කේ රුපියල් 2,50,000ට වඩා අඩු වටිනාකමක් ඇති ආරාවුලක් පිළිබඳව පමණක්ය කියලා මතයක් ඇති වුණොත් ඒක වැරදියි. අපි රටට කියන්න අවශ්‍ය කාරණය තමයි මූල්‍ය වටිනාකම නොතකා සමථ මණ්ඩලයට යා හැකියි, හැබැයි රුපියල් 2,50,000කට වඩා අඩු වටිනාකමක් ඇති කාරණයක් ගැන අධිකරණයට යනවා නම් එවැනි අවස්ථාවක

අධිකරණයට යෑමට ප්‍රථම සමථ මණ්ඩලයට ගිහිල්ලා නිරවුල් නොකිරීමේ සහතිකයක් ගැනීම අවශ්‍යයි කියන එක. ඒක තමයි මෙහි ඇති වන ප්‍රතිඵලය. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ නිසා මේක ඉතාම කාලීන සංශෝධනයක්. මේ රුපියල් 2,50,000 මුදල ප්‍රමාණවත් නැහැ. මෙය ඊටත් වඩා වැඩි වටිනාකමක් විය යුතුයි කියලා සාකච්ඡා ඇති වුණත්, උපදේශක කාරක සභාවේදී අපිට එකඟ වන්න පුළුවන්කම ලැබුණා කාටත් පිළිගත හැකි වටිනාකමක් හැටියට රුපියල් 25,000 වෙනුවට රුපියල් 2,50,000ක මුදල යොදන්න. ඒ නිසා මේක වැදගත්, කාලීන දෙයක්. ඒ ගැන අපි එකඟ වෙනවා.

ඒ වාගේම තවත් වෙනසක් සිද්ධ වෙනවා, දණ්ඩ නීති සංග්‍රහයේ 367 වගන්තිය සහ 368 'ආ' වගන්තිය යටතේ දඬුවම් ලැබිය හැකි වරදක් පිළිබඳව සැක කරනු ලැබූ වයස අවුරුදු දහඅටට අඩු තැනැත්තෙකු සම්බන්ධව ඒ වරද පළමුව සමථ මණ්ඩලයට යොමු කළ යුතුයි; එය සමථ මණ්ඩලයේදී නිරාකරණය කර ගැනීමට නොහැකි වුණොත් තමයි මහේස්ත්‍රාත් අධිකරණයට යා හැක්කේ කියා. මුල් පනතේ මේ වටිනාකම තිබෙන්නේ රුපියල් 50,000ක් වශයෙන්. අද සංශෝධනයක් ඉදිරිපත් වෙනවා. සිංහල සංශෝධනයේ තිබෙනවා රුපියල් 5,000ක් විය යුතුයි කියා. ඉංග්‍රීසි සංශෝධනයේ තිබෙනවා රුපියල් 5ක් විය යුතුයි කියා. යම් පරිවර්තන දෝෂයක් තිබෙන බවයි පෙනෙන්නේ. නමුත් මාගේ පෞද්ගලික අදහස නම් මේ මුල් පනතේ තිබෙන 50,000 එලෙසම තිබීම කිසිම ගැටලුවක් නැහැ කියන එකයි. මක් නිසාද මෙතැන අවුරුදු දහඅටට අඩු තැනැත්තෙක් ගැනයි කථා කරන්නේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, නීතියේ අර්ථයෙන් බැලුවොත් දරුවෙක් ගැන. අපි දරුවා කියලා කියන්නේ අවුරුදු දහඅටට අඩු අවස්ථාවක සිටින කෙනෙකුටයි. ඒ නිසා දරුවෙක් මෙම වැරදි හා සම්බන්ධව සැක කොට අත් අඩංගුවට ගෙන තිබෙන අවස්ථාවක එහි වටිනාකම රුපියල් 50,000ක් කියන කාරණය මම නම් සලකන්නේ ප්‍රායෝගිකව මෙලෙසම තිබීම සුදුසුයි කියායි. නමුත් මම ඒ පිළිබඳව වැඩි වාදයක් ඉදිරිපත් කරන්නේ නැහැ. ගරු ඇමතිතුමාට ඒ පිළිබඳව මාගේ මතය දැන්වීම පමණක් කරන්නට කැමැතියි.

පළමුව ඉතා වැදගත් මෙම සංශෝධනයට මම එකඟතාව පළ කරනවා. ඒ වාගේම මම කියන්න කැමැතියි, සමථ මණ්ඩල ක්‍රමය මේ රටේ ආරවුල් විසඳීමට, අධිකරණයේ නඩු බර අඩු කිරීමට ඉතාම විශාල සේවයක් කරලා තිබෙන බව. ගෞරවනීය සේවයක් කරන දසදහස් ගණනක් වුණු මේ රටේ සමථකරුවෝ මේ රටේ අභිවෘද්ධිය පිණිස තමන්ගේ ශ්‍රමය, තමන්ගේ වටිනා කාලය, ඇතැම් විට තමන්ගේ ධනය පවා පෞද්ගලිකව කැප කරලායි මේ සමථකරණයේ යෙදෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සමථකරණය තව ඉදිරියට අරන් යන්න ඉතාම වැදගත් යෝජනාවක් කරන්න මම කැමැතියි. අපේ රටේ සමථ මණ්ඩලය තිබෙන්නේ කොහේද කියා ගමක කෙනෙකුට දැන ගැනීමට ක්‍රමයක් නැහැ. සමථ මණ්ඩලයට කාර්යාලයක් නැහැ. මම ජීවත් වන්නේ බණ්ඩාරගම. බණ්ඩාරගම සමථ මූල මණ්ඩලයේ කාර්යාලය තිබෙන්නේ එහි සභාපති ධුරය දරන ගරු ස්වාමීන් වහන්සේගේ පන්සලේ. කාලයෙන් කාලයට සභාපති ධුරය වෙනස් වන කොට කාර්යාලය වෙනස් වෙනවා. සමහර වෙලාවට මේ සභාපති ධුරය දරන ස්වාමීන් වහන්සේ වැඩ සිටින පන්සල කොහේද, එහෙම නැත්නම් සභාපති ධුරය දරන තැනැත්තා ජීවත් වන ස්ථානය කොහේද කියා දන්නේ නැහැ. සමහර විට බොහොම දුර බැහැර ස්ථානයක් වන්නට පුළුවන්. ඒ නිසා මම කැමැතියි, සෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකම සමථ මණ්ඩල ලේකම් කාර්යාලයක් පිහිටුවිය යුතුයි කියා යෝජනාවක් කරන්න. මම මේ කියන්නේ විශාල කාර්යාලයක් පිහිටුවන්න කියන එක නොවෙයි. මම කථා කරන්නේ එක කාමරයක්, එක ලිපිකරුවෙක්, එක පරිගණකයක්, මේසයක්, පුටුවක් සහ අල්මාරියක් තිබෙන කුඩා කාර්යාලයක් ගැනයි. මොකද, නීතිඥවරයෙක් වශයෙන් මා දන්නවා ඇතැම් අවස්ථාවල සමථ ක්‍රියාවලිය පිළිබඳ ගැටලුවක් ඇති වෙලා ඒ පිළිබඳව සමථ මණ්ඩලයෙන් සාක්ෂිකරුවෙක් කැඳවූ විට පැරණි ලිපි ගොනු සොයා ගැනීමට නොහැකි වීම ලොකුම ප්‍රශ්නයක් බව. ඒ පිළිබඳව වග කීමට නිලධාරියෙකු නොමැතිකමත් ගැටලුවක්. ඒ නිසා මා යෝජනා කරන්න කැමැතියි, සමථකරණය තුළ ගොනු වන්නා වූ ලිපි ලේඛන පිළිවෙළකට ක්‍රමානුකූලව පවත්වා ගෙන යාමටත්, සමථකරුවන්ගේ ක්‍රියාවලිය විධිමත් ලෙස පවත්වා ගැනීමටත් දායක වන කාර්යාලයක් ප්‍රාදේශීය ලේකම් කාර්යාල තුළ පිහිටුවිය යුතුයි කියලා. ඒ වාගේම අධිකරණ කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව තුළත් මේ ප්‍රශ්නය පිළිබඳව සාකච්ඡා වුණා. රාජ්‍ය පරිපාලන ව්‍යුහයට දායක වන ප්‍රාදේශීය ලේකම් කාර්යාලයත් සමථ ක්‍රියා දාමයත් අතර සම්බන්ධය ඉතාම දුරස්ථයි. එක්කෝ කිසිම සම්බන්ධයක් නැහැ. සමථ මණ්ඩල ක්‍රියා දාමය අධිකරණ අමාත්‍යාංශය යටතටත්, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය යටතටත් වැටෙන කොට මේ දෙක අතර සම්බන්ධීකරණයක් ඇති වන්නේ නැති බව අපිට තේරුම් ගන්නට පුළුවන්. ඒ නිසා මේ රාජ්‍ය පරිපාලන ව්‍යුහය සකස් කිරීමේ දී ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේම කොටසක් ලෙස මේ සමථකරණ ක්‍රියා දාමය ඇතුළත් කරන්නය කියලා මම යෝජනා කරන්න කැමැතියි. එතකොට අපට අදටත් වඩා වැඩි සාර්ථකත්වයක් ලබා ගැනීමට හැකියාව ලැබෙනවා. ඒ වාගේම මෙතෙක් කල් මේ සමථකරණ ක්‍රියාදාමය ඉදිරියට ගෙන යාමට දායක වෙච්ච සමථකරුවන්ට මගේ ප්‍රණාමය පිරිනමන්නටත් මම මේ අවස්ථාව භාවිත කරන්නට කැමැතියි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 2000 අංක 9 දරන වැඩිහිටි තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ පනත සංශෝධනය කිරීම සඳහා වැදගත් සංශෝධන ගණනාවක්ම ඉදිරිපත් කර තිබෙනවා. මේ ආණ්ඩුව වැදගත් දෙයක්, නිවැරදි දෙයක් කරනවා නම් හිතේ කහටක් නැතිව ඒ වැඩේ හරියි කියලා කියන්න විපක්ෂය හැටියට අපි සූදානම් වෙලා ඉන්නවා. ඒ නිසා මේ 2000 අංක 9 දරන වැඩිහිටි තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ පනත සංශෝධනය කිරීම සඳහා ගෙනැවිත් තිබෙන මේ යෝජනාවන් කාලීන, වැදගත් යෝජනාවන් ලෙස සලකා ඒ පිළිබඳව රජයට ස්තුති කරන්නට මා කැමැතියි. නමුත් මේ වැඩිහිටි තැනැත්තන්ගේ අයිතිවාසිකම් සම්බන්ධයෙන් ගත්තාම, වැඩිහිටියා කියලා කියන්නේ වයස අවුරුදු 60ට වැඩි තැනැත්තන් කියලා අර්ථ දක්වනවා. ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමාත් සඳහන් කළා වාගේ, ජ්‍යෙෂ්ඨ පුරවැසියන් කියලා ගෞරව නාමයක් දීලා, ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ට රට තුළ සමිති පිහිටුවලා, ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ගේ සැඳෑ කාලය යහපත් කිරීමට අප විසින් රට පුරා වැඩ කටයුතු කර ගෙන යාමට අවශ්‍ය කාලය එළඹීලා තිබෙනවා. ඒ වාගේම රජය මේ පාර්ලිමේන්තුවේ සිටින ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ට, ජ්‍යෙෂ්ඨ අමාත්‍ය යනුවෙන් ගෞරව නාම ලබා දීලා තිබෙනවා. ඒ අයව වැඩක් නැතත්, රටට ප්‍රයෝජනයක් නැතත්, ආරක්ෂාව රැකවරණය සහිතව රැක බලා ගැනීමට ගරු ජනාධිපතිතුමා කටයුතු කර තිබෙනවා. එතුමාත් ජ්‍යෙෂ්ඨ පුරවැසියෙක්. එතුමාටත් වයස අවුරුදු 60ට වැඩියි. ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ගේත් කණ්ඩායම් තිබෙනවා. වැඩ පුළුවන් ජ්‍යෙෂ්ඨ පුරවැසියන් තව දුරටත් වෙනම තබා ගන්නටත්, වැඩ බැරි ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ට ආණ්ඩුවේ බදු ගෙවන ජනතාවගේ වියදම්වලින් විශේෂ රැකවරණය දීලා ආරක්ෂා කරන්නටත් එතුමා කල්පනා කරලා තිබෙනවා. කමක් නැහැ, වැඩිහිටියන්ට සැලකීම හොඳ ගුණයක්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, හැබැයි අපේ රටේ වැඩිහිටියන්ට නොසලකන දරුවනුත් සිටිනවා. සාමාන්‍ය නඩත්තු පනත යටතේ වැඩිහිටියකුට තමන්ගේ දරුවන්ගෙන් නඩත්තු ලබා ගැනීමට හැකියාවක් නැහැ. අසරණ වෙච්ච වැඩිහිටියකුට තමන්ගේ දරුවන්ගෙන් නඩත්තු ලබා ගැනීමට හැකියාව තිබෙන්නේ එක්කෝ රෝම ලන්දේසි නීතිය යටතේ දිසා

[ගරු අජිත් පී. පෙරේරා මහතා]

අධිකරණයක නඩු පැවරීමෙනුයි. ඒක බොහොම දීර්ඝ ක්‍රියා දාමයක්. ඒ සඳහා ගත වන කාලය බොහොම වැඩියි. ඒ සඳහා වියදම් කරන්න, ඒ සඳහා වසර ගණනාවක් තිස්සේ අධිකරණයට එන්න, මේ අසරණ වෙච්ච දෙමවුපියන්ට ප්‍රායෝගිකව හැකියාවක් නැහැ. 2000 අංක 9 දරන වැඩිහිටි තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ පනතෙන් වැඩිහිටි ඉල්ලීම් මණ්ඩල ඇති කර තිබෙනවා. දැන් මේ වැඩිහිටි ඉල්ලීම් මණ්ඩලය තුළ තමයි අධිකරණයෙන් පරිබාහිර ක්‍රමවේදයක් තුළ අසරණ වෙච්ච වැඩිහිටියන්ට තමන්ගේ දරුවන්ගෙන් නඩත්තු ලබා ගැනීමට හැකියාව ලබා දීලා තිබෙන්නේ.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු මන්ත්‍රීතුමා තව විනාඩියකින් අවසන් කරන්න.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දැන් තිබෙන ගැටලුව තමයි මේ ප්‍රශ්නය විසඳා ගන්න ඈත පළාත්වල ඉන්න වැඩිහිටියන්ට කොළඹට එන්න සිද්ධ වීම. මුළු ලංකාවටම වැඩිහිටි ඉල්ලීම් මණ්ඩලයක් ක්‍රියාත්මක වන්නේ කොළඹ විතරයි. මේක ලොකු ප්‍රශ්නයක්. අසරණකම වැඩි වෙච්ච වැඩිහිටියකුට බස් එකකට රුපියල් සිය ගණනක් වියදම් කර ගෙන, කෝච්චියට රුපියල් සිය ගණනක් වියදම් කර ගෙන කොළඹට එන්න පුළුවන්කමක් නැහැ. ඒ ප්‍රශ්නය විසඳා ගන්න සාකච්ඡා කිරීමට දින ගණනක් කොළඹට එන්න පුළුවන්කමක් නැහැ. ඒ නිසා ඉතාම සද්භාවයෙන් මා යෝජනා කරන්න කැමැතියි පළමුවැනි පියවර විධියට අඩු ගණනේ මේ රටේ සෑම පරිපාලන දිස්ත්‍රික්කයකට වැඩිහිටි ඉල්ලීම් මණ්ඩල එකක් බැගින්වත් පිහිටුවන්න කියලා. ඒ තුළ අද සංශෝධන සහිතව සම්මත කරන පනතේ තිබෙන පරමාර්ථයන් වඩාත් හොඳින් ඉෂ්ට කර ගන්න හැකියාව ලැබෙනවා. ඒ සඳහා වූ අදහස් හා යෝජනා ඉදිරිපත් කරමින් මා නතර වනවා. බොහොම ස්තුතියි.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
බොහොම ස්තුතියි.

[අ. භා. 4.42]

**ගරු ෆයිසර් මුස්තාපා මහතා (තාක්ෂණ හා පර්යේෂණ නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு பைசர் முஸ்தபா - தொழில்நுட்ப, ஆராய்ச்சி பிரதி அமைச்சர்)
(The Hon. Faiszer Musthapha - Deputy Minister of Technology and Research )

Mr. Presiding Member, firstly, I am thankful to you for giving me this opportunity to speak in the Debate of the Mediation Boards (Amendment) Bill. I would also like to thank the Hon. Rauff Hakeem, Minister of Justice, for bringing in a very meaningful amendment.

After a case is filed in the District Court, - the Hon. Wijeyadasa Rajapakshe, as a legal practitioner knows very well about this - you can appeal to the Court of Appeal and to the Supreme Court, and for you to get the fruits of the judgment, it will take a minimum of 10 years. So, earlier if the debt, demand or damage was less than Rs. 25,000 then, you could go to the Mediation Board. But, now, this amendment has become meaningful, especially with the vision of His Excellency President Mahinda Rajapaksa, that laws should be accessible to the common man. When it is less than Rs. 250,000, you would see the workload in the court dropping. If it is a case of less than Rs. 250,000 and if you retain somebody like the Hon. Wijeyadasa Rajapakshe, it will cost you more than Rs. 250,000.

So, I would like to say, when the debt, demand or damage is less than Rs. 250,000, most counsels advise not to go to courts. Therefore, with this amendment, the poor man would be able to find a solution to his problems. In addition, the Mediation Boards have proved to be a success where 50 per cent of the disputes have been sorted out. We saw earlier, due to parate execution people losing their houses overnight when courts used the Debt Recovery Act and passed a resolution. But, thanks to the vision of His Excellency the President, for debts less than Rupees five million, you do not have to go by parate execution and thereby, again safeguarding the common man of this country. Further, alternative dispute resolution has proved to be successful. Even with regard to commercial litigation, you can see the Arbitration Act coming into being. Therefore, once again I welcome this amendment and I believe that the poor man of this country will benefit by this amendment because earlier it was only with regard to Rs. 25,000. One could say it is only a certification but when you go to a court, it is confrontational and adversarial. Therefore, when parties discuss at a Mediation Board, I am sure they would be able to reach an amicable settlement without going into the facts. You go into litigation to find out who is right and who is wrong but here, it is a conducive environment for parties to discuss and reach an amicable settlement. Once again, I am thankful for this opportunity given to me to speak on this Bill.

[අ. භා. 4.45]

**ගරු විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. Wijeyadasa Rajapakshe)

Mr. Presiding Member, I think this amendment brought in relation to the Mediation Boards Act is timely, important and appropriate. As the Hon. Minister stated, the Mediation Boards Act was introduced as far back as in 1988 but we must not forget the fact that this conciliation procedure was a part of our legal system, which had been ingrained even during the colonial period. Earlier, we had one Act called the "Conciliation Board Act", which is something similar to this Mediation Boards Act. But, apparently and unfortunately, we failed in our efforts under the Conciliation Board Act and after some time, that was abolished by the legislature. I also

must not forget to state to this august Assembly that the Conciliation Board failed basically due to interference by politicians. Especially when appointments were made as Members to the Conciliation Board, there were a lot of political interferences and pressure. When people who are involved in politics are appointed as Members to the Conciliation Board, people lose faith in that system. That was the main reason why it was abolished. Again, when there was a serious congestion in our courthouses. Under the normal laws of the country, the legislature thought that it was high time to make another effort to bring in a conciliation procedure. As a result, in 1988 this Mediation Boards Act was introduced and enacted. Certain statistics were mentioned by the Hon. Minister. Overall, there is no doubt. We can be satisfied with the performance of the Mediation Boards functioning in every part of the country. But, I must insist the fact that in the recent past, there were certain elements raising their ugly heads in relation to the appointment of members to the Mediation Boards. Sometimes politics is involved in Mediation Boards in certain areas. If it happens, again people will lose confidence. Therefore, it is the foremost responsibility cast upon the Ministry to ensure that all these appointments are made on an apolitical basis without any interference or influence. Otherwise, we might again and again fail in this system and people might lose their confidence in the system. Therefore, I urge the Government to ensure that everything is done on an apolitical basis because it is a part of the judicial process.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අප ජීවත් වන සමාජයේ විශේෂයෙන්ම බහුතර බෞද්ධ ජනතාවක් ජීවත් වන සමාජයේ උදේට අපි දවස පටන් ගන්නේ, "ගෙදර බුදුන් අම්මා" කියලායි. හැබැයි අපි එහෙම කිව්වාට අද සමාජයේ අම්මාට, තාත්තාට, වැඩිහිටියාට තිබෙන සැලකිල්ල අඩු වෙලා ගිහිල්ලා තිබෙනවා; පිරිහිලා ගිහිල්ලාත් තිබෙනවා. ඒක සමාජයේ සිද්ධ වන එක විපර්‍යාසයක් හේතුවෙන් සිදු වුණු දෙයක් නොවෙයි. කාලයක් තිස්සේ දිගින් දිගට සිද්ධ වෙන්න බලපාපු නොයෙකුත් හේතු සාධක පාදක කොට ගෙන සිද්ධ වුණු දෙයක් බව අපි දන්නවා. මේ වැඩිහිටියන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කරන්න මේ රටේ උත්තරීතර පාර්ලිමේන්තුව නීතියක් පනවන එක හොඳයි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට හිතෙන්නේ නැද්ද එක අතකින් අපට මෙහෙම නීති ගෙනෙන්න සිද්ධ වීමම මහා ඛේදවාචකයක් නොවෙයිද කියලා. හේතුව මේ රටේ කුමන ආගමකට අයිති කණ්ඩායමක්, ජන සමාජයක් වුණත් අම්මාට, තාත්තාට සැලකුවේ, වැඩිහිටියන්ට සැලකුවේ අපට කවුරුවත් කිසි නීතියකින් බල කරලා තිබුණු නිසා නොවෙයි. අපේ රටේ ආගමික පරිසරයත් එක්ක හැදිච්ච වැඩිච්ච, ගුණ ගරුක ගතිත් එක්ක මේ සමාජය නිරන්තරයෙන්ම වැඩිහිටියන්ට ගරු කරන ස්වභාවය තිබුණා. හැබැයි දැන් ඒ තත්ත්වය තරමක් අඩු වෙලා යන කොට ඒ කියන්නේ අපට මේ සභාවට නීතියක් ගෙනෙන්න වෙන්නෙම රටේ පවතින යම් වැදගත් කාරණයක් පිළිබඳව සමාජයේ පවතින සම්මුතියක්, සමාජයේ පවතින සිරිතක්, සමාජයේ පවතින සම්ප්‍රදායක් ජනතාව අනුගමනය කරන්නේ නැහැය කියලා පෙනෙන්නට තිබෙන කොටයි. අපට මතකයි මීට අවුරුදු දෙක, තුනකට කලින් නීතියක් සම්මත කළා ගෘහස්ථ පීඩනය -හිංසනය- වළක්වන්නට. ඒ කියන්නේ අපේ ගෙවල්වල එදා තිබුණු දෙන්නා දෙමහල්ලන්ගේ, දූ දරුවන්ගේ සමඟිය, සහෝදරත්වය, ඥාතිත්වය, ප්‍රේමත්වය, බැඳීම පිළිබඳව තැකීම සමාජයේ මිනිසුන්ගේ අඩු වන කොට මේ කාන්තා හිංසනය, දරුවන්ට ඇති කරන හිංසනය වැළැක්වීම සඳහා අපට නීති පනවන්නත් මේ සභාවේදී සිද්ධ වුණා. ඒ නිසා මේ නීති ගෙන ඒම වරදක්ය කියා මා කියන්නේ නැහැ. මෙම නීති ගෙන ඒම හොඳයි. හැබැයි මා මතු කරලා පෙන්වන්න උත්සාහ කරන කාරණය තමයි මේ වාගේ නීති ගෙනෙනවාය කියන්නේ අද සමාජයේ ඛේදවාචකයක් දකින්නට තිබෙනවාය කියායි. ඒ ඛේදවාචකය පෙන්නුම් කරන ලක්ෂණයක් තමයි මේ නීති ගෙන ඒම. සංස්කෘතික පඬිවරුන්ගේ කාලයේ ඉඳලා අපේ පැරණි කියමනක් තිබෙනවා. ඒ තමයි කෙනෙක් කොහේ හරි රටකට ගියාම ඒ රටේ මිනිසුන් කොච්චර සදාචාර සම්පන්න ජාතියක්ද, නැද්ද කියලා බලන්න හොඳ දර්ශකයක් තිබෙනවා; ඒ දර්ශකය අනුව ඒ රටේ ජනතාව ඒ රටේ ඉන්න දරුවන්ට, ඒ රටේ ඉන්න කාන්තාවන්ට සහ ඒ රටේ ඉන්න වැඩිහිටියන්ට කොච්චර හොඳට සලකනවාද, නැද්ද කියලා බලන්නට පුළුවන් කියලා. එතකොට ඒ රටේ ජනතාව, දරුවන්ට කාන්තාවන්ට හා වැඩිහිටියන්ට හොඳට සලකන බවක් පෙනෙන්නට තිබෙනවා නම් රටට අලුතෙන්ම ආපු කෙනාට, පළමුවැනි වරට ඒ රට දැකපු කෙනාට මතයක් ගොඩ නඟා ගන්නට පුළුවන්, ඒ රටේ ජනතාවගේ සදාචාර සම්පන්නභාවයේ ප්‍රමාණය ගැන. ඒක නිසා මේ කරන කර්තව්‍ය හොඳයි. ජනතාව ස්වයිනව, තම කැමැත්තෙන් මේ කටයුතු කරනවා නම් තමයි වැඩියත් හොඳ. නමුත් අපට එහෙම කර ගන්න බැරි තත්ත්වයට තල්ලු වෙච්ච නිසා, අද නීතියේ පිහිට, නීතියේ පිළිසරණ පතන්න සිද්ධ වෙච්ච තත්ත්වයක් උදා වෙලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සමථ මණ්ඩල (සංශෝධන) පනත් කෙටුම්පත හා වැඩිහිටි තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ (සංශෝධන) පනත් කෙටුම්පත යන පනත් කෙටුම්පත් දෙක ඒකාබද්ධ කරලා කථා කරන කොට මගේ පෞද්ගලික අත් දැකීමක් කියන්න කැමැතියි. මීට අවුරුදු හත අටකට කලින් දවසක මටත් නඩුවකට පෙනී සිටින්න හදිසියේ යන්න සිද්ධ වුණා කොළඹ මහේස්ත්‍රාත් අධිකරණයට. කොළඹ මහේස්ත්‍රාත් අධිකරණයේ ඒ නඩුව කැඳවපු වෙලාවේ කොයි විධියේ නඩුවක්ද කියලා මට කිසි අවබෝධයක් තිබුණේ නැහැ. වයසක දෙමහල්ලන්ගෙන් එක් කෙනෙක් හැරමිටියක් ඇතුව එක පැත්තකින් ආවා. බොහොම ලස්සනට ජේත්තුවට ඇඳ ගත්ත, ඉතා වටිනා ඔරලෝසු මුතු මැණික් ආභරණ පැළඳ ගත්ත, විශාල ධනවතුන් කියලා බැලූ බැල්මටම පෙනෙන, බොහොම වැදගත් විධියට පෙනෙන තරුණ මහත්තුරු තුන් දෙනෙක් ඇවිල්ලා විත්ති පක්ෂයෙන් හිට ගත්තා. මම ඒ නඩු වාරය ඉවර වුණාට පස්සේ, නඩුව කල් ගියාට පස්සේ ඒ නඩුවට පෙනී හිටපු නීතිඥ මහත්මයාගෙන් ඇහුවා මොකක්ද මේ නඩුව කියලා. එතකොට එතුමා මට කිව්වා, ඒ දරුවෝ තුන් දෙනා අර දෙමව්පියෝ දෙදෙනා නඩත්තු කරන්න කිසිදු උදව්වක් කරන්නේ නැති නිසා ඒ දෙමව්පියන්ට නඩත්තු ඉල්ලන්න උසාවියට එන්න සිද්ධ වෙලා කියලා. ඒ කාරණය නීතිඥතුමා මට ප්‍රකාශ කළා. ඒ වෙලාවේ මගේත් හදවත උණු වෙච්ච නිසා මටත් හැකි පමණින් ඒ වයසක දෙපළට ආධාරයක් කරලා තමයි මම ඒ උසාවියෙන් එළියට බැහැලා ආවේ. එදා මට විශාල කම්පනයක් දැනුණා අපි ජීවත් වන සමාජය මේ තරමටම පිරිහිලාද කියලා. ඒ තරුණ පුත්තු තුන් දෙනා ඇඳ පැළඳ ගෙන ආපු දේවල්වල වටිනාකම බැලුවත් රුපියල් ලක්ෂ ගණනක් වනවා. නමුත් දෙමව්පිය දෙදෙනා ජීවත් වීම සඳහා කීයක් හෝ ඉල්ලා අධිකරණයේ පිහිට පතා ගෙන ඇවිල්ලා දරුවන්ට විරුද්ධව නඩු ආලා තිබුණත් ඒ උදවිය කැමැත්තෙන් ශත පහක්වත් ගෙවන්නේ නැති තත්ත්වයක් ඒ නඩුවේ තිබුණා. ඒක නිසා තමයි ඒ නඩුව ඇදි ඇදී ගියේ. දෙමව්පියන්ට නීතිඥවරු මාර්ගයෙන් නඩත්තු මුදල් ලබා ගැනීම සඳහා දිගින් දිගටම අධිකරණවලට ගිහිල්ලා කාලය යොදවන්න අපි ඉඩකඩ සැලසීම ඉතාම අසාධාරණයි; අයුක්ති සහගතයි. ඒක නිසා මට යෝජනා කරන්න අවශ්‍යතාව තිබෙන්නේ මෙයයි. සමථ මණ්ඩලය වාගේ තැනකට ඒවා යොමු කරන්න පුළුවන් නම් හොඳයි. දරුවන්ගේ සුජාතභාවය තීන්දු කරන නඩත්තු නඩු ගැන නොවෙයි මම කියන්නේ. ජීවත් වීමට අපහසුකම් තිබෙන දෙමව්පියන්ට තමන්ගේ දරුවන්ගෙන් නඩත්තු ඉල්ලන්න අවස්ථා

[ගරු විජයදාස රාජපක්ෂ මහතා]

යෙදෙනවා නම්, ඒ අධිකරණ බලයත් සමථ මණ්ඩලයට යොමු කළොත් ඒ අහිංසක, අසරණ දෙමව්පියන්ට තමන්ගේ ගමේ පිහිටුවා තිබෙන සමථ මණ්ඩලයට ගිහිල්ලා නීතිය ගැන තර්ක විතර්කවලින් තොරව සානුකම්පිතව ඒ ප්‍රශ්න විසඳා ගැනීමේ හැකියාවක් ලබා ගැනීමේ අවස්ථාව තිබෙනවා. ඒක නිසා මම යෝජනා කරනවා සමථ මණ්ඩල ක්‍රමය ඒ දක්වා පුළුල් කරන්නට ඕනෑ කියලා. මම දන්නවා අද මේ සංශෝධනයේදී ඒක කරන්න බැරි බව. අපේ අධිකරණ ඇමතිතුමා මේ ස්ථානයේ සිටියා නම් හොඳයි. මම එතුමාගෙන් ඉල්ලා සිටිනවා මේ ගැන සලකා බලන්න කියලා.

අද ගරු අධිකරණ ඇමතිතුමාගේ කථාවේදී සඳහන් කළා අපේ සමථ මණ්ඩල පනත සමාජය, නැත්නම් අධිකරණ ක්‍රමය දියුණු කරන්න හොඳ ක්‍රමවේදයක් කියලා හුඟක් රටවල පිළිගෙන ඇගැයීමට ලක් වෙලා තිබෙනවා කියලා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ කාරණය මමත් පිළිගන්නවා. පසු ගිය දවස්වල ඉන්දියාවේ උත්තර ප්‍රදේශයේ ප්‍රාන්ත රාජ්‍යයේ නීතිපති දෙපාර්තමේන්තුවේ වග කිව යුතු නිලධාරින් කිහිප දෙනෙක් ඇවිල්ලා ලංකාවේ සමථ මණ්ඩල පනත ක්‍රියාත්මක වන ආකාරය පිළිබඳව මාත් එක්කත් දීර්ඝ වශයෙන් සාකච්ඡා කරලා විශාල අධ්‍යයනයක් කළා. මොකද, ඒ ගොල්ලන්ගේ අදහසක් තිබෙනවා ලංකාවේ ආකෘතියට අනුකූලව ඒ රටේ සමථ මණ්ඩල ක්‍රමයක් ඇති කර ගන්න.

ඒකෙන්ම අපට පිළිගන්න සිද්ධ වනවා, ජාත්‍යන්තර වශයෙන් සමථ මණ්ඩලයට පිළිගැනීමක් ලැබුණාය කියන කාරණය. ඒ වාගේම පසු ගිය වකවානුවේ සම්මේලනයකට නේපාලයට අපි ගිය අවස්ථාවේදී නේපාලයේ නීතිය පිළිබඳව බලධාරින් කිප දෙනෙක් අපිත් එක්ක සාකච්ඡා කළා. මොකද ඒ ගොල්ලෝත් දන්නවා, ලංකාවේ මේ සමථ මණ්ඩල ක්‍රමය ගැන. අද නේපාලයත් උනන්දුවක්, උත්සාහයක් දරනවා, ඒ රටටත් මේ සමථ මණ්ඩල ක්‍රමය හඳුන්වා දීම සඳහා.

විශේෂයෙන්ම මෙම සමථ මණ්ඩල පනත සඳහා අලුතින් ඇති කළ යුතු සංශෝධනයක් මම දකිනවා. පුද්ගලයන් අතර ඇති වන දේපළ පිළිබඳ ප්‍රශ්නවලට අමතරව -ඒ කියන්නේ දෙලක්ෂ පනස්දාහකට වඩා අඩු වටිනාකමකින් යුක්ත දේපළ -ඒ ඒ ප්‍රදේශවල ජීවත් වන ග්‍රාමීය ජනතාව මුහුණ පාන විශාල ප්‍රශ්න සංඛ්‍යාවක් තිබෙන්නේ පළාත් පාලන ආයතනත් එක්කයි. පළාත් පාලන ආයතනය තමන්ගේ ප්‍රදේශයේ කානු පද්ධතිය නඩත්තු කරන්නේ නැති වන කොට, මදුරු නාශක දියර ඉසින්නේ නැති වන කොට, ඩෙංගු රෝගය බෝ වන කොට, තමන්ගේ නිවස හදා ගන්න සැලසුමක් ඉදිරිපත් කරපුවාම ඒක අනුමත කරන්නේ නැති කොට, තමන්ගේ ඉඩම කැබලි කරන්න නගර සභාව නැත්නම් ප්‍රාදේශීය සභාව අනුමත කරන්නේ නැති කොට විශාල ප්‍රශ්නවලට මුහුණ පාන්න අද ජනතාවට සිද්ධ වෙලා තිබෙනවා. ඒක නිසාම අද ඒ ආයතනවල නිලධාරින් දැවැන්ත විධියට අල්ලස් ලබා ගැනීමේ ක්‍රමවේදයකට හුරු වෙලා තිබෙනවා. මම නියෝජනය කරන මහරගම ආසනයේ නගර සභාව ඒවා පිළිබඳව හුඟක්ම නරක විධියේ ප්‍රචාර, නරක විධියේ හැඟීමක් ජනතාව අතර ඇති කර තිබෙන නගර සභාවක්. අල්ලසක්, පගාවක් නොදී කිසිම දෙයක් කර ගන්න බැරි නගර සභාවක් බවට මුළු රටේම ප්‍රචලිත වෙලා තිබෙනවා. මේ වාගේ කාරණයක් සම්බන්ධව රිට් අධිකරණ බලය ක්‍රියාත්මක කරන්න ජනතාවට එක්කෝ යන්න වන්නේ මහාධිකරණයට. එහෙම නැත්නම් අභියාචනාධිකරණයට. මේක දීර්ඝ නඩු ක්‍රමයක්. මේ සඳහා ප්‍රවීණ නීතිඥවරුන්ගේ සහාය බොහෝ විට වුවමනා වනවා. බහුතරයක් ජනතාවට ඒ ක්‍රමය දරන්නේ නැති, ඔරොත්තු දෙන්නේ නැති තත්ත්වයකට අද පත් වෙලා තිබෙනවා. නගර සභාවක්, ප්‍රාදේශීය සභාවක්, මහ නගර සභාවක් බැඳිලා ඉන්නවා ජනතාවගේ මූලික අයිතිවාසිකම් ඉෂ්ට කරන්න. ජනතාවගේ සෞඛ්‍ය පිළිබඳව කාරණාවලදී ආරක්ෂාව ලබා දීම, ගොඩනැඟිලි ඉදි කිරීම්වලදී අනුමැතිය ලබා දීම වාගේ අවස්ථාවලදී ඒ ප්‍රදේශයේ ජනතාවට යුක්තිය, සාධාරණය ඒ නගර සභාව ඉෂ්ට කරන්නේ නැත්නම්, ග්‍රාම නිලධාරිවරයා ඉෂ්ට කරන්නේ නැත්නම්, අධිකරණයට යෑම ඉතාම දුෂ්කර කාර්යයක් නිසා, සාම මණ්ඩලයට නැත්නම් සමථ මණ්ඩලයට ඒ අධිකරණ බලය ලබා දිය යුතුයි කියන යෝජනාව මම ඉදිරිපත් කරනවා. අධිකරණ අමාත්‍යාංශයේ නිලධාරින් අද ඇවිල්ලා ඉන්නවා. ඒ උදවියගේ අවධානයට මේ කරුණ යොමු කරනවා. ගරු ඇමතිතුමාගේ අවධානයට යොමු කරනවා, එවැනි යෝජනාවක් රටට අත්‍යවශ්‍ය, ඉතාම හදිසි තත්ත්වයක් විධියට සලකලා මේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන්න කියලා. විපක්ෂයේ අපි, එවැනි සාධනීය හොඳ වැඩවලට සහයෝගය දෙන්න නිතරම සැදී පැහැදී ඉන්නවා.

ඒ එක්කම වැඩිහිටියන් සම්බන්ධව අපි සාකච්ඡා කළා. එන්න එන්න මේ රටේ වැඩිහිටියන්ගේ ප්‍රතිශතය වැඩි වීම අපට විශාල බරක් වනවා කියලා ගරු ඇමතිවරුන්, මන්ත්‍රීවරුන් කිව්වා. අපි ඇත්තටම මානුෂික විධියට කල්පනා කරන කොට, කථා කරන කොට ඒ "බරක්" කියන වචනය පාවිච්චි කරන්න සුදුසු නැහැ කියන එක තමයි මගේ හැඟීම. මොකද, අද වැඩිහිටියෝ කියන්නේ එදා තරුණ ජවයකින් යුතුව මේ රට ගොඩ ගන්න කටයුතු කරපු, කාගේත් ප්‍රසාදයට ගෞරවයට පාත්‍ර විය යුතු ජනතාවක් නිසා. ඒ ජනතාව වැඩිහිටි තත්ත්වයට පත් වන කොට, "ඒක අපට බරක්" කියලා කියනවා නම් ඒ ජනතාවගේ හිත් රිදීමක් එතැනම සිද්ධ වනවා. අපි කියන්නේ ඒක බරක් නොවෙයි කියලායි. ඒ උදවියගේ සුව විහරණය ඇති කිරීම සඳහා, සුබසාධනය ඇති කිරීම සඳහා අපි විශාල කැප කිරීමක් කරන්නට ඕනෑ. දැන් දවස් තුනකට කලින් පුවත් පතක ප්‍රකාශයක් දාලා තිබුණා මම දැක්කා, එක කාන්තාවකගේ ඡායාරූපයකුත් එක්ක. ඒ වයසක අම්මාට අවුරුදු 90ක් විතර වනවා. අපේ රටේ සමාජ සේවා අමාත්‍යාංශයෙන් පිං පඩියක් කියා එකක් ගෙවනවා. ඒ අම්මාට පිං පඩිය හැටියට ගෙවන්නේ රුපියල් 100යි. එහෙම වැඩිහිටියෝ ඉතා සුළු කොටසක් තමයි අපේ රටේ ඉන්නේ. රුපියල් 100ක් වාගේ මුදලක් නම් අප ගෞරව කරන්න ඕනෑය කියන මේ රටේ වැඩිහිටියාට ගෙවන්නේ, අපි ඒ ගැන දුක් වන්න ඕනෑ; ඒ සම්බන්ධව අප කනගාටු වන්න ඕනෑ. අනවශ්‍ය නොයෙකුත් දේවලට රුපියල් කෝටි ගණන් වැය කරන, විනාශ කරන කටයුතුවල යෙදෙමින් දිගින් දිගටම පැවැති ආණ්ඩු වැඩිහිටියා කෙරෙහි නිසි ගෞරවය, නිසි සැලකිල්ල දක්වා නැහැයි කියන එකට මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඊට වැඩිය හොඳ උදාහරණයක් ගෙනෙන්න මට නම් බැහැ. ඒ වාගේ වැඩිහිටියන්ට ජීවත් වන්න පුළුවන් සාධාරණ මුදලක් -පිං පඩිය කියන නම වෙනස් කරලා- ලබා දෙන්න කටයුතු කරන්න. ඒක පිනට දීමක් නොවෙයි. වැඩිහිටි ජනතාව යෞවන කාලයේ මේ රට සරුසාර කරන්න, සංවර්ධනය කරන්න කටයුතු කළ නිසා ඒකෙන් උපයන දෙයක් ඒ ගොල්ලන්ට ගෙවන කොට ඒක ගෙවිය යුත්තේ පිං පඩියක් හැටියට නොවෙයි. ඒක මේ රටේ ජනතාවට අයිති දෙයින් ගෙවන්නේ. අපි ගෙවන්නේ ඒ උදවිය කරපු සේවයට ප්‍රසාදයක් වශයෙනුයි. සමහර වෙලාවට රජයේ රැකියාවක් කරලා පඩියක් ගත්තේ නැති වන්න පුළුවන්. පෞද්ගලික අංශයේ කර්මාන්තශාලාවක සේවය කරලා වැටුපක් ගත්තේ නැතිවන්න පුළුවන්. නමුත් ඒ වැටුප් ඉපැයූ උදවියට වඩා වැඩි සේවයක් කරපු රටට වටිනා දූ දරුවෝ දායාද කරපු, රටේ මහ පොළොවේ සම්පත් දියුණු කරලා රටේ කෘෂිකර්මය, ආර්ථිකය සංවර්ධනය කරපු උදවිය තමයි අපි වැඩිහිටි උදවිය කියලා වැඩි වශයෙන් කථා කරන්නේ. ඒ උදවියට කරන උපකාරය පිං පඩියක් නොවෙයි. ඒක ඒ උදවියට ලැබිය යුතු අයිතිවාසිකමක්. ඒ අයිතිවාසිකම තහවුරු කරන්න මේ රටේ මිලියන 20ක් නියෝජනය කරන මේ උත්තරීතර සභාවේදී සියලුම මන්ත්‍රීවරුන්ට වග කීමක්, යුතුකමක් තිබෙනවා. ඒ කාරණය පිළිබඳව අවධානය යොමු කරවලා - [බාධා කිරීමක්] මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ කාලයෙන් අඩු කර ගෙන මට තව විනාඩි 3ක් විතර දෙන්න.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
උදය වරුවේ වෙලාව ඔක්කොම අඩු වූ නිසා පුළුවන් තරම් ඉක්මනට, මිනිත්තු දෙකකින් අවසාන කරන්න.

**ගරු විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. Wijeyadasa Rajapakshe)
හොඳයි මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විනාඩි 3යි.

ඒ උදවිය විතරක් නොවෙයි තවත් අය සිටිනවා. විශේෂයෙන්ම ගොවීන් වාගේ අයටත් විශ්‍රාම යන්න අවුරුදු 60ද, 70ද කියා වයසක් නැහැ. දේශපාලනඥයන්ට වාගේම තමයි. පුළුවන් තාක් කල් වැඩ කරන්න පුළුවන්. හැබැයි යම් කිසි බැරි දවසක් එන විට අපේ රටේ ගොවියෝ, ධීවරයෝ, කම්කරුවෝ විශ්‍රාම යනවා. එතකොට ඒ උදවියත් අපි නඩත්තු කරන්න ඉන්න වැඩිහිටි ගොඩට එකතු වනවා. අපි ඒ දේ කරන්න අවශ්‍ය වන්නේ නැහැ, කල් ඇතුව සැලසුමක් හදලා ගොවීන්ට, කම්කරුවන්ට, ධීවරයන්ට ඒ ගොල්ලන්ගේ සැදෑ සමය ගත කරන්න අවශ්‍ය ප්‍රමාණයේ ආදායමක් ලැබෙන විශ්‍රාම වැටුප් ක්‍රමයක් සාර්ථකව ක්‍රියාත්මක කර තිබෙනවා නම්. එහෙම වුණොත් ඒ පිළිබඳව සමාජයට අලුතෙන් බරක් ඇති වන්නේ නැහැ.

ඒ එක්කම අනෙකුත් ක්ෂේත්‍රත් තිබෙනවා. පළමුව කලා ක්ෂේත්‍රය ගනිමු. විශේෂයෙන්ම චිත්‍රපට කලාව, සංගීත කලාව වැනි නොයෙකුත් කලා ක්ෂේත්‍රයන් තිබෙනවා. කලා ක්ෂේත්‍රයෙත් වැඩිහිටියන් බවට පත් වන අයට කිසිම හව්හරණක් නැහැ. අප දන්නවා, එදා මේ රටේ සම්පත් විධියට සලකපු කලාකරුවෝ වයසට යන කොට ඉන්න හිටින්න තැනක් නැතුව, කන්න බොන්න ආහාර ටිකක් ගන්න බැරුව දුක්ඛිත තත්ත්වයට පත් වුණ බව. මේ කාරණය දිගින් දිගටම සමාජයේ අවධානයට යොමු වූ කාරණයක්. ගොවීන්, ධීවරයන්, කම්කරුවන් කියන අයට වැඩිය මේ උදවියගේ මේ කාරණය පිළිබඳව සමාජයේ සංවාදයක් තිබුණා. මේ සංවාදයේදී මා යම් දෙයක් දැක්කා. පසු ගිය අවුරුදු 25, 30දීම කලාකරුවෝ, සංගීතඥයෝ, නළු නිළියෝ එකතු වුණා, ඒ උදවියේ අනාගත අයිතිවාසිකම් ආරක්ෂා කරන්න ඒ අය සංවිධාන හැදුවා. ඒ සංවිධානවල සභාපති කෙනෙක්, ලේකම් කෙනෙක් පත් වනවා. මොකක් හෝ ආණ්ඩුවක් ආවාම ඒ සභාපතිට උපදේශකකමක් හම්බ වනවා. ලේකම්ට යම් කිසි ආයතනයක සභාපතිකමක් හම්බ වනවා. එතැනින් ඒ සංවිධානය අවසානයට පත් වනවා. හැම දාම අපේ රටේ කලාකරුවන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කරන්න පිහිටුවූ වූ කලා සංවිධාන සියල්ල අවසන් වෙලා තිබෙන්නේ ඔන්න ඔය ක්‍රමයටයි. ඒ නිසා ජාතික වැඩ පිළිවෙළක් විධියට මේ සියලු දෙනාගේම අනාගත සුරක්ෂිතතාව ඇති කරන්න ඕනෑ. විශේෂයෙන්ම තව අවුරුදු 15ක්, 20ක් යන විට ලංකාවේ වැඩ කරන ජනතාවට වැඩිය විශ්‍රාම ගන්නා ජනතාවගේ ප්‍රමාණය වැඩි වන නිසා දැන්ම කටයුතු කර අලුත් වැඩ පිළිවෙළක් ඇති නොකළොත් අපට අනාගතයේදී විශාල ගැටලුවලට මුහුණ පාන්න සිද්ධ වනවාය කියන කාරණය මතක් කර දෙමින්, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා හට වැඩිපුර කාලයක් ලබා දීම පිළිබඳව ඔබතුමාට ස්තුතිවන්ත වමින් මා නිහඬ වනවා.

[අ. භා. 5.08]

**ගරු වයි.ජී. පද්මසිරි මහතා**
(மாண்புமிகு வை.ஜீ. பத்மசிரி)
(The Hon. Y.G. Padmasiri)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද ඉදිරිපත් වී තිබෙන මේ සංශෝධන පනත් කෙටුම්පත් දෙක අතුරින් වැඩිහිටි තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ (සංශෝධන) පනත් කෙටුම්පත පිළිබඳව ඉතාම කෙටියෙන් කරුණු කීපයක් සඳහන් කරන්න මා බලාපොරොත්තු වෙනවා. විශේෂයෙන්ම, "පෙරදිග" කියන්නේ වැඩිහිටියන්ට සැලකීම පිළිබඳව තිබෙන උතුම් ගුණාංගයන්, සාර ධර්මයන් බොහොම දීර්ඝ කාලයක් තිස්සේ පිළිපැදපු ජනතාවක් ජීවත් වන කලාපයක්. ඒ වාගේම ශ්‍රී ලංකාවේ අපිටත් ඒ දීර්ඝ ඉතිහාසයේ උරුමය තිබෙනවා. අද නීතිරීති මඟින් වැඩිහිටියන් රැක බලා ගැනීම සොයා බැලීම දක්වා පසු බැසීමට සිද්ධ වෙලා තිබෙනවා. එදා කෘෂිකාර්මික සමාජයේ මේ ගැටලුව තිබුණේ නැහැ. නමුත් අද එදාට වඩා සංකීර්ණ තත්ත්වයක් ඇති වෙලා තිබෙනවා. මෑත යුගයේ -මේ දශක එකහමාර තුළ- මේ වැඩිහිටි ජනගහනයේ අනාගතය දිහා බලා නීති සකස් කිරීමට මේ රටේ නීති සම්පාදන අංශයට උනන්දුවක් ඇති වීම හා ඒ පිළිබඳව ඔවුන්ගේ අවධානය යොමු වීම අපි ඉතාම අගය කරනවා. ඉදිරි දශක දෙකක පමණ කාලය වන විට මේ ගැටලුව එන්න එන්නම වැඩි වෙනවා. ඉතින් ඒකට මුහුණ දීමට අවශ්‍ය ව්‍යුහයක් දැන් සකස් වෙමින් පවතිනවා. අන්න ඒක තවත් ශක්තිමත් කිරීමක් හැටියටයි මා මෙම සංශෝධනය දකින්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, වැඩිහිටියන් සම්බන්ධව කථා කරන කොට, ඔවුන් සඳහා වැඩිහිටි නිවාස රාශියක් තිබෙන බව අපට පෙනෙනවා. සමාජ සේවා අමාත්‍යාංශය යටතේ, ස්වේච්ඡා සමාජ සේවා සංවිධාන (ලියාපදිංචි කිරීම හා අධීක්ෂණය) පනත යටතේ ලියා පදිංචි වූ වැඩිහිටි නිවාස රාශියක් තිබෙනවා. ඒ සම්බන්ධයෙන් මට තිබෙන අත් දැකීම මේකයි. එවැනි ස්වේච්ඡා සංවිධානයක් හැටියට 1990 දී රුවන්වැල්ල ශ්‍රී සෝමරතන වැඩිහිටි අසරණ සරණ සමිතිය ලියා පදිංචි කරලා වැඩිහිටි නිවාසයක් ආරම්භ කළා. එහි දැන් අම්මලා තාත්තලා දෙකොටසම 30ක් පමණ ඉන්නවා. මෙය ආරම්භ කරලා දැන් වසර විස්සකටත් වැඩි කාලයක් ගත වෙලා තිබෙනවා. මේ නිවාසය පටන් ගැනීමේදී අපි පළමුව බැලුවේ ගොඩනැඟිල්ලක් ගැන නොවෙයි. ඒක පටන් ගත්තාට පස්සේ එහි පාලක පාලිකාවන් හැටියට, උපස්ථායකයින් හැටියට ඒ අය පුහුණු කර ගන්නේ කොහොමද කියන එක ගැනයි බැලුවේ. ගොඩනැඟිල්ලක් තිබුණාට වැඩක් නැහැ; මේ අහිංසක පිරිස් නිවාසගත කර ගත්තාට වැඩක් නැහැ, ඒ අය රැක බලා ගැනීමේදී ප්‍රශ්න ඇති වෙනවා නම්. එහිදී ඒ අය රැක බලා ගැනීම පිළිබඳව පුහුණුවක් ලබා ගැනීම සම්බන්ධ ගැටලුවට අප මුහුණ දුන්නා. ඒ නිසා මම මේ අවස්ථාවේ සඳහන් කරන්න කැමැතියි, වැඩිහිටි මහ ලේකම් කාර්යාලයට යෝජනා කරන්න කැමැතියි, ඒ වැඩිහිටි නිවාසවල උපස්ථායක සේවයේ යෙදිලා ඉන්න අයට වරින් වර යම් සේවාස්ථ පුහුණුවක් ලබා දිය යුතුයි කියලා. මොකද ඔවුන්ට විවිධ දේ ඉගෙන ගන්න වෙනවා. කෑම ටික දීම, නාවන එක, ඇඳුම් ටික දීම පමණක් නොවෙයි, ඒ අයගේ මනස හරිහැටි තේරුම් අරගෙන ඒ මනස සුවතාවකින් -සනීපෙන්- තියන්න, නිරෝගීව තියන්න, ඒ වාගේම ඒ අයට අවශ්‍ය සැලකිලි නිසි පරිදි කරන්න යම් දැනුමක් අලුත් කර කර දෙන්න ඕනෑ. අන්න ඒ කාර්ය භාරය මේ ආයතනය මඟින් සිදු විය යුතුය කියලා අපි කල්පනා කරනවා.

අද පළාත් සභා මඟින් යම් යම් නිවාස ආධාර වැඩසටහන් ක්‍රියාත්මක කරනවා. මා නිවාස අමාත්‍යාංශය භාරව සිටියදී යම් වැඩ පිළිවෙළක් යෝජනා කළා, මුදල් කොමිෂන් සභාවෙන්. "සරණ සෙවණ" නමින් එම වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කළා. එතැනදී තෝරා ගත්තේ මහ ජන ආධාර ලබන වැඩිහිටියන්. ඒ වැඩිහිටියා ජීවත් වන නිවසේ, ඔහු ජීවත් වන කාමරයේ අඩු පාඩු සකස් කර ගැනීමට මුදලක් -ආධාරයක්- අප දුන්නා. ඒ විධියට මට මතක හැටියට 2005 වර්ෂයේ රුපියල් 25,000ක මුදලක් දුන්නා. ඉතින් ඒ 25,000 දීලා මදි. පහසුකම් ඇති වැසිකිළියක් කාමරයටම අල්ලලා හදන්න, එහෙම නැත්නම් තෙමෙන තැනක් නම් තෙමෙන වහලය වෙනුවට අලුත් වහලක් හදා ගන්න, ඒ වැඩිහිටි අය ඉන්න තැන පමණක් -වැඩිහිටියාගේ කාමරය පමණක්- සකස් කිරීමටයි ඒ 25,000ක මුදල දුන්නේ. ඒකට ගමේ යම් සංවිධානයක්, පිරිසක් සම්බන්ධ කරලා දුන්නාම ඒක තවත් හොඳට කර ගන්න පුළුවන්.

[ගරු වයි.ජී. පද්මසිරි මහතා]

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද වසම් මට්ටමින් වැඩිහිටි සංවිධාන රාශියක් පිහිටුවලා තිබෙනවා. ඒකත් ඉතාම අගය කළ යුතු දෙයක්. නිවසින් නිවසට හුදකලා වෙලා -තනි වෙලා- හිටපු වැඩිහිටියන්, වසම් මට්ටමින් පිහිටුවා තිබෙන වැඩිහිටි සංවිධානවල අද බොහොම සන්තෝෂයෙන්, ඒ සම වයසේ කණ්ඩායම් එක්ක එකට කටයුතු කරනවා දකින්න ලැබෙනවා. සමහර තැන්වල ඉතාම සාර්ථක වැඩිහිටි සංවිධාන තිබෙනවා. මේ ක්‍රමය තවත් දියුණු කරන්න ඕනෑ.

මේ වැඩසටහනේ තිබෙන වෛද්‍ය සායන මා දැක්කා. මේ වෛද්‍ය සායන පැවැත්වීමේදී දේශීය වෛද්‍ය අමාත්‍යාංශයත් එක්ක සාකච්ඡා කරලා, ඒ වෛද්‍ය සායන වැඩිහිටි නිවාසවලටම ලබා දෙන්න අපට පුළුවන්කම තිබෙනවා. ඒ වාගේම රෝහල් සේවය වුණත්, වරින් වර ඒ වැඩිහිටි නිවාසවලටම ඇවිල්ලා වෛද්‍ය සේවාවක් පවත්වනවා නම් ඉතාම සුදුසුයි. ඒක වැඩිහිටි ජනතාවට ඉතා විශාල සහනයක්.

අවසාන වශයෙන් මා මතක් කරන්න කැමැතියි, ඒ වැඩිහිටියන්ට නිදහස, රැකවරණය ලැබෙනවාත් එක්කම මේ හැඳුනුම් පත ලබා දීමෙන් වැඩිහිටියන්ට වැඩක් වනවාද කියන එක ගැන සැකයක් තිබෙනවාය කියලා. රජයේ කාර්යාලවල හා ආයතනවල මේ හැඳුනුම් පතට දක්වන සැලකිල්ල ඉතාම මදියි; වැඩිහිටි හැඳුනුම් පත කියලා විශේෂ සැලකිල්ලක් දක්වන්නේ නැහැ. එම නිසා එය තවත් හැඳුනුම් පතක් පමණයි.

තමන්ගේ දෙමවුපියන් කුමන ආගමකට අයත් වෙලා සිටියත් හැම ආගමකින්ම වැඩිහිටි සැලකිල්ලට ඉහළම තැනක් දීලා තිබෙනවා. පුංචි අවධියේම ගෙදර පරිසරය තුළ වැඩිහිටියන්ට සැලකීම පිළිබඳව හිතට ඇතුළු වුණාම ඒක මුළු ජීවිතයටම පවතින දෙයක්. එම නිසා මේ ගුණාංගය, වැඩිහිටියකු දැක්කාම මේ හැඳුනුම් පත තිබුණත්, නැතත් ඒ වැඩි හිටියාට සැලකිල්ලක් දැක්වීම අපේ රාජ්‍ය සේවය තුළත්, ආයතන තුළත් ඇති විය යුතුයි. මේ තත්ත්වය පිළිබඳව ජාතික වශයෙන් අපේ අවධානය යොමු විය යුතුයි කියලා මා මතක් කරමින්, විශේෂයෙන් මේ සංශෝධන පනත් කෙටුම්පත තුළින් ඒ වැඩ පිළිවෙළ ශක්තිමත් කිරීමට ගෙන ඇති පියවරයන් පිළිබඳව අගය කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා. ස්තුතියි.

[பி.ப. 5.15]

**ගරු එස්. ශ්‍රීතරන් මහතා**
(மாண்புமிகு சி. சிறீதரன்)
(The Hon. S. Shritharan)

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, முதியோர்களுக்காகக் கொண்டுவரப்படும் ஒரு சட்டமூலம் தொடர்பாகப் பேசுவதற்கு இந்த இடத்திலே ஒரு வாய்ப்புத் தந்தமைக்காக நன்றி. இலங்கையிலே பெரும்பாலான முதியவர்கள் பராமரிப்பில்லாது அந்தரிப்பதை அவதானிக்க முடிகின்றது. உலக நாடுகளில் முதியோர்களுக்கு உரிய கௌரவம் அளிக்கப்படு கின்றது. அதேபோல இலங்கையில் முதியோர்களுக்குச் சரியான முறையில் கௌரவம் வழங்கப்படுகின்றதா என்பதை நாம் பார்க்கின்றபொழுது, அவ்வாறு கௌரவம் வழங்கப்படுவதில்லை என்பதே சரியான கருத்தாகத் தெரிகின்றது. எனக்கு முன்னர் பேசிய கௌரவ உறுப்பினர் விஜயதாச ராஜபக்ஷ அவர்களும் இக்கருத்தையே மேலோட்டமாகக் குறிப்பிட்டிருந்தார். இலங்கையிலே முதியவர்கள் சரியான முறையிலே பாராமரிக்கப் படாமல் இருப்பதுதான் இந்தச் சட்டத் திருத்தத்தைக் கொண்டுவர வேண்டிய தேவையை ஏற்படுத்தியிருக்கின்றது. முதியவர்களுக் காக இலங்கையிலே மேற்கொள்ளப்படுகின்ற நலன்புரி நடவடிக்கைகள் சரியான முறையில் மேற்கொள்ளப்படுவதில்லை என்பதையும், எல்லா இடங்களிலும் இருக்கின்ற முதியவர்கள் சரியான முறையிலே பராமரிக்கப்படுவதில்லை என்பதையும் இந்தச் சபை முதலிலே ஏற்றுக் கொள்ள வேண்டும்.

இன்று வடக்கு, கிழக்குப் பகுதிகளிலே யாருமற்றவர்களாகப் பத்தாயிரத்துக்கும் மேற்பட்ட முதியவர்கள் இன்னோரன்ன துன்பங்களோடு தங்களுடைய வாழ்க்கையை நடத்திக் கொண்டிருக்கின்றார்கள். இவர்களில் பலருடைய பிள்ளைகள் சிறைச்சாலைகளிலே கைதிகளாக வாழ்ந்துகொண்டிருக்கின்ற அதேநேரத்தில், பலபேர் காணாமற்போயிருக்கின்றார்கள். காணாமற்போன பிள்ளைகளோடு, சிறைச்சாலைகளிலே அரசியல் கைதிகளாக இருக்கின்ற பிள்ளைகளையும் நினைத்து இன்று வாடுகின்ற இந்த முதியவர்கள் உளரீதியாகவும் உடல்ரீதியாகவும் பாரிய அளவான துன்பங்களோடு மிகவும் மனம் நொந்தவர்களாக வாழ்ந்து கொண்டிருக்கின்றார்கள். ஆகவே, வடக்கு, கிழக்குப் பகுதிகளிலே இருக்கின்ற இந்த முதியவர்களுடைய மனங்களிலும் அவர்களுடைய வாழ்க்கையிலும் மாற்றங்களை ஏற்படுத்த வேண்டுமாயின், அவர்கள் தங்களுடைய பிள்ளைகளைப் பார்க்கின்ற வகையிலும் பிள்ளைகள் தங்களுடைய பெற்றோரைப் பராமரிக்கின்ற வகையிலும் சிறைச்சாலைகளிலே இருக்கின்ற தமிழ் அரசியல் கைதிகளை விடுதலை செய்ய வேண்டியது இந்த அரசாங்கத்தின் ஜனநாயகக் கடமையாகும். பிள்ளைகளைச் சிறையிலே அடைத்து வைத்திருப்பதனால் அந்தப் பெற்றோர்கள் நாளாந்தம் அந்தப் பிள்ளைகளை எண்ணி வேதனைப்படுகின்ற ஒரு சூழலையே இன்று வடக்கு, கிழக்குப் பகுதிகளிலே நாங்கள் பார்க்கின்றோம். மனோரீதியாகவும் உடல்ரீதியாகவும் பாதிக்கப் பட்டிருக்கின்ற இந்தப் பெற்றோர்களுடைய மனங்களில் மாற்றங்களைக் கொண்டுவருவதற்காகவே இன்று வன்னிப் பகுதியிலேகூட பல இடங்களில் வீட்டுத் திட்டங்கள் அறிமுகப்படுத்தப்பட்டிருக்கின்றன. ஆனால், அங்கு குடும்பமாக இருப்பவர்களுக்கு மட்டுமே அந்த வீட்டுத் திட்டத்தில் இடம் வழங்கப்படுகின்றது. அதாவது, அறுபது வயதுக்கு மேற்பட்ட அம்மாவும் அப்பாவும் தனிமையாக இருந்தால் அவர்களுக்கு அந்த வீட்டுத் திட்டம் இல்லையென அதிகாரிகளால் தெரிவிக்கப் பட்டிருக்கின்றது. ஆனால், அவர்களின் பிள்ளைகள் போரிலே இறந்தும் சிறைகளிலே வாடிக்கொண்டும் அல்லது காணாமல் போயும் இருக்கின்ற அதேநேரத்தில், அந்தப் பெற்றோரைப் பராமரிப்பதற்கு முறையான பராமரிப்பு நிலையங்களும் இல்லாத நிலைமையே இருக்கின்றது. அவர்கள் இடம்பெயர்ந்து போவதற்கு முதல் நல்லதொரு வீட்டில், தங்களுடைய பிள்ளைகளின் பராமரிப்பில்தான் வாழ்ந்து கொண்டிருந்தார்கள். ஆனால், திரும்பவும் அவர்கள் தங்கள் வீட்டிற்கு வந்து வாழ்வதற்கு அவர்களுக்கு வீடு இல்லை; பிள்ளைகளும் இல்லை; அவர்கள் இன்று அநாதரவாக விடப்பட்டிருக்கின்றார்கள். ஆகவே, பாதிக்கப்பட்ட முதியவர்களுக்கு அதிலும் குறிப்பாக வன்னிப் பெருநிலப்பரப்பிலே தங்களுடைய வீடுகள் இல்லாத, அந்த வீட்டுத் திட்டம் மறுக்கப்பட்ட வயோதிபர்களுக்கு அந்தத் திட்டத்தின்மூலம் வீட்டை வழங்கி, அவர்களும் இந்த நாட்டில் பேணப்படுகின்ற பிரஜைகளாக வாழ்வதற்கான சந்தர்ப்பம் இந்தப் பாராளுமன்றத்தின் ஊடாக வழங்கப்பட வேண்டும்.

ஆதரவற்ற முதியோருக்குக் கடந்த இருபது ஆண்டுகளுக்கு முதல் வழங்கப்பட்ட 100 ரூபாய் உதவுதொகை மட்டுமே இப்பொழுதும் இலங்கை பூராவும் வழங்கப்படுகின்றது. அதைக் கிராமங்களிலே "பிச்சைச் சம்பளம்" என்று சொல்வார்கள். ஆனால், இன்று இருபது ஆண்டுகள் கடந்த பின்னர் வாழ்க்கைச் செலவு வீக்கத்தினால் எவ்வளவோ துன்பங்களுக்கு மத்தியில் மக்கள் வாழ்கின்றபோது முதியோருக்கு வழங்கப்படும் இந்த உதவுதொகை போதாது. சாதாரணமாக ஒரு பத்து கிலோ மீற்றர் தூரம் பஸ் பயணம் செய்வதற்குக்கூட அந்த 100 ரூபாய் பணம் போதாது. ஆகவே, இலங்கையிலே அந்த உதவு தொகையை ஆகக்குறைந்தது 500 ரூபாவுக்குக் குறையாமல் நிர்ணயிக்க வேண்டும். அதை இந்த உயர்ந்த சபை தன்னுடைய கவனத்திலே எடுக்க வேண்டும். அதனூடாக அந்த வயோதிபர்களுடைய

வாழ்க்கையிலே அல்லது அநாதரவாக இருக்கின்ற பெற்றோர்களுடைய வாழ்க்கையிலே எங்களால் சில மாற்றங்களை ஏற்படுத்திக் கொடுக்க முடியும்.

வடக்கு, கிழக்கிலே மிக முக்கியமாக வவுனியாவிலே கோயில்குளம் என்கின்ற பகுதியில், கோயில் குளம் சிவன்கோயில் ஆலய நிர்வாகத்தால் வயோதிபர் பராமரிப்பு நிலையம் ஒன்று சிறந்த முறையில் பேணப்பட்டு வருகின்றது. அதுபோல யாழ்ப்பாணத்திலே சித்தன்கேணியிலே துர்க்கையம்மன் ஆலய நிர்வாகத்தினரால் 'சிவபூமி' என்கின்ற முதியோர் பராமரிப்பு இல்லம் நடத்தப்படுகின்றது. அதேநேரம் கைதடியிலே அரச முதியோர் பராமரிப்பு நிலையம் காணப்படுகின்றது. இதேபோல வன்னிப் பெருநிலப்பரப்பிலே உள்ள கிளிநொச்சி மாவட்டத்தில் அமைந்துள்ள வன்னேரிக்குளம் பகுதியிலே "யோகர் சுவாமிகள் திருவடி நிலையம்" என்ற இல்லத்தில் ஏற்கெனவே கிட்டத்தட்ட 250க்கும் மேற்பட்ட வயோதிபர்கள் பராமரிக்கப்பட்டு வந்தார்கள். அது ஒரு "மூதாளர் பேணலகம்" என்ற அடிப்படையில் அங்குள்ள வயோதிபர்களுக்குத் தேவையான சகல வசதிகளும் செய்து கொடுக்கப்பட்டு, 5 ஏக்கருக்கும் அதிகமான பரப்பளவுகொண்ட பரந்த காணிப்பகுதியிலே அவர்கள் சுதந்திரமாக வாழ்ந்து வந்தார்கள். யுத்தம் காரணமாக அவர்கள் அங்கிருந்து இடம்பெயர்ந்து சென்று இப்பொழுது திரும்பவும் அந்த இடத்துக்கு வந்தபொழுது, அந்த இடம் முதியோர் பராமரிப்பு நிலையத்துக்கு வழங்கப்படாது இன்றுவரையில் இராணுவ முகாமாகவே இருக்கின்றது. தமிழ்ப் பகுதியிலுள்ள அந்த நிலப்பரப்பிலே முதியவர்கள் வாழ்வதற்காக அமைக்கப்பட்டிருந்த ஒரு முதியோர் இல்லத்தில் தமது வாழ்க்கையின் கடைசிக்காலங்களில் ஓய்வாக, சுதந்திரமாக வாழ்வதற்கு அனுமதி வழங்காது தடுக்கப்படுகின்ற அநியாயத்தை நினைத்து அம்முதியோர் வெந்து கொண்டிருக்கின்றார்கள். எனவே, வன்னேரிக்குளம் யோகர் சுவாமிகள் திருவடி நிலையத்தின்மூலம் பராமரிக்கப்பட்டுவரும் பிள்ளைகள் இல்லாத நிலையிலுள்ள பல பெற்றோர்களைக் கொண்ட வயோதிபர் இல்லத்தை மீண்டும் அவர்களிடம் ஒப்படைக்க வேண்டுமென நான் இந்த உயரிய சபையினூடாக வேண்டிக் கொள்கின்றேன்.

இதேபோலவே நாங்கள் இன்று இலங்கையிலே மாற்றுத் திறனாளிகள் பலரைப் பார்க்கிறோம். யுத்தத்திற்கு முன்னர் பல விபத்துக்களில் சிக்கியும், யுத்தத்தின்பொழுது யுத்தத்தினால் பாதிக்கப்பட்டும் தமது அவயவங்களை இழந்துள்ள நிலையில் பல மாற்றுத் திறனாளிகள் வாழ்ந்து கொண்டிருக்கின்றார்கள். குறிப்பாக வடக்கு, கிழக்குப் பிரதேசங்களிலே இருபதாயிரத்துக்கும் மேற்பட்ட மாற்றுத் திறனாளிகளை நாங்கள் பார்க்கக்கூடியதாக இருக்கிறது. அந்த மாற்றுத் திறனாளிகள் தமது அன்றாட வாழ்க்கையைக் கொண்டுசெல்வதற்கு மிகுந்த சிரமப்படு கின்றார்கள். அவர்கள் நாளாந்த வருமானம் இன்றியும் உழைப்பதற்கேற்ற உடல் வலிமையின்றியும் தவிக்கிறார்கள். அவர்களில் சிலர் கண் தெரியாத நிலையிலும் காது கேட்காத நிலையிலும் உள்ளனர். கை, கால் இயங்க முடியாததால் நடமாட முடியாத சிலர் உருளும் வண்டிகளில் அல்லது முச்சக்கர வண்டிகளிலே நடமாடுகின்ற வாழ்க்கை நிலையைக் கொண்டவர்களாக இருக்கின்றார்கள். ஆகவே, முதியவர்களைப் பேணுவதைப்போல, அரசாங்கம் இந்த மாற்றுத் திறனாளிகளுக்கும் கொடைப்பணமாக ஒரு தொகையை வழங்குவதற்கான ஒரு தீர்மானத்தை இந்த உயர்ந்த சபையினூடாக மேற்கொண்டு, அதனை வழங்கவேண்டும் என்று கேட்டுக்கொள்கின்றேன்.

அண்மையில் மேதகு ஜனாதிபதி அவர்கள் யாழ்ப்பாணத்திற்குச் சென்று தைப்பொங்கல் தினத்தை மிகவும் சிறப்பாகக் கொண்டாடியிருந்தார். ஆனால், அதேவேளையில் அனுராதபுரம் சிறைச்சாலையிலுள்ள தமிழ் அரசியல் கைதிகள் தைப்பொங்கல் தினத்தன்று பொங்கல் செய்வதற்கு முற்பட்ட வேளையில், சிறைச்சாலை அதிகாரிகள் அவர்களைப் பொங்கல் செய்யவிடாது தடுத்ததன்மூலம் அவர்களுடைய உரிமை மறுக்கப் பட்டிருக்கின்றது. எனவே, பாலங்களைத் திறப்பதன் மூலமும் வீதிகளை அமைப்பதன்மூலமும் தமிழ் மக்களுக்கான அபிவிருத்தியைச் செய்துவிட்டதாகக் கருதுவதைவிட, மக்களின் மனங்களை வென்றெடுப்பதற்கான நடவடிக்கைகளை மேற்கொள்ளவேண்டும். இன்று அரசியல் கைதிகளாக இன்று சிறைச்சாலைகளில் தடுத்து வைக்கப்பட்டுள்ள பன்னிரண்டாயிரத்துக்கும் மேற்பட்ட தமிழ் இளைஞர்களும் யுவதிகளும் நாளாந்தம் தமது வாழ்க்கைக்காக ஏங்கிக் கொண்டிருக்கிறார்கள்; அவர்களுடைய பெற்றோர்கள் தமது வாழ்க்கையை எண்ணி நொந்துகொண்டிருக்கின்றார்கள். இந்தச் சூழ்நிலையில் அவர்களின் வாழ்க்கையில் மாற்றங்களை ஏற்படுத்த வேண்டுமாயின், அந்த இளைஞர் யுவதிகளை விடுதலை செய்ய வேண்டியது அவசியமாகும். ஆகவே, இந்த அரசாங்கம் அந்த இளைஞர், யுவதிகளை விடுதலை செய்வதைக் காலத்தின் கடமையாக ஏற்றுக்கொள்ள வேண்டுமென்று நான் கோரிக்கை விடுக்க விரும்புகின்றேன்.

அடுத்து, கிளிநொச்சி நகரிலே அமைந்துள்ள பிரசித்திபெற்ற கந்தசாமி ஆலயத்திலே நாளை மறுதினம் அதாவது எதிர்வரும் ஞாயிற்றுக்கிழமை மகா கும்பாபிஷேகம் நடைபெறவுள்ளது. நீங்கள் யுத்தத்தை முடிவுறுத்தி இடத்தைக் கைப்பற்றியுள்ளதாகவும் அப்பிரதேசத்திலுள்ள மக்களை விடுவித்ததாகவும் கூறி எல்லா வழிகளிலும் பிரச்சாரம் செய்கின்ற இக்காலகட்டத்தில் அப்பிரதேசத்தில் மீளக்குடியேறிய மக்களே அந்தக் கந்தசாமி கோவிலின் மஹாகும்பாபிஷேகத்தைச் செய்கின்றார்கள். ஆனால் அந்த ஆலயத்துடன் இணைந்துள்ள அன்னதான மடம் இன்னமும் அந்த ஆலய நிர்வாகத்தினரிடம் கையளிக்கப்படவில்லை. இது தொடர்பாக நாங்கள் எழுத்துமூலமாக கிளிநொச்சி மாவட்டக் கட்டளைத் தளபதியிடம் கோரியபொழுது அவர், "அந்த அன்னதான மடம் எங்களுடைய இரத்தம் சிந்தப்பட்டுக் கைப்பற்றப்பட்ட இடம் என்பதால் நாங்கள் அதனை மீண்டும் ஒப்படைக்க முடியாது" என்று எழுதியிருந்தார். அதற்குப் பதிலாக நான் திரும்பவும் அவருக்கு "அந்தக் கோவில் சூழலில் அமைந்துள்ள இடத்தில் புலிகள் அமைப்பினுடைய எந்தவிதமான முகாம்களோ அல்லது கட்டுப்பாட்டுப் பிரதேசமோ அமைந்திருக்கவில்லை; அதனால் அப்பிரதேசத்தில் இரத்தம் சிந்துவதற்கான வாய்ப்புக்கள் எதுவும் இருக்கவில்லை" என்று எழுதினேன். அதற்கு அவர் திரும்பவும் "இல்லை, அங்கே புலிகளின் முகாம் இருந்தது" எனப் பதில் எழுதியிருந்தார். நான் அந்த மண்ணிலே தொடர்ந்து 42 வருட காலமாக வாழ்பவன் என்ற வகையில் புலிகளுடைய அமைவிடமோ அல்லது முகாமோ அந்த ஆலயச் சூழலிலே இருக்கவில்லை என்பதைப் பொறுப்புடன் குறிப்பிடுகின்றேன். கிளிநொச்சிக் கந்தசாமி ஆலயம் கிளிநொச்சி நகரத்தின் மத்தியிலே அமைந்துள்ளது. அந்த ஆலயத்திலே நாளை மறுதினம் நடைபெறவிருக்கின்ற மஹாகும்பாபிஷேகத்திற்கு வருகைதந்து அதனைப் பார்த்துச் செல்லும் எமது பக்தர்களுக்கு அன்னதானம் வழங்குவதற்காக அந்த அன்னதான மடத்தை இந்த அரசால் விடுவித்துத் தரமுடியவில்லையே என்பது எங்களுக்கு வேதனை அளிக்கிறது. ஆனால், அந்த அன்னதான மடத்திலே மாமிசங்கள் காய்ச்சப்பட்டு, அவை தென்னிலங்கையிலிருந்து வருகின்றவர்களுக்கு பரிமாறப்படுகின்றன. இச்செயற்பாடானது இந்துக்களுடைய மனங்களைப் பாதிக்கின்ற ஒரு செயற்பாடு என்பதை நான் தங்களுடைய மேலான கவனத்திற்குக் கொண்டுவர விரும்புகின்றேன்.

அதேபோல், இன்னுமொரு முக்கிய விடயத்தையும் நான் இங்கு குறிப்பிட விரும்புகின்றேன். அதாவது, இன்று இலங்கை பூராவும் கடமை நிறைவேற்றும் அதிபர்களாக கிட்டத்தட்ட 600க்கும் மேற்பட்டவர்கள் கடந்த 08 ஆண்டுகளாகப் பணிபுரிந்து வருகின்றார்கள். இவ்வாறு கடமை நிறைவேற்றும் அதிபர்கள் தங்களுக்கு நிரந்த நியமனங்கள் வழங்குமாறுகோரி, பல தடவைகள் விழிப்புணர்வுப் போராட்டங்களை நடத்தியிருக்கின்றார்கள். இலங்கை பூராவுமுள்ள கடமை நிறைவேற்றும் அதிபர்களுக்கு நிரந்தர நியமனம் வழங்கி, அவர்களும் இந்த மண்ணிலே - இலங்கையிலே - அதிபர் தரங்களோடு மிளிர்வதற்கு இந்தச் சபை ஆவன செய்யவேண்டும்.

[ගරු එස්. ශ්‍රීතරන් මහතා]

இது தொடர்பாக நாங்கள் இந்தச் சபையினூடாகப் பல தடவைகள் கோரிக்கைவிடுத்தும்கூட, அதற்கான எந்தவிதமான நடவடிக்கைகளும் இதுவரையில் மேற்கொள்ளப்படவில்லை என்பதை நான் இச்சபையிலே மனவருத்தத்துடன் குறிப்பிட விரும்புகின்றேன்.

அவ்வாறே, இரண்டு ஆண்டுகளுக்கு முன்னர் வடக்கு, கிழக்கில் தொண்டர் ஆசிரியர்களாகப் பணியாற்றியவர்களுக்கு நிரந்தர நியமனங்கள் வழங்கப்பட்டபொழுது, கிளிநொச்சி மற்றும் முல்லைத்தீவு மாவட்டங்களிலுள்ள தொண்டர் ஆசிரியர்களின் வெற்றிடங்கள் அங்கிருந்த தொண்டர் ஆசிரியர்களுக்கு வழங்கப்படாமல், யாழ்ப்பாணத்தைச் சேர்ந்த குறித்த சில கல்வித் தராதரங்களைக் கொண்டவர்களுக்கு வழங்கப்பட்டன. அப்பதவிக்குரிய Cadre நிரப்பப்பட்டு இருக்கின்றது என்று சொல்கின்றார்களே தவிர, கிளிநொச்சி மற்றும் முல்லைத்தீவு மாவட்டங்களில் கிட்டத்தட்ட பத்து வருடங்களாக தொண்டர் ஆசிரியர்களாக பணிபுரிந்தவர்களுக்கு இதுவரை நிரந்தர நியமனம் வழங்கப்படவில்லை. இதனால், அவர்கள் மிகவும் வேதனையோடு வாழ்கின்றார்கள். நாங்கள் அவர்களுடைய நிலையைக் கருத்தில்கொண்டு, அவர்களுக்கும் நிரந்தர நியமனங்கள் வழங்கப்படவேண்டுமென்று இச்சபையினூடாகவும் கல்வி அமைச்சரினூடாகவும் பல தடவைகள் எடுத்தியம்பி யிருக்கின்றோம். எனவே, அத்தொண்டர் ஆசிரியர்களுடைய மனங்களை புரிந்து, அவர்களுடைய கடந்தகாலப் பணியினை ஏற்று, அவர்களுக்கு நிரந்தர நியமனம் வழங்குவதற்கு இச்சபை முடிசெய்யவேண்டும் என நான் வேண்டுகோள் விடுக்கின்றேன். இரண்டு ஆண்டுகளுக்கு முன்னர், யாழ்ப்பாணத்தில் தொண்டர் ஆசிரியர்களாக கடமையாற்றியவர்களுக்கு நிரந்தர ஆசிரியர் நியமனம் வழங்கப்பட்டு, அவர்களுக்கு மாதாந்தக் கொடுப்பனவாக 3,000 ரூபாய் வழங்கப்பட்டது. அவர்களுக்கு தற்பொழுதும் அந்த 3,000 ரூபாய் சம்பளமே வழங்கப்படுகின்றது. ஓர் ஆசிரியருக்கு தொடர்ந்து 3,000 ரூபாய் சம்பளம் வழங்கப்படுவது என்பது, அவருடைய குடும்பத்தைக் கொண்டுசெல்வதற்கு - வழிநடத்து வதற்கு - எவ்வளவுதூரம் பொருத்தமானதாக இருக்கும் என்பதை நீங்கள் எண்ணிப் பாருங்கள்! எனவே, 3,000 ரூபாய் மாதச் சம்பளத்தோடு இருக்கின்ற அந்த ஆசிரியர்களுடைய நிலையை மாற்றும்வகையில், தராதரப்பத்திரமற்ற ஆசிரியர் நிலையில் தொண்டர் ஆசிரியர்களுக்கும் நிரந்தர நியமனம் வழங்கி, அவர்களையும் ஆசிரியர் சேவையில் உள்வாங்குவதற்கு நடவடிக்கை எடுக்கவேண்டுமென நான் இச்சபையினூடாகக் கேட்டுக்கொள்கின்றேன்.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

கௌரவ உறுப்பினர் அவர்களே, உங்களுடைய உரையை இன்னும் ஓரிரு நிமிடங்களில் முடித்துக்கொள்வது நல்லது.

**ගරු එස්. ශ්‍රීතරන් මහතා**
(மாண்புமிகு சி. சிறீதரன்)
(The Hon. S. Shritharan)

இன்னும் ஒரு நிமிடத்திற்குள் எனது உரையை முடித்துக் கொள்கின்றேன்.

அடுத்ததாக, யாழ்ப்பாணத்திலுள்ள இலங்கை வங்கிக் கிளைகளிலே கடந்த 08 ஆண்டுகளுக்கு மேலாக பல்தர உதவியாளர்களாக 40க்கும் மேற்பட்டவர்கள் பணிபுரிகின்றார்கள். இவர்கள் தங்களுடைய பணியின் நிமித்தம் பல சேவைகளை கடந்த யுத்த காலங்களில் ஆற்றியிருக்கின்றார்கள். இவர்களுடைய நிரந்தர நியமனம் தொடர்பாக நான் யாழ். பிராந்தியத்திற்குப் பொறுப்பான இலங்கை வங்கிக் கிளையின் உதவி முகாமையாளர் திரு. சுமணசிறி அவர்களுடன் பேசியபொழுது, அவர் அதற்கு "நீங்கள் இவ்விடயத்தை பாராளுமன்றத்தினூடாக கொண்டு வாருங்கள்! நாங்கள் அதற்குரிய வழிவகைகளைச் செய்கின்றோம்" என்று சொன்னார். எனவே, நான் அதனை மீண்டும் ஒரு முறை இங்கு ஞாபகப்படுத்த விரும்புகின்றேன். பல ஆண்டுகள் சேவையாற்றி விட்டு, மீண்டும் ஒரு வேலைக்குச் செல்லமுடியாத வயதில் இருக்கின்ற இவர்களுக்கு நிரந்தர நியமனம் வழங்குவதற்கு நீங்கள் ஆவன செய்யவேண்டும் எனக்கேட்டு, வாய்ப்புக்கு மீண்டும் நன்றிகூறி, விடைபெறுகின்றேன்.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

மிகவும் நன்றி, මී ළඟට ගරුතර එල්ලාවල මේධානන්ද ස්වාමීන් වහන්සේ.

[අ. භා. 5.28]

**ගරු (පූජ්‍ය) එල්ලාවල මේධානන්ද හිමි**
(மாண்புமிகு (வண.)எல்லாவல மேதானந்த தேரர்)
(The Hon. (Ven.) Ellawala Medhananda Thero)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, වැඩිහිටි තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ (සංශෝධන) පනත් කෙටුම්පත හා සමථ මණ්ඩල (සංශෝධන) පනත් කෙටුම්පත දෙවැනි වර කියැවීමේ විවාදයට සම්බන්ධ වීමට ලැබීම ගැන මම සතුටු වනවා. ඒ වාගේම හදිසි නීතිය දීර්ඝ කිරීම පිළිබඳ ඡන්ද විමසීමත් අද පැවැත්වෙන බව ප්‍රකාශ වෙලා තිබෙනවා.

වැඩිහිටියන් ගැන කථා කරන කොට මට මතක් වනවා අපේ රටේ සමාජය තුළ තිබෙන "පැසුණු හිසින් බුහුමන් ලබන්න" කියන ප්‍රස්තාව පිරුළ. මේ ප්‍රස්තාව පිරුළේ "පැසුණු හිසින්" කියන වචනය බොහොම අර්ථවත් වචනයක්. සාමාන්‍ය සරල වශයෙන් නම් අප මෙහිදී ගන්නේ හිස කෙස් ටික පැසුණාය කියන කාරණය විතරයි. නමුත් ඊට වඩා ගැඹුරු අර්ථයක් මේ තුළ තිබෙනවා. "පැසුණු හිස" කියන විට ඒ හිස ගුණයෙන්, නුවණින්, සදාචාරාත්මක බවින් ආදි විවිධ ක්‍රමවලින් පැසෙන්න පුළුවන්. නමුත් අද "වැඩිහිටි" කියන වචනයට අපේ මාතෘ භාෂාවල පාවිච්චි කරන්නේ "වෘද්ධ" කියලායි. ඒ "වෘද්ධ" කියන වචනය අර්ථ විග්‍රහ කරලා තිබෙනවා අපේ ධර්මයේත්, පෙර දිග දර්ශනයේත්, හින්දු දර්ශනය වැනි දර්ශනවලත් "වයෝ වෘද්ධ", "ඥාණ වෘද්ධ", "ගුණ වෘද්ධ", "තපෝ වෘද්ධ" ආදී වශයෙන්. මේක ඒ විධියට අර්ථ විවරණය කරලා තිබෙනවා. නමුත් දැන් මෙතැනදී මේ පනත් කෙටුම්පතට සහ මේ සාකච්ඡාවට අදාළව වැඩිහිටියන් කියලා කියන්නේ ඒ විවරණයේ වයෝ වෘද්ධ කියන අය, එනම් වයසට ගිය උදවිය පිළිබඳවයි. ඒ අය අතර ගුණ වැඩි අයත් ඉන්න පුළුවන්. "වයෝ වෘද්ධ" කියන කොට වයසින් වැඩි වෙච්ච අය. "ගුණ වෘද්ධ" කියන කොට වයසින් අඩු වුණත් ගුණයෙන් වැඩි අය. "තපෝ වෘද්ධ" කියන කොට වයසින් අඩු වුණත් තපසින් වැඩි අය. නමුත් මෙතැනදී විශේෂයෙන්ම සැලකෙන්නේ, "වයෝ වෘද්ධ" හෙවත් "වැඩිහිටි" කියන වචනයෙන් අර්ථ විවරණය කෙරෙන්නේ වයසින් වැඩිහිටි උදවිය පිළිබඳවයි.

අවුරුදු දහස් ගණනක් තිස්සේ පැවත එන විශිෂ්ට සංස්කෘතියකට හිමිකම් කියන, ඒ වාගේම වැඩිහිටියන්ට සැලකීම පිළිබඳව විශිෂ්ට ඉගැන්වීම් පවතින බුදු දහමින් පරිපෝෂණය වූ සමාජයක් හැටියට සලකන අපේ සමාජය වර්තමාන කාලය තුළ වැඩිහිටියන්ට සැලකීම අතින් බොහෝ පහළට වැටී ගෙන යන තත්ත්වයක් මෑත භාගයේ සිට අපට දකින්නට ලැබිලා තිබෙනවා. මා දකින හැටියට අපේ රටේ පවතින මේ තත්ත්වයට හුඟක් දුරට හේතු වෙලා තිබෙනවා විවිධ බලවේග සහ විවිධ දර්ශන. ඒ කියන්නේ වැදගත් දර්ශන නොවෙයි. ඒක විවරණය කිරීමට කාල වේලාවක් මට ලැබෙන්නේ නැහැ. විවිධ පුද්ගලයන්ගේ මතවාද

දර්ශන හැටියට ඉදිරිපත් කරනවා. ඒ වාගේම විවෘත ආර්ථිකය තුළ ධනය පස්සේ හඹා යෑම, ගුණ ධර්මවලට පයින් ගසා යෑම වැනි ක්‍රියා කලාපයන් නිසා මේ තත්ත්වය ඇති වෙලා තිබෙන බව පෙනෙනවා.

වැඩිහිටියකු කියලා කියන්නේ කවුරු හෝ මාපියකුගේ දරුවෙක්. ඒ වැඩිහිටියෝ -අවිවාහක වැඩිහිටි පිරිස හැරෙන විට- කාගේ හෝ දූ දරු පිරිසකගේ මාපියෝ. මේ තත්ත්වය අනුව මේ සමාජ සංස්ථාව බැඳී තිබෙන්නේ දූ දරුවන් හා මාපියන් අතර ඇති මේ සම්බන්ධතාව උඩයි. ඒක නිසා මෙතැනදී "වැඩිහිටියන්" කියන වචනයෙන් වැඩියෙන්ම අවධාරණය වෙලා තිබෙන්නේ යම් දූ දරු පිරිසකගේ මාපියනුයි. බුදු රජාණන් වහන්සේ මේ පිළිබඳව කදිම විස්තරයක්, පැහැදිලි කිරීමක් කර තිබෙනවා. එක අතකට වැඩිහිටියන්ට නොසලකන උදවිය පරිහානියට පත් වන ආකාරය පරාභව සූත්‍රයෙන් බුදු හාමුදුරුවෝ දේශනා කළා. සමාජයක් පවතින්නේ මිල මුදල් මතම නොවෙයි. ගුණාත්මක ධර්ම පද්ධතියක් මත තමයි බොහෝ විට සමාජය පවතින්නේ. ගුණ ධර්ම අඩු වැඩි වන විට එම ගුණ ධර්මවලින් පිරිහෙන සමාජයක බාහිර පරිසරය විනාශ වෙලා, ස්වභාව ධර්මය විසින් හානියක් කරන්නට පුළුවන්. අපේ රටට පසු ගිය දවස්වල මහා සුනාමියක් ආවා. ඊයේ පෙරේදා විශාල ගංවතුරක් ආවා. ස්වභාව ධර්මය විසින් මේ විධියට විනාශයන් ඇති කරන්න, ස්වභාව ධර්මය විසින් අපට වෙනස්කම් කරන්න ධර්මානුකූලව බලන කොට යම් කිසි විධියකට අපි ධර්මයෙන් ඈත් වීමක් හේතු වන්නට පුළුවන්. මොකද, ධර්මයට පටහැනි වන විට ස්වභාව ධර්මය අපට විරුද්ධ වනවා. ඒක හොඳට තර්කානුකූලව, විද්‍යානුකූලව ඔප්පු කරන්න පුළුවන් කාරණයක්. ඒක නිසා ධනය මතම, ආර්ථිකය මතම සමාජයක් ගෙන යන්න පුළුවන්කමක් නැහැ. එම සමාජය තුළ ගුණ ධර්ම පද්ධතියක් තිබෙන්නට ඕනෑ. බුදු රජාණන් වහන්සේ සිඟාලෝවාද සූත්‍රය මඟින් ඒක බොහොම ලස්සනට පැහැදිලි කර දුන්නා. මාපියන් වෙනුවෙන් දරුවෝ කොහොමද පිළිපැදිය යුත්තේ කියා, පිළිපැදිය යුතු ආකාරය එතැන දී පෙන්වනවා. ඒක ඒ සූත්‍රයේ සඳහන් කර තිබෙන විධියටම කථා කරනවා නම්, "භතෝ තේසං භරිස්සාමි", අම්මලා, තාත්තලා තමයි මාව හදලා වඩලා පෝෂණය කළේ; ඒක නිසා මාව පෝෂණය කළ අම්මලා, තාත්තලා මම ඉතා හොඳින් පෝෂණය කරන්නට ඕනෑය කියා දරුවා කල්පනා කරන්නට ඕනෑ. ඒක යුතුකමක්; වග කීමක්; ගුණ ධර්මයක්. ඊ ළඟට "කිච්චං තේසං කරිස්සාමි". අම්මලා තාත්තලා යම් කිසි කටයුතු කොටසක් කළා නම්, ඒ කියන්නේ සමාජයට යම් යුතුකම් කොටසක් ඉටු කළා නම්, රජය වෙනුවෙන් යම් යුතුකම් කොටසක් ඉෂ්ට කළා නම්, එහෙමත් නැත්නම් තමන්ගේ නෑදෑ හිතමිත්‍රාදීන් වෙනුවෙන් යම් කිසි වැඩ කොටසක් ඉටු කළා නම්, දරුවෝ කල්පනා කරන්නට ඕනෑ අපව පෝෂණය කළ අම්මලා තාත්තලා කළ එම කටයුතු අඩු පාඩුවක් නැතිව ඒ අය වෙනුවෙන් කරන්නට ඕනෑය කියා. ඒ වාගේම "කුලවංසං ඨපෙස්සාමි". බලන්න කොච්චර ලස්සන ද කියා. අම්මලා තාත්තලාගේ යම් කුල පරම්පරාවක් තිබුණා නම්, එම කුල පරම්පරාව විනාශ කරන්නේ නැතිව ආරක්ෂා කරන්නට ඕනෑ. අඹු දරුවන් පෝෂණය කිරීම, දරු පරම්පරාව ඇති කිරීම, එම කාර්ය නිවැරදි විධියට, මාපියන්ට ගෞරව පිණිස කරන්නට ඕනෑ. ඊ ළඟට "දායජ්ජං පටිපජ්ජාමි". අම්මලා තාත්තලා යම් වස්තුවක් හරි හම්බ කරලා දායාද වශයෙන් අපට දීලා තිබෙනවා නම්, එසේ ලබා දී තිබෙන සම්පත් අපි නිසි පරිදි පිළිපදින්නට ඕනෑ; දියුණු කරන්නට ඕනෑ; ආරක්ෂා කරන්නට ඕනෑ. මේ කාරණයේ දී බුදු රජාණන් වහන්සේ අවසාන වශයෙන් කියනවා, මෙලොවටත්, පරලොවටත් දෙකටම හේතු වන පරිදි "අථ ච පන පේතානං දක්ඛිනං අනුපදස්සති" කියා. අප මිය පරලොව ගියාට පස්සේ අපේ දරුවන් පරලොව වශයෙන් ආගමික චාරිත්‍ර වාරිත්‍ර ඉෂ්ට කරලා අපට පරලොවින් සංග්‍රහයක් කරාවිය කියා දෙමාපියන් අපේක්ෂා කරනවා. බලන්න මෙතැන කොච්චර ලස්සනද කියා.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
එසේය ස්වාමීන් වහන්ස.

**ගරු (පූජ්‍ය) එල්ලාවල මේධානන්ද හිමි**
(மாண்புமிகு (வண.)எல்லாவல மேதானந்த தேரர்)
(The Hon. (Ven.) Ellawala Medhananda Thero)

බුදු හාමුදුරුවෝ දේශනා කළ මෙම ධර්මය පදනම් කර ගෙන ඇති වුණු අතීත සමාජය තුළ වැඩිහිටියන්ට කළ සැලකිල්ල පිළිබඳව අපේ පොත් පත්වල ඕනෑ තරම් සඳහන් වෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මගේ කාලය ඉක්ම වනවා වෙන්න පුළුවන්. වැඩිහිටියන් ගැන අද තිබෙන සැලකිල්ල පිළිබඳව දැන් මෙතැන දී කියැවුණා. කාන්තාවක් සම්බන්ධව අරගෙන බලන්න. කාන්තාවක් අරගෙන බැලුවොත්, කාන්තාව ගැන හින්දු දර්ශනයේ උගන්වලා තිබෙන්නේ මෙහෙමයි. "කුඩා කාලයේ දී කාන්තාව මාපියන් යටතේ සිටිය යුතුයි, තරුණ කාලයේ දී විවාහ වන පුරුෂයා යටතේ කාන්තාව සුරැකිය යුතුයි, කාන්තාව වයසට ගියාට පස්සේ දරුවන්ගේ ආරක්ෂාව යටතේ සිටිය යුතුයි".

බලන්න, කාන්තාවගේ සුරක්ෂිතභාවය පිළිබඳව එදා සමාජය කොපමණ ලස්සණට අගය කරලා තිබුණාද කියන එක. නමුත් අද කාගේවත් පිහිටක් නැතුව, අසරණ වෙලා, නිවසක සිටිය අවුරුදු 80ක් වයසැති කාන්තාවකගේ ගෙදරට පැනලා, බලහත්කාරකමින් ඇයව දූෂණය කරලා ගිය ආකාරය පිළිබඳව පසු ගිය දිනක මාධ්‍යවල පළ වෙලා තිබුණා මා දුටුවා. එතකොට ඉතාමත්ම ඉහළ තනතුරු දරන දූ පුතුන් සිටින පිය කෙනකු රාත්‍රී කාලයේදී ඒ දරුවන් විසින්ම වාහනයක දමා ගෙන ගිහින්, නොදන්නා පළාතක බස් නැවතුම් පොළක තනි කර දමා ගිහින් තිබෙනවා. ඒ පිළිබඳව පොලීසිය සොයා බලා කටයුතු කරපු ආකාරය පිළිබඳව පුවත් පතක පළ වෙලා තිබුණා. මේ සිද්ධිය ඉතාම කනගාටුදායක සිද්ධියක්.

අවසාන වශයෙන් අද කාන්තා පක්ෂය පිළිබඳව මා කියන්න කැමැතියි. විශේෂයෙන් අපේ රටට නිදහස ලබා දීම සඳහා ක්‍රියා කරපු අපේ රණ විරුවන්ගේ භාර්යාවන් අද අනාථ වෙලා ඉන්නවා. ඒ කියන්නේ තමන්ගේ ස්වාමිපුරුෂයා අහිමි වෙලා ඉන්නවා. ඒ අය වැන්දඹුවන් කියලා බොහෝ දෙනෙක් කථා කරනවා. ඒ අය වැන්දඹුවෝ නොවෙයි. ඒ වචනයේ තේරුම දන්නේ නැතුවයි එහෙම කථා කරන්නේ. ඒක ඒ අයට කරන නිග්‍රහයක්. "වැන්දඹු" කියා කියන්නේ වචන දෙකක එකතුවක්. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "වඳ" සහ "අඹු" කියන වචන දෙක එකතු වෙලා තමයි, "වැන්දඹු" කියන වචනය හැදිලා තිබෙන්නේ. ඒකේ තේරුම කුමක්ද? දරුවන් නැති කාන්තාව කියන එකයි ඒකේ තේරුම. වැන්දඹුව කියන්නේ ඒකයි. එහෙම නැතුව රණ විරු ස්වාමියන් නැති වීම නිසා ඒ භාර්යාවෝ වැන්දඹුවන් වන්නේ නැහැ. ඒක නිසා ඒ නිගරු වචනය මේ අයට පාවිච්චි කිරීමත් වැරදියි කියන එක මම සඳහන් කරන්නට ඕනෑ. අපි සමාජය තුළ ගුණ ධර්ම, ගුණාත්මක පද්ධතිය වැඩිදියුණු කිරීම සඳහා සුවිශේෂ අවධානයක් යොමු කරන්නට ඕනෑ. වැඩිහිටි තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සඳහා මෙම පනතට සංශෝධන ගෙනාවා වාගේම, දැනට විනාශ වී තිබෙන වැඩිහිටියන්ට සැලකීම, ගරු කිරීම කියන කාරණා සමාජය තුළ ස්ථාපනය කිරීමටත් ව්‍යාපෘතියක් ගෙන යන්නට ඕනෑ.

ඔබතුමා මට විනාඩියක් පමණ කාලයක් වැඩිපුර ලබා දුන්නා. ඒ ගැන ස්තුතිවන්ත වෙමින් මම නිහඬ වනවා.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
එහෙමයි ස්වාමීන් වහන්ස. ඔබවහන්සේගේ දේශනය කදිමයි.

[අ. භා. 5.40]

**ගරු තිලංග සුමතිපාල මහතා**
(மாண்புமிகு திலங்க சுமதிபால)
(The Hon. Thilanga Sumathipala)
නමෝ බුද්ධාය!

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සමථ මණ්ඩල (සංශෝධන) පනත් කෙටුම්පතත්, වැඩිහිටි තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ (සංශෝධන) පනත් කෙටුම්පතත් කියන මේ කාලෝචිත සංශෝධන පනත් කෙටුම්පත් දෙක ගැන විවාදයට සහභාගි වෙලා සුළුවෙන් හෝ වචනයක් ප්‍රකාශ කරන්නට ලැබීම ගැන ප්‍රථමයෙන්ම මම සන්තෝෂ වනවා.

1972 දී විතර සමගි මණ්ඩලයක් හැටියට ස්ථාපිත වෙලා තිබුණු මෙය 1988 වන විට සමථ මණ්ඩලය බවට පරිවර්තනය වුණා. 1972 ඇති කළ හැම සමගි මණ්ඩලයකම සාමාජිකයන් හැටියට හිටියේ ඒ පළාතේම හිටපු සාම විනිසුරුවරු. නමුත් 1977න් පසුව දිගින් දිගටම සාම විනිසුරුවරුන් අලුතින් පත් කරපු විධිය අනුව, සමථ මණ්ඩලයට පත් කරපු ඒ නිලධාරින් කෙරෙහි තිබුණු විශ්වාසය 1988 වන විට ඇත් වුණා. ඒක තමයි ඇත්ත. අද ගරු රවුෆ් හකීම් ඇමතිතුමාගේ යුගයේදී මේ අලුත් වෙනස් කිරීම් කිරීම ගැන අපි එතුමාට ප්‍රශංසා කරනවා. මුදලේ යම් කිසි සීමාවකට එහා වැරදිවලට සමථ මණ්ඩලයට යන්න බැරිව තිබෙන නිසා ගම් මට්ටමෙන් විසඳා ගන්නට තිබුණු ප්‍රශ්න උසාවිය දක්වා ගෙන යන්නට සිදු වුණා. ඇමතිතුමාගේ අදහස අනුව දැන් ඒ මුදලේ වටිනාකමේ සීමාව රුපියල් 2,50,000 දක්වා වෙනස් කළ නිසා සමථ මණ්ඩල ක්‍රියාදාමය වැඩිදියුණු වෙයි කියලා අපි විශ්වාස කරනවා. ඒ අනුව අධික වියදම් සහිත නඩු මාර්ගයට නොගිහින් ගමේ ප්‍රශ්න ගම තුළම විසඳා ගන්නට අවස්ථාවක් ලබා දීම ගැන අපි එතුමාට ප්‍රශංසා කරනවා.

ඒ වාගේම මේ කාලයේ වැඩිහිටියන්ට සලකන එක ගැන අපි කොච්චර කථා කළත්, ඒ ගැන අදහසක් තිබුණත්, වුවමනාවක් තිබුණත් ඒක ඉෂ්ට වුණාද කියන ප්‍රශ්නය තිබෙනවා. කල් ගත වී හෝ මෙවැනි අතිශය වැදගත් සංශෝධනයක් ඉදිරිපත් කිරීම ගැන ගරු ෆීලික්ස් පෙරේරා ඇමතිතුමාට අපි ප්‍රශංසා කරනවා. එතුමා දෙමව්පියන් ගැන අවබෝධයක් තිබෙන, වැඩිහිටියන්ට සලකන කෙනකු හැටියට හැමෝම දන්නවා. මෙය, එතුමා උපදේශක කාරක සභාවේදී අනෙක් සියලු අයත් එක්ක සාකච්ඡා කරලා, හිතලා බලලා, බොහොම ලොකු කැපවීමක් කරලා ගෙනාපු සංශෝධන පනත් කෙටුම්පතක් බව අපි දන්නවා. එතුමා මෙම පනත් කෙටුම්පතේ සඳහන් හැම අංගයක් ගැනම, යෝජනාවක් ගැනම අදහස් දැක්වුවා. විශේෂයෙන්ම සැලකිල්ල දැක්වුවේ වර්තමානයේ ජනගහනයෙන් අවුරුදු 60ට වැඩි සියයට 10ක් පමණ වන අය ගැනයි. අපට තිබෙන සංඛ්‍යා ලේඛන අනුව 2031 වන විට මේ රටේ ජනගහනයෙන් සියයට 21ක් අවුරුදු 60ට වැඩි අයයි. මේ අය වෙනුවෙන් ක්‍රමවත්, විධිමත් වැඩසටහනක් නැහැ. දැනට පොඩි පොඩි ආයතන විසින් වැඩිහිටි නිවාස ආරම්භ කර තිබෙනවා. නමුත් ඒ අය බලා ගැනීම සඳහා, ඒ අයගේ රැකවරණය සඳහා ක්‍රමවත්, විධිමත් වැඩ පිළිවෙළක් නැහැ. දැන් මෙහිදී සඳහන් වුණු ආකාරයට 1977න් පසු ඇති වූ විවෘත ආර්ථිකයත් එක්ක මේ රටේ නොයෙකුත් වෙනස්කම් නිර්මාණය වෙලා ජනතාව ඒවාට යොමු වන විට අපේ තිබුණු හැදියාව, අපේකම, අප තුළ තිබුණු ගුණවත්භාවය ඇත් වෙලා, දෙමව්පියන්ට සලකන එක, වැඩිහිටියන්ට සලකන එක ක්‍රමක්‍රමයෙන් අපේ සමාජයෙන් ඇත් වුණු බව ඇත්ත. ඒක වෙනත් විධියකට විග්‍රහ කරන්න අමාරුයි. නමුත් මෙවැනි උපක්‍රම මඟින්, එහෙම නැත්නම් වෙනත් ක්‍රමවේදයකට යොමු කරවීම තුළින් ඒ කරුණු කෙරෙහි නැවතත් ජන සමාජයේ අවධානය යොමු කරවලා, ඒ අයගේ සහයෝගය ලබා ගන්න අපට පුළුවන් වනවා. සුනාමි අවස්ථාවේ වෙන්න පුළුවන්, ගංවතුර අවස්ථාවේ වන්න පුළුවන් විදේශිකයන් මේ රටට මුදල් ආධාර දීලා උදවු කරන්න උත්සාහ ගත් අවස්ථා අපට මතකයි. නමුත් ඒ අවස්ථාවල ක්‍රමවත්, විධිමත් වැඩසටහන් තිබුණා අඩුයි. එතකොට ඒ අය උදවු කරන්නත් බය වනවා. ඒ නිසා මම හිතන විධියට මේ වැඩසටහන තුළින් අපට හැකියාව තියේ තෝරා ගන්නා යම් පිළිවෙළකට කටයුතු කරන්න. මේ වැඩිහිටි අය තවත් වයසට ගියාම සැප සම්පත් කියන ඒවා බඩු මුට්ටුවලින් පමණක් දෙන්න බැහැ. ඒ අයගේ මානසික තත්ත්වය වැඩිදියුණු කරන්න ඕනෑ. ඒ අයට උදවු කරන්න ඕනෑ. ඒ අයගේ වටාපිටාව ඉතාම බුද්ධිමත් විධියට, ක්‍රමවත් විධියට සකසන්න ඕනෑ. වැඩිහිටියන්ට සලකන වැඩසටහන ගැන දිගින් දිගටම අපේ මාලනී ෆොන්සේකා මන්ත්‍රීතුමිය කථා කරනවා කියලා මට පැහැදිලිව කියන්න පුළුවන්. එතුමිය වයසට ගිය කලාකරුවන් වෙනුවෙන් කරන වැඩසටහනක් ගැන කථා කරනවා. ඒ සඳහා මෙය හොඳ අවස්ථාවක් වනවා. ඒ වාගේම වයසට ගිය අපේ රණ විරුවන් ගැන අපි කථා කළා. ක්‍රීඩාව වෙන්න පුළුවන්, රාජ්‍ය සේවය වෙන්න පුළුවන්, නොයෙකුත් ක්ෂේත්‍රවල ඉන්න වැඩිහිටියන්ට සැලකීමට උත්සාහ ගත්තාට ඒ වෙනුවෙන් වැඩසටහනක් ක්‍රියාත්මක කිරීමේදී ගැටලු රාශියක් මතු වනවා අපි දැක්කා. ඒ නිසා තව අවුරුදු ගණනාවක් යන කොට ක්‍රමක්‍රමයෙන් වයසට යන අය, අසරණ වන අය, හරියට බලා ගන්න බැරි තත්ත්වයක් උදා වන බව පැහැදිලිව අවබෝධ කර ගෙන අනාගතය ගැන හිතලා ක්‍රියාත්මක කරන වැඩසටහනක් හැටියට මේ වැඩසටහන මම දකිනවා.

මේ 2011 අවුරුද්ද. තව අවුරුදු දහයකට හෝ විස්සකට පසුව මිලියනවලින් බැලුවොත් අවුරුදු 60 ඉක්ම වූ අය අවම වශයෙන් මිලියන හතරකට වඩා ප්‍රමාණයක් මේ රටේ ඉන්නවා. ඒක අද සම්පූර්ණ පාසල් පද්ධතියේ සිටින දරුවන්ට වඩා වැඩි ප්‍රමාණයක් වෙන්න පුළුවන්. ඉතින් එහෙම වුණොත් ඒ අය වෙනුවෙන් තිබෙන වැඩසටහන මොකක්ද? සමහර විට ඒ අයට සලකන්න අපේ ජනගහනයෙන් සියයට පහක් වාගේ ප්‍රමාණයකට පුළුවන් වෙයි; ඒ මූල්‍යමය ශක්තිය තියෙයි. නමුත් දරුවන්ගෙන් රැකවරණය ලැබුණේ නැත්නම්, ඒ අයව බලා ගන්න පුළුවන් යන්ත්‍රණයක් තිබුණේ නැත්නම්, විශාල මානසික අසහනයක් තිබෙන වයසට ගිය විශාල පිරිසක් ඉන්න රටක් බවට අපේ රට පත් වනවා. ඉතින් ඒ කම්පනය තුළින් ඇති වන අනික් ප්‍රශ්න දිහා බැලුවාම අපට ඒ සඳහා පැහැදිලි විසඳුමක් සොයා ගන්න බැරි වෙන්න පුළුවන්. ඒ නිසා හුඟක් දුර කල්පනා කරලා, මේ රටේ අත්‍යවශ්‍යතාවක් වෙනුවෙන් අවුරුදු ගණනාවකින් නොවෙච්ච දෙයක් කරන්න අපේ ෆීලික්ස් පෙරේරා ඇමතිතුමා මේ පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීම අපි පැසසුමට ලක් කරනවා වාගේම මහින්ද චින්තන වැඩසටහනේ කොටසක් හැටියට ඒ වෙනුවෙන් ක්‍රියාත්මක වූ ඒ නිලධාරින් ඇතුළු මහන්සි වෙච්ච සියලු දෙනාමත් පැසසුමට ලක් කරමින්, මට මේ අවස්ථාව ලබා දීම ගැන සන්තෝෂ වෙමින් මා නිහඬ වනවා. බොහොම ස්තුතියි.

[අ. භා. 5.47]

**ගරු අජිත් කුමාර මහතා**
(மாண்புமிகு அஜித் குமார)
(The Hon. Ajith Kumara)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සමථ මණ්ඩල (සංශෝධන) පනත් කෙටුම්පතටත්, වැඩිහිටි තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ (සංශෝධන) පනත් කෙටුම්පතටත් අදහස් කීපයක් එකතු කරන්න මා බලාපොරොත්තු වනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ අවස්ථාවේදී සමථ මණ්ඩල (සංශෝධන) පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීම අපි විශේෂයෙන් අගය කරනවා. සමථ මණ්ඩලය හරහා මේ රටේ ගෞරවනීය ස්වාමීන් වහන්සේලා, රාජ්‍ය සේවකයන්, ප්‍රජා නායකයන් ඇතුළු වැඩිහිටි සමාජයේ විශාල පිරිසක් ස්වේච්ඡාවෙන් විශාල කාර්ය භාරයක් ඉටු කරනවා. ඔවුන්

ස්වේච්ඡාවෙන් ආත්ම තෘප්තිය පමණක් තමන්ගේ ලාභය කර ගෙන අධිකරණමය කටයුත්තක් වෙනුවෙන් කරන මේ කැපවීම අපි අගය කරනවා. විශේෂයෙන් සමථ මණ්ඩල ක්‍රියාවලියත් එක්ක විශාල නඩු ප්‍රමාණයක් අඩු කර ගන්න අද අපට පුළුවන් වෙලා තිබෙනවා. අද අධිකරණයේ තිබෙන ප්‍රධාන ප්‍රශ්නයක් තමයි නඩු තදබදය. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ නිසා අපි මේ අවස්ථාවේදී විශේෂයෙන් ඒ ගැන කල්පනා කරන්න ඕනෑ. විශේෂයෙන් නව අධිකරණ අමාත්‍යතුමාත් එක්ක අමාත්‍යාංශයේ උපදේශක කාරක සභාවේදී අපි මේ ගැන සාකච්ඡා කළ යුතුයි. පසු ගිය උපදේශක කාරක සභාවලදීත් මේ සමථ ක්‍රියාවලිය මීටත් වඩා පුළුල් කරන්න කථා වුණා. මේ සමථ ක්‍රියාවලිය තව විධිමත් කරන්න අපට පුළුවන් නම්, ජනතාවට විශාල ප්‍රමාණයකින් සහන සලසන්න පුළුවන් වනවා. ඒ වාගේම ඒ සමථ මණ්ඩලවල නඩු සමථය කිරීම සඳහා මැදිහත් වන නිලධාරින්, එනම් සමථකරුවන් සඳහා වූ ඇගැයීම, ඒ වාගේම ඔවුන්ට දිය හැකි සහයෝගය, සහනය සහ සමාජය තුළ ඔවුන්ට දෙන්න පුළුවන් ස්ථානය පිළිබඳව වූ මැදිහත් වීමකුත් මීට වඩා කළ යුතුයි කියලා අපි විශ්වාස කරනවා.

ඒ වාගේම සමථ මණ්ඩලයට යොමු කරන නඩුවලට අදාළව තිබූ රුපියල් 25,000ක මුදල් සීමාව මේ පනත් කෙටුම්පත හරහා වැඩි කිරීම ඉතා හොඳ දෙයක් විධියට මම දකිනවා. මමත් ඒ උපදේශක කාරක සභාවේ සාමාජිකයකු විධියට ඒ සාකච්ඡාවට සම්බන්ධ වුණා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි ඒ කටයුත්ත අගය කරන අතරේ, සමථ මණ්ඩල (සංශෝධන) පනත් කෙටුම්පතටත් එහා ගිය වෙනත් කාරණයක් ගරු ඇමතිතුමාගේ අවධානයට යොමු කරන්න මා කල්පනා කළා. ගරු අමාත්‍යතුමනි, සමථ මණ්ඩල ක්‍රියාවලියට අදාළ වටිනාකම රුපියල් 25,000 සිට රුපියල් 2,50,000 දක්වා අපි දැන් වැඩි කරලා තිබෙනවා. නමුත් මෙම අවස්ථාවේ මම තව කාරණයක් මතු කරනවා. උපදේශක කාරක සභාවේදීත් මම මෙය මතු කළා ඇමතිතුමනි. අද අපේ රටේ විරුද්ධවාදීන්ගෙන් පළි ගන්න, එහෙම නැත්නම් පොලීසියත් එක්ක යම් ආරාවුල් තිබෙන අයගෙන් පළි ගන්න පාවිච්චි කරන ප්‍රධාන නීතියක් තමයි පොදු දේපළ පනත. පොදු දේපළකට රුපියල් විසිපන්දාහකට වඩා හානියක් වුණා නම් අද ඇප ගන්නට බැහැ. එම නිසා මොකක්ද වන්නේ? එක පැත්තකින් දේශපාලන වශයෙන් විරුද්ධවාදීන්ට, ඒ වාගේම අනෙක් පැත්තෙන් පොලීසියත් එක්ක ගැටුම් ඇති කර ගන්නා අයට, පොලීසියට එකඟ නොවන අයට අද පොලීසිය ඉතාම නින්දිත විධියට, අසාධාරණ විධියට පොදු දේපළ පනත යටතේ නඩු පවරනවා. ඒ අත් දැකීමට අප පෞද්ගලිකව මුහුණ දුන්නා. අද මේ රටේ අධිකරණ පද්ධතියේ විභාග වන සමහර නඩු බැලුවාම, බන්ධනාගාර ගත වන අය බැලුවාම පොදු දේපළ පනත යටතේ නඩු පවරා අසාධාරණකම් කළ රාශියක් ඉන්නවා. ගරු ඇමතිතුමනි, අධිකරණ ඇමතිතුමා විධියට ඔබතුමාගේ අවධානයට මා මේ කාරණය යොමු කරනවා. සමථ මණ්ඩල පනතේ රුපියල් විසිපන්දාහේ සීමාව රුපියල් දෙලක්ෂ පණස්දාහ කළා වාගේම මේ පිළිබඳවත් -මේක ඊට වඩා බරපතළ කාරණයක්- අධිකරණ අමාත්‍යාංශයේ උපදේශක කාරක සභාව තුළ සාකච්ඡා කර මැදිහත් වීමක් කරන්නය කියන කාරණය මා මේ අවස්ථාවේදී යෝජනාවක් විධියට කියනවා.

ගරු ඇමතිතුමනි, මීටත් වඩා සමථ ක්‍රියාවලිය මේ සංශෝධනයෙන් එහාට ගිහින් තවත් පුළුල් කරන්න ඉඩකඩ හදා ගන්න, සාකච්ඡා අරඹන්න කියන යෝජනාවත් මේ අවස්ථාවේදී කියන්නට ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කාල වේලා අනුව, ගරු ෆීලික්ස් පෙරේරා ඇමතිතුමා ඉදිරිපත් කළ වැඩිහිටි තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ (සංශෝධන) පනත් කෙටුම්පත ගැන අපේ අදහස් එකතු කරන්නට ඕනෑ. අපි එතුමාට ස්තුතිවන්ත වනවා. විශේෂයෙන් මේ අණ පනත් ගෙන ඒම විතරක් නොවෙයි, වැඩිහිටි සමාජය පිළිබඳව මීට වඩා මැදිහත් වන්නටය කියා අප ආණ්ඩුවෙන් ඉල්ලීමක් කරනවා. මේ ආණ්ඩුව වැඩිහිටියන්ට හොඳට සලකන ආණ්ඩුවක්ය කියා අද රටේ සාකච්ඡා වෙනවා. විශේෂයෙන් වැඩිහිටි ඇමතිවරුන්; ජ්‍යෙෂ්ඨ ඇමතිවරුන් පත් කිරීමත් සමඟ වැඩිහිටියන්ට සලකන ආණ්ඩුවක් බවට මේ ආණ්ඩුව දැන් සැලෙන තැනක් අරගෙන තිබෙනවා. ඒක හොඳ දෙයක් විධියට තමයි ආණ්ඩුවේ අය කථා කරන්නේ. වැඩිහිටියන් අතර එක් ප්‍රධාන කොටසක් තමයි විශ්‍රාමිකයෝ. ගොවි විශ්‍රාමිකයා, ධීවර විශ්‍රාමිකයා, ඒ වාගේම විශ්‍රාම වැටුප කිසි සේත් නොලබන වැඩිහිටියා, මේ සමස්තය පිළිබඳව මීට වඩා පුළුල් වැඩ පිළිවෙළක් හැදෙන්න ඕනෑය කියන කතිකාව පසු ගිය අය වැය ලේඛනය හරහා ඉදිරිපත් වුණා. නමුත් ඒක මේ අය වැය ලේඛනයෙන් හෝ ප්‍රතිපත්ති ප්‍රකාශනවල සීමාවෙන් එහාට යා යුතුයි. ඒ සඳහා ක්‍රියාමාර්ගයක් ගත යුතුයි.

ගරු ඇමතිතුමනි, මේ කාරණය අප විශේෂයෙන් ඔබතුමාගේ අවධානයට යොමු කරනවා. "මහින්ද චින්තනය" යටතේත්, "මහින්ද චින්තන ඉදිරි දැක්ම" යටතේත් "ජ්‍යෙෂ්ඨ පුරවැසි බුහුමන්"වැඩසටහන ඉදිරිපත් කළා. මහින්ද චින්තන ඉදිරි දැක්මේදී ජ්‍යෙෂ්ඨ පුරවැසි රැකවරණය කියා කිව්වා. මේ චින්තන දෙකේම කියන දේවල් ඒ විධියට කෙරුණා ද? විශේෂයෙන් 2006ට පෙර විශ්‍රාම ලැබූ රජයේ සියලුම සේවකයන්ට 2006 වැටුප් ක්‍රමයට ගැළපෙන අයුරින් විශ්‍රාම වැටුප සකස් කරනවාය කියා රජය කිව්වා. මේක ඊ ළඟ අය වැයේදී ක්‍රියාත්මක කරනවාය කියා එදා කිව්වා. [බාධා කිරීමක්] පොල් සංවර්ධන ඇමතිතුමා මොකක් දෝ කිව්වා. ගරු ඇමතිතුමනි, මී ළඟ අය වැයේ සිට ක්‍රියාත්මක කරනවාය කිව්වා. ඒ, 2010 දී. මී ළඟ අය වැය කියන්නේ මේ පසු ගිය අය වැයයි. ඒක කෙරුණේත් නැහැ. විශ්‍රාමිකයන්ට වැඩි කරන එක කෙරුණේත් නැහැ. එම නිසා මේ මහින්ද චින්තන තුළ තිබුණු දෙයක්. මේ පනත් සම්මත කරන්නට කලින් කිව්වේ. මේක හොඳ දෙයක්. නමුත් ඒ කිව්ව දේවල් කෙරිලා නැහැ. විශ්‍රාමිකයන් වූ රජයේ සේවකයන්ට සෞඛ්‍ය පහසුකම් වෙනුවෙන් ඖෂධ හා වෛද්‍ය ගාස්තු සඳහා වර්ෂයකට රුපියල් දහදාහක් වන සෞඛ්‍ය රක්ෂණයක් හඳුන්වා දෙනවාය කිව්වා. මේ කිව්ව ඒවා. ඒවා කෙරිලා නැහැ. එම නිසා මා විශේෂයෙන් වැඩිහිටියන් ගැන බලා කියා ගන්න සිටින ගරු ඇමතිතුමනි, ඔබතුමාවත් මේ පිළිබඳව අරගලයක් කරන්නටය කියා ඉල්ලීමක් කරනවා.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

Order, please! ගරු අජිත් කුමාර මන්ත්‍රීතුමාට කථා කරන්න තව විනාඩියක් තිබෙනවා. Before he winds up, will an Hon. Member propose the Hon. Ajith P. Perera to take the Chair?

**ගරු ෆීලික්ස් පෙරේරා මහතා**
(மாண்புமிகு பீலிக்ஸ் பெரேரா)
(The Hon. Felix Perera)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ අවස්ථාවේදී "ගරු අජිත් පී. පෙරේරා මහතා මූලාසනය ගත යුතුය" යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා මූලාසනයෙන් ඉවත් වුයෙන් ගරු අජිත් පී. පෙරේරා මහතා මූලාසනාරූඪ විය.***

*அதன் பிறகு, மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு அஜித் பீ. பெரேரா அவர்கள் தலைமை வகித்தார்கள்.*

*Whereupon* THE HON. ALHAJ A.H.M. AZWER *left the Chair,* THE HON. AJITH P. PERERA *took the Chair.*

**ගරු අජිත් කුමාර මහතා**

(மாண்புமிகு அஜித் குமார)

(The Hon. Ajith Kumara)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා මූලාසනයේ සිටින අවස්ථාවේදී මට කථා කරන්නට ලැබීම ගැන මා සන්තෝෂ වනවා. "බාලගිරි දෝෂය අද නොවෙයි හෙට" වාගේ වන්නේ නැතිව ගරු ෆීලික්ස් පෙරේරා ඇමතිතුමනි, මේ යෝජනා ක්‍රියාත්මක කරන්න. මොකද, මහින්ද චින්තන වැඩ පිළිවෙළ තුළ තිබුණු ඒවා කරන්නට බැරි වෙලා. ඒවා මහින්ද චින්තන ඉදිරි දැක්මටත් ඇවිත් තිබෙනවා. ඉදිරි දැක්මේත් ඊ ළඟ පියවර විධියට ඇතුළත් කරන්න ඉඩ තියා ගන්නේ නැතිව මේවා ක්‍රියාත්මක කරන්නය කියන බලපෑම මා මේ අවස්ථාවේදී කරනවා.

ගොවි විශ්‍රාම වැටුප්, ධීවර විශ්‍රාම වැටුප් ගැනත් කියන්නට ඕනෑ. මේ වන කොට කෘෂි රක්ෂණ මණ්ඩලය අහෝසි කරන්න කැබිනට් පත්‍රිකාවක් ඔය වාගේම එනවාය කියා අප දැන ගෙන තිබෙනවා. ඇවිත් ද, නැද්ද දන්නේ නැහැ. ඇවිත් ද, නැද්ද කියා රජයේ කවුරු හෝ කියනවා නම් ඒක වඩා හොඳයි. අද ගොවීන්ට සහ ධීවරයන්ට ලැබෙන විශ්‍රාම වැටුප ප්‍රමාණවත් නොවනවා වාගේම ඒ ලැබෙන එකත් අහෝසි වන තැනට කටයුතු කරමින් යනවාය කියන සැකය මේ සමාජයේ තිබෙනවා. මොකද, ගොවි විශ්‍රාම වැටුප් දෙන ඒ අරමුදල එන්න එන්න හීන් වෙලා, ක්ෂය වෙමින් යනවා. ඒ නිසා ඒ පිළිබඳවත් මේ අවස්ථාවේදී අවධානය යොමු කරවන්න කැමැතියි. ඒ වාගේම සමස්ත සමාජයේම වැඩිහිටියන්ට විශ්‍රාම වැටුපක් දීම සඳහා ඇති යෝජනාව ප්‍රායෝගික තත්ත්වයට ගෙනෙන්න මැදිහත් වන්න කියන යෝජනාව අපි කරනවා.

ඒ වාගේම මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද සමාජයේ පිං පඩිය වශයෙන් හඳුන්වන වැඩිහිටි අසරණ සරණ දීමනාව රුපියල් 1,000ක් දක්වා ඉහළ නංවනවායි කියලා ගරු ජනාධිපතිතුමා කිව්වා. අපි දැන ගන්න කැමැතියි, රුපියල් 100, 120, 300 වශයෙන් දෙනු ලබන මේ දීමනාව රුපියල් 1,000 දක්වා වැඩි කරනවායි කියන ඒ පොරොන්දුව කවදා ඉඳලාද ඉෂ්ට වන්නේ කියලා. ඒ වාගේම අපි දන්නවා, අද රජය විසින් කළ යුතු වැඩ කටයුත්තක් විශේෂයෙන්ම ස්වේච්ඡා සංවිධාන වැඩිහිටි නිවාස හරහා ක්‍රියාත්මක කරන බව. මොකද, මේ පිං පඩිය කියා හඳුන්වන ඒ දීමනාව ගන්න යන කොට ඒ රුපියල් 100 වැය වනවා, බස් ගාස්තුවටම. තැපැල් කන්තෝරුවේ පෝලිමේ ඉන්න කොට ගරු ඇමතිතුමනි, ඒක ඉවරයි. නමුත් මේ මිනිස්සු රුපියල් 100 ගන්න පෝලිමේ ඉන්නේ මේ රුපියල් 100 ගැන හිතලාම නොවෙයි. එතැනදී වැඩිහිටි සමාජය හම්බ වනවා; මුණ ගැහෙනවා; සතුටු සාමීචියේ යෙදෙනවා. ඒ සුහදතාව, මානසික සුවය සඳහා තමයි ඔවුන් යන්නේ. නමුත් එයින් එහාට ගියපු පෞද්ගලික ප්‍රතිලාභයක් ඔවුනට ලබා දෙන්න ඕනෑයි කියන යෝජනාව මම මේ අවස්ථාවේදී ඉදිරිපත් කරනවා.

ඒ වාගේම වැඩිහිටි නිවාස බොහෝ ප්‍රමාණයක් කරන්නේ පෞද්ගලික ආයතන විසින්. මේ පනත් කෙටුම්පතේ 6 වන වගන්තියේ තිබෙනවා, වැඩිහිටියන්ට නේවාසික සත්කාර සැපයීමට ඒ පවත්වන ආයතන ලියා පදිංචි කරන්න ඕනෑයි කියලා. ගරු ඇමතිතුමනි, මේ ලියා පදිංචිය ඔවුන්ට වදයක් වෙන්න, කරදරයක් වෙන්න නොවෙයි සහනයක් වෙන්න කරන්න. මොකද, අද මේ රටේ කුණු ගොඩටත් බදු ගහන තත්ත්වයකදී යම් සැකයක් ඇති වනවා, මේවාත් ආපහු බදු ගහන්න හෝ මොනවා හෝ රජයට ආදායම් එන්න හදන වැඩද කියලා.

අපි දන්නවා, විශේෂයෙන් ගාල්ල දිස්ත්‍රික්කයේ සෙනරත් පරණවිතාන මැතිතුමා ඉගෙන ගත්ත රංවලගොඩ විහාරයේ ධම්මාලෝක හාමුදුරුවෝ ඉතා අමාරුවෙන් වැඩිහිටි නිවාසයක් කර ගෙන යන බව. ගාල්ලේ තරුණ බෞද්ධ සංගමය අවුරුදු හැට ගණනක් තිස්සේ ඒ වැඩිහිටි නිවාසය කර ගෙන යනවා. නමුත් මේ වැඩිහිටි නිවාසයකට හම්බ වෙන්නේ කීයද? එක් කෙනෙකුට රුපියල් 300යි. මරණයක් වුණාම රුපියල් 2,500යි. වතුර බිල්, ලයිට් බිල්, ටෙලිෆෝන් බිල් ගෙවන්න ඕනෑ. විශේෂයෙන් LECO එක හරහා ගෙවන බිල්වලටත් රජයෙන් ලැබෙන සහනය ලැබෙන්නෙත් නැහැ. ඒ නිසා අද මෙවැනි ස්වේච්ඡාවෙන් පවත්වන ආයතන ලියා පදිංචි කරන්න යෝජනා කරන කොට ඔවුන්ට ඒක කරදරයක් වන විධියට කරන්නේ නැතුව ඔවුන්ට ඒක සහනයක් වන විධියට කරන්න කියන අතරේ ස්වේච්ඡාවෙන් පවත්වා ගෙන යන විහාරස්ථාන හා අනෙකුත් ආයතන කේන්ද්‍ර කර ගෙන පවත්වා ගෙන යනු ලබන වැඩිහිටි නිවාස ආරක්ෂා කරන්න රජයෙන් මීට වඩා මැදිහත් වීමක්, ප්‍රතිපාදනයක් ලබා දෙන්න කියන යෝජනාව මේ අවස්ථාවේදී කරමින් මගේ අදහස් දැක්වීම අවසන් කරනවා. බොහොම ස්තුතියි.

[අ. භා. 5.57]

**ගරු රෙජිනෝල්ඩ් කුරේ මහතා (සුළු අපනයන භෝග ප්‍රවර්ධන අමාත්‍යතුමා)**

(மாண்புமிகு ரெஜினோல்ட் குரே - சிறு ஏற்றுமதிப் பயிர்கள் ஊக்குவிப்பு அமைச்சர்)

(The Hon. Reginold Cooray -Minister of Minor Export Crop Promotion)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද අපි මේ එක් රැස් වී සාකච්ඡා කරන්නේ වැඩිහිටියන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමටත්, ඒ වාගේම නීතිය තවදුරටත් ජනතාවට සමීප, ලෙන්ගතු ලිහිල් ක්‍රියාවලියක් බවට පත් කිරීමටත් දරනා ප්‍රයත්නයක් වෙනුවෙන් ඉදිරිපත් කරපු පනත් කෙටුම්පතක් සම්බන්ධයෙනුයි.

යම් කිසි රටක නීති රීති, අණ පනත්, නියෝග, විධිවිධාන හා දඬුවම් කොයි තරම් ප්‍රමාණයකට වැඩි වනවාද, ඒ වැඩි වන ස්වරූපයට අනුව එය පිළිබිඹුවක් බවට පත් වනවා, ඒ සමාජය තුළ පවතින්නා වූ සදාචාර හොඳා පාළුව, පරිහානිය හා කඩා වැටීම කියන ඒවායේ. නීති රීති, අණ පනත් නැතුව හෘදය සාක්ෂියට අනුව දෙයියෝ බුදුන් අදහන ලෝකයක, හදවතින් ඇතිවන හැඟීම මත දෙමවුපියන්ට සලකපු රටේ, දරුවන් රැකපු රටේ, සත්ව හිංසාව නොකර හිටපු රටේ, ආගමින් දහමින් හික්මවපු රටේ අද ඒ දහම් පිළිවෙත් හර පද්ධතීන් සිඳ බිඳ දමමින් නීති රීති අණ පනත් බවට පත් වන්නට පටන් ගෙන තිබෙනවා. නීතියක් රීතියක් හැටියට අණ පනතක් ගෙනෙන එක තුළින් සමාජයට යම් කිසි ශක්තියක් ලැබෙනවා වාගේම සමාජයේ විශාල අභ්‍යන්තර බිඳ වැටීමක්ද තිබෙන බව කියන්නටයි මම යන්නේ.

කෙනෙක් තමන්ගේ හෘදය සාක්ෂියට අනුව, හදවතට අනුව, ඇදහිලි අනුව සමාජය යහ මඟට ගෙන ගිය මාවත අත් හැරලා පොලිසිය, උසාවිය, අධිකරණයේ නීතිය, අණ පනත් මඟින් මිනිසුන්ව හික්ම වන්නට යන එක තුළ මා දකින්නේ බරපතළ කඩා වැටීමක් හා ඇද වැටීමක් ඇති බවයි. වැඩිහිටියන්ට නොසලකන එක ගැන අද අපි බොහෝ දෙනා කල්පනා කරනවා. අනික් අතට අපි කතා කරනවා, පුංචි දරුවන්ට නොසලකන එක ගැන. වැඩිහිටියන් රකින්න වීමත්, දරුවන් රකින්න අණ පනත් ගෙනෙන්න සිදු වීමත් එකම කාසියේ දෙපැත්තක් හැටියට, සදාචාර සෝදා පාළුවක් හා කඩා වැටීමක් හැටියට මා දකිනවා. අද දරුවා හෙට වැඩිහිටියා. යම් කිසි කාලයකදී දරුවන්ට යම් යම් දේ නොලැබීම පසු කාලයකදී වැඩිහිටියන් නොසලකන්නත් හේතුවක් වෙනවාය කියන එක මම මේ අවස්ථාවේදී ඉතා පැහැදිලිව කියනවා. මම දැකපු එක දෙයක් තමයි පසු ගිය කාලයේදී අපේ වැඩිහිටියන් විසින් දරුවන්ට මොන තරම් අසාධාරණකම් සිද්ධ කළාද කියන එක. වැඩිහිටියන්ගේ

අයිතිවාසිකම් ආරක්ෂා කරන මේ මොහොත වන කොට මම කියන්න කැමැතියි, අද මේ ඇති වෙලා තිබෙන තත්ත්වයට හැදෙන දරුවන්ටම, නව පරම්පරාවටම, තරුණයන්ට විතරක් දොස් කියන්න අයිතියක් නැහැ කියා. ඒකට හේතුව මේ සමාජ ක්‍රමය නිර්මාණය කිරීමෙහි ලා, මේ සමාජ ක්‍රමය මේ විධියට මෙතැනට ගෙන ඒමෙහි ලා වැඩිහිටියන්ටත් යම් කිසි වග කීමක් තිබෙන නිසායි. ඒ නිසා අද වැඩිහිටියන් දුක් විඳින්නේ වැඩිහිටියන් විසින්ම නිර්මාණය කරන ලද ලෝකයේ ඒ අවාසනාවේ අතුරු ප්‍රතිඵලයක් හැටියටය කියන එක මට කියන්නට සිද්ධ වෙනවා. උදාහරණයක් හැටියට මම කියන්න කැමැතියි, ඒ දවස්වල අම්මා කෙනෙක් දරුවෙකුට කිරි දුන්නේ මහා කැමැත්තකින්, ආසාවකින්, දරු සෙනෙහසින්, නැළවිලි ගීත කියමින්. අද මව් කිරි දෙනවාය කියන එක සල්ලි වියදම් කර ගෙන, රූපවාහිනියෙන්, ගුවන් විදුලියෙන් ප්‍රචාරය කරලා දැනුවත් කරලා කරන්න ඕනෑ දෙයක් වෙලා තිබෙනවා. කිරි එරෙන්නේ කාගේවත් ප්‍රචාරක දැන්වීම්වලට නොවෙයි. ස්වාභාවිකවම මව් පියයුරුවලට කිරි එරෙනවා. ස්වාභාවිකව පියයුරුවලට එරෙන කිරි දරුවන්ගේ දෙතොළින් උදුරා ගෙන ඔවුන්ට නොදී, ඒ වෙනුවට ඔවුන්ට නවසීලන්තයෙන්, ඕස්ට්‍රේලියාවෙන් ගෙනෙන පිටි කිරි දෙන්න පටන් ගත්තා. මට මතකයි ඒ දවස්වල අපේ අම්මලා අපට කියපු දෙයක් තමයි, "පුතේ මම උඹව දස මාසයක් කුසේ දරාගෙන ලේ කිරි කර පොවලා, මම කන්නේ නැතුව උඹට කන්න දීලා, මම අඳින්නේ නැතුව උඹට අඳින්න දීලා, ඇඟේ මූණේ තියා ගෙනයි මම උඹ හැදුවේ" කියන එක. නමුත් අද සමහර අම්මලාට ඒක කියන්න පුළුවන්කමක් නැහැ. දැන් ඉන්න අම්මා කෙනෙක් වැරදිලාවත් පුංචි දරුවෙකුට කිව්වොත් මම උඹට කිරි දුන්නාය කියා, ඒ දරුවො කියාවි "අම්මා, බොරු කියන්න එපා"ය කියා. අර කුස්සියේ තිබෙන SMA, Oster Milk ටින් කාට පොවපු ඒවාද කියා අසාවි. දස මාසයක් කුසේ දරා ගෙන හිටි එක ඇත්තයි. නමුත් කිරි දෙන අම්මලා හිටියේ ඕස්ට්‍රේලියාවේ, ඩවුන්ස් තණ බිම්වලය කියා කිව්වොත් දෙන්න උත්තරයක් තිබෙනවාද කියා මම අහන්න කැමැතියි. දරුවො හදපු බව ඇත්තයි. නමුත් කිරි දුන්නු අම්මලා ඉන්නේ නවසීලන්තයේ සහ ඕස්ට්‍රේලියාවේයි. ඒ නිසා අද වැඩිහිටියන්ගෙනුත් දරුවන්ට ඉටු විය යුතු යුතුකම් නොසිදු වීම නිසා ඒ ක්‍රියාවන්හි ප්‍රතික්‍රියාවක් හැටියට මා දකිනවා, දරුවන් විසින් දෙමව්පියන් නොසලකා හැරීම. අද අපේ රටේ අම්මාවරු අටලක්ෂයක්, දසලක්ෂයක් විතර පිට රටවල ඉන්නවා. එතකොට පියවරුත් එහෙමයි. ඒ මව්වරුන්ගේ, පියවරුන්ගේ සෙනෙහස දරුවන්ට ලැබෙන්නේ නැහැ. ඔවුන්ට ඒක දකින්න, අත් විඳින්න හැකියාවක් නැහැ. අම්මායි, තාත්තයි දෙදෙනාම රැකියාවලට ගිහිල්ලා. ඒ නිසා ඒ දරුවන්ට මව් පිය සෙනෙහස විඳින්න ලැබෙන්නේ නැහැ. මට මතකයි මම එක දවසක් දරුවෙකුගෙන් ඇහුවා ලොකු වුණාම තාත්තාට මොනවාද කරන්නේ කියා. එතකොට ඒ පුංචි දරුවා කිව්වා, "මම තාත්තාව - [බාධා කිරීමක්]

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

කරුණාකර නිශ්ශබ්ද වෙන්න. මේ අවස්ථාවේදී ගරු නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයට පැමිණෙනවා ඇති.

***අනතුරුව ගරු අජිත් පී. පෙරේරා මහතා මූලාසනයෙන් ඉවත් වුයෙන්, නියෝජ්‍ය කථානායකතුමා මූලාසනාරූඪ විය.***

*அதன் பிறகு, மாண்புமிகு அஜித் பீ. பெரேரா அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, பிரதிச் சபாநாயகர் அவர்கள் தலைமை வகித்தார்கள்.*

*Whereupon* THE HON. AJITH P. PERERA *left the Chair, and* MR. DEPUTY SPEAKER *took the Chair.*

**ගරු රෙජිනෝල්ඩ් කුරේ මහතා**
(மாண்புமிகு ரெஜினோல்ட் குரே)
(The Hon. Reginold Cooray)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, දැන් අපි වැඩිහිටි නිවාස ගැන කතා කරනවා. ගෙවල්වල හිටපු අපේ අම්මලා, තාත්තලා දැන් වැඩිහිටි නිවාසවලට ගෙනිහින් ගාල් කරනවා. ඒ අම්මලා තාත්තලාම තමයි දරුවන්ව day care centre එකට ගෙනිහිල්ලා ගාල් කළේ. ඒ නිසා පුංචි කාලයේ දරුවන්ව day care centre එකට ගෙනිහිල්ලා දාන්න අම්මාට අයිතියක් තිබෙනවා නම්, දරුවෝ අනෙක් පැත්තට පෙරළා තර්ක කරන්න පුළුවන් ඔවුන් වැඩිහිටියෝ වුණාම ඔවුන්ව වැඩිහිටි නිවාසයකට ගෙනිහිල්ලා දමන එකත් සාධාරණයි කියලා. ඒ නිසා මෙවැනි සමාජ පිරිහීමකට අපි මේ අණපනත්වලින් සුරක්ෂිතභාවය දෙන්නට හැදුවත් මම හිතන්නේ ඒක තවත් දුෂ්කර වූ, කටුක වූ, ඒ වාගේම කඩා වැටෙන එකට අපි කරන අසාර්ථක ප්‍රයත්නයක් කියලායි. ඒ විධියට තමයි මම දකින්නේ. නමුත් පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් හැටියට, ව්‍යවස්ථාදායක සභාවේ ඉන්න දේශපාලනඥයන් හැටියට, ජනතා නියෝජිතයන් හැටියට අපට කළ හැකි එක වැඩක් තමයි මේවාට අණපනත් සම්මත කිරීම. නමුත් මම හිතනවා, රජයක් හැටියට අපේ යුතුකමක් තිබෙනවාය කියා, අපේ සාර ධර්ම අගය කරන සමාජ ක්‍රමයක් නැවත ඇති කිරීම සඳහා ඒකට අවශ්‍ය වෙනත් අවශේෂ පියවරත් මේ සමඟ ගැනීමට කටයුතු කිරීමට. දරුවන් තමන්ගේ හෘදය සාක්ෂිය අනුව තම දෙමවුපියන්ට සාධාරණය ඉෂ්ට කරන්නේ නැත්නම් ඒ දෙමවුපියන්ට, වැඩිහිටියන්ට සිදු වන මේ අසාධාරණය වෙනුවෙන් නීතිය ඉදිරිපත් වීමේ ඓතිහාසික කාර්ය භාරය ඉෂ්ට කරන්නට එතුමා මූලික වීම ගැන ගරු ඇමතිතුමාට මා ස්තුතිවන්ත වනවා.

සමථ මණ්ඩල (සංශෝධන) පනත් කෙටුම්පත පිළිබඳවත් මා මේ අවස්ථාවේදී අදහස් දක්වන්න කැමැතියි. ගාම්භීර, ඒ වාගේම සම්භාව්‍ය, සාඩම්බර, අහංකාර, පරවශ, අධිකාරිවාදී, වියදම් අධික, අහසින් මිහි මත පතිත වන මහ බලයක් හැටියටයි අපට අධිකරණය පේන්නේ. ඒ වෙනුවට, මා විශේෂයෙන් සඳහන් කරන්න කැමැතියි, හිටපු අධිකරණ අමාත්‍යතුමා -අතාවුද සෙනෙවිරත්න මැතිතුමා- ගෙනාපු පියවර ඉදිරියට ගෙන යමින් හකීම් ඇමතිතුමා ජනතාවට ජනතාවාදී, වියදම් අධික නැති, ලෙන්ගතු, හිතවත්, සමීප, නියෝගවලින් තොරව මේ ජනතාව අතරින් එකමුතුකමක් ඇතිව මේ වැඩ කොටස කරන්නට යන එක ගැන. මා එතුමාට ඒ ගැන ස්තුතිවන්ත වෙනවා. හැබැයි මේ සමථ මණ්ඩල ක්‍රියාවලියට යම් අවකාශ පහසුකම් සලසනවා විනා, මේ සමථ මණ්ඩල ක්‍රියාවලිය වුණත් ඉතා වේගයෙන් ඉක්මනට මිනිසුන් අතරට ගෙන යන්න ඒක අණපනත් මඟින් වඩවඩා බලසම්පන්න කරන්න ගියොත් නැවත වතාවක් ඒකත් උසාවියක් බවට පත් වෙනවා. ඒ නිසා අවශ්‍ය වන්නේ සමථ මණ්ඩලවලට විහිදීමට අවශ්‍ය පහසුකම් සලසා දී අවහිරතා මහ හරවාලමින් ඒකට වැඩි අවකාශයක් සලසා දීමයි. ඒ මිස එය තවත් ආයතනයක් බවට පත් නොකළ යුතුයි කියන එකයි මගේ අවංක හැඟීම. එයට නිදහසේ හෙම්හිට වැඩෙන්න කල් අවශ්‍යයි කියන එකයි මගේ අවංක හැඟීම. ඒ නිසා මම ගරු ඇමතිතුමාට ස්තුතිවන්ත වෙනවා, මේ පනත් කෙටුම්පත ගෙනැල්ලා ජනතාවට මහ බරක් වෙලා තිබෙන මේ අධිකරණ ක්‍රියාවලිය සැහැල්ලු කිරීමට කටයුතු කිරීම පිළිබඳව. බොහොම ස්තුතියි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
***පනත් කෙටුම්පත ඊට අනුකූලව දෙ වන වර කියවන ලදී.***
*வினா விடுக்கப்பட்டு, ஏற்றுக் கொள்ளப்பட்டது.*
*அதன்படி, சட்டமூலம் இரண்டாம் முறையாக மதிப்பிடப்பட்டது.*
*Question put, and agreed to.*
*Bill accordingly read a Second time.*

***මතු පළවන යෝජනාව සභා සම්මත විය.:***
***"පනත් කෙටුම්පත පූර්ණ පාර්ලිමේන්තු කාරක සභාවකට පැවරිය යුතු ය." -[ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා ]***
*தீர்மானிக்கப்பட்டது.*
*"சட்டமூலம் முழுப் பாராளுமன்றக் குழுவுக்குச் சாட்டப் படுமாக" [ மாண்புமிகு நிமல் சிறிபால த சில்வா ]*
*Resolved:*
*"That the Bill be referred to a Committee of the whole Parliament." - [ The Hon. Nimal Siripala De Silva.]*

*කාරක සභාවෙහිදී සලකා බලන ලදී.*
*[නියෝජ්‍ය කථානායකතුමා මූලාසනාරූඪ විය.]*
*குழுவில் ஆராயப்பட்டது.*
*[பிரதிச் சபாநாயகர் அவர்கள் தலைமை வகித்தார்கள்.]*
*Considered in Committee.*
*[MR. DEPUTY SPEAKER in the Chair.]*

*1 සිට 9 තෙක් වගන්ති පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.*
*1ஆம் வாசகத்திலிருந்து 9 ஆம் வாசகம் வரை சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*
*Clauses 1 to 9 ordered to stand part of the Bill.*

## 10 වන වගන්තිය.- (ප්‍රධාන ප්‍රඥප්තියේ 28 වන වගන්තිය සංශෝධනය කිරීම)
## 10 ஆம் வாசகம்.- (முதன்மைச் சட்டவாக்கத்தின் 28 ஆம் பிரிவைத் திருத்துதல்)
CLAUSE 10. - (Amendment of section 28 of the principal enactment)

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)

ගරු සභාපතිතුමනි, මා පහත සඳහන් සංශෝධනය ඉදිරිපත් කරනවා:

"5 වන පිටුවේ, 13 වන පේළිය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

'යෝජිතයාගෙන් ඉල්ලා සිටිය හැකි ය.' "

*සංශෝධනය පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*திருத்தம் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Amendment put, and agreed to.*

*10 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.*
*10ஆம் வாசகம் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*
*Clause 10, as amended, ordered to stand part of the Bill.*

*11 වන වගන්තිය පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.*
*11ஆம் வாசகம் சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டு மெனக் கட்டளையிடப்பட்டது.*
*Clauses 11 ordered to stand part of the Bill.*

*ප්‍රඥප්ති වගන්තිය සහ නාමය පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.*
*පනත් කෙටුම්පත, සංශෝධන සහිතව වාර්තා කරන ලදී.*
*சட்டமாகு வாசகமும் தலைப்பும் சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*
*சட்டமூலம் திருத்தங்களுடன் அறிக்கை செய்யப்பட்டது.*
*Enacting Clause and Title ordered to stand part of the Bill.*
*Bill reported with Amendments.*

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, "පනත් කෙටුම්පත සංශෝධිතාකාරයෙන් දැන් තුන්වන වර කියවිය යුතුය"යි මා යෝජනා කරනවා.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*පනත් කෙටුම්පත ඊට අනුකූලව සංශෝධිතාකාරයෙන්, තුන් වන වර කියවා සම්මත කරන ලදී.*

*வினா விடுக்கப்பட்டு, ஏற்றுக்கொள்ளப்பட்டது.*
*அதன்படி, சட்டமூலம் திருத்தப்பட்டவாறு மூன்றாம் முறையாக மதிப்பிடப்பட்டு நிறைவேற்றப்பட்டது.*

*Question put, and agreed to.*
*Bill, as amended, accordingly read the Third time, and passed.*

## සමථ මණ්ඩල (සංශෝධන) පනත් කෙටුම්පත
## மத்தியஸ்த சபைகள் (திருத்தம்) சட்டமூலம்
## MEDIATION BOARDS (AMENDMENT) BILL

*දෙ වන වර කියවීමේ නියෝගය කියවන ලදී.*
*இரண்டாம் மதிப்பிற்கான கட்டளை வாசிக்கப்பட்டது.*
*Order for Second Reading read.*

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, "පනත් කෙටුම්පත දැන් දෙවන වර කියවිය යුතුය"යි මා යෝජනා කරනවා.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*පනත් කෙටුම්පත ඊට අනුකූලව දෙවන වර කියවන ලදී.*
*வினா விடுக்கப்பட்டு, ஏற்றுக் கொள்ளப்பட்டது.*
*அதன்படி, சட்டமூலம் இரண்டாம் முறையாக மதிப்பிடப்பட்டது.*

*Question put, and agreed to.*
*Bill accordingly read a Second time.*

*මතු පළවන යෝජනාව සභා සම්මත විය.:*
*"පනත් කෙටුම්පත පූර්ණ පාර්ලිමේන්තු කාරක සභාවකට පැවරිය යුතු ය." -[ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා]*

*தீர்மானிக்கப்பட்டது.*
*"சட்டமூலம் முழுப் பாராளுமன்றக் குழுவுக்குச் சாட்டப் படுமாக" [ மாண்புமிகு நிமல் சிறிபால த சில்வா ]*

*Resolved:*
*"That the Bill be referred to a Committee of the whole Parliament." - [The Hon. Nimal Siripala de Silva.]*

*කාරක සභාවෙහිදී සලකා බලන ලදී.*
*[නියෝජ්‍ය කථානායකතුමා මූලාසනාරූඪ විය.]*

*குழுவில் மேலும் ஆராயப்பட்டது.*
*[பிரதிச் சபாநாயகர் அவர்கள் தலைமை வகித்தார்கள்.]*

*Considered further in Committee. -*
[MR. DEPUTY SPEAKER *in the Chair.]*

*1 වන වගන්තිය පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.*

*1 ஆம் வாசகம் சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*

*Clause 1 ordered to stand part of the Bill.*

## 2 වන වගන්තිය.- (1988 අංක 72 දරන පනතේ 7 වන වගන්තිය සංශෝධනය කිරීම)
வாசகம் 2.- (1988 ஆம் ஆண்டின் 72ஆம் இலக்கச் சட்டத்தின் 7 ஆம் பிரிவைத் திருத்துதல்.)
CLAUSE 2. - *(Amendment of section 7 of Act, No. 72 of 1988)*

**ගරු රවුෆ් හකීම් මහතා**
(மாண்புமிகு றவுப் ஹக்கீம்)
(The Hon. Rauff Hakeem)
ගරු සභාපතිතුමනි, මා පහත සඳහන් සංශෝධනය ඉදිරිපත් කරනවා:

"1 වන පිටුවේ, 17 වන පේළිය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

' (ඇ) ඒ වරද, වටිනාකම රුපියල් පන්දහසක් ' "

***සංශෝධනය පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***

*திருத்தம் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Amendment put, and agreed to.*

***2 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***

*2 ஆம் வாசகம் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*
*Clause 2, as amended, ordered to stand part of the Bill.*

***3 වන වගන්තිය පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.***

*3 ஆம் வாசகம் சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*
*Clause 3 Ordered to stand part of the Bill.*

***ප්‍රඥප්ති වගන්තිය සහ නාමය පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.***
***පනත් කෙටුම්පත, සංශෝධන සහිතව, වාර්තා කරන ලදී.***

*சட்டமாகு வாசகமும் தலைப்பும் சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*
*சட்டமூலம் திருத்தங்களுடன் அறிக்கை செய்யப்பட்டது.*

*Enacting Clause and Title ordered to stand part of the Bill.*
*Bill reported with Amendments.*

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, "පනත් කෙටුම්පත දැන් තුන්වන වර කියවිය යුතුය"යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
***පනත් කෙටුම්පත ඊට අනුකූලව සංශෝධිතාකාරයෙන්, තුන්වන වර කියවා සම්මත කරන ලදී.***

*வினா விடுக்கப்பட்டு, ஏற்றுக்கொள்ளப்பட்டது.*
*அதன்படி, சட்டமூலம் திருத்தப்பட்டவாறு மூன்றாம் முறையாக மதிப்பிடப்பட்டு நிறைவேற்றப்பட்டது.*

*Question put, and agreed to.*
*Bill, as amended, accordingly read the Third time, and passed.*

## මහජන ආරක්ෂක ප්‍රකාශනය
பொதுசனப் பாதுகாப்புப் பிரகடனம்
PUBLIC SECURITY PROCLAMATION

**ගරු දි.මු. ජයරත්න මහතා (අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා)**
(மாண்புமிகு டீ.எம்.ஜயரத்ன - பிரதம அமைச்சரும் பௌத்த சாசன, மத அலுவல்கள் அமைச்சரும்)
(The Hon. D.M. Jayaratne - Prime Minister, Minister of Buddha Sasana and Religious Affairs)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"1959 අංක 8 දරන පනතින් ද, ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 6 දරන පනතින් සහ 1988 අංක 28 දරන පනතින් ද සංශෝධිත (40 වැනි අධිකාරය වූ) මහජන ආරක්ෂක ආඥාපනතේ 2 වැනි වගන්තිය යටතේ ජනාධිපතිතුමා විසින් ඉහත කී ආඥාපනතේ II වැනි කොටසේ විධිවිධාන 2011 ජනවාරි මස 18 වැනි දින සිට ශ්‍රී ලංකාව මුළුල්ලේම ක්‍රියාත්මක කරමින් කරන ලද ප්‍රකාශනය අනුමත කළ යුතු ය."

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විශේෂයෙන්ම හදිසි නීතිය නියමිත පරිදි ලබන මස 08 වෙනි දාට ගැනීම මඟින් නීතිමය බාධාවක් පැන නඟින බව ආණ්ඩු පක්ෂය දන්වා සිටියා. ඒ අනුව තමයි අපි අද ඡන්ද විමසීම පමණක් ගැනීමට එකඟතාවකට ආවේ. නමුත් 08 වෙනි දා හදිසි නීති තත්ත්වය පිළිබඳව කල් තැබීමේ යෝජනාවක් ගෙනැල්ලා දවසම එය සාකච්ඡා කරන්න අපට අවස්ථාවක් ලබා දෙන්න කියා ඉල්ලා සිටින්නට කැමැතියි.

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)
පක්ෂ නායක රැස්වීමේදී එකඟ වූ පරිදි 08 වෙනි දා අපි ඒ විවාදය ලබා දෙනවා.

***ප්‍රශ්නය විමසන ලදී.***
***කටහඬවල් අනුව "පක්ෂ" මන්ත්‍රීන්ට ජය බව නියෝජ්‍ය කථානායකතුමා විසින් ප්‍රකාශ කරන ලදී.***

*வினா விடுக்கப்பட்டது.*
*குரல்களின்படி "ஆம்" மேலோங்கிற்று என பிரதிச் சபாநாயகர் அவர்கள் அறிவித்தார்கள்.*

*Question put.*
MR. DEPUTY SPEAKER, *having collected the Voices, declared that the "Ayes" had it.*

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
බෙදීමක් අවශ්‍යයි.

***පාර්ලිමේන්තුව 43 වන ස්ථාවර නියෝගය යටතේ - පක්ෂව 123: විරුද්ධව 5 යනුවෙන් බෙදුණේය.***

*பாராளுமன்றம் 43 ஆம் நிலைக்கட்டளைப்படி பிரிந்தது: சார்பாக 123; எதிராக 5.*

*The Parliament divided under Standing Order No. 43: Ayes:123; Noes: 5.*

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ඒ අනුව යෝජනාව වැඩි ඡන්දයෙන් සම්මත වූ බව මම ප්‍රකාශ කරමි.

## කල්තැබීම
## ஒத்திவைப்பு
## ADJOURNMENT

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, "පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතුය"යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.***
*வினா எடுத்தியம்பப்பெற்றது.*
*Question proposed.*

## ප්‍රාසාංගික කලාවන් සඳහා ජාතික රංග ශාලාවක් ස්ථාපනය කිරීම
## அரங்கியற் கலைகளுக்கெனத் தேசிய அரங்கம் ஒன்றினைத் தாபித்தல்
## ESTABLISHMENT OF A NATIONAL THEATRE FOR PERFORMING ARTS

**ගරු මහාචාර්ය රාජීව විජේසිංහ මහතා**
(மாண்புமிகு பேராசிரியர் ராஜீவ விஜேசிங்க)
(The Hon. (Prof.) Rajiva Wijesinha)

Mr. Deputy Speaker, I move,

"In view of the importance of the performing arts for education as well as national integration, this House do stand adjourned to urge the establishment of a National Theatre that would:

a) establish a theatre group able to perform in all three national languages;

b) introduce high level training in performance and production, including the capacity to develop productions for touring islandwide;

c) encourage productions that use other art forms, in particular music and dance, to promote wider understanding of pluralistic cultural traditions;

d) develop links with the broadcasting media to ensure wider dissemination of productions and

e) act as a flagship for provincial and other troupes while providing opportunities to showcase local talent."

Sir, I am very pleased to be able to speak on this Adjournment Motion today which I first suggested a few months ago. The main reason for advancing this is that it is based on a principle -

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

Order, please! Will an Hon. Member propose the Hon. Alhaj A.H.M. Azwer to take the Chair?

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)

I propose that the Hon. Alhaj A.H.M. Azwer do now take the Chair.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා මූලාසනාරූඪ විය.***

*அதன் பிறகு, பிரதிச் பிரதிச் சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர் அவர்கள் தலைமை வகித்தார்கள்.*

*Whereupon* MR. DEPUTY SPEAKER *left the Chair, and* THE HON. ALHAJ A.H.M. AZWER *took the Chair.*

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

Hon. Member, you can continue.

**ගරු මහාචාර්ය රාජීව විජේසිංහ මහතා**
(மாண்புமிகு பேராசிரியர் ராஜீவ விஜேசிங்க)
(The Hon. (Prof.) Rajiva Wijesinha)

Sir, the main reason for proposing this Motion is that it is based on a principle that has proved extremely effective in helping to build up nations that are in situations like our own. The main purpose of this Motion is to encourage the Ministry of Cultural Affairs to set up a national theatre that will act as a catalyst not only for artistic purposes but also for the purpose of nation building by bringing together many people from all over this country to work together. As you know, the arts is an extremely good instrument of building up discipline and socialization and it is a pity that we have not got anything of the sort. If you look at several countries near our own, for instance, India and China have done a lot of investment in the arts and this has not only produced very disciplined young people but created a sense of togetherness since people come from all over the country to work together. This is not something that Sri Lanka has spent much attention on over the last few decades and it shows, because there are a few areas in which our young people can work together, can feel a spirit of competition, can try to do their best to reach standards of excellence in which they will have to co-operate with each other.

There have been some attempts at this in the past. For instance, the National Youth Services Council developed a dance troupe that tries to showcase a lot of excellent items from all over the county together. Certainly, this idea has been at the basis of a lot of work done. For instance, if we look at the programme for the Independence Day festival which will take place on the 4th of February in Kataragama, the young people of the entire Uva Province will come together to perform in a range of artistic activities that will showcase a lot of the different styles of art practised by the many citizens of this multicultural nation.

In a sense, we should not be happy with only festival events, but there should be a long sustained programme of training. I am very happy that long after I put this Motion as a suggestion, the Ministry of Culture and the Arts has moved in a more active way towards the

promotion of multiculturalism. The cultural centres that they plan all over the country should be a showcase for this purpose and very recently they have written to all district secretaries stressing the need for multiculturalism**.** I hope that this will lead to all Public servants being aware of the need for this. But, this particular Motion, Sir, dwells on the subject of a national theatre and this is something that I think is particularly important because theatre is something that brings together many art forms and which also encourages communication in a very direct fashion. Even though I think we can be very optimistic about the effects of things like dance, of things like the plastic arts, of the visual arts, of paintings and of sculpture in encouraging self expression; there is something very, very special about the spoken word. There is something very special about groups of people getting together for getting themselves in an attempt to work together to put on an artistic production. It is extremely important that communication and skills in developing contacts with other people are developed amongst the youngsters of this country who come from such diverse backgrounds and a national theatre will certainly help in that respect. It will also be a spur to one of the fundamental principles of the "Mahinda Chintana" that this country has endorsed so resoundingly over the last few years and that is the principle of multilingualism.

Theatre alone, amongst the arts, will ensure the encouragement of learning other languages. There have been attempts, most notably in the University of Colombo to have bilingual and trilingual productions. But, these again are events that happened as one-offs. What is important is a group of young people working together in a sustained fashion to understand each other; to speak each other's languages; to be sympathetic and understanding about the different nuances that will be expressed in the different languages, and that is why I think theatre is so particularly important.

Another aspect of this Motion that I have advanced - I hope it will be possible for the Hon. Minister of Culture and the Arts to take this up - is that such a theatre group should also engage in high-level training for both performance and production and develop productions for touring islandwide. Although in the past we have had a great tradition of drama by amateurs, when we read the records of the work done by such people, most recently the extremely interesting account by Henry Jayasena of his many years of work in theatre all over the country, we realized how difficult it was for artistes to work at the widest possible levels and that is an area in which most countries have a subsidized national theatre that will not only work in the capital but will move towards the provinces.

I have also suggested that such a theatre does not concentrate only on what you might call "pure theatre", that adduces other art forms, in particular, music and dance that will promote understanding of wider cultural traditions.

This of course is something that again this country has seen in a magnificent fashion in some of the greatest productions of theatre as with the seminal place of Prof. Sarathchandra where many arts forms are used together. But, that tradition seems to be fading and we need a little input from the State in order to develop that whole system of a holistic approach to theatre. That is why I hope that that element too will be encouraged. I think we also need to develop links with the broadcasting media because although at the moment we have a flourishing teledrama industry, it really does not act in the course of high art and of art that can engage in the understanding that a national theatre could do.

Finally, I think a national theatre of this sort could actually help with highlighting and foregrounding regional talent. After I drafted this Motion, I saw the enormous impact that can be had by the theatre, the Performing Arts Centre, that is being built for us with the assistance of the Chinese Government and the way it has developed so rapidly over the very short period, the last six months, to turn into a really beautiful building, which means that it will be an appropriate place to house such a national theatre and correspondingly such a beautiful building deserves a national theatre and should not be left on its own. I think the Hon. Minister of Culture and the Arts has inherited a very fortunate portfolio at the right time, in that, he will have this theatre to inaugurate over the next year. I hope that it will be seen not only as a building to have particular events occasionally, but that it will also be seen as an essential part of the nation building process. For this reason, Sir, I welcome this opportunity to highlight the need for such a theatre and the need to work towards the nation building in which many other countries have used arts so effectively.

Thank you.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
මී ළඟට ගරු මාලනී ෆොන්සේකා මන්ත්‍රීතුමිය විසින් යෝජනාව ස්ථිර කිරීම. ඊට ප්‍රථම, will an Hon. Member propose the Hon. M.B. Farook to take the Chair.

**ගරු මාලනී ෆොන්සේකා මහත්මිය**
(மாண்புமிகு (திருமதி) மாலனீ பொன்சேக்கா)
(The Hon. (Mrs.) Malani Fonseka)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "ගරු එම්. බී. ෆාරුක් මහතා දැන් මූලාසනය ගත යුතුය" යි මා යෝජනා කරනවා.

**ගරු ටී. බී. ඒකනායක මහතා (සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යතුමා)**
(மாண்புமிகு ரி. பி. ஏக்கநாயக்க - கலாசார, கலை அலுவல்கள் அமைச்சர்)
(The Hon. T.B. Ekanayake - Minister of Culture and the Arts)

***විසින් ස්ථිර කරන ලදී***
*ஆமோதித்தார்.*
*Seconded.*

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***

*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*

*Question put, and agreed to.*

***අනතුරුව ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා මූලාසනයෙන් ඉවත් වුයෙන්, ගරු එම්. බී. ෆාරුක් මහතා මූලාසනාරූඪ විය.***

*அதன் பிறகு, மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு எம்.பி. பாறூக் அவர்கள் தலைமை வகித்தார்கள்.*

*Whereupon* THE HON. ALHAJ A.H.M. AZWER *left the Chair, and* THE HON. M.B. FAROOK *took the Chair.*

**ගරු මාලනී ෆොන්සේකා මහත්මිය**

(மாண்புமிகு (திருமதி) மாலனீ பொன்சேக்கா)

(The Hon. (Mrs.) Malani Fonseka)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අධ්‍යාපනය සඳහා මෙන්ම ජාතික ඒකාබද්ධතාව සඳහා ප්‍රාසංගික කලාවන්හි ඇති වැදගත්කම සැලකිල්ලට ගනිමින්, දේශීය කුසලතා වර්ධනයට ද ඉතාමත් වැදගත් යයි සඳහන් කරමින්, ජාතික රංග ශාලාවක් ස්ථාපනය කළ යුතු යයි පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු මහාචාර්ය රාජීව විජේසිංහ මහතා විසින් ඉදිරිපත් කළ මෙම යෝජනාව මම මේ අවස්ථාවේ ස්ථිර කරනවා.

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**

(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)

(The Hon. Alhaj A.H.M. Azwer)

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, மன்னார் மாவட்டத்தைச் சேர்ந்த நீங்கள் இச்சபைக்குத் தலைமை தாங்குகின்ற இவ்வேளையில் மாண்புமிகு பேராசிரியர் ராஜீவ விஜேசிங்க அவர்கள் முன்வைத்துள்ள "அரங்கியற் கலைகளுக் கெனத் தேசிய அரங்கம் ஒன்றினை ஸ்தாபித்தல்" பற்றிய ஒத்திவைப்புப் பிரேரணை மீதான விவாதத்தில் கலந்துகொண்டு உரையாற்றுவதில் நான் பேரார்வமுடையவனாக இருக்கின்றேன். நீங்கள் பிரதிநிதித்துவப்படுத்துகின்ற மன்னார் மாவட்டம் கலை வளர்ந்து ஓங்குகின்ற நிலம்.

அண்மையில் மன்னாரில் தமிழ் விழா ஒன்று நடைபெற்றது. எம்முடன் தொடர்புகொண்ட அங்கு பிரபலமான கலைவாதி கலீல் குடும்பத்தினர் இவ்விழா பற்றிய விளக்கங்களை எமக்குத் தந்தார்கள். அவருடைய சகோதரர் “மக்கள்” காதர் அவர்களும் இந்தக் கலைவிழாவில் பங்கு பற்றியிருந்தார். அந்தக் குடும்பத்தில் ஒரு பிரபல வித்துவான் இருந்தார். அதேபோன்று இலங்கையிலே மாலினி பொன்சேகா போன்றவர்கள் நடித்த படப்பிடிப்பின் பொழுது ‘கெமரா’வை இயக்கிய எம்.ஏ.கபூர் அவர்களும் மன்னார் பிரதேசத்தைத் தாயகமாகக்கொண்ட இவர்களது குடும்பத்தைச் சேர்ந்தவர் என்பது குறிப்பிடத்தக்கது. இப்பொழுது சபைக்குத் தலைமைதாங்குகின்ற உங்களுக்கும் இது மிக்க இனிப்பான செய்தியாக இருக்குமென எண்ணுகின்றேன்.

எமது புதிய கலாசார, கலை அலுவல்கள் அமைச்சர் மாண்புமிகு ரி.பி. ஏக்கநாயக்க அவர்கள் கலை கலாச்சாரத்தை வளர்ப்பதில் மிகவும் துரிதமாகப் பணியாற்றி வருகிறார். அவர் அண்மையில் ஜோன் த சில்வா "ரங்க ஹல" என அழைக்கப்படுகின்ற கலையரங்கில் கலாபூஷண விருது விழாவை ஜாம் ஜாம் என நடத்தினார்கள். வடக்கிலிருந்து மிகவும் பிரபல்யம் வாய்ந்த சங்கீத விற்பன்னர்களும், எழுத்தாளர்களும் நடன ஆசிரியர்களும், நாடக மணிகளும், சாகித்தியவாதிகளும் கலாபூஷண விருது பெறுவதற்காக அந்த மண்டபத்திற்கு வருகை தந்திருந்தார்கள்.

முப்பது ஆண்டுகளுக்குப் பின்னர் கொழும்பு நகரிலே இடம்பெற்ற கலாபூஷண விருது வழங்கும் விழாவில் கலந்து கொண்டதையிட்டு வடக்கிலிருந்து வந்த அவர்கள் பெருமைப் பட்டார்கள். அவர்கள் கலாசார, கலை அலுவல்கள் அமைச்சர் மாண்புமிகு ரி.பி. ஏக்கநாயக்க அவர்களிடமிருந்தும், எமது மேல் மாகாண ஆளுநர் அஸ்ஸய்யித் எஸ். அலவி மௌலானா அவர்களிடமிருந்தும், என்னிடமிருந்தும் ஆனந்தக் கண்ணீர்மல்க அந்த விருதுகளைப் பெற்றுக்கொண்டார்கள். இப்படியான ஒரு புதிய யுகத்தை மலரச்செய்ய வேண்டுமென்பதே எமது மேதகு ஜனாதிபதி மஹிந்த ராஜபக்ஷ அவர்களுடைய அபிலாஷையும் குறிக்கோளுமாகும்.

ஆகவே, எமது நாட்டில் தமிழ் நாடக விழாக்கள் தொடர்ந்தும் நடைபெற வேண்டும். எமது நாட்டில் தமிழ்-முஸ்லிம் நாடகக் கலைஞர்கள் பலர் இருக்கின்றார்கள். இந்த நாட்டில் 'கம்பவாரிதி' போன்றவர்கள் சமயத்தையும் கலை, கலாசாரத்தையும் வளர்க்கி றார்கள். அதேபோன்று பொன்விழாக் கண்ட ‘கலைச்செல்வன்’ அப்துல் ரவுப் போன்றவர்கள் கலையை வளர்க்கிறார்கள். ஆகவே, இந்த அரசாங்கம் நாடகத்துறை, நாட்டியத்துறை, சங்கீதத்துறை ஆகியவற்றில் தமிழ் முஸ்லிம் மக்களையும் ஒருங்கிணைத்து அவர்களின் முன்னேற்றத்துக்காக உழைப்பதற்கு முன்னிற்கிறது என்பதை நான் இச்சந்தர்ப்பத்தில் சுட்டிக்காட்ட விரும்புகின்றேன்.

அதேபோன்று கலைத்துறையில் ஈடுபட்ட பல பழைமை வாய்ந்த சிங்களக் கலைஞர்கள் மற்றும் தமிழ் கலைஞர்கள் இலங்கை வானொலியிலே பல அற்புதமான நிகழ்ச்சிகளை நடத்தியிருக்கின்றார்கள். சங்கீத மேதை பீ.கே. முத்துசாமி அவர்கள், அவரது அருமை மகன் மோகன்ராஜ், அவர்தம் மகள் ‘கலாபேபி’ வித்யாஷினி மோகன்ராஜ் போன்றவர்களை நாங்கள் எளிதில் மறந்துவிட முடியாது. அதேபோன்று கடம் போன்ற சங்கீத வாத்தியங்களை வாசிக்கக்கூடியவர்கள், மற்றும் தப்லா மாஸ்டர் எஸ். நடராஜா, மிருதங்க மேதை சோ. ஷண்முகலிங்கம், ரீ. இரத்தினம் மாஸ்டர், வயலின் மேதை ரி.வி. பிச்சையப்பா, கடம் மேதை கே.கே. அச்சுதன், பண்டிதர் டி.எஸ். மணிபாகவதர் போன்றவர்களை எம்மால் மறக்கத்தான் முடியமா? இப்படியா னவர்கள் எல்லோரையையும் இந்த நாட்டுக்கு அறிமுகம் செய்துவைத்த பெருமை இலங்கை வானொலியையே - தற்போது Sri Lanka Broadcasting Corporation - சாரும். எனவே, அமைச்சர் அவர்கள் இவர்கள் போன்ற புகழ்பூத்த கலைஞர்களை அரவணைத்து, அவர்தம் கலை வளர உதவி செய்ய வேண்டும்.

"மஹிந்த சிந்தனை"யிலே அவர்களுக்கும் உதவிகள் மற்றும் pension rights வழங்கப்படவேண்டுமென்று சொல்லப் பட்டிருக்கின்றது. அதேநேரம் கலைவாதிகளுடைய நாயகராக, கலைஞர்களை ஊக்குவிக்கும் ஒரு முன்னோடியாக இந்த அரசாங்கத்தின் அமைச்சர் கௌரவ ரி.பி. ஏக்கநாயக்க அவர்கள் பணிபுரிவது மகிழ்ச்சிக்குரியது.

எங்களுடைய கௌரவ சபாநாயகர் சமல் ராஜபக்ஷ அவர்களுடன் நாங்கள் அண்மையில் பாகிஸ்தானுக்குச் சென்றிருந்தபோது மாண்புமிகு மாலனீ பொன்சேக்கா அவர்களின் புகழை எங்களால் அங்குங்கூட அறிய முடிந்தது. எங்களுடன் பாராளுமன்றப் பிரதிச் செயலாளர் தம்மிக திஸாநாயக்க அவர்களும் அங்கு வந்திருந்தார். மாலனீ பொன்சேக்கா அவர்கள் இந்த நாட்டில் கலைத் துறைக்காக பாடுபட்டது மாத்திரமல்லாமல் கிழக்காசியாவிலும் மற்றும் மேற்குலகிலும் விருது பெற்றிருப்பதைக் கவனிக்கும்பொழுது அவரை நாங்கள் ஒரு கலையரசி, கலைஞானி, கலைத்தலைவி என்று அழைக்கலாம். அதேநேரம் இப்டியானவர்களை மேதகு ஜனாதிபதி மஹிந்த ராஜபக்ஷ அவர்கள் இந்த நாட்டின் பாராளுமன்றத்திற்கு தேர்ந்தெடுத்திருப்பதை நினைக்கும்பொழுது கலைத்துறைக்கு அவர் ஆற்றியிருக்கின்ற சேவை மிகமிக அளப்பரியது. சிங்கள, தமிழ், முஸ்லிம் மக்கள் - கலைஞானமிக்க மக்கள் - அவரை ஒருக்காலும் மறந்துவிடமாட்டார்கள். ஆகவே, கலைத்துறை வளர்ச்சிக்குத் திட்டம் வகுத்து, ஒரு கேந்திர நிலையம் அமைத்து உதவி செய்வதற்கு புதிய கலாசாரத்துறை அமைச்சர் முன்வரவேண்டுமென்று வேண்டுகின்றேன். நன்றி.

**ගරු ටී. බී. ඒකනායක මහතා (සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යතුමා)**

(மாண்புமிகு ரி. பி. ஏக்கநாயக்க - கலாசார, கலை அலுவல்கள் அமைச்சர்)

(The Hon. T.B. Ekanayake - Minister of Culture and the Arts)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු රාජීව විජේසිංහ මන්ත්‍රීතුමා විසින් ඉදිරිපත් කරපු සභාව කල් තබන අවස්ථාවේ යෝජනාවෙන් සිංහල, දමිළ සහ ඉංග්‍රීසි භාෂාව ප්‍රයෝජනයට ගනිමින් රංගන කණ්ඩායමක් බිහි කිරීමට "ජාතික රංග ශාලාවක්" ස්ථාපනය කළ යුතු යැයි කියන කරුණ ඉතාම කාලෝචිත එකක්.

අපි මේ වන කොට ක්‍රියාත්මක කරපු වැඩසටහන ඔබතුමන්ලාට දැන ගැනීම සඳහා කියන්නට ඕනෑ. යම් කිසි කඩා වැටීමකට භාජන වෙලා තිබුණු "ටවර් හෝල් රඟහල" ජනාධිපතිතුමාගේ සහයෝගය මත රුපියල් කෝටි 6ක් වියදම් කරලා අංග සම්පූර්ණ රංග ශාලාවක් විධියට මේ පළමුවැනි දා මා විවෘත කළා. විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කරන්න මාර්තු මාසය වනතුරු ඒක වෙන් වෙලා තිබෙනවා. ඒ වාගේම එල්ෆින්ස්ටන් රඟහල නැවත ප්‍රතිසංස්කරණය කිරීමේ යෝජනාවලිය අපි ඉදිරිපත් කරලා තිබෙනවා. මෙයට අමතරව රුපියල් මිලියන 3,080ක් වියදම් කරමින් නොමැඩිස් පිටියේ ඉදි වන ජාතික ප්‍රසංග හා රංග කලා මධ්‍යස්ථානය මාර්තු මාසයේ විවෘත කරන්න අප බලාපොරොත්තු වනවා. චීන රජයේ සම්පූර්ණ ප්‍රදානයක් විධියට ආසන 1,300ක ඉතාම දැකුම්කලු නවීන පහසුකම් සහිත රංග ශාලා දෙකකුත්, එළිමහන් රංග ශාලාවකුත්, ඉලෙක්ට්‍රොනික් පහසුකම් සහිත ඉතාම නවීන ක්‍රමයට හසුරුවන්න පුළුවන් වේදිකාවකුත් සහිත මෙම රංග ශාලාව අතිගරු ජනාධිපතිතුමාත්, චීන රජයත් ඒකාබද්ධව විවෘත කිරීමට අවශ්‍ය කටයුතු කරන්න අපි කල්පනා කරනවා.

ඊට අමතරව අපි යෝජනා කරලා තිබෙනවා දශක තුනක් සංස්කෘතික කාර්යයන් ක්‍රියාත්මක කරන්න බැරිව තිබුණු උතුරු හා නැගෙනහිර ප්‍රදේශයේ යාපනය, කිලිනොච්චිය, මඩකලපුව, ත්‍රිකුණාමලය සහ අම්පාර කියන දිස්ත්‍රික්ක පහම ඉලක්ක කර ගත්ත සංස්කෘතික සහ තොරතුරු මධ්‍යස්ථාන පහක් මේ වසරේ ආරම්භ කරන්න. ඒ ප්‍රදේශයේ හින්දු, මුස්ලිම් ජාතීන් වාගේම විවිධ භාෂාත් එක්ක ඒකාබද්ධ වෙලා තිබුණු වැඩසටහන් අපේ මන්ත්‍රීතුමා යෝජනා කරපු "ජාතික රංග ශාලා" වැඩසටහන යටතේ ක්‍රියාත්මක කරන්නට පුළුවන් වනවා.

ජනාධිපතිතුමා අය වැයේදී මේ සම්බන්ධව කරුණු ප්‍රකාශ කළා. සිරිසඟබෝ, විදුර, ශ්‍රී වික්‍රම වාගේ පැරණි නූර්ති සහ නාට්‍ය යළි නිෂ්පාදනය කරලා ප්‍රදර්ශනය කරන්න බලාපොරොත්තු වනවා. ඇත්ත වශයෙන්ම පැරණි දෙයක් බලන්න දැන් ලොකු උනන්දුවක් තිබෙනවා. ටවර් හෝල් රඟහල පදනමත්, සංස්කෘතික දෙපාර්තමේන්තුවත් ඒකාබද්ධව මේ කාර්යය ක්‍රියාත්මක කර ගෙන යනවා.

ලංකාවේ සංස්කෘතික මධ්‍යස්ථාන එකසිය අසූහතක් තිබෙනවා. මේ සංස්කෘතික මධ්‍යස්ථාන හැම එකේම මේ වාගේ වැඩසටහන් -නිර්මාණ වැඩසටහන්, නාට්‍ය, සංගීත, පැරණි සාම්ප්‍රදායික නාට්‍ය මේ හැම එකක්ම- පුහුණු කරනවා විතරක් නොවෙයි, විවිධ වර්ෂවලදී කල එළි මංගල්‍යයන් පවත්වනවා.

ඒත් එක්කම ලංකාවේ සෑම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයකම අපට පිහිටුවන්න බැරි වුණු සංස්කෘතික මධ්‍යස්ථාන පිහිටුවීම සඳහා මුදල් ප්‍රදානය කරන්න ජනාධිපතිතුමා එකඟ වෙලා තිබෙනවා. ඊට අමතරව අපි මිලියන භාරදහසකට වැඩි මුදලක් වියදම් කරලා මහනුවර, කුණ්ඩසාලේ "රංග භූමිකාව" කියලා එකක් පටන් ගත්තා. ඒ අනුව පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ "වළ" වාගේ නාට්‍ය රඟ දක්වන්න පුළුවන් ස්ථාන අපි නිර්මාණය කරලා හදලා ඉවරයි. ඒ වාගේම බලි තොවිල්, යාග හෝම, යන්ත්‍ර මන්ත්‍ර, අපේ පැරණි සාම්ප්‍රදායික නාට්‍ය වාගේ ඒවා පිළිබඳ පර්යේෂණ කරන්න, ගීත ගැන පර්යේෂණ කරන්න ඒ මධ්‍යස්ථානය පාවිච්චි කරන්න අපි ගොඩනැඟිලි සමූහයක් මේ දිනවල හදා ගෙන යනවා. මා හිතන හැටියට මේ අවුරුද්දේ අපට පුළුවන් වෙයි මේ රටේ නව නිර්මාණ කරන අයට ඒ ස්ථානය විවෘත කරලා දෙන්න. ඊට අමතරව මාතර ප්‍රදේශයේ ඉතා දැකුම්කලු තැනකත් එවැනි රංග භූමිකා ක්‍රියාත්මක කරන ස්ථානයක් හදන්න අපිට රුපියල් මිලියන භාරදහස් ගණනක් ලැබී තිබෙනවා. අපි ඒකේ ටෙන්ඩර් එක අද තමයි අවසන් කළේ. යුද හමුදාව තමයි ඒකේ ඉදි කිරීම් භාරව කටයුතු කරන්නේ. ඒක ඉතාම දැකුම්කලු, නිර්මාණශීලී රංග භූමිකාවක් ක්‍රියාත්මක කරන තැනක් වෙයි. ඒ රංග භූමිකාවේ නිෂ්පාදන කාර්ය විතරක් නොවෙයි, සංගීත නිෂ්පාදන කාර්ය විතරක් නොවෙයි, පුහුණුවීම්, පරීක්ෂණ පැවැත්වීම් යන සියල්ල ක්‍රියාත්මක කරනවා.

ඊට අමතරව අපි ආරම්භ කරනවා, සුනාමියෙන් කෝච්චි අනතුර සිදු වෙච්ච පැරැළිය ප්‍රදේශයේ පරීක්ෂණ කෞතුකාගාරයක් සමඟ මේ වාගේ නිර්මාණශීලී රංග භූමිකාවක් ක්‍රියාත්මක කරන්න පුළුවන් ගොඩනැඟිලි සමූහයක්. ඒ ගොඩනැඟිලි සමූහය ඉදි කරන්නේ ගාලු පාරට පෙනෙන දුරින්. එහි ගිහිල්ලා නේවාසිකව ඉඳලා නිර්මාණ කරන්න පුළුවන්. ඒ වාගේම විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කරන්න පුළුවන්. තාක්ෂණික කාර්ය භාරයන් ක්‍රියාත්මක කරන්න පුළුවන්. ඒ වාගේම අපට මේ ළඟදී නෝර්වේ රටින් ආධාරයක් ලැබුණා, විශේෂයෙන් අපේ පැරණි ගීත සංරක්ෂණය කිරීම සඳහා; විශේෂයෙන් අපේ ජන ගීත පර්යේෂණාගාරයක් ඇති කිරීම සඳහා. අපි දැනට ජෝන් ද සිල්වා සමරු රඟහලේ වෙනම ස්ථානයක ඒ පටිගත කිරීම් කරපුවා, පැරණි ගීත එකතු කරපුවා සංරක්ෂණය කරලා තිබෙන ඒවා සියල්ලම එකතු කරලා වෙනම කලා මණ්ඩලයක් යටතේ සංරක්ෂණය කරන්න බලාපොරොත්තු වනවා. අපි ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාවට, ස්වාධීන රූපවාහිනී සේවයට, ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවට හා ලක්හඬ ගුවන් විදුලි සේවයට ආරාධනා කළා, සතියකට විනාඩි 45ක් ලංකාවේ ජන ගී පිළිබඳ වැඩසටහන් විකාශනය කරන්න කියලා. ඇත්ත වශයෙන්ම ජන ගී හුහක් විකාශනය කරන්න අපි යෝජනා කරන්නේ එළිමහනේ. ජන ගීතයේ තිබෙන හඬ mike එකෙන් එන කොට නොවෙයි කන්කලු වන්නේ එළිමහනේ තිබෙන ස්වභාවයත් එක්කයි; එළිමහනේ තිබෙන ස්වාභාවික පරිසරයත් එක්කයි. ඒ වාගේ වැඩසටහන් රාශියක් අපි ක්‍රියාත්මක කරන්න බලාපොරොත්තු වනවා.

ඒ වාගේම අපේ පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු මහාචාර්ය රාජීව විජේසිංහ මහතා අදහස් කරන ආකාරයට විවිධ ප්‍රදේශවල රංග භූමිකාව ක්‍රියාත්මක කරන අතර තුර අපි එන මාසයේ සිට පාර්ලිමේන්තුව අසලම තිබෙන ජනකලා කේන්ද්‍රයේදී සෙනසුරාදා සහ ඉරිදා ආරම්භ කරන්න කල්පනා කරනවා, හෝටල් කාමරවල සිර වෙලා ඉන්න විදේශිකයන් වෙනුවෙන් සහ ලාංකිකයන් වෙනුවෙන් අපේ විවිධ මට්ටමේ කලා කුසලතා තිබෙන අයගේ දේශීයකම, අපේකම, ඒ වාගේම අපේ සංස්කෘතික දායාදයන් ඒකාබද්ධ කරපු රඟහල් භූමිකාවක්. අපි ඒ ස්ථානයේ විශේෂයෙන් බෙර සංධ්වනිය වාගේ වැඩසටහන්, සබරගමු විලාසයේ රංගනයන්, ඒ වාගේම උඩ රට නාට්‍ය කලාවේ රංගනයන් ඇතුළු නව නිර්මාණ ප්‍රදර්ශනය කරන්න කල්පනා කරනවා. ඒ වැඩසටහන සඳහා ඒ ස්ථානය නිර්මාණය කරලා ඒ ප්‍රවේශය ගොඩ නඟන්න අපි බලාපොරොත්තු වනවා. මෙවැනි රඟහල් බිහි කිරීමෙන් අපි බලාපොරොත්තු වන්නේ යළිත් රටේ සංස්කෘතික ප්‍රබෝධයක් ආරම්භ කිරීමත්, ජනාධිපතිතුමා අපේක්ෂා කරන ඒ කාර්යයට තවත් ශක්තියක් ලබා දීම සඳහාත් තමයි. ගරු මන්ත්‍රීතුමා ප්‍රකාශ කළා, චීනය හා ඉන්දියාව මේ ක්ෂේත්‍රය පිළිබඳව දැන් දක්වන උනන්දුව පිළිබඳව. මෙවර ඉන්දියානු ජාතික දිනය වෙනුවෙන් යාපනයේත්, මාතරත්, මහනුවරත්, ඒ

[ගරු ටී. බී. ඒකනායක මහතා]

වාගේම කොළඹත් ඉන්දියානු ජන නැටුම් වැඩසටහන් රාශියක් තානාපති කාර්යාලය සංවිධානය කරලා තිබෙනවා. එහි ආරම්භක වැඩසටහන 25 වැනි දා කුලරත්න ශාලාවේදී පැවැත්වෙනවා. එච්චර උනන්දුවක් ඒ ගොල්ලන් තුළ තිබෙනවා, ඒ ගොල්ලන්ගේ ජන නැටුම්, ඒ ගොල්ලන්ගේ ඉන්දියානු නර්තන විලාසයන් අපේ රටේ අයට දැන ගැනීමට සලස් වන්න. චීනය මේ වාගේ විශේෂ වැඩසටහනක් සංවිධානය කරන්න අපට ආරාධනා කරලා තිබෙනවා.

එපමණක් නොවෙයි සාර්ක් කලාපයේ අපට සම්බන්ධ රටවල් හතේම අය සඳහා අපි සාර්ක් සංස්කෘතික මධ්‍යස්ථානයක් මාතර පිහිටු වනවා. එම මධ්‍යස්ථානය පිහිටු වීමේදී හැම රටකටම ඒ භූමියේ ඒ රටේ සංස්කෘතිය පිළිබඳව අධ්‍යයනය කරන්න, ඒ රටේ සංස්කෘතිය හදාරන්න, ඒ රටේ සංස්කෘතික වැඩසටහන් පිළිබඳව අත් දැකීම් ලබා ගන්න පුළුවන් වනවා. ඒ නිසා ඒ හුවමාරු වැඩ පිළිවෙළ පිළිබඳ ගිවිසුම අපි අත්සන් කරලා ඉවරයි. ඒකත් එක්ක ඒ වැඩසටහන් ක්‍රියාත්මක කරනවා. මේ ජාතික රඟහල ස්ථාපනය කිරීම සම්බන්ධයෙන් ඉදිරියේ දී අපේ සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යාංශයෙන් රට පුරා අලුත් වැඩසටහනක් ක්‍රියාත්මක කරන්නට බලාපොරොත්තු වනවා. අපේ අමාත්‍යාංශයේ බස් රථ තිබෙනවා. අපි නිර්මාණය කරන නාට්‍ය, සංවිධායකයන් මඟින් හැම ගමකටම ගිහින් පෙන්වීමේ ජාතික වැඩසටහනක් ක්‍රියාත්මක කරන්නට අපි කල්පනා කරනවා. අපට වේදිකාවක් අවශ්‍ය වන්නේ නැහැ. ඉස්සර ගමේ පන්සලේ බණ මඩුව අපි මේ සඳහා පාවිච්චි කළා. කමත, වෙල් එළිය පාවිච්චි කළා. ඒ රංග භූමිය බවට පත් කළේ ස්වාභාවික පරිසරය. ඒ නිසා එම නාට්‍ය ගමට ගිහින් පෙන්වීමේ වැඩසටහනක් ජාතික වශයෙන් ක්‍රියාත්මක කිරීමයි අපේ වැඩ පිළිවෙළ වන්නේ. ගරු මන්ත්‍රීතුමා බලාපොරොත්තු වන ජාතික රඟහලක් ස්ථාපනය කිරීමේ වැඩසටහන සඳහා අපේ පූර්ණ අවධානය යොමු කරනවා. ඒ පිළිබඳව හොඳ අදහසක් ජාතික වශයෙන් මතු කරන්නට මහන්සි වුණු ගරු මන්ත්‍රීතුමාට අපේ අමාත්‍යාංශය වෙනුවෙන් අපේ ස්තුතිය පළ කරනවා. බොහොම ස්තුතියි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***පාර්ලිමේන්තුව ඊට අනුකූලව අ. භා. 6.47 ට, 2011 පෙබරවාරි 08 වන අඟහරුවාදා අ. භා. 1.00 වන තෙක් කල් ගියේය.***

*அதன்படி பி. ப. 6.47 மணிக்கு பாராளுமன்றம், 2011 பெப்ரவரி 08, செவ்வாய்க்கிழமை பி. ப.1.00 மணிவரை ஒத்திவைக்கப்பட்டது.*

*Adjourned accordingly at 6.47 p.m. until 1.00 p.m. on Tuesday, 08th February, 2011.*

**සැ.යු.**

මෙම වාර්තාවේ අවසාන මුද්‍රණය සඳහා ස්වකීය නිවැරදි කළ යුතු තැන් දක්වනු රිසි මන්ත්‍රීන් මින් පිටපතක් ගෙන නිවැරදි කළ යුතු ආකාරය එහි පැහැදිලිව ලකුණු කොට, පිටපත ලැබී දෙසතියක් නොඉක්මවා **හැන්සාඩ්** සංස්කාරක වෙත ලැබෙන සේ එවිය යුතුය.

குறிப்பு

உறுப்பினர் இறுதிப் பதிப்பிற் செய்யவிரும்பும் பிழை திருத்தங்களைத் தமது பிரதியில் தெளிவாகக் குறித்து அதனைப் பிழை திருத்தப்படாத பிரதி கிடைத்த இரு வாரங்களுள் **ஹன்சாட்** பதிப்பாசிரியருக்கு அனுப்புதல் வேண்டும்.

**NOTE**

Corrections which Members suggest for the Final Print should be clearly marked in their copy and sent to be Editor of HANSARD within two weeks of receipt of the uncorrected copy.

---

**Contents of Proceedings :**

**Final set of manuscripts**
**Received from Parliament :**

**Printed copies dispatched :**

**දායක මුදල් : පාර්ලිමේන්තු විවාද වාර්තාවල වාර්ෂික දායක මිල රු. 2178කි. පිටපතක් ගෙන්වා ගැනීම අවශ්‍ය නම් ගාස්තුව රු. 18.15කි. තැපැල් ගාස්තුව රු. 2.50කි. කොළඹ 6, කිරුළපන, පාමංකඩ පාර, අංක 102, පියසිරි ගොඩනැගිල්ලේ රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම නොවැම්බර් 30 දාට ප්‍රථම දායක මුදල් ගෙවා ඉදිරි වර්ෂයේ දායකත්වය ලබා ගෙන විවාද වාර්තා ලබාගත හැකිය. නියමිත දිනෙන් පසුව එවනු ලබන දායක ඉල්ලුම් පත් භාර ගනු නොලැබේ.**

**சந்தா** ; ஹன்சாட் அதிகார அறிக்கையின் வருடாந்த சந்தா ரூபா 2,178. ஹன்சாட் தனிப்பிரதி ரூபா 18.15. தபாற் செலவு ரூபா 2.50. வருடாந்த சந்தா முற்பணமாக **அத்தியட்சகர், அரசாங்க வெளியீட்டலுவலகம், இல. 102, பியசிறி கட்டிடம், பாமன்கடை வீதி, கிருளப்பனை, கொழும்பு 6** என்ற விலாசத்திற்கு அனுப்பி பிரதிகளைப் பெற்றுக்கொள்ளலாம். ஒவ்வோராண்டும் நவம்பர் 30 ஆந் தேதிக்கு முன் சந்தாப்பணம் அனுப்பப்பட வேண்டும். பிந்திக் கிடைக்கும் சந்தா விண்ணப்பங்கள் ஏற்றுக்கொள்ளப்படமாட்டா.

**Subscriptions :** The annual subscription for Official Report of Hansard is Rs. 2,178. A single copy of Hansard is available for Rs. 18.15. (Postage Rs. 2.50) Copies can be obtained by remitting in advance an annual subscription fee to the SUPERINTENDENT, GOVERNMENT PUBLICATIONS BUREAU, No. 102,Piyasiri Building, Pamankada Road, Kirulapone, Colombo 6. The fee should reach him on or before November 30 each year . Late applications for subscriptions will not be accepted.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.